# බස්නාහිර පළාතේ පළාත් සභාව

மேல் மாகாண மாகாண சபை

WESTERN PROVINCE PROVINCIAL COUNCIL

**2013 දෙසැම්බර් 04** වන බදාදා

2013 டிசெம்பர் 04 ஆந் திகதி புதன்கிழமை

Wednesday 04th December 2013

**බත්තරමුල්ල, ශ්‍රී ජයවර්ධනපුර, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවතේ, අංක 204 හි පිහිටි බස්නාහිර පළාතේ සභා ගොඩනැගිලි සංකීර්ණයේ නව සභා ශාලාවේදී පැවැති සභා රැස්වීම**

பத்தரமுல்ல .இல ,டென்சில் கொப்பேகடுவ மாவத்தை ,ஸ்ரீ ஜயவர்த்தனபுர , 204இல் மேல் மாகாண சபையின் புதிய கட்டடத் தொகுதியில் அமைந்துள்ள புதிய சபை மண்டபத்தில் நடைபெற்ற கூட்டம்

The meeting held at the Western Provincial Council new building complex at No.204, Denzil Kobbekaduwa Mawatha, Sri Jayawardhanapura, Battaramulla.

**පූ.භා. 09.36 ට පළාත් සභාව රැස් විය.**

*மு.ப. 09.36* ***க்கு சபை கூடியது***

*The Provincial Council met at 09.36 a.m.*

**ගරු සභාපතිතුමා [සුනිල් විජේරත්න මහතා] මූලාසනාරූඪ විය.**

*திரு தவிசாளர் .[ சுனில் விஜேரத்ன அவர்கள்] ] தலைமை வகித்தார்.*

*Mr. Chairman [ Sunil Wijerathne ] in the Chair*

## වාර්ෂික මුදල් ප්‍රකාශය - 2014
## පූර්ණ කාරක සභාව

ANNUAL FINANCIAL STATEMENT - 2014

COMMITTEE OF THE WHOLE COUNCIL

***2014 වාර්ෂික මුදල් ප්‍රකාශයේ ප්‍රදානයන් සලකා බැලීම සඳහා පළාත් සභාව පූර්ණ කාරක සභාවක් බවට පරිවර්තනය විය යුතු යැයි ජගත් අංගගේ ගරු අමාත්‍යතුමා විසින් යෝජනා කරන ලදුව, පළාත් සභාව පූර්ණ කාරක සභාවක් බවට පත් විය.***

*Having stated by the Hon. Minister Jagath Angage that the Provincial Council be converted into a Committee of the Whole Council, in order to consider the grants of the Annual Financial Statement of 2014, the provincial council converted itself into a Committee of the Whole Council.*

| | |
|---|---|
| ශීර්ෂ අංක-**100** | - **ආණ්ඩුකාරවරයා** |
| ශීර්ෂ අංක-**101** | - **බස්නාහිර පළාත් සභාව** |
| ශීර්ෂ අංක-**102** | - **පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව** |
| Head no 100 | - Governor |
| **Head no 101** | - Western Province Provincial Council |
| **Head no 102** | - Provincial Public Service Commission |

[පූ.භා. 09.39]

**ගරු ඒ.එම් යූසුෆ්.**

Hon. A M Yoosuf

ගරු සභාපතිතුමනි, මෙම ශීර්ෂයන් යටතේ ගරු ආණ්ඩුකාරතුමා යටතේ, ඒ වාගේම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව සහ පළාත් සභා කටයුතු යන වැය විෂයයන් පිළිබඳව අපට අද සාකච්ඡාවට භාජනය කරන්න සිදු වෙලා තියෙනවා. මම විශේෂයෙන් සඳහන් කරන්න ඕනෑ ගරු සභාපතිතුමනි, මේ බස්නාහිර පළාත් සභාවේ ආණ්ඩුකාරතුමා අවුරුදු ගණනක් තිස්සේ මේ පළාත් සභාවේ කටයුතු මෙහෙයවනවා. ඒ තියෙද්දිත් මම පහුගිය අවස්ථාවකදිත් පෙන්වා දුන්නා, එතුමාගේ කාර්යාලය සම්බන්ධව එතුමාට ලොකු අඩුවක් තියෙන බව. ඒ වාගේම නිල නිවාසය සම්බන්ධව. විශේෂයෙන් ගරු ආණ්ඩුකාරතුමාගෙන් බස්නාහිර පළාත නියෝජනය වන නිසා එතුමාට නිල නිවාසයක අවශ්‍යතාවයක් තියෙනවා. ඉතින් මම මුලින් සඳහන් කළේ, පසුගිය වර්ෂවලත් මේ අඩුව පෙන්නුම් කළා. පහුගිය දවස්වල චෝගම් පවත්වපු අවස්ථාවේ හරි අඩු තරමින් මෙතුමාට කාර්යාලයක් එහෙම නැත්නම් නිල නිවාසයක් ලබා දෙන්න තිබුණා. ඒ වාගේම කලින් Unity Plaza ගොඩනැගිල්ලේ තිබුණු කාර්යාලය දැන් වෙන ස්ථානයකට අරගෙන ගිහිල්ලා තියෙනවා. එතැනත් මට නම් පේන විධියට ඉඩ පහසුකම් තිබුණත්, කාර්යාල පහසුකමක් නැහැ. මන්ත්‍රීවරුන්ට ගියාම වාහන නවත්වන්න හරි අපහසුතාවයක් තියෙන තැනකයි ඉන්නේ.

විශේෂයෙන් ඔබතුමා මගින් ප්‍රධාන අමාත්‍යතුමාටත්, අමාත්‍ය මණ්ඩලයටත් යෝජනා කරනවා. අවධානය යොමු කරනවා. මේ ඉදිරි වර්ෂය ඇතුළතවත් අඩු තරමින් ආණ්ඩුකාර කාර්යාලය හොඳට ස්ථාපනය කරන්න ඒ මූලික කටයුතු ආරම්භ කරන්නය කියලා. විශේෂයෙන් එය අත්‍යවශ්‍ය කාර්යයක්. අවුරුදු විසිපහක් වෙලත් තවමත් ආණ්ඩුකාරවරයෙකුට ඉන්න ස්ථානයක් නැහැ. නිල නිවාසයක් නැහැ. ඒ වාගේ සමහර විට පිළිතුරු කථාවේදී කියන්න පුළුවන්, අපි මේ තට්ටු පහළොව හැදුවාම දෙන්නම් කියලා. ඒ තට්ටු පහළොව අවසන් වන විට හයවන පළාත් සභාවේත් භාගයක්වයත් ක්‍රියාත්මක වෙලා යාවි. අවුරුදු තුනක් යන්න ඕනෑ. ඊට කලින් ප්‍රථමයෙන්ම හොඳ ස්ථානයක හොඳ ගොඩනැගිල්ලක් එතුමාට ලබා දීලා මේ කටයුතු කර ගෙන යන්න අවස්ථාව ලබා දෙන්න

[ ගරු ඒ.එම්. යූසුෆ් ]

විශේෂයෙන්ම උනන්දු වෙන්න ඕනෑය කියලා මතක් කරනවා.

ඒ වාගේම ආණ්ඩුකාර කාර්යාලය පිළිබඳව ඒ රාජකාරි කටයුතු කිරීමේදී පළාත් සභා මන්ත්‍රීවරු පිළිබඳවත් ඒ වාගේ අනෙකුත් රාජකාරිවලදී ආණ්ඩුකාරතුමා දක්වන උනන්දුවත් අපි විශේෂයෙන් අගය කරන්න ඕනෑ. විශේෂයෙන්ම එතුමා මුස්ලිම් ජාතිකයෙක් වුණත්, එතුමාගේ ඒ කටයුතුවලදී කිසිදු භේදයකින් තොරව කටයුතු කරන බව පැහැදිලිව කියන්න වෙනවා. ඒ වාගේම මේ මුදල් ප්‍රකාශනයම අවසාන බලධාරියා හැටියට එතුමා තමයි අනුමත කරන්නේ. එතුමා අද අපි මේ සභාවේ කථා කරන, සම්මත කරන දස ලක්ෂ හතළිස් තුන්දහස් හත්සිය හත මේ සභාවෙන් අනුමත වෙලා එතුමාගේ අනුමැතිය ලැබුණායින් පස්සේ තමයි අපි මේ කටයුතු කරන්න ආරම්භ කරන්නේ. එතැන්දි විශේෂයෙන්ම මතක් කරන්න ඕනෑ, මේ මුල්‍ය වියදම් දැරීම පිළිබඳව එතුමා කොයි ආකාරයට අනුමත කළත්, හොඳින් පරිශීලනයට ලක් කරලා එය සොයා බැලීමක් කරන්නෙයි කියලා ඉල්ලා සිටිනවා. විශේෂයෙන් පළාත් රාජ්‍ය ගිණුම් කාරක සභාවට යොමුවන කාරණා පිළිබඳව. එතැන්දි ආණ්ඩුකාරතුමාට යවලා අපට එතුමා මාර්ගයෙන් එන්නේ. ඒ ලැබුණු වාර්තා පිළිබඳව, එහි අන්තර්ගත වෙලා තියෙන අඩුපාඩුකම් පිළිබඳව විශේෂයෙන්ම එතුමාගේ අවධානය යොමු කරලා සොයා බැලීමක් කරන්න වෙනවා. ඒ වාගේම ගිණුම් කාරක සභාව ගන්නා වූ තීරණ නිර්දේශයන් පිළිබඳව නැවත අපි ආණ්ඩුකාරතුමාට වාර්තා එවනවා. ඒ පිළිබඳවත් මෙතෙක් කල් මා දන්න විධියට කිසිම කටයුත්තක් කරලා නැහැ. එය ලොකු අඩුවක් හැටියට මම සඳහන් කරන්න වෙනවා. දැන් ඒ කටයුතු කිරීමේදී හරියාකාර පාලනය වුණා නම්, සොයා බැලීමක් කළා නම් යම් යම් තැන්වල තියෙන අඩුපාඩුකම් සම්පූර්ණ කරගන්න ඉඩ තිබුණා. තවදුරටත් ඒ කටයුතු ඒ ආකාරයෙන් සමහර අවස්ථාවල යනවා.

විශේෂයෙන් පළාත් පාලන ආයතන ගැන මෙතැන්දි සඳහන් කරන්න වෙනවා. පළාත් පාලන ආයතනවලට පළාත් සභාවෙන් ප්‍රතිපාදන මුදල් ලබා දුන්නත්, ඒ පිළිබඳව ගිණුම් කාරක සභාවට එන්නේ නැත්නම්, මේ පළාත් සභාවට ඒ පිළිබඳව සාකච්ඡා කරන්න අවස්ථාවක් ලැබෙන්නේ නැහැ. ඒ අයට නියෝගයක් දෙන්න තරම් අපට හැකියාවක් නැහැ. එහෙම නම් ආණ්ඩුකාරතුමාගේ අවධානය යොමු කරලා, ඒ වාර්තාවන් අරගෙන කමිටුවක් පත් කරලා ඒවායේ අඩුපාඩුකම් සොයා ගෙන පළාත් පාලන ආයතනවල නිවැරදි පාලනයක් කරන්න අවශ්‍ය වෙනවා. පළාත් පාලන ආයතනවල විෂය භාර අමාත්‍යවරයා හැටියට කටයුතු කිරීමේදී යම් අපහසුතාවයක් ඇති වුණත්, ආණ්ඩුව විසින් නිසි බලධාරියා හැටියට, ජනාධිපතිතුමාගේ නියෝජිතයා හැටියට පළාත් පාලන ආයතනවල සිදුවන දූෂණ, ඒ වාගේම විවිධ අඩුලුහුඩුකම් පිළිබඳව සොයා බැලීමක් කරන්න ඕනෑ. දැනටමත් බස්නාහිර පළාතේ පළාත් පාලන ආයතන කිහිපයක්ම යම් යම් සිද්ධීන්වලට සම්බන්ධ වෙලා තියෙනවා. ඒ අය අධිකරණගත කරලා තියෙනවා. ඒ වාගේම රිමාන්ඩ්ගත කරලා තියෙනවා. එහෙම නම් විනය කඩ කිරීම් පිළිබඳව ඒ අයගේ රාජකාරි පැහැර හැරීම පිළිබඳව ආණ්ඩුකාරතුමාට කටයුතු කරන්න හැකියාවක් තියෙනවා. මෙතැන්දී එසේ නොකිරීම පිළිබඳව අපි කනගාටුව ප්‍රකාශ කරන්න ඕනෑ. මම දන්නවා. අගලවත්ත ප්‍රාදේශීය සභාවේ සභාපතිතුමා, එවැන්නකට සම්බන්ධ වුණා. කළුතර සභාපතිතුමා එවැනි දේවලට සම්බන්ධ වෙලා තියෙනවා. මේවා සම්පූර්ණයෙන්ම දේශපාලන වශයෙන් අනෙකුත් පළාත් පාලන ආයතනවලට වාගේම, පළාත් සභාවේ ඉන්න මන්ත්‍රීවරුන්ටත් එච්චර සුදුසු නැහැ. මම අද උදේ අහගෙන හිටියා, අල්ලස් හෝ දූෂණ කොමිෂමෙන් මේ අවුරුද්දට පැමිණිලි දෙදහස් අටසියයක් ලැබිලා තියෙනවා. ඒවා විශේෂයෙන්ම ප්‍රාදේශීය සභාවල සභාපතිවරු පිළිබඳව. ඒ වාගේම මන්ත්‍රීවරු පිළිබඳව. ඇයි මෙවැනි සිදුවීම් සිද්ධ වෙන්නේ? රටේ නීතිය හා විනය හරියට ක්‍රියාත්මක වෙනවා නම්, විශේෂයෙන්ම මේවා වළක්වා ගන්න පුළුවන් වේවි.

ආණ්ඩුකාරතුමාගේ කාර්යාලය පිළිබඳව අපි විශේෂයෙන්ම සන්තෝෂයෙන් මතක් කරන්න ඕනෑ. ඒ කාර්ය මණ්ඩලය පිළිබඳව. ඒ කාර්ය මණ්ඩලයෙන් සිදුවිය යුතු කටයුතු ප්‍රමාදයකින් තොරව ලේකම්තුමා මෙහෙයවනවා. පහුගිය කාලයේ කාර්ය මණ්ඩලයේ අඩුපාඩුකම් තිබුණා. දැන් සම්පූර්ණ වෙලා. විශේෂයෙන් මම එහෙම කිව්වේ, විගණනයට ඉදිරිපත් වන කරුණු අනුව අපට පැහැදිලි වෙනවා, ආයතනයේ පැවැත්ම. පසුගිය කාලයක් තිබුණා මුල්‍යතා පිළිබඳ ගැටළු. ඒ තත්ත්වයෙන් මිදිලා අද ඒ කටයුත්ත කර ගෙන යන්න ඒ කාර්ය මණ්ඩලයට හැකියාව ලැබිලා තියෙනවා.

ඒ වාගේම කෙටියෙන් පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව ගැන සඳහන් කරනවා. විශේෂයෙන්ම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, ඒ අයට පැවරුණු වගකීම්වලින් බොහොමයක්ම උනන්දුවෙන් කටයුතු කරපු ආයතනයක් කියලා විශේෂයෙන්ම සඳහන් කරන්න වෙනවා. ගුරුවරු බඳවා ගැනීමේදී, ගුරුවරුන්ට පත්වීම් ලබා දීමේදී මධ්‍යම අමාත්‍යාංශයෙන් අනුයුක්ත කරන ගුරුවරුන්ගේ - එක් අවස්ථාවක් තිබුණා, දින කිහිපයයි තිබුණේ. මම දන්න නිසා. ඒ දින කිහිපයක් ඇතුළත පත්වීම් ලිපි භාර දෙන්නත් ඕනෑ, කඩිමුඩියේ ඒ අය අනුයුක්ත කරන්නත් ඕනෑ. ඒ ලේකම්තුමියට ස්තුතිවන්ත වෙන්න ඕනෑ. ඒ කොමිෂන් සභාවේ සභාපතිතුමා ඇතුළු කාර්ය මණ්ඩලයට. විශේෂයෙන්ම ඒ වාගේ අවස්ථාවලදී පළාත් සභාවේ සේවාව තේරුම් අරගෙන අවශ්‍යතාවයන් අනුව කටයුතු කිරීම පිළිබඳව. පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවටත් කාර්යාල ගොඩනැගිල්ලක් පිළිබඳව අවධානය යොමු කරන්න ඕනෑ යුගය දැන් ඇවිල්ලා තියෙනවා. වැඩ ගත්තාට මදී. ඒ පහසුකම් ලබා දෙන්න ඕනෑ. ඒ පහසුකම් තිබුණොත් තමයි අපට හොඳ සේවාවක් ලබා ගන්න පුළුවන් වෙන්නේ ගරු සභාපතිතුමනි.

ඊළඟට මම ඔබතුමා ඇතුළු පළාත් සභා කාර්යාලය ගැන කෙටියෙන් සඳහන් කරන්න ඕනෑ. පළාත් සභාව යටතේ සම්බන්ධ වෙලා සභාපතිවරයෙක් හැටියට - ඔබතුමා මන්ත්‍රීවරුත් සමග සම්බන්ධ වෙලා ඒ රාජකාරි කටයුතු කිරිම ගැන ප්‍රශංසා මුඛයෙන් මම කථා කරන්න ඕනෑ. වගකීම් පැහැර හැරීමක් කළේ නැහැ. ඒ වාගේම සභාවක් හැටියට ගත්තාට පස්සේ තවමත් - එදා අපට වාසනාවට වාගේ පුළුවන් විධියට මේ ගොඩනැගිල්ල අපි සකස් කර ගත්තාට, අඩුපාඩුකම් රාශියක් තියෙනවා. මේ අඩුපාඩුකම් මකන්න තවම පියවර අරගෙන නැහැ. මේ සභා භූමිය ගත්තත්, වැසි කාලෙට යන්න එන්න බැරි තත්ත්වයක් තියෙනවා. නැවත වරක් මම මතක් කරනවා ඒ සභා භූමිය සම්බන්ධව අවධානය යොමු කරන්නය කියලා.

ලේකම්තුමා ඇතුළු කාර්ය මණ්ඩලය ගැනත් විශේෂයෙන් සඳහන් කරන්න ඕනෑ. මන්ත්‍රීවරයෙක් ගියාම ඔහුගේ අවශ්‍යතාවය හඳුනාගෙන ඔහුගේ අඩුපාඩුකම් සම්පූර්ණ කරලා ඒ අවශ්‍ය කටයුතු ඉතා ඉක්මණින් සකස් කරලා දීමේ අඩුවක් අපි දැක්කේ නැහැ. විශේෂයෙන්ම කාර්ය මණ්ඩලයේ උනන්දුවක් තිබුණත්- ඒ කාර්ය මණ්ඩලයට පහුගිය කාලයේ ටොරින්ටන් එකේ ඉඳලා එන්න සිද්ධ වුණා, ඉඩ පහසුකම් නැතෙයි කියලා. කාර්යාලය අද වෙන තැනකට ගියා. එතැන ඉඩ පහසුකම් තියෙනවා. නමුත් ස්ථාවරයක් නැහැ. තව අවුරුද්දයි දෙකයි ඉන්න වෙන්නේ. කාර්යාල ගොඩනැගිල්ලේ අවශ්‍යතාවය පවතිනවා. මේ අවුරුද්දේ ආරම්භ කරනවාය කියලා මහ ඇමතිතුමා සඳහන් කළත් තව අවුරුදු තුනක් යනකල් අපට ඒ ගැන හිතන්න බැරි තත්ත්වයක් තියෙනවා. කාර්ය මණ්ඩලයට ඒ අයගේ සේවාව තෘප්තිමත්ව කරන්න අනෙකුත් අවශ්‍ය පහසුකම් පිළිබඳව විශේෂයෙන් මම මතක් කරන්න ඕනෑ. ඔවුන්ගේ අවශ්‍යතාවය. ඒ වාගේම ලේකම්තුමා ඇතුළු අනෙකුත් කාර්ය මණ්ඩලය තමන්ගේ අඩුපාඩුකම් මැද්දේ හරි තවමත් ඒ කටයුතු කිරීම පිළිබඳව විශේෂයෙන් මම සඳහන් කරන්නේ ඒකයි. පළාත් සභාවක් හැටියට ඒ කටයුතු කිරීමේදී අපි ඉතාමත් හොඳ සේවාවක් ලබා ගන්න අපි කල්පනා කරන්න ඕනෑ ගරු සභාපතිතුමනි. එහෙමනම් මේ පළාත් සභා ගොඩනැගිල්ල, ඒ වාගේම ලේකම් කාර්යාලය, සභාපතිතුමා, ඒ වාගේම කාර්ය මණ්ඩලය, විශේෂයෙන්ම මන්ත්‍රීවරුන්ගේ ගේ සුභසාධනය පිළිබඳව මීට වඩා අවධානය යොමු කරන්නය කියලා විශේෂයෙන් මතක් කරන්න ඕනෑ.

ගරු සභාපතිතුමනි, දෛනිකව පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට පත්තරයක් ලබා දෙනවා. එහෙනම් පළාත් සභා මන්ත්‍රීවරුන්ටත් එයින් අඩක් පත්තර කිහිපයක් හෝ අඩු තරමින් එක පත්තරයක් හරි ලබා ගන්න ඒ පහසුකම් සලසලා දෙන්න ඕනෑ කියන එක මම විශේෂයෙන් මතක් කරන්න ඕනෑ. පහුගිය කාලයේ අපට ලිපි ද්‍රව්‍ය වශයෙන් යම් මුදලක් ලබා දෙනවා. ඒ සාකච්ඡා කරලා තීන්දු කර ගත්ත ඒවා. නමුත් විශේෂයෙන්ම අනෙකුත් පොදු පහසුකම් පිළිබඳව, ඒ වාගේම මන්ත්‍රීවරුන්ගේ සංචාරය පිළිබඳව මම මතක් කරන්න ඕනෑ. ඒක පහුගිය කාලයේ මහ ඇමතිතුමා අමාත්‍යාංශවලට අනුයුක්ත කළා. නමුත් සභාපතිතුමා යටතේ එය ලබා දෙනවා නම් මම හිතන විධියට වඩාත් සුදුසු යැයි යෝජනා කරන්න කැමතියි. එහෙම නම් මන්ත්‍රීවරුන්ගේ අධ්‍යාපන චාරිකාවලදී ඔවුන්ව අඩු තරමින් වර්ෂයකට වරක්වත් ඔවුන්ට දැනුම ලබා ගන්න පුළුවන් ආකාරයට - අපි යම් යම් තැන්වලට ගියාට පසුව ඒ දැනුම තුළ පුළුවන් වෙනවා. මේ පළාත් සභා කටයුතු මෙහෙයවීමේදී, කටයුතු කිරීමේදී හොඳ පහසුකමක් ලබා ගත්තා ගරු සභාපතිතුමනි. ඒ නිසා විශේෂයෙන්ම ආණ්ඩුකාරතුමාගේ, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ, පළාත් සභාව පිළිබඳ ශීර්ෂයන් යටතේ මගේ

[ ගරු ඒ.එම්. යූසුෆ් ]

කාලය පිළිබඳව සිතලා ඉතා කෙටියෙන් කරුණු කිහිපයක් දක්වන්න ලැබීම ගැන මම ඉතා සන්තෝෂ වෙනවා. එහෙමනම් මේ ආයතන තුන තමයි අපේ ප්‍රධාන ස්ථාන. මේ ස්ථාන තුනම නිසියාකාරව අපි පාලනය කළ යුතුව පවතිනවා. විශේෂයෙන්ම මෙන්න මේ පළාත් සභා ගොඩනැගිල්ලේ පරිපාලනය තුළදී අපි ඒ පිළිබඳව විශේෂ අවධානය යොමු කළ යුතු යැයි යෝජනා කරනවා.

ගරු සභාපතිතුමනි, මම නැවත වරක් මතක් කරන්න ඕනෑ. මේ මන්ත්‍රීවරුන්ට අඩුතරමින් ආණ්ඩුකාරතුමා සම්බන්ධ වෙලා වසරකට වරක් හරි කමක් නැහැ. මන්ත්‍රීවරුන්ගේ අඩුපාඩුකම් සාකච්ඡා කරන්න ඕනෑ. කලින් සම්ප්‍රදායක් තිබුණා. පළාත් සභාවේ ආණ්ඩුකාරතුමාගේ ප්‍රතිපත්ති ප්‍රකාශනය අවුරුදු දෙකකට වරක් පවත්වා ගෙන ආවා. ඒක දැන් සිද්ධ වෙන්නේ නැහැ. ඒ වාගේම ආණ්ඩුකාරතුමාත්, අමාත්‍ය මණ්ඩලයත් නිරන්තරයෙන්ම සම්බන්ධ වෙලා සාකච්ඡා කරනවා නම්, අපට ලැබෙන යම් යම් වරප්‍රසාද පිළිබඳව නැත්නම් පළාත් සභාවේ නීතිමය ගැටළු පිළිබඳව, එහෙම නැත්නම් අපේ 13 වන සංශෝධනයෙන් ලබා දීලා තියෙන බලතල මධ්‍යගත කරන මොහොතක, මහ ඇමතිවරු හත් දෙනා එකතු වෙලා ඒ බලය නිසි ලෙස රැක ගැනීම සඳහා පියවරක් ගන්නවා නම්, විශේෂයෙන්ම B.T.T එක, එක පැත්තකින්. ඒ වාගේම ඉඩම් පිළිබඳව ප්‍රශ්න මතු වෙලා තිබුණා. ඒකත් දැන් රජය මධ්‍යගත කරලා තියෙනවා. ගොවිජන සේවා මධ්‍යස්ථාන අපට ලැබෙන්නේ නැහැ. මේ පළාත් හතේම තිබුණු අඩුපාඩුකම් පිළිබඳව සාකච්ඡා කළා නම්, පළාත් සභාව මීට වඩා ඉදිරියට යන්න හැකියාවක් තියෙනවා. මහ ඇමතිතුමා යම් යම් තීරණයක් ගැනීමේදී අපේ පළාත් සභාවේ අනෙකුත් අමාත්‍යවරුන්ට ලොකු ශක්තියක් වෙනවා ඒක. උතුරේ පළාත් සභාව නිසි ලෙස ක්‍රියාත්මක වෙන කොට 13 වැනි සංශෝධනයේදී පැහැදිලිව තිබෙන බලතල මේ පළාත් සභාවත් සතුව තිබිය යුතුය යන මතය තුළ ඉන්න වෙනවා. අද පළාත් සභා අහෝසි කරන්න කථා කරලා නැවත අපට පළාත් සභාව ලබා දීලා තියෙනවා. එහෙමනම් පළාත් සභාව ග්‍රාමීය ජනතාවට සමීප වුණු ආයතනයක්. මේ මන්ත්‍රීවරු අද සන්තෝෂයෙන් ඉන්නේ, මන්ත්‍රීවරු හෙට ගමට ගිහිල්ලා ඒ අයට පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් හා සමානව කටයුතු කරන්න හැකියාවක් ලැබුණු නිසයි. ඒ ලබා දීපු ප්‍රතිපාදන යොදා ගෙන ගමේ තිබුණු නොපෙනුනු පැත්ත ගැන පළාත් සභා මන්ත්‍රීවරු ගොඩාක් කටයුතු කරලා තියෙනවා. එය විශේෂයෙන් සඳහන් කරන්න ඕනෑ. ගමේ විදුලි කණුවක් දකින්නේ නැති උදවියට ගමේ පළාත් සභා මන්ත්‍රීවරයා ගමට ගියාම, එහෙම නැත්නම් මළ ගෙදරකට ගියාම ඔවුන්ට කියනවා, අනේ මන්ත්‍රීතුමනි, අපට විදුලිය ලබා දෙන්න කියලා.

ඒ වාගේම ස්වයං රැකියා වැඩ පිළිවෙළ ගත්තාම, අපි ඊයේ පොදු සාකච්ඡාවේදී කථා කරන කොට අධ්‍යාපනය පිළිබඳව බොහෝ දුරට අපි කථා කළා. ඇයි? අද කථා කරන්න පුළුවන් වුණේ? පළාත් සභා ක්‍රමය නිසි ලෙස ක්‍රියාත්මක වන නිසා. අපි ප්‍රතිපත්තියක් හැටියට විවේචනය කර ගත්තාට, යම් යම් ග්‍රාමීය පැත්තෙන් අධ්‍යාපනය ගැන කථා කළත්, පළාත් සභා ක්‍රමය නිසි ලෙස යොදවන නිසා තමයි ඒ තත්ත්වයට එන්න පුළුවන් වෙලා තියෙන්නේ. ඒ නිසා ග්‍රාමීය ජනතාවත් එක්ක සමීප වෙන පාලමක් විධියටයි විශේෂයෙන් පළාත් සභාව ගැන සඳහන් කරන්න ඕනෑ.

ඒ නිසා අවසාන වශයෙන් මතක් කරනවා, පළාත් පාලන ආයතන පිළිබඳව මීට වඩා ගරු සභාපතිතුමා මගින් ගරු ඇමතිතුමාගේ අවධානය යොමු කරනවා. පළාත් පාලන ආයතන නිසි ලෙස තමන්ගේ සේවාව, එහෙම නැත්නම් පළාත් සභාවෙන් ලබා ගන්නා වූ මුදල් හරියට පරිහරණය කරනවාද? ඒ පරිහරණය පිළිබඳව තවමත් අපට බැරි වුණා, යම් එකඟතාවයකට, තීන්දුවකට එන්න. ඉදිරි කාලයේදී ලබන වසර හෝ වේවා, මෙන්න මේ පිළිබඳව අවධානය යොමු කරලා කටයුතු කරන්නය කියන ඉල්ලීම කරමින් මට ලබා දුන් කාලය පිළිදව ඔබතුමාට ස්තුතිවන්ත වෙමින් මම නිහඬ වෙනවා. ස්තුතියි.

[පූ.භා. 09.55]

**ගරු එම්.එම්.එම්. අම්ජාඩ්**
Hon. M.M.M. Amjad

ගරු සභාපතිතුමනි, ස්තුතියි, මට මේ අවස්ථාව ලබා දීම සම්බන්ධයෙන්. බස්නාහිර පළාත් සභාවේ පස්වන පළාත් සභාවේ පස්වන වසරේ 25 වැනි අයවැය සඳහා මට වැය ශීර්ෂයන් අංක 100, 101, 102 යටතේ පළාත් ආණ්ඩුකාරතුමාගේ, බස්නාහිර පළාත් සභාවේ සහ පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ 2014 වර්ෂයේ මුදල් ප්‍රකාශය පිළිබඳව කථා කිරීමට අවස්ථාව ලබා දීම පිළිබඳව

මා සන්තෝෂ වෙනවා. අපි දකිනවා. මේ 2014 වසරේ මුදල් ප්‍රකාශය තුළ ගරු ආණ්ඩුකාරතුමාගේ වැය ශීර්ෂය සඳහා මිලියන 54.67 කුත්, බස්නාහිර පළාත් සභාව සඳහා මිලියන 56.85 කුත් , පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව සඳහා මිලියන 30.28 කුත් සමස්තය මිලියන 141ක් දක්වා වූ මුදලක් වෙන් කරලා තියෙනවා. මේ ඉලක්කම් දිහා බලන කොට අපි දකිනවා, මධ්‍යම ආණ්ඩුවේ සමස්ත අයවැය දිහා බැලුවා නම් 2014 වසරේ මධ්‍යම ආණ්ඩුවේ මුළු වියදම බිලියන 1996 ක් වෙනවා. ඒ 2014 වසරේ මධ්‍යම ආණ්ඩුවේ මුදල් වියදම බිලියන 1996 ක් වෙන කොට, අපේ බස්නාහිර පළාත් සභාවේ වාර්ෂික මුදල් ප්‍රකාශය තුළ අන්තර්ගතය තියෙන්නේ බිලියන 44 ක්. එතකොට අපි මධ්‍යම ආණ්ඩුවේ ඒ අයවැයත් එක්ක බස්නාහිර පළාත් සභාවේ ප්‍රතිශතයන් දිහා බලන කොට අපේ මුදල් ප්‍රකාශයේ ප්‍රතිශතය තියෙන්නේ, 2.01% ක්. ඒ තුළයි අපි බලන්න ඕනෑ.

මේ බස්නාහිර පළාත් සභාව තුළ රාජ්‍ය සේවකයක් දිහා බලන කොට මුළු ලංකාවේම රාජ්‍ය සේවකයන් සමග සංසන්දනය කරන කොට අපට ලැබිලා තියෙන තොරතුරු අනුව 35%ක රාජ්‍ය සේවකයන් බස්නාහිර පළාත් සභාව තුළ සිටිනවා. ඒක අධ්‍යාපනයෙන් වෙන්න පුළුවන්. ඒක සෞඛ්‍ය අමාත්‍යාංශයෙන් වෙන්න පුළුවන්. අනෙකුත් අමාත්‍යාංශවලින් වෙන්න පුළුවන්. සමස්ත රාජ්‍ය සේවකයන්ගෙන් බස්නාහිර පළාත් සභාව තුළ 35% ක රාජ්‍ය සේවකයන් ප්‍රමාණයක් සේවය කරනවයි කියන එක මතක් කරන්න ඕනෑ. එතකොට බස්නාහිර පළාත් සභාවේ රාජ්‍ය සේවා කොමිෂන් සභාවට විශාල කාර්ය භාරයක්, මේ තුළ විශාල වගකීමක් කරට අරගෙන කරන්න වෙලා තියෙනවා. ඒ වාගේම අපේ බස්නාහිර පළාත් සභාව තමයි පළාත් සභා නවයෙන්ම වැදගත් වූ පළාත් සභාව. අපි උදාහරණයක් වශයෙන් ගත්තා නම් රජයට ලැබෙන බදු ආදායම්වලින් 40% ක් ලබා දෙන්නේ බස්නාහිර පළාත් සභාවට. අනෙකුත් පළාත් සභා අටටම ලබා දෙන්නේ 60% යි. ඒ කියන්නේ අපි සමස්තයක් වශයෙන් ගත්තා නම්, පළාත් සභා නවයෙන්ම 40% ක වැදගත්කමක් බස්නාහිර පළාත් සභාවට තියෙනවා. එතකොට බස්නාහිර පළාත් සභාවේ ආණ්ඩුකාරතුමා මම හිතන්නේ, පළාත් සභාවේ ප්‍රධානියා වශයෙන් එතුමාට ලබා දීලා තියෙන වැය ශීර්ෂය තුළ අපි කථා කරන කොට අපේ යුසුෆ් ගරු මන්ත්‍රීතුමා මේ වසරේ විතරක් නොවෙයි, ගිය වසරේ විවාදයේදීත් එතුමා කථා කළා, එතුමාට නිල නිවාසයක් නැහැයි කියලා. එතුමාට තමන්ගේ කාර්යාලය හරියට පවත්වා ගෙන යැමට කාර්යාල පහසුකම් නැහැයි කියන එක. අපි හිතනවා. මේ පිළිබඳව අවධානය යොමු කරලා ලබන වසරේ ඉඳලාවත් හයවන පළාත් සභාව තුළ මේ ආණ්ඩුකාර කාර්යාලයක් ස්ථාපනය කරන්න අවශ්‍ය කරන මුදල්, මූල්‍ය ප්‍රකාශය සකස් කරන කොට 2014 වසරේ නොවෙයි, 2015 වසරේවත් මේ සඳහා අවධානය යොමු කරලා, අපට පුළුවන් වෙනවා නම් ඒ සඳහා මුදල් ප්‍රතිපාදන වෙන් කරලා ඒ කර්තව්‍යය ඉෂ්ට කරලා දෙන්න, ඒක අපට ලොකු හයියක් වෙනවා.

ඒ වාගේම අපි දැක්කා. බස්නාහිර පළාත් සභාව තුළ අපි මේ ආයතන තුනේම වැඩ කරන සේවක සේවිකාවන්ට අවශ්‍ය කරන දේශීය දැනුම මෙන්ම, විදේශීය දැනුම ලබා දීමේදී මේ පළාත් සභාවේ වෙන් කරලා තියෙන මුදල ප්‍රමාණවත් නැහැයි කියන එක මට මේ සංඛ්‍යා ලේඛන තුළින් පෙනී යනවා. උදාහරණයක් වශයෙන් ගත්තා නම් අපි මේ අවස්ථාවේදී අවධානය යොමු කරනවා, අපේ මේ මුදල් ප්‍රකශයේ පිටු අංක 13 හි අනු අංක1703 යටතේ පළාත් සභාවේ රාජ්‍ය සේවකයන්ට විදේශිය දැනුම ලබා ගැනීමට දීලා තියෙන්නේ, රුපියල් ලක්ෂ පහක මුදලක් පමණයි. මම හිතනවා රුපියල් ලක්ෂ පහක මුදලක් කියන්නේ, එක සේවකයෙකුට විතරක් ඒ විදේශ දැනුම ලබා ගැනීමට අවස්ථාව ලබා ගන්න පුළුවන් ප්‍රමාණයක්. මේ නිසා මේ පිළිබඳ අදාළ මුදල් ප්‍රකාශය සකස් කරන නිලධාරීන්ගේ අවධානය යොමු කරලා මම හිතන්නේ, අපේ නිලධාරීන්ට හරියාකාරව, හරි විධියට ඒ විදේශ දැනුම ලබා ගන්න පුළුවන් ආකාරයට කටයුතු සලස්වලා ඒ දේශීය දැනුම හා සමාන විදේශීය දැනුම පාවිච්චි කරලා මේ බස්නාහිර පළාත් සභාව නූතන යුගයට ගැළපෙන විධියට, නූතන යුගයට ගැලපෙන ආකාරයෙන් ජාත්‍යන්තර දැනුම පාවිච්චි කරන්න පුළුවන් විධියට එහෙම ක්‍රමවේදයන් සකස් කරන්න පුළුවන් විධියට ඒ නිලධාරීන්ට අවශ්‍ය දැනුම ලබා දෙන්න, ලබාදෙන්නා වූ ප්‍රතිපාදන වැඩි කිරීම පිළිබඳ අවධානය යොමු කරන්න ඕනෑ කියන එක තමයි අපි තමුන්නාන්සේලාට මේ අවස්ථාවේදී අවධාරණය කර ගන්න ඕනෑ.

ඒ වාගේම අපි අපේ බස්නාහිර පළාත් සභාවේ පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවෙන් කරනු ලබන කාර්ය භාරය පිළිබඳව අපි කථා කරන්න ඕනෑ. අපි විශේෂයෙන්ම සන්තෝෂ වෙනවා. අපේ බස්නාහිර පළාත් සභාවේ ප්‍රධාන

[ ගරු එම්.එම්.එම්. අමීජාඩ් ]

අමාත්‍ය ප්‍රසන්න රණතුංග මැතිතුමා පහුගිය කාල වකවානුව තුළ රාජ්‍ය සේවකයන් 7995 දෙනෙක් ගුරු සේවය සඳහා බඳවා ගත්තා. පළාත් රාජ්‍ය ගුරු සේවය සඳහා ගුරුවරු 7995 ක් බඳවා ගන්න කොට අපට පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය ලබා ගන්න වෙනවා. ඒ වාගේම සෞඛ්‍ය සේවය සඳහා ඒ නිලධාරීන් පත් කරගන්න කොට රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය ලබා ගන්න වෙනවා. මෙන්න මේවා කාර්යක්ෂමව, හරියාකාරයෙන් හරි වෙලාවට, හරි විධියට නිවැරදි විධියට කරන්න ඒ සඳහා සහයෝගය ලබා දුන්නු බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව සඳහා මම හිතන්නේ, මේ පළාත් සභාවේ වැය ශීර්ෂ අංක 102 යටතේ ලබා දුන්න මුදල රුපියල් මිලියන 30.28 ප්‍රමාණවත් වෙන්නේ නැහැයි කියන එකත් මම මේ සභාවේදී මතක් කරන්න ඕනෑ.

මේ නිලධාරීන්ව අපි motivate කරන්න ඕනෑ. මේ අය සඳහා අවශ්‍ය කරන ඒ සම්පත් ලබා දෙන්න ඕනෑ. තොරතුරු තාක්ෂණය වැඩි දියුණු කරන්න ඕනෑ. ඒ තොරතුරු තාක්ෂණය වැඩි දියුණු කරලා රාජ්‍ය සේවා කොමිෂන් සභාවත්, අනෙකුත් අමාත්‍යාංශත් අතර තියෙන අන්තර් සම්බන්ධතාවයන් වැඩි දියුණු කරන්න ඕනෑ. මේවා තොරතුරු තාක්ෂණයත් එක්ක බද්ධ වෙන්න ඕනෑ. එහෙම නැතුව ලියුම් හුවමාරු කර ගෙන එහෙන් මෙහාට ලියුම් යවලා, මෙහෙන් එහෙට ලියුම් යවලා කාලය නාස්ති කරන්නේ නැතුව ඒ අන්තර් තොරතුරු තාක්ෂණ ක්‍රමවේදය වඩාත් කාර්යක්ෂම කරන්න පුළුවන් ආකාරයට, ඒ නවීණ තාක්ෂණය බද්ධ කරන්න පුළුවන් ආකාරයට මේ තොරතුරු බද්ධ කරන්න හැකි ක්‍රමවේදයන් සොයා බලලා, මේ රාජ්‍ය සේවා කොමිෂන් සභාවත්, ඒ වාගේම අපේ අන්තර් අමාත්‍යාංශවල සම්බන්ධයත් වැඩි දියුණු කරන්න පුළුවන් විධියට මුදල් ප්‍රතිපාදන වෙන් කරන්න ඕනෑ. ඒ නිසා මම හිතන්නේ, මේ බස්නාහිර පළාත් සභාව තුළ අපේ ප්‍රධාන අමාත්‍ය ගරු ප්‍රසන්න රණතුංග මැතිතුමාගේ කාර්යක්ෂම පාලන කාලය තුළ අපට අභිමානයෙන් කථා කරන්න පුළුවන් විධියට කටයුතු සිදු කරලා තියෙනවා. අද අපට අභිමානයෙන් කථා කරන්න පුළුවන් අවස්ථාව ලැබිලා තියෙනවා. බස්නාහිර පළාත් සභාවේ අනෙකුත් අමාත්‍යවරු අපේ නිමල් ලාන්සා ගරු අමාත්‍යතුමා, අපේ උදය ගම්මන්පිල ගරු අමාත්‍යතුමා, අපේ ගරු උපාලි කොඩිකාර අමාත්‍යතුමා, මා නියෝජනය කරන කළුතර දිස්ත්‍රික්කයේ ජගත් අංගගේ ගරු අමාත්‍යතුමා. මේ සියලු දෙනාගේම සහයෝගය තුළ මම හිතන්නේ ආණ්ඩුකාරතුමාත් එක්ක ඉතාමත්ම සහජීවනයෙන්, ඉතාමත්ම සහයෝගයෙන් අපි මේ බස්නාහිර පළාත සංවර්ධනය කිරීම සඳහා සුවිශාල මෙහෙවරක් කර ගෙන යනවා. ඒ සඳහා බස්නාහිර පළාතේ ආණ්ඩුකාර අලවි මවුලානා මැතිතුමාගෙන් ලැබෙන සහයෝගය මේ අවස්ථාවේදී ඉතා අගය කරන්න ඕනෑ.

එතුමා දක්ෂ දේශපාලඥයෙක් වශයෙන්, දක්ෂ පරිපාලකයෙක් වශයෙන් නිහතමානී දේශපාලඥයෙක් වශයෙන්, නිහතමානී පුද්ගලයෙක් වශයෙන් අපේ ආණ්ඩුකාර අලවි මවුලානා මැතිතුමාගෙන් පහුගිය අවුරුදු කිහිපය තුළ බස්නාහිර පළාත් සභාවට වූ සුවිශේෂ සේවාව පිළිබඳව ස්තුති කරන්නට මෙය අවස්ථාවක් කර ගන්නවා. අපේ ආණ්ඩුකාරතුමාට ලබන වසරේත්, ලබන පළාත් සභාවේත් ආණ්ඩුකාර ධුරය හරි විධියට නිවැරදි විධියට කරන්න පුළුවන් වන්න සෞඛ්‍ය ශක්තිය ලැබේවා කියලා මම මේ අවස්ථාවේදී ප්‍රාර්ථනා කරනවා. ඒ සඳහා එතුමාට ශක්තිය ධෛර්යය ලැබේවා කියා ප්‍රාර්ථනා කරනවා. ඒ වාගේම මේ සඳහා අවශ්‍ය කරන සහයෝගය ලබා දෙන සියලු නිලධාරීන්ට මේ අවස්ථාවේදී ශක්තිය ලැබේවා කියා ප්‍රාර්ථනා කරනවා. ඒ වාගේම අපේ මේ වැය ශීර්ෂයට අදාළව රාජකාරිවල නියැලෙන අපේ නිලධාරීන්ට මේ අවස්ථාවේ ප්‍රණාමය පුද කරනවා. තමන්ගේ රාජකාරිය හරියාකාරයෙන්, නිසියාකාරයෙන් පළාත් සභාවේ උන්නතිය වෙනුවෙන්, පළාත් සභාවේ යහපත වෙනුවෙන්, බස්නාහිර පළාත් සභාවේ කීර්ති නාමය වෙනුවෙන් අපේ ප්‍රධාන අමාත්‍යතුමා ඇතුළු කැබිනට් මණ්ඩලයටත්, පළාත් සභා මන්ත්‍රීවරුන්ගේත් සාමූහික ගෞරවය ආරක්ෂා කර ගනිමින් කටයුතු කිරීම පිළිබඳව නැවත වතාවක් මම මේ අවස්ථාවේදී ස්තුතිවන්ත වෙමින් මගේ වචන ස්වල්පය මෙයින් අවසන් කරනවා. ස්තුතියි.

[පූ.භා. 10.05]

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

ගරු සභාපතිතුමනි, මා පළමුව ස්තුතිවන්ත වෙනවා, අපේ ගරු ආණ්ඩුකාර අලවි මවුලානා මැතිතුමා පිළිබඳව. ඒ වාගේම ආණ්ඩුකාර කාර්යාලය පිළිබඳව අදහස් දක්වන්න අවස්ථාව ලබා දීම පිළිබඳවත්. ඒ එක්කම පැහැදිලිව මම සතුටු වෙනවා. මෙවන් නායකයෙක් සිටින පළාත් සභාවක

ඉදගෙන එතුමා ගැන, එතුමාගේ කාර්යාලය ගැන කථා කරන්න ලැබීම පිළිබඳව. මොකද, අපි දන්නවා, මම මේ බස්නාහිර පළාත් සභාවේ මන්ත්‍රීවරයෙක් හැටියට කටයුතු කරන්න ඉස්සෙල්ලා බණ්ඩාරගම ප්‍රාදේශීය සභාවේ සභාපති හැටියට කටයුතු කළා. ඒ කටයුතු කරන කාලයේ සිට මේ බස්නාහිර පළාත් සභාවට නවක මන්ත්‍රීවරයෙක් හැටියට තේරී පත් වූ දවසේ සිට මම දැකපු සුවිශේෂී දේ තමයි ආණ්ඩුකාරතුමාගේ ජනතා නියෝජිතයෙකු හා සමානව එතුමා සියලු දේට ඇහුම්කන් දීලා කිසි කෙනෙක් එක්ක ගැටෙන්නේ නැතුව ඒ ප්‍රශ්නයට බොහොම හොඳින් පිළිතුරු දෙනවා. විසඳලා දෙනවා. අපට මතකයි, අපි ප්‍රාදේශීය සභාවේ සභාපති කාලයේ යම් යම් ප්‍රශ්න අර්බුද ඇති වුණාම එතුමාව හමු වුණාම, එතුමා ඉතාමත් නිහතමානීව ඒ ප්‍රශ්නවලට විසඳුම් ලබා දුන්නා, බස්නාහිර පළාත් සභාවත් එක්ක සාකච්ඡා කරලා. මේ ආණ්ඩුකාරවරුන් පත් වෙන කොට මම දැකපු සුවිශේෂී දේ තමයි මෙන්න මේ වාගේ ජනතාවත් එක්ක හිටපු, ජනතාවත් එක්ක ඉන්න, සුහදශීලීව පක්ෂ භේදයක් නැතිව, ජාති භේදයක් නැතුව, ආගම් භේදයක් නැතුව කටයුතු කිරීම. එවැනි අය තමයි මේ තැන්වලට නායකත්වය දෙන්න ඕනෑ. මොකද, ඒ නිසා තමයි අද බස්නාහිර පළාත් සභාවේ ගරු ප්‍රධාන අමාත්‍ය ප්‍රසන්න රණතුංග මැතිතුමා ඇතුළු ඒ අපේ අමාත්‍ය මණ්ඩලයට, අපේ මන්ත්‍රීවරුන්ට මේ විධියේ බොහොම සුහදශීලීව ගරු සභාපතිතුමනි, වැඩ කරන්න පුළුවන් වෙලා තියෙන්නේ.

අද පළාත් සභාවෙන් අපි යම් තීන්දුවක් ගත්තාම, ජනතාවට හිතවාදී තීන්දුවක් ගත්තාම කවදාවත් අපිත් එක්ක ගැටෙන්නේ නැහැ. ඒක මොන ක්‍රමයෙන් හරි ඉෂ්ට කරලා දෙන්න එතුමා කැප වෙනවා. අද අපි අනෙකුත් පළාත් සභා අතර ගත්තාම සමහර පළාත් සභා ආණ්ඩුකාර කාර්යාලයත් අතර ගැටීම් ඇති වෙන තැන් තියෙනවා. මම දැකපු දේ තමයි, මම එදා ඉඳන් අද වෙන කල් තවම දැක්කේ නැහැ, බස්නාහිර පළාත් සභාවේ අපේ ගරු ප්‍රධාන අමාත්‍යතුමාත්, ආණ්ඩුකාරතුමා ඇතුළු ආණ්ඩුකාර කාර්යාලයත් අතර කවදාවත් මේ පළාත් සභා ඉතිහාසයේ ගැටීම් ඇති වෙනවා. මම හිතන විධියට ආණ්ඩුකාර අලවි මවුලානා මැතිතුමාට දැන් අවුරුදු දහයකට වඩා වැඩි කාලයක සිට මේ පිළිබඳව ප්‍රායෝගික අත්දැකීම් තියෙනවා. ඉතින් ඒ නිසා අපි සතුටු වෙනවා, පැහැදිලිවම මෙවන් ආණ්ඩුකාරවරයෙක් යටතේ අපට ඉන්න ලැබීම පිළිබඳව. ඒකත් එක්කම මම දකිනවා, ආණ්ඩුකාර කාර්යාලයට ගියාම - ගිය ගමනත් අපේ ගොඩක් මන්ත්‍රීවරු කථා කළා. ආණ්ඩුකාර කාර්යාලයට ගියාම අපිට තියෙනවා ලොකු ගැටළු. ඒ නිසා පළාත් සභාවක් හැටියට අපි තීන්දුවක් ගන්න ඕනෑ. ආණ්ඩුකාර කාර්යාලය නිසි තැනකට ගෙනැවිත් සම්බන්ධීකරණය කරන්න, එක තැනකින් කරන්න පුළුවන් විධියට වැඩ පිළිවෙළක් හදන්න. අපට ආණ්ඩුකාර කාර්යාලයට ගියාම අඩු තරමේ අපි යන වාහනය නවත්වා ගන්න තැනක් නැහැ. ඒ වාගේ අපහසුකම් තියෙනවා. ඒ අපහසුකම් ටික පළාත් සභාවක් හැටියට අපි ආණ්ඩුකාරතුමාට, ආණ්ඩුකාර කාර්යාලයට විසඳලා දෙන්න ඕනෑ. මම හිතනවා ගරු සභාපතිතුමනි, ලබන වසරේවත් මේ ටික විසඳෙයි කියලා. මේක ආණ්ඩුකාරතුමාට විතරක් නොවෙයි, එතුමාව හම්බ වෙන්න යන මහජනතාවට, මන්ත්‍රීවරුන්ට සියලු දෙනාටම ලොකු ප්‍රයෝජනයක් වෙනවයි කියලා පවසනවා.

මේකත් එක්කම අපි දකින දෙයක් තියෙනවා. ආණ්ඩුකාර කාර්යාලයත් එක්ක අපේ සභා ලේකම් කාර්යාලය බද්ධව කටයුතු කරනවා. අපිට පේන්නේ නැති වුණාට සභා ලේකම් කාර්යාලය තිරෙන් පිටුපස ඉඳගෙන ලොකු සේවාවක් කරනවා. ඒ සේවාව කරන කොට ඒකටත් ලොකු අඩුපාඩු තියෙනවා. ලබන වසරේදී ඒ අඩුපාඩු ටික සපුරලා දෙන්න පුළුවන් වෙයි කියලා විශ්වාස කරනවා. සමහර වෙලාවට අපි දකිනවා, වෙනත් අමාත්‍යාංශවල වෙනත් තැන්වලට මේ පහසුකම් හම්බ වෙන කොට යාන වාහන ටික හම්බ වෙන කොට සමහර වෙලාවට සභා ලේකම් කාර්යාලයට අපේ නිලධාරීන් යන ඒවා දැක්කාම අපට පුදුම හිතෙනවා. ඒ නිසා මම ඉල්ලා සිටින්නේ ගරු සභාපතිතුමනි, ලබන වසරේවත් අනෙක් අමාත්‍යාංශවලට වාගේම සභා ලේකම් කාර්යාලයට මේ පහසුකම් ටික ලබා දෙන්න ඕනෑ. එහෙම වුණොත් මේ සේවය තව තවත් විධිමත් විධියට කර ගන්න හැකියාව ලැබෙනවා. ඒ නිසා මම දකින්නේ, මෙන්න මේ පහසුකම් ටික ලබා දීලා, තව තවත් ආණ්ඩුකාර කාර්යාලයත් එක්ක බද්ධව කටයුතු කරන්න වැඩ පිළිවෙළ අපි හදල දෙන්න ඕනෑ. මේකෙන් ජනතාවට ලොකු සේවාවක් වෙනවා. මේකෙන් අපි පැහැදිලිවම සතුටු වෙන්නේ, මේ කාලය තුළ මේ වාගේ සම්බන්ධීකරණයකින් කටයුතු කිරීම තුළින් තමයි. අපේ ආණ්ඩුකාර අලවි මවුලානා මැතිතුමාට තව බොහෝ කාලයක් සේවය කරන්න ශක්තිය ධෛර්යය ලැබෙන්න කියලා ප්‍රාර්ථනා කරනවා. මොකද, ඒ වාගේම මුළු රටටම කියන්න ඕනෑ, පැහැදිලිවම සියලුම පළාත් සභාවලට අද මුළු රටටම මේ ආණ්ඩුකාරතුමා, අපේ අලවි

[ ගරු ලලිත් එල්ලාවල ]

මවුලානා මැතිතුමා ආදර්ශයක් විධියට ආණ්ඩුකාරකම කරනවා. ඒ නිසා මම පැහැදිලිව කියන්නේ අපේ ආණ්ඩුකාරතුමා අලවි මවුලානා මැතිතුමා අද මුළු රටටම ආදර්ශයක්. ඒ ආදර්ශය මුළු රටම ගත්තොත් මේ පළාත් සභා කිසිවක ගැටුම් ඇති වෙන්නේ නැහැ. ගැටුම් ඇති නොවී කටයුතු කරන්න පුළුවන්කම ලැබෙනවා. ඒ නිසා අපි නැවත නැවතත් ප්‍රාර්ථනා කරන්නේ, අලවි මවුලානා මැතිතුමාට තව දීර්ඝ කාලයක් මේ සේවය කරන්න ශක්තිය, ධෛර්යය ලැබෙන්න කියලයි. එහෙම ප්‍රාර්ථනා කරමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

[පූ.භා. 10.15]

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

ගරු සභාපතිතුමනි, ගරු ආණ්ඩුකාරතුමාගේ වැය ශීර්ෂයට සම්බන්ධ වීමට ලැබීම ගැන මම සතුටු වෙනවා. ඒ වාගේම -

**ගරු සභාපතිතුමා,**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, වැය ශීර්ෂ තුනක් තියෙනවා, මේ විවාදයට. 100, ආණ්ඩුකාරතුමා, 101 බස්නාහිර පළාතේ පළාත් සභාව. 102 පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව.

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

මම ඔබතුමාත් එක්ක එකඟයි. ගරු සභාපතිතුමනි, අපට හොඳ ආණ්ඩුකාරවරයෙක් ඉන්නවා කියලා ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරු සියලු දෙනාම කථා කළා. ඒ පිළිබඳව අපට කිසිදු ප්‍රශ්නයක් තිබුණේ නැහැ. ගරු සභාපතිතුමනි, පහුගිය කාලයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් එතුමාට ලැබී තියෙන බලතල පිළිබඳව පසුගිය වසරේ එතුමා ක්‍රියා කළ ආකාරය පිළිබඳව අපේ යම් යම් ගැටළු තියෙනවා. විශේෂයෙන්ම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 වන සංශෝධනයෙන් පවරපු බලතල තුළ විශේෂයෙන්ම එතුමාට පහුගිය කාලයේදී මම ඇමතිවරු සම්බන්ධයෙන් දූෂණ සම්බන්ධයෙන් එතුමාට තියෙන කාර්ය භාරය සම්බන්ධයෙන් කථා කරලා එතුමාට ලිඛිතව ඒවා පිළිබඳව දැනුම් දුන්නා. නමුත් ඒවා පිළිබඳව එතුමාගෙන් අපට සෑහීමට පත් වෙන්න පුළුවන් පිළිතුරක් ලැබුණේ නැහැ. ඒ වාගේම එතුමා ඉදිරියේ දිවුරුම් දීපු සමහර මන්ත්‍රීවරු ප්‍රසිද්ධියේ ව්‍යවස්ථාව උල්ලංඝනය කරන කොට එතුමා නිහඬව බලාගෙන හිටියා. එතුමා ඒ සම්බන්ධයෙන් ක්‍රියාත්මක වුණේ නැහැ. මේ ඔක්කෝම මැද්දේ ගරු සභාපතිතුමනි, මම දැක්කා, පහුගිය කාලයේ මේ රටේ මිනිස්සු දැවැන්ත ලෙස උහුලාගත නොහැකි ආර්ථික පීඩනයෙන්, බඩු මිල ඉහළ යාම තුළ, උද්ධමනය තුළ අනාථ වෙලා අසරණ වෙලා ඉන්න කොට මේ රටේ වෘත්තීය සමිති නායකයෙක් විධියට නොවෙයි, මම පුදුමයට පත් කරමින් -

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී. ]***
*[Expunged on the order of the chair]*

ආණ්ඩුකාරවරයා විධියට අද එතුමාගේ වැය ශීර්ෂයට මොකක්ද වෙන්නේ ගරු සභාපතිතුමනි. වැය ශීර්ෂයේ අංක 1403 යටතේ එතුමාට අදාළ එතුමාගේ නිල නිවාසය සහ කාර්යාලයට අදාළ විදුලිය හා ජලය සම්බන්ධයෙන් ඇස්තමේන්තුව 50% කින් වැඩි කරලා තියෙනවා. එදා අපි විදුලි බිල 40% කින් නැග්ගාය කියන එක අද ආණ්ඩුකාරතුමාගේ වැය ශීර්ෂයෙන්ම ඒක අද සහතික වෙලා තියෙනවා ගරු සභාපතිතුමනි. අපි පුදුමයට පත් වුණා.

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී. ]***
*[Expunged on the order of the chair]*

අපි පුදුමයට පත් වුණා ගරු සභාපතිතුමනි. ඒ නිසා අපි බලාපොරොත්තු වන්නේ නැහැ, එතුමා වැනි කෘතහස්ත දේශපාලඥයෙක්. අද බස්නාහිර පළාත් සභාවේ අපි විශ්වාස කරන්නේ, මේ පළාත් සභාව හරි මාර්ගයේ ගෙන යන්න බලා ගෙන ඉන්න ජනාධිපතිවරයාගේ නිත්‍ය නියෝජිතයා විධියට එතුමාගෙන් ඒ කාර්යභාරය පහුගිය අවුරුද්දේ වුණාද කියන කාරණයත් අපේ සැකයට අද මතු වෙලා තියෙනවා.

ඒ නිසා ගරු සභාපතිතුමනි, විශේෂයෙන්ම පළාත් සභාව පිළිබඳව එතුමාගේ වැය ශීර්ෂය පිළිබඳව කථා කරන කොට මේ නිලධාරීන් පහුගිය කාලයේ අනන්ත අප්‍රමාණ දුක් වින්දා, අපි දන්නවා. එතුමන්ලාව අපි බලහත්කාරයෙන් අරගෙන ගිහිල්ලා වෙනත් ගොඩනැගිල්ලකට දැම්මා. අර මන්ත්‍රීතුමා කිව්වා වාගේ ආණ්ඩුකාරවරයා විතරක් නොවෙයි. ආණ්ඩුකාරවරයා, පළාත් සභාව. මේ ලංකාවේ තියෙන ලොකුම පළාත් සභාව. ඒ නිසා ආණ්ඩුකාරවරයා-

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, මම ඔබතුමා 64 (1) රීතියට යොමු කරනවා. එම රීතිය යටතේ ඔබතුමාට ආණ්ඩුකාරතුමා ගැන විවේචනයක් කරන්න ඉඩ ලබා දෙන්න මට බැහැ. ඔබතුමා දිගින් දිගටම ආණ්ඩුකාරතුමා ගැන කථා කරනවා. රීති අනුව මට ඔබතුමාට අවස්ථාවක් ලබා දෙන්න බැහැ. ඔබතුමා වැරදියි කථා කළා.

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

ඔබතුමා එළියේද කථා කරන්න කියන් නේ?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

එළියේ නොවෙයි. ගරු මන්ත්‍රීතුමා. අපේ රීති 64 (1) පැහැදිලිව තියෙනවා. ජනාධිපතිවරයා, ආණ්ඩුකාරවරයා, විනිශ්වයකාරවරු, පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ හැසිරීම සම්බන්ධයෙන් සාකච්ඡා කිරීම තහනම් කරන පනතේ 18 වන වගන්තිය දැඩි ලෙස පිළිපැදිය යුතුයි කියලා.

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

එතකොට වැය ශීර්ෂය ගැන මොනවද කථා කරන්නේ?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා ආණ්ඩුකාර කාර්යාලයට මොනවද වෙන්න ඕනෑ, එතුමාට මොකද කරන්න ඕනෑ. සභා ලේකම් කාර්යාලයට මොනවද කරන්න ඕනෑ කියලා. එතුමාට උදව් කරන්න.

**ගරු නිරෝෂණන් පාදුක්ක**
Hon. Niroshan Padukka

ගරු සභාපතිතුමනි, අපි විශ්වාස කරනවා, ගමේ දේශපාලඥයෝ හැටියට කියනවා මාතෘ සායනයයි, ග්‍රාම සේවකගේ කාර්යාලයයි, සමෘද්ධි කාර්යාලයයි එක තැන තියන්න පුළුවන් නම් හොඳයි කියලා. මොකද, මිනිසුන්ට රස්තියාදු නොවී මේ සේවාව තවත් කාර්යක්ෂම කරන්න.

ඒ වාගේම මේ පළාත් සභාවේ කාර්යාලයත්, ආණ්ඩුකාරවරයාත්, කොමිෂන් සභාවත් යන තුනම ලලිත් එල්ලාවල ගරු මන්ත්‍රීතුමා කථා කළා වාගේ එකම ස්ථානයක - මේ පළාත් සභාව විනාශ කරන මුදල් සම්භාරය දිහා දැක්කාම ලක්ෂ 1200 ක ගණුදෙනු අතුරුදහන් කියන විගණන වාර්තාවක් එන පළාත් සභාවක් ඇතුළේ, මේ නාස්ති කරන මුදල් ප්‍රමාණය එකතු කරලා ගරු සභාපතිතුමනි, මේ ආයතන තුන එක තැනකට ගේන්න පුළුවන් නම් මම විශ්වාස කරනවා, මීට වඩා කාර්යක්ෂම සේවාවක් ලබා දෙන්න පුළුවන් වෙයි කියලා.

විශේෂයෙන්ම පළාත් සභාවේ පෙත්සම් කාරක සභාව. සමහර වෙලාවට මිනිස්සු දැන් බස් හයක යන්න ඕනෑ. මේවා පිළිබඳ අවධානය යොමු කරන්න. ඒ වාගේම ඔබතුමා හරහා මම යොමු කරනවා. විශේෂයෙන්ම අද මේ බස්නාහිර පළාත් සභාව කියන්නේ, දියුණුම පළාත් සභාව. විශේෂයෙන්ම ප්‍රධාන අමාත්‍යතුමාගේ කැමරාව තමයි එන්නේ. ප්‍රධාන අමාත්‍යතුමාගේ මාධ්‍ය කණ්ඩායම වෙනමම, අපට නවීණ තාක්ෂණය තව ඇතුල් කරන්න ඕනෑ, මේ තුළට. විශේෂයෙන්ම ඔබතුමාලා වරප්‍රසාද සම්බන්ධයෙන්, එහෙම නැත්නම් මන්ත්‍රීවරුන්ගේ හැසිරීම සම්බන්ධයෙන් මීට වඩා කාර්යක්ෂම ප්‍රතිපාදන රාමුවක් හදා ගන්න පුළුවන් අලුත් තාක්ෂණය මේ ස්ථානය ඇතුළට එකතු කරනවා නම්, වඩාත් හොඳයි. මම නැවත නැවතත් කියනවා, අපේ පළාත් සභාවක් බවට පත් කර ගන්න. ඊයෙත් මගේ කථාවේදී කිව්වේ, මේක අපට නොවන අපේ නොවන පළාත් සභාවක් වෙලා කියලා.

ගරු සභාපතිතුමනි, මන්ත්‍රීවරුන්ගේ අභිමානය නොවෙයි, බස්නාහිර පළාතේ මිනිසුන්ගේ අභිමානය ඇති කරන ස්ථානයක් කරන්න. පළාත් සභාවෙන් වඩාත් කාර්යක්ෂම සේවාවක් බස්නාහිර පළාතේ මිනිසුන්ට කරන ස්ථානයක් වෙන්න ඕනෑ. ඒ වාගේම පෙත්සම් කාරක සභාව පිළිබව ජනතා ප්‍රසාදය දවසින් දවස ගිලිහී යනවා. ඒකට විශේෂම හේතුවක් තමයි බහුතරය දකින විධියට ප්‍රාදේශීය සභාවල සභාපතිවරු සම්බන්ධයෙන් පෙත්සම් කාරක සභාවේ ගන්නා වූ තීන්දු ක්‍රියාමාර්ග පිළිබඳව කිසිදු පිළිතුරකින් බලාපොරොත්තු ඇති වෙන්නේ නැහැ. ජනතාව සෑහීමකට පත් වන්නේ නැහැ. සමහර සේවකයින්ට වෙලා තියෙන අසාධාරණකම් පිළිබඳව කථා කළාම, ඒවා විසඳුනේ නැහැ ගරු සභාපතිතුමනි. (බාධා කිරීමක්)

ගරු සභාපතිතුමනි, කැස්බෑව ප්‍රදේශයේ එක්තරා කාන්තාවකට ශ්‍රේෂ්ඨාධිකරණය විසින් ඇයට අදාළ මුදල් ප්‍රමාණය ගෙවන්න කියලා නියෝගයක් නිකුත් කරලා

[ ගරු නිරෝෂන් පාදුක්ක ]

තියෙද්දී, සමුපකාර කොමිෂන් සභාව නොකරන කොට මට සිද්ධ වුණා, මගේ මිත්‍ර උදය ගම්මන්පිල ගරු ඇමතිතුමාට කියන්න. එතුමා ඒ File එක බලලා මේක ගෙවිය යුතුයි කියලා නිර්දේශ කළා. ශ්‍රේෂ්ඨාධිකරණ නියෝගය අනුව ගණනය කරන්න කියලා. ඊට පස්සේ එතැනින් සාධාරණය ඉටු නොවුණාම ආණ්ඩුකාරවරයාගේ කාර්යාලයට ගියා. ඇයට සාධාරණයක් මේ බස්නාහිර පළාත් සභාවෙන් ඉටුවුණේ නැහැ. අද ඇයට නැවතත් ශ්‍රේෂ්ඨාධිකරණයට ගිහිල්ලා නඩුවක් දාන්න මුදල් නැහැ. ගරු සභාපතිතුමනි, මොකක්ද අපි බලාපොරොත්තු වන දේ? ඒ නිසා මා ඔබතුමා මාර්ගයෙන් ඉල්ලා සිටින්නේ, මේ ක්‍රමය වඩාත් ශක්තිමත් කරන්න ජනතාව අතර පළාත් සභා ක්‍රමය පිළිබඳව විශ්වාසයක් ඇති වෙන්න නම් ආණ්ඩුකාරවරයාගේ සිටම ජනතා විශ්වාසය දිනා ගන්නා වූ ක්‍රියාමාර්ග අවශ්‍ය වෙනවා.

විශේෂයෙන්ම කොමිෂන් සභාව ගැන කථා කරන්න තිබුණත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව පිළිබඳව යම්තාක් දුරට සැහීමකට පත් වෙනවා. නමුත් ගම්වල විභාගවලට වාඩි වෙන ළමයි රාජ්‍ය සේවා කොමිෂන් සභාවෙන් කොහොමද මේ ලකුණු දෙන්නේ කියන එක පිළිබඳව අවබෝධයක් නැහැ. ඒ නිසා මම ඉල්ලා සිටිනවා පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය භාරය පිළිබඳව, විශේෂයෙන්ම සම්මුඛ පරීක්ෂණ පිළිබඳ පළාත් සභාවේ ඇතුළත් වෙන අයට දැනුවත් කිරීමක් කරන්න ඕනෑ. ගොඩාක් අය අහනවා, මගේ ළමයාට ලකුණු 122 යි. මගේ දරුවා තේරුනේ නැහැ. 110 ගත්ත එක්කෙනා ගිහින් තියෙනවා. කොහොමද ඒක වුණේ? ඔවුන් දන්නේ නැහැ විද්‍යාවට මෙහෙමයි, ගණිතයට මෙහෙමයි, වාණිජවලට මෙහෙමයි ලකුණු මට්ටම් වෙනස් කියලා. ඒ නිසා විශේෂයෙන්ම අලුත් පරම්පරාව දැනගැනීමට අවශ්‍ය වෙබ් අඩවිද, එහෙම නැත්නම් නව තාක්ෂණයද ඇතුළත් කරන්න ඕනෑ. මේ සියලු කාරණාත් එක්ක තමයි මේ පළාත් සභාව ඉදිරියට යන්න පුළුවන් වෙන්නේ. එහෙම නැතුව මේ ඇමතිවරු පස් දෙනාට විතරක් කළ හැකි කාර්යභාරයක් වෙන්නේ නැහැ. මේක රගර් කණ්ඩායමක් වාගේ සියලු දෙනාම එකතු වෙලා ආණ්ඩුකාරවරයාගේ ඉඳන් අවසානය දක්වා සියලුදෙනා එකතු වුණු සාමූහික වගකීමක් තුළින් විතරයි බස්නාහිර පළාත් සභාව ඉදිරියට ගෙන යන්න පුළුවන් වෙන්නේ ගරු සභාපතිතුමනි. ඒ නිසා ඔබතුමා හරහා මම දැඩි අවධානය යොමු කරන්නේ, බස්නාහිර පළාත් සභාව - මම අද සතුටු වෙනවා. කෙසේ හෝ මම ආණ්ඩුකාරවරයා විවේචනය කරනවා නොවෙයි, එතුමා මේ රටේ උසස්ම දේශපාලඥයෙක් වෘත්තීය සමිති නායකයෙක් විධියට එදා පෙළපාලි යනවා දැකලා මට කනගාටුවක් ඇති වුණා. ඒ නිසයි මම ඒ ගැන සඳහන් කළේ. නමුත් එය යථාර්ථයක් බවට පත් වෙනවා එතුමාගේ ලක්ෂ 20 ක් තිබුණ විදුලි බිල ලක්ෂ 30 දක්වා 2014 ට වැඩි කරලා තියෙනවා. ඒ තුළින්ම ගම්‍ය වෙනවා 40% ක විදුලිබිල වැඩිවීම නිවැරදියි කියලා. ඒ නිසා ගරු සභාපතිතුමනි, එතුමා වැනි කෘතහස්ත දේශපාලඥයෙකුගෙන් අපි පෙළපාලියකට දායකත්වය බලාපොරොත්තු වෙන්නේ නැහැ. ඒ නිසා මේ සභාවේ මන්ත්‍රීවරයෙක් විධියට එතුමා ඉදිරියේ දිවුරුම් දීපු පළාත් සභා මන්ත්‍රීවරයෙක් විධියට 13 ව්‍යවස්ථා සංශෝධනය දිවි හිමියෙන් ආරක්ෂා කරනවයි කියලා පොරොන්දු වුණු මන්ත්‍රීවරයෙක් විධියට මම එතුමාට ලබන වසරේ බස්නාහිර පළාතේ ලක්ෂ 550 ක් වෙන් කරන මේ වැය ශීර්ෂය තුළ මම විශ්වාස කරනවා ජනතාවගේ පමණක් නොවෙයි, පළාත් සභා මන්ත්‍රීවරුන් වන අපේත් විශ්වාසය දිනාගත හැකි ආණ්ඩුකාරවරයෙක් බවට පත් වේවා කියා ප්‍රාර්ථනා කරමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මෙම අවස්ථාවේදී ඒ.එම්. යූසුෆ් ගරු මන්ත්‍රීතුමා මූලාසනාරූඪ වෙනවා.

***ඊට අනුකූලව ගරු සභාපතිතුමා [සුනිල් විජේරත්න මහතා] මූලාසනයෙන් ඉවත් වූයෙන්, ඒ.එම්. යූසුෆ් ගරු මන්ත්‍රීතුමා මූලාසනාරූඪ විය.***

*Accordingly the Hon. Chairman [Mr. Sunil Wijeratne] left the Chair and Hon. Yoosuf M.P.C took the Chair*

[පූ.භා. 10.27]

**ගරු උදය ගම්මන්පිල** (කෘෂිකර්ම, ගොවිජන සංවර්ධන, සුළු වාරිමාර්ග, කර්මාන්ත සහ පරිසර කටයුතු අමාත්‍යතුමා)

Hon. Udaya Prabhath Gammanpila (Minister of Agriculture, Agrarian Development, Minor Irrigation, Industries and Environmental Affairs.)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මාධ්‍ය වාර්තා කරන ආකාරයට අතිශය බහුතරයක් පළාත් සභා තුළ ඇමතිවරුන් හා ආණ්ඩුකාරතුමා අතර නිරන්තර ගැටුමක් තිබෙනවා. මෙය හුදෙක් මාධ්‍ය වාර්තාවක් නොවෙයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. අපේ පළාත් අමාත්‍යවරුන්ගේ සංගමයේ

රැස්වීම් පවත්වන විට, ඇමතිවරුන්ගේ ප්‍රශ්න ගැන කථා කරන විට ඒ සංගමයේ නිලධාරියෙක් විධියට අපේ ඇමතිවරු මතු කරන ප්‍රමුඛතම ප්‍රශ්නය තමයි අනේ අපේ ආණ්ඩුකාරතුමාත් එක්ක අපට වැඩ කරන්න බැහැ. පුළුවන් නම් ජනාධිපතිතුමාට කථා කරලා ආණ්ඩුකාරතුමා මාරු කරලා දෙන්න. බොහෝ අය මෙහෙම චෝදනා නගන කොට අපි ඉතා ආඩම්බරයෙන් කියනවා, අනේ අපට නම් අපේ ආණ්ඩුකාරතුමාගෙන් කිසිම ඇඟිලි ගැසීමක් නැහැ. කිසිම කරදරයක් නැහැ. එතුමා තාත්තා කෙනෙක් දරුවන් බලා ගන්නවා වාගේ අපට නිසි මග පෙන්වනවා. උපදෙස් අවවාද ලබා දෙනවා.

ඒ විතරක් නොවෙයි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, වසර පහකට ආසන්න මගේ අමාත්‍ය ධුරය කාලය තුළ මෙන්න මේ දේ කරන්න කියලා එතුමා කවදාක්වත් ලියුමක්වත් එවලා නැහැ. එතුමා දුරකථනයෙන් කථා කරලා අහන්නේ, කරුණාකරලා මට මේ පුංචි උදව්ව කළ හැකිද? ඇත්තෙන්ම එතුමා ශ්‍රී ලංකාවේ සිටින සමස්ත ආණ්ඩුකාරවරුන්ට ආණ්ඩුකාර ධුරයේ කටයුතු කරන්නේ, කෙසේද යන ක්‍රියාවලියට ආදර්ශයක්. එතුමා අපි ගැන හොයන්නේ නැතුව ඉන්නවා නොවෙයි. හොයනවා. බලනවා. හැබැයි, ආදරයෙන් දරුවන්ට වගේ උපදෙස් දෙනවා මිසක්, කවදාවත් අනවශ්‍ය ඇඟිලි ගැසීමක් කරලා නැහැ. මා හිතන්නේ, එතුමාට මෙවැනි ආදර්ශවත් ආණ්ඩුකාරවරයෙක් බවට පත් වෙන්න පුළුවන් වුණේ, එතුමාගේ තියෙන පරිණත භාවය නිසාමයි. අත්දැකීම් සම්භාරය නිසාමයි. අද මේ ශ්‍රී ලංකාවේ ජීවත් වන ජ්‍යෙෂ්ඨතම ක්‍රියාකාරී දේශපාලඥයන් දෙදෙනාගෙන් එක් අයෙක් තමයි අපේ ආණ්ඩුකාරතුමා. එවැනි ආණ්ඩුකාරතුමෙකු ලැබීම ගැන අපි සන්තෝෂ වෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ ගැටුම ඇති වෙලා තියෙන්නේ, ආණ්ඩුකාරතුමාලා බහුතරයක් තමන්ගේ රාජකාරිය හරියට තේරුම් අරන් නැති නිසා. අපේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (ඇ) වගන්තිය පැහැදිලිව කියනවා, විධායකයේ ප්‍රධානියා ආණ්ඩුකාරතුමන්ය කියලා. 154 (ඊ) වගන්තියේ කියනවා, ......... ආණ්ඩුකාරවරයා විසින් තම කර්තව්‍ය හෝ ඉන් කිසිවක් තම අභිමතය අනුව ඉටු කළ යුතු බවට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් හෝ යටතේ හෝ නියම කරනු ලැබ ඇති තාක් දුරට හැර, ආණ්ඩුකාරවරයා විසින් එම උපදෙස්වලට අනුකූලව තම කර්තව්‍ය ඉටු කළ යුත්තේය. මෙන්න මේ කාරණය අවබෝධ නොවුණු නිසා තමයි මේ ගැටුම ඇති වෙලා තියෙන්නේ. ඇමතිවරුන් සහ ප්‍රධාන අමාත්‍යවරයා තනි තනියෙන් ඉන්නවා. ඊට පස්සේ ආණ්ඩුකාරතුමා ඉන්නවා. ආණ්ඩුකාරතුමාට උඩින් අමාත්‍ය මණ්ඩලය ඉන්නවා. ඇමතිවරුන් තනි තනිව ඉන්නකොට ආණ්ඩුකාරවරයාට යටත්. ඇමති මණ්ඩලයක් විධියට සාමූහිකව ක්‍රියා කරද්දී ඊට ඉහළින් පිහිටන්නේ. මෙන්න මේ සරළ කාරණය මේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විධිවිධානය අන් පළාත් සභාවල අය තේරුම් නොගැනීමයි මේ ගැටුමට හේතුව. ඒ නිසා අපි කලින් කිව්වා වාගේ ඉතාම වාසනාවන්තයි.

අපේ මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමන් සමාවන්න ඔබතුමා සඳහන් කරමින් කථා කිරීම ගැන. නිල නිවසක් සහ කාර්යාලයක් ගැන කථා කළා. ඇත්තෙන්ම කාර්යාලය ඉදිවෙමින් පවතිනවා. එතුමාට විශිෂ්ට කාර්යාලයක් අනිවාර්යයෙන්ම අපි සකස් කෙරෙමින් පවතිනවා. නිල නිවාස ප්‍රශ්නයේදී එතුමන් තමන්ගේ නිවස කොළඹ ආසන්නයේම තියෙන නිසා එතුමා නිල නිවාස ගැන ප්‍රශ්නයක් මතු කරලා නැහැ. නමුත් ඔබතුමා කියන ආකාරයේ එතුමන් මතු කළත්, නැතත් නිල නිවාසයක් සැපයිය යුතුයි. අලුත් කාර්යාල සංකීර්ණය ආසන්නයේ. එතුමාට නිල නිවසක් ඉදි කිරීමට ඉඩමක් සෙවීමේ කටයුත්ත අපි අනිවාර්යෙන්ම කළ යුතුයි කියන කාරණය මම මේ අවස්ථාවේදී පිළිගන්නවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි ආණ්ඩුකාරතුමන්ට තමන්ගේ තනතුරේ රාජකාරිය තවදුරටත් මේ ලෙසම ඉටු කරගෙන යන්න අවශ්‍ය ශක්තිය, ධෛර්යය නිරෝගීකම දීර්ඝායුෂ ලැබේවා කියා ප්‍රාර්ථනා කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේමයි. අපට එතුමාගේ ලේකම්තුමා ඇතුළු කාර්ය මණ්ඩලය අමතක කරන්න බැහැ. ඉතාම කාර්යක්ෂම කාර්ය මණ්ඩලයක් ලේකම්තුමාගේ නායකත්වය යටතේ තියෙන්නේ. බොහෝ දිනවල අපි දන්නවා. විවිධ තැන් පසු කරමින් ආණ්ඩුකාර කාර්යාලයට ලිපිය යන්නේ අපට වැඩේ කරගන්න තියෙන අන්තිම මොහොතේ. විදේශ ගමනකට අනුමැතිය හෝ වේවා, තනතුරකට පුරප්පාඩුවක් පිරවීම හෝ වේවා, බොහෝ වෙලාවට ලේකම්තුමාට කථා කරලා මම කියනවා. ඕන්න අද ලියුම ආවා. අනේ ලේකම් තුමනි, මට අදම අනුමැතිය ලැබුණොත් හොඳයි කියලා. පැයක් දෙකක් යන්න කලින් අනුමැතිය පැකුම් මාර්ගයෙන් අපට එවන්න තරමට එතුමා කාර්යක්ෂමව කටයුතු කරලා තියෙනවා. අපි ඒ ගැනත් විශේෂයෙන්ම සිහිපත් කළ යුතුයි.

[ ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල - අමාත්‍යතුමා ]

ඒ වාගේම තමයි පළාත් රාජ්‍ය සේවා කොමිෂම ගත්තොත්. අද මධ්‍යම ආණ්ඩුවේ තත්ත්වය මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, රාජ්‍ය ආයතන ගණනාවක පුරප්පාඩු වසර දෙක තුනකින් පුරවලා නැහැ. අධ්‍යාපන පරිපාලන සේවයේ විභාග තියලා දීර්ඝ කාලයක් ගත වෙලා තියෙනවා. තවම පත්වීම් ටික ලබා දීලා නැහැ. නමුත් අපේ පළාත් රාජ්‍ය සේවයේ ගුරුවරුන් වේවා, ලිපිකරුවන් වේවා තරග විභාග පවත්වලා පොරොත්තු ලේඛන හදලා පුරප්පාඩු අමාත්‍යාංශවලින් වාර්තා කරන සැනින් ඒවා පිරවීමේ ක්‍රමවේදයක් තියෙනවා. ඊළඟට අර ලැයිස්තු ඉවර වෙන්න කලින්, ඊළඟ විභාගය තියලා මේ ලැයිස්තුව ඉවර වෙන කොටම අලුත් ලැයිස්තුව සූදානම් කර ගැනීමේ ක්‍රියාවලියත් සිද්ධ වෙනවා. ඒ සම්බන්ධයෙන් අපි අන් පළාත් සභාවන්ට, මධ්‍යම ආණ්ඩුවට ආදර්ශයක් සපයලා තියෙනවා කියන එක අපි සඳහන් කරන්න ඕනෑ. ඒ නිසා පළාත් රාජ්‍ය සේවා කොමිෂමේ සභාපතිතුමන්ටත්, ඒ වාගේම ලේකම්තුමියටත්, එහි සේවය කරන සියලු දෙනාටත් අපේ ගෞරවය පුද කරන්න ඕනෑ.

ඒ වාගේම මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පළාත් සභාවේ මේ වැය ශීර්ෂයේ 2010 අයවැය කථාවේදී මා කාරණා තුනක් සිහිපත් කළා. පළමුවැනි දේ තමයි. හැමෝම කියනවා රාජ්‍ය සේවයේ විනිවිද භාවය රැකගත යුතුයි කියලා. හැබැයි Transparency International සංවිධානයවත් අපි තරම් විනිවිද භාවයක් ප්‍රාර්ථනා කරන්න නැතිව ඇති මන්ත්‍රීතුමනි. අපේ මන්ත්‍රීතුමන්ලා මෙතැන වැසිකිළියට යන කොට පාරේ යන අයට පවා පේනවා ඔන්න මන්ත්‍රීතුමා දැන් ඉන්නේ වැසිකිළියේ කියලා. මම හිතන්නේ, විනිවිද භාවය එතරම් තිබිය යුතුයි කියලා මා විශ්වාස කරන්නේ නැහැ. මම හිතන්නේ, ඒ ප්‍රශ්නයට නම් අලුත් ගොඩනැගිල්ලේ විසඳුම් ලැබෙනවා. අපි ගෘහ නිර්මාණ ශිල්පීන් එක්ක සැලසුම් කරද්දීම එවැනි අකරතැබ්බ නොවන ආකාරයෙන් සැලසුම් කරලා තියෙනවා. හැබැයි එදා මා තවත් යෝජනාවක් කළා. ඒ තමයි, අද යුද්ධය අවසන් වෙලා තිබුණත්, අපේ මන්ත්‍රීතුමන්ලාව හිසේ සිට දෙපතුළ දක්වා අතපත ගාලා තමයි මේ සභාව ඇතුළට එවන්නේ. ඒක අපේ මන්ත්‍රීවරුන්ගේ ගෞරවයට, අභිමානයට කැළලක්. හොඳ වෙලාවට තවම අපේ මන්ත්‍රී කෙනෙකුට කිචි රෝගය නැහැ මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඇඟ පුරාම කිචි තියෙන මන්ත්‍රී කෙනෙක් හිටියා නම්, මේ අතගාන අතගෑවිල්ලට බරපතළ අකරතැබ්බයක් සිද්ධ වෙන්න ඉඩ තියෙනවා. මට මතකයි. චින්තාමනී කියන පරණ සිංහල චිත්‍රපටයක ජෝ අබේවික්‍රම මැතිතුමා රඟපාන චරිතේ. ඔහුට කිතිකැවිච ගමන් කටින් කුණුහරුප පිටවෙනවා. බැරි වෙලාවත් එවැනි රෝගයක් තියෙන මන්ත්‍රී කෙනෙක් මේ පළාත් සභාවේ එහෙම හිටියා නම්, අපි බරපතළ අකරතැබ්බයකට පත් වෙනවා. ඒ නිසා මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ලබන වසරේවත් - අපි මේ පළාත් සභාව අවසන් කිරීමේ අග ඉන්නේ. ලබන පළාත් සභාවේවත් මන්ත්‍රීවරුන්ගේ ගරුත්වය රැකෙන්න පාසල්වල පවා අද භාවිතා කරන Metal Ditectors කියන උපකරණ භාවිතයෙන් මේ පරීක්ෂාව කළ යුතු යැයි මා 2009 අගදී කළ යෝජනාව නැවත වතාවක් මේ සභාවට ඉදිරිපත් කරනවා.

ඒ වාගේමයි මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ මේ සභාවේ මූලාසනයේ සිටින ඔබතුමන් හෝ වේවා, ගරු සභාපතිතුමන් වේවා, නියෝජ්‍ය සභාපතිතුමන් වේවා විශේෂයෙන් මුහුණ පාන ප්‍රශ්නයක් තමයි, ගණ පූරණය පවත්වා ගැනීම. ඒක මූලාසනයේ අයට අභියෝගයක්. මූලාසනයට මේ අභියෝගය ජය ගැනීමට මා කැමතියි තව යෝජනා දෙකක් ඉදිරිපත් කරන්න. පළමුවැනි දේ තමයි මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මන්ත්‍රීවරුන්ගේ පැමිණීම පදනම් කරගත් වරප්‍රසාද ලබා දීමේ වැඩ පිළිවෙළක් මේ සභාව විසින් පවත්වා ගෙන යා යුතු යැයි මා යෝජනා කරනවා. ඒ වාගේමයි. අද පාර්ලිමේන්තුවේ මන්ත්‍රී කෙනෙක් කථා කළාම ඒ මන්ත්‍රීතුමන්ගේ කථාව ජනමාධ්‍ය වලින් යනවා. ඒ නිසා පාර්ලිමේන්තුවට ඇවිල්ලා කථා කිරීම ඒ මන්ත්‍රීවරයාට තමන් ජනතාව ඉදිරියේ පෙනී සිටියාය කියන එක ලොකු ශක්තියක්. හැබැයි අපේ පළාත් සභාවට මේ රටේ පාර්ලිමේන්තුවෙන් අඩකට ආසන්න මන්ත්‍රීවරුන් සිටින මේ දැවැන්ත පළාත් සභාවට මාධ්‍යවලින් හිමි විය යුතුයි. හිමි වෙනවාද කියන ප්‍රශ්නය අපට තියෙනවා. ඒ නිසා මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි පළාත් සභාවක් විධියට මේ සම්බන්ධයෙන් ජනමාධ්‍යයත් සමග සාකච්ඡා කරලා, එහෙම නැත්නම් අපට විශේෂ ජනමාධ්‍ය පිරිසක් ඉන්නවා නම් අපේ වීඩියෝ පට එකතු කරලා දෙපාර්ශවයම කථා සංස්කරණය කරලා වැදගත් කොටස් අරගෙන සෑම මාධ්‍යවලටම D.V.D මගින් ලබා දීමේ වැඩ පිළිවෙළක්වත් හැදුවොත් මේ සභාවට පැමිණෙන්න, සූදානම්ව ඇවිත් කථා කරන්න, සාරගර්භ වැදගත් ප්‍රශ්න කථා කරන්න ඒ වාගේම සභාවේ විනය රැක

ගන්න එය වැදගත් පිටිවහලක් වේවි කියලා මම විශ්වාස කරනවා.

ඒ වාගේම අපි පසුගිය වසර පහ පුරාවට ඉතා ඉවසීමෙන් දෙපාර්ශවයේම ගෞරවය රැක ගනිමින් මේ සභාවලට නායකත්වය දුන්නා. අද මේ අවස්ථාවේ මෙතැන නොසිටියත් අපේ ගරු සභාපතිතුමාටත්, ඒ වාගේම විනය ගැන ඉතාමත් තදින් ක්‍රියා කරපු, මාවත් වරක් එළියට යද්දී ගෙනැල්ලා වාඩි කරවපු අපේ ගරු නියෝජ්‍ය සභාපතිතුමාටත් - මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එතුමා පසුගිය කාලයේ නම් සභාවේ දැක්කේ නැහැ. එතුමාගේ සිතේ මොකක් හරි තුවාලයක් තිබෙනවා නම්, ඒකත් සුවපත් වේවායි කියලා මම මේ අවස්ථාවේදී ප්‍රාර්ථනා කරනවා. ඉතින් ඒ වාගේම මූලාසනයේ කටයුතු කරන ඔබතුමාත්, අශෝකා ලංකාතිලක ගරු මන්ත්‍රීතුමියත්, ඒ වාගේම අපේ සුමිත් විජයමුණි ද සොයිසා ගරු මන්ත්‍රීතුමා ඇතුළු වරින් වර මූලාසනය හෙබවූ සභාපති නාමාවලියේ සියලුම ගරු මන්ත්‍රීතුමන්ලා මෙම සභාව කර ගෙන යාමට ඒ දැක්වූ දායකත්වයටත්, සභාවේ ගෞරවය රැක ගැනීමට කටයුතු කිරීම වෙනුවෙනුත් ඒ සියලු දෙනාට මාගේ ගෞරව ප්‍රණාමය පුද කරමින් මා නිහඬ වෙනවා. සියලු දෙනාටම තෙරුවන් සරණයි.

[පූ.භා. 10.37]

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ශීර්ෂ අංක 100, 101, 102 ශීර්ෂයන් සම්බන්ධයෙන් මෙම සාකච්ඡාවට සම්බන්ධ වීමට අවස්ථාව ලබා දීම ගැන ස්තුතිවන්ත වෙනවා. අපේ ශීර්ෂ අංක 100 ආණ්ඩුකාරවරයා යටතේ කථා කරද්දී අපි දන්නවා. ශ්‍රී ලංකාවේ බස්නාහිර පළාත, බහු ජාතික, බහු ආගමික, විවිධ අදහස උදහස් තියෙන පුද්ගලයන් ජීවත් වන ප්‍රදේශයක් හැටියට අපි ආණ්ඩුකාරවරයා වශයෙන් තෝරා පත් කර ගෙන තියෙන්නේ, මුස්ලිම් ජාතික මවුලානා මැතිතුමාව. මෙයින් ඇත්ත වශයෙන්ම නිරූපනය වන කාරණයක් තමයි, ශ්‍රී ලංකාවේ සිංහල ජාතියට වාගේම, මේ අනෙක් සියලුම ජාතිකයින්ටත් නිසි සැලකිල්ලක්, නිසි ගෞරවයක් දීලා, තනතුරුවල පිහිටුවලා කටයුතු කරන්න, ශ්‍රී ලංකාවේ දේශපාලන සහ පරිපාලන කටයුතුවලදී අවස්ථාව ලැබිලා තියෙනවා කියන එක. අපි දන්නවා. එක්සත් ජාතික පක්ෂය තමයි, පළමුවෙන්ම මේ සියලුම ජාතීන්ට දේශපාලනයට, පරිපාලන කටයුතුවලට සම්බන්ධ වෙන්න පුළුවන්කම ලැබෙන විධියට ඡන්ද ක්‍රමය පවා වෙනස් කරලා ඒ සියලුම සුළු ජාතිකයන්ට තමන්ගේ අවශ්‍යතාවය ඉෂ්ට සිද්ධ කර ගන්න, එවැනි නිලතලවලට පත් වෙන්න අවස්ථාව සලසලා දුන්නේ. මෙම කාරණාවේදී අපි ආණ්ඩුකාරවරයාගේ වැය ශීර්ෂය සම්බන්ධයෙන් වාද විවාද කරන්නේ නැහැ. ඉතා ගරුත්වයෙන් ගරු කටයුතු නිලයක් වශයෙන් සලකන මෙම ආණ්ඩුකාර ධූරය දරන මවුලානා මැතිතුමා බස්නාහිර පළාත් සභාවට ඉතා ගෞරවයක් ඇතිවන ආකාරයෙන් පවත්වා ගෙන ඇවිල්ලා තියෙනවා. ඒ සම්බන්ධයෙන් අපේ ප්‍රශංසාව අපි හිමි කරනවා.

ඒ එක්කම, අපි ආණ්ඩුකාරවරයෙක් පත් කළාම අපි දන්නවා, ඒ වැය ශීර්ෂයන් අපි අනුමත කරලා දෙන්නේ, කුමන ආණ්ඩුවක් බලයේ හිටියත්, ඒ පවතින රජයත් සමග ඉතාමත් සුහදත්වයෙන්, විශේෂයෙන් බස්නාහිර පළාත් සභාව කරන කියන කටයුතුවලදී ඒ එක්කම බස්සනාහිර පළාත් සභාවට ලබා ගන්න ඕනෑ රාජ්‍ය ප්‍රතිපාදන ලබා ගැනීම්වලදී මධ්‍යම රජයත් එක්ක ඉතාම සුහදත්වයෙන් කටයුතු කිරීම අවශ්‍ය වන නිසාය කියලා. ඒකට තියෙන ආණ්ඩුව මොකක්ද කියන එක වැදගත් වන්නේ නැහැ. මෙතැන වැදගත් වන්නේ ඒ ආයතන අතර සුහදත්වය පවත්වා ගැනීම. මෙම කාරණයේදීත් අපේ ආණ්ඩුකාරවරයා ඉතාම සුහදශීලී ක්‍රමවේදයක් සහිතව ඒ කටයුත්ත ඉතා සාර්ථකව ඉෂ්ට කරලා තිබෙනවා.

ඒ එක්කම අපට දැකගන්න ලැබුණා, පසුගිය වකවානුවේ කිසිම අවස්ථාවක අපට මධ්‍යම ආණ්ඩුවත් එක්ක විශේෂ ගැටුම්කාරි තත්ත්වයන් නිර්මාණය වුණේ නැහැ. ඒ එක්කම මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි දන්නවා. මේ බස්නාහිර පළාත මුළු ලංකාවේම භාර දූර කාර්යයක් ඉෂ්ට කරන පළාත් සභාවක් හැටියට අපේ යම් යම් මන්ත්‍රීතුමන්ලාගේ අදහස් ඉදිරිපත් වුණා. ඒ මේ දේශපාලනමය කටයුතුවල යෙදෙද්දී ඇති වුණු යම් යම් තත්ත්වයන්. නමුත් අපි ඉතාම ගරුත්වයෙන් සලකන ධූරයක් හැටියට කුමන දේශපාලන පක්ෂයකින් පත් වුණත් අපි මේ මුළු පළාත් සභාවටම ආණ්ඩුකාරවරයෙක් විධියට ඒ කටයුත්ත ඉතාම ස්වාධීනව ගරුත්වයෙන් යුතුව ඉෂ්ට කිරීම අවශ්‍ය වෙනවා. ඒ එක්කම මෙතුමාගේ වැය ශීර්ෂය සම්බන්ධයෙන් විපක්ෂය හැටියට අපි තර්ක විතර්ක කරන්නේ නැහැ. ඒ සම්බන්ධයෙන් විරෝධතාවයක් විශේෂයෙන් ප්‍රකාශ කරන්නේ නැහැ. නමුත්, මෙම ධූරයේ

[ ගරු රෝස් ප්‍රනාන්දු ]

කටයුතු ඉදිරියටත් ඉතාම ස්වාධීනව බස්නාහිර පළාත් සභාවට ගරුත්වයක් ඇතිවෙන ආකාරයෙන් මේ ආකාරයටම කර ගෙන යන්න ශක්තිය ධෛර්යය ගරු ආණ්ඩුකාරවරයාට ලැබේවායි ප්‍රාර්ථනා කරනවා.

ඒ එක්කම එතුමාගේ මැදිහත්වීමෙන් විශේෂයෙන්ම මේ පළාත් සභාවේ කෙරෙන යෝජනාවන් එතුමාගේ අනුමැතියෙන් තමයි අවසන් වෙන්නේ. මෙවැනි කටයුතුවලදී මේවා ක්‍රියාත්මක වීමේදී මධ්‍යම ආණ්ඩුවට කරන යෝජනාවන් යොමු කිරීමේදී ඉතා ඉක්මන්, ඒ එක්කම ජනතාවට දැනෙන ආකාරයට ඒවා ඉෂ්ට සිද්ධ කරන්නත් එතුමාට ශක්තිය ධෛර්යය ඉදිරියේදී ලැබේවායි කියලා ප්‍රාර්ථනා කරනවා.

බස්නාහිර පළාතේ පළාත් සභාව ගැන කථා කළොත් අපි දන්නවා, අපි 1980 වකවානුවේ ඉඳලා අපේ අණපනත් මේ පළාත් සභාවේ සම්මත කරනවා. විවිධ යෝජනා සම්මත කරනවා. ඇතැමුන් මෙම නීති රෙගුලාසි පනත් යම් කිසි අවශ්‍යතාවයක් වෙලා ලබා ගන්නට ගියොත් - අපේ රාජ්‍ය මුද්‍රණ අංශය තියෙනවා. එහෙත් සමහර අවස්ථාවල ලබා ගන්න යද්දී ඒ අදාළ පිටපත් ලබා ගැනීමට නොහැකි තත්ත්වයක් මා පෞද්ගලිකව දැකලා තියෙනවා. ඒ අනුව මා මේ පළාත් සභාවේ කටයුතු සම්බන්ධයෙන් කථා කරන කොට එවැනි යම්කිසි අණපනතක් සම්මත කරපු දෙයක් ඕනෑම අවස්ථාවක මේ කාර්යාලයකින් ලබා ගැනීමට හැකි වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කිරීම අවශ්‍ය යැයි කියලා මා මතක් කරනවා.

ඒ එක්කම මේ පළාත් සභාවේ නිලධාරී මණ්ඩලය ගැන අපි කථා කළොත්, විශේෂයෙන්ම අපගේ ප්‍රතිපාදන කටයුතු සම්පාදනය කරන තැන දක්වාම ඉතාම කාර්යක්ෂම ආකාරයෙන් කටයුතු කරන නිලධාරී මණ්ඩලයක් සිටිනවා. සමහර විට එක්කෙනෙක්, දෙන්නෙක් අතරේ පොඩි පොඩි අඩුපාඩුකම් ඇති. නමුත්, අපි හැම වෙලාවකම මේ රටේ දැවැන්ත කාර්ය භාරයක් ඉෂ්ට කරන නිලධාරී මණ්ඩලයක් හැටියට ඒ ඔවුන්ගේ කාර්ය භාරයත් ඉතාම අගය කරනවා. ඒ එක්කම කිසිම බලපෑමකට දේශපාලන පෙළඹවීමකට යටත් වෙන්නේ නැතුව තමන්ගේ රාජකාරිය හරියට ඉෂ්ට සිද්ධ කරන්න ඒ අයටත් ශක්තිය ධෛර්යය ප්‍රාර්ථනා කරනවා.

ඒ එක්කම යම් හෙයකින් රාජකාරියක් සාර්ථකව ඉෂ්ට කරන්න යම්කිසි නිලධාරියෙකුට බලපෑමක් තියෙනවා නම්, නොබියම ඒ සම්බන්ධයෙන් ඉදිරිපත් වෙලා කටයුතු කරන අවස්ථාවක අපි මන්ත්‍රීවරුන් හැටියට ඒ නිලධාරීන්ගේ අයිතිවාසිකම්, නිලධාරීන්ගේ වටිනාකම්, රාජකාරියේ ගරුත්වය ආරක්ෂා කරන්න අපි නිරන්තරයෙන්ම ඉදිරිපත් වෙනවා කියලත් මා මේ අවස්ථාවේදී ප්‍රකාශ කරනවා.

ඒ එක්කම මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට දැනගන්න ලැබුණා පළාත් සභාව විසුරුවන්න ආසන්නව තියෙන කොට අපේ ඉතාම දක්ෂ, ඉතාම ගරුත්වයෙන් යුතුව මෙම පළාත් සභාවට සේවාවන් සපයපු නිලධාරීන් දහයක්, දොළහක් අතර ප්‍රමාණයක් හදිසියේ මාරු කිරීමක් කර තිබෙන බව. කෙසේ වෙතත්, මෙම පුහුණු නිලධාරීන්ගේ වටිනාකම මෙම පළාත් සභාවට ඉතා වැදගත් වන්නේ, අපි අභිනවයෙන් පළාත් සභාවක් විසුරුවා හැරලා අලුත් පළාත් සභාවක් පත් කරන කොට තමාට පත්වෙන මන්ත්‍රීවරු පවා මේ සාමාන්‍ය වැඩ කටයුතු, නීති තත්ත්වයන් ගැන අවබෝධයකින් නොවෙයි එන්නේ. ඉතින් පළපුරුදු නිලධාරියෙක් මේ කාර්යාලය තුළ සිටීමෙන් ඒ අයට අවශ්‍ය කරන සහයෝගය, දායකත්වය ලබලා දීලා සාර්ථක සේවාවක් කිරීමට හැකියාව ලැබෙනවා. අපි කුමන හෝ හේතුවක් නිසා පළපුරුදු නිලධාරීන් මාරු කර හැරියොත් ඒ නිලධාරීන්ගෙන් ලබා ගන්න පුළුවන් වටිනා සේවය මේ සභාවට අහිමි වෙන්න ඉඩ තියෙනවා. ඉතින් මෙවැනි කටයුතු කිරීමේදී ඔබතුමා මගින් ඒ අදාළ ආණ්ඩුකාරතුමා දක්වා වන සියලුම දෙනාගේ අවධානය යොමු කර සිටිනවා වැදගත් සේවාවන් ඉෂ්ට කරන්න පුළුවන් යම් සේවකයෙක් අපි ගාව ඉන්නවා නම්, ඒ අයට ඒ නිසි ගරුත්වය දීලා පෞද්ගලික මති මතාන්තර ඒවාට අදාළ කරගන්නේ නැතුව ඒ සියළුම සේවාවන් සාර්ථකව ලබා ගන්න කටයුතු කිරීම ඉතාම වැදගත් කියන කාරණය මා මේ අවස්ථාවේදී මතක් කරනවා.

ඒ එක්කම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව ගැන කථා කළොත්, කිසිම අවස්ථාවක අපි මේ පළාත් රාජ්‍ය සේවා කොමිෂමේ වැය ශීර්ෂයන් සම්බන්ධයෙන් වාද විවාද කරන්නේ නැහැ. අපි බලාපොරොත්තු වෙනවා, පළාත් රාජ්‍ය සේවා කොමිෂම මේ රටට අවශ්‍ය කරන ඉතාම ප්‍රබුද්ධ ඒ එක්කම බුද්ධිමය සේවාවක් සැපයෙන ආයතනයක් හැටියට ඒ කටයුත්ත ඉතාම සියයට සියයක් සාර්ථකව ඉෂ්ට කරනවා කියලා අපේ විශ්වාසයක් තියෙනවා. එය එසේම

කරයි කියා බලාපොරොත්තුවක් තියෙනවා. ඒ එක්කම මේ රාජ්‍ය සේවයේදී අපි දන්නවා, විවිධ පුද්ගලයින්ගේ ක්‍රියාකාරකම් නිසා ඒ සේවයේ යම් යම් අඩුපාඩුකම් සිදු වෙනවා නම් ඒවා හොයලා බලලා හරියාකාර තැනට ශ්‍රී ලංකාව අරගෙන යන්න වගකීම තියෙන්නේ මේ රාජ්‍ය සේවා නිලධාරීන්ට. අපි දැක්කා. අපට ඉදිරිපත් වෙලා තියෙන විගණකාධිපති වාර්තාව අනුවත්, යම් යම් ස්ථානවල අඩුපාඩු තිබෙනවා. මේ සියල්ලම සාර්ථකව ඉෂ්ට කරන්න මේ නිලධාරීන්ට ස්වාධීනව කටයුතු කරන්න අවශ්‍ය කරන වාතාවරණය ඉදිරියටත්, මේ සභාවේ අපි සියලු දෙනාගේ මැදිහත්වීමෙන් ලබා දෙන්න ඕනෑ කියන කාරණාව කියමින් අපට ලැබී තිබෙන කාලයත් අවසන් වෙලා තිබෙනවා. මේ සියලුම නිලධාරි මහත්ම මහත්මීන්ට ඒ තමන්ගේ රාජකාරිය කිසිම හයකින් සැකයකින් තොරව තමන්ගේ උපරිම ශක්ති ප්‍රමාණයෙන් මේ රටට සේවයක් කරන්න දායක කර ගන්න අවශ්‍ය මානසික සහ ශාරීරික වාතාවරණය ඉදිරියටත් ලැබේවා කියා අපගේ ශුභාශිංසනය ප්‍රාර්ථනය කරමින් මා නිහඬ වෙනවා. ස්තුතියි.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

මේ අවස්ථාවේ ගරු සභාපතිතුමා මූලාසනයේ අසුන් ගන්නවා ඇති.

***ඊට අනුකූලව මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා [ඒ.එම්. යූසුෆ් මහතා ] මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු සභාපතිතුමා [සුනිල් විජේරත්න මහතා] මූලාසනාරූඪ විය.***
*Accordingly Hon. Presiding Member [Mr. A.M. Yoosuf M.P.C] left the Chair and Hon. Chairman [Mr. Sunil Wijeratne] took the Chair.*

[පූ.භා. 10.50]

**ගරු කීර්ති උඩවත්ත**
Hon. Keerthi Udawatte

ගරු සභාපතිතුමනි, ආණ්ඩුකාරතුමාගේ වැය ශීර්ෂය යටතේ ඉතාම කෙටියෙන් කරුණු ඉදිරිපත් කිරීමට අපේ සංවිධායකතුමා මට අවස්ථාව ලබා දුන්නා. ඒ ගැන පළමුවෙන්ම මම එතුමාට ස්තුතිවන්ත වෙනවා. මගේ මේ අභිප්‍රාය වන්නේ මේ වැය ශීර්ෂය යටතේ මේ සම්බන්ධ ආදායම් වියදම් ගැන විග්‍රහයක් කිරීමට වඩා මගේ යුතුකමක් ඉෂ්ට කිරීමක් හැටියටයි මා මෙය දකින්නේ.

මේ තනතුර දරන අපේ ආණ්ඩුකාරතුමා අලවි මවුලානා මැතිතුමා පිළිබඳව ඉතිහාසයේ බොහෝ දෙනෙක් නොදන්නා කරුණු කිහිපයක් මේ වෙලාවේ සඳහන් කරන්න කැමතියි. මට මතකයි. මම නීති ශිෂ්‍යයෙක් වශයෙන් එතුමා සමග දේශපාලන කටයුතුවල නියැලෙන අවස්ථාවේදී අපි එක්තරා උත්සවයක් සංවිධාන කරලා තිබුණා. බණ්ඩාරනායක සමාධියේ සිට කොළඹ බණ්ඩාරනායක පිළිරුව දක්වා ගමන් කරන.

මම හිතන්නේ, ගරු සභාපතිතුමනි, ඔබතුමාත් ඒ පෙරහැරේ ගමන් කළ පුද්ගලයෙක් කියා මා විශ්වාස කරනවා. මේ පෙරහැරේ පළමුවැනි දවස නිම වෙන්නට තිබුණේ කඩවත නගරයෙන්. මේ පෙරහැරට සම්බන්ධ වූ සියලුම දෙනා රාත්‍රී අට පමණ වන විට කඩවතට පැමිණ විසිරී ගියා. ඒ විසිරී ගිය අවස්ථාවේදී ඉතිරිව සිටියේ පුද්ගලයන් තිදෙනෙක් පමණයි. එක් අයෙක්, අපේ ආදරණීය ආණඩුකාරතුමා. දෙවැනියා අපේ හිත මිත්‍ර උපාලි කොඩිකාර. ඒ වන විට එතුමා ඇමති කෙනෙක්වත්, පළාත් සභා මන්ත්‍රී කෙනෙක්වත් නොවෙයි. ඊළඟට මම හිටියේ. කඩවත පොලීසියේ ලොකු ජීප් රථයක් ඇවිල්ලා විසි පහක් විතර නිලධාරීන් අපව වට කර ගත්තා. වට කරගෙන අපිව අත්අඩංගුවට අරගෙන කඩවත පොලීසියට එක්ක ගෙන ගියා. මොකක්ද අපි කළ වරද? නීති විරෝධී රංචු ගැසීම සහ අනවසරයෙන් ශබ්ද විකාශන යන්ත්‍ර පාවිච්චි කිරීම. හරියට අපි නුරිවත්තේ අත කොටා අල්ලන්න ඉන්නවා වාගේම හා සන්නද්ධ හමුදාවක් ඇවිල්ලා අඩු තරමින් බ්ලේඩ් තලයක්වත් අතේ නැති ඒ අවිහිංසක මවුලානා මැතිතුමාවත්, මාවත්, උපාලි කොඩිකාර මැතිතුමාවත් පොලීසියට අරගෙන ගියා. අලවි මවුලානා ආණ්ඩුකාරතුමා දැනගෙන හිටියා මම ඒ අවුරුද්දේ නීති විභාගයේ අවසාන විභාගය කරලා දිවුරුම් දීමට නියමිත තැනැත්තෙක් කියලා. අපිව අත්අඩංගුවට ගත්තාට පස්සේ සෙනඟ පිරුණා. එතුමා මට පොඩි ඉඟියක් කරලා කිව්වා, ඉක්මනට මෙතැනින් මාරු වෙලා යන්න කියලා. මොකද, මම එච්චර ප්‍රසිද්ධ පුද්ගලයෙක් නොවෙයි. නිකම්ම නිකම් කොල්ලෙක් ඒ කාලයේ. හැබැයි රාජ කුමාරයෙක් නොවෙයි. ගමේ කොල්ලෙක්. ඒ නිසා මාව පොලිස් නිලධාරීන්ගේ උකුසු ඇසට යොමු වෙලා තිබුණේ නැහැ. එතුමා පොඩි සිග්නල් එකත් දීලා කිව්වා ඉක්මනට මාරු වෙලා යන්න කියලා. ඇත්තටම ඒ වෙලාවේ මම එළියට ආවේ නැත්නම් සමහර විට මේ සම්බන්ධයෙන් අධිකරණයට ඉදිරිපත් කරලා දඬුවමක් විඳින්න සිද්ධ වුණා

[ ගරු කීර්ති උඩවත්ත ]

නම්, සමහර විට මට නීති වෘත්තියේ දිවුරුම් දෙන්න බැරි වෙනවා. හැබැයි එළියට ආවාට මට මෙතුමාව දාලා යන්න පුළුවන්කමක් තිබුණේ නැහැ. මම පොලීසිය මිදුලේ ඇවිද ඇවිද ඉන්න කොට අපේ මහ ඇමතිතුමාගේ තාත්තා රෙජී රණතුංග මැතිතුමා ඇවිල්ලා එතුමාව එළියට ගත්තා. එහෙත් කොඩිකාර මහත්තයව එළියට ගන්න බැරි වුණා. පසුව, එතුමා එළියට ඇවිල්ලා මාත් එක්ක - අපට එතකොට ලොකු යාන වාහන තිබුණේ නැහැ. ඔය පැජරෝ එහෙම දැනුත් අපට නැහැ. එදා තිබුණෙත් නැහැ. එතුමාට පක්ෂයෙන් දීලා තිබුණා ඩයිහට්සු කබල් ජීප් එකක්. කොළපාට. ඒකෙන් මාවත් නග්ගගෙන කෙළින්ම ගියේ හොරගොල්ල වලව්වට. එතකොට රාත්‍රි දහය පහු වෙලා. සිරිමාවෝ බණ්ඩාරනායක මැතිණිය නිදිවර්ජිතව අපි එන කල් බලා ගෙන හිටියා. එතුමිය ඇහුවා අලවි මවුලානා ආණ්ඩුකාරතුමාගෙන්, මොකද මේ සිද්ධිය වුණේ? කියලා. එතකොට කිව්වා මෙහෙම දෙයක් වුණා. අපේ උපාලි කොඩිකාර තවම කූඩුවේ ඉන්නවා. එතුමිය සියලු පොලිස් නිලධාරීන්ට කථා කළත් මේ කිසිම වරදක් නොකළ උපාලිව අපට එළියට දා ගන්න බැරි වුණා. ඊට පහුවදා උසාවියට ඉදිරිපත් කරලයි අපි බේරා ගත්තේ.

මම මේ කිව්වේ, මේ වාගේ ඉතාම මානුෂිකව මිනිසුන්ට ආදරය කරපු දේශපාලඥයෙක් හැටියට, මේ ආණ්ඩුකාරතුමා යටතේ අපට මේ පළාත් සභාවේ ඉන්න සිදුවීම විශාල ගෞරවයක් හැටියටයි මා දකින්නේ. ඒ නිසා මට දවසක් කවුද එක්කෙනෙක් කිව්වා, අලවි මවුලානා සහෝදරයා වයසයි. දැන් එයාව යවන්න ඕනෑ කාලය ඇවිල්ලයි කියලා. මම දන්නේ නැහැ, ඒ මනුස්සය ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ දේශපාලනය ගැන මොනවද දන්නේ කියලා. මොළය වැඩ නොකෙරුවත්, අලවි සහෝදරයාගේ ආණ්ඩුකාරතුමාගේ මැෂින් එකක දාලා හරි එතුමාගේ හුස්ම ටික යන කල් එතුමා මේ ආණ්ඩුකාර ධුරයේ ඉන්න ඕනෑ. එහෙම නොකරුවොත් ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ඉතාම ගුණමකු දේශපාලන පක්ෂයක් වෙනවා. ඒ නිසා අපි අතිගරු ජනාධිපතිතුමා -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට ලබා දී ඇති කාලය විනාඩි පහයි. හරියටම 11 ට ගරු මහ ඇමතිතුමාගේ වැය ශීර්ෂය පටන් ගන්න තිබෙනවා. අමාත්‍යතුමාටත් පුංචි කාලයක් දෙන්න සිදු වෙන නිසා -

**ගරු කීර්ති උඩවත්ත**
Hon. Keerthi Udawatte

ඔබතුමා දන්නවා මම බොහොම කීකරු මන්ත්‍රීවරයෙක් බව.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔව්, මම දන්නවා කීකරුයි කියලා. බොහොම කීකරුයි.

**ගරු කීර්ති උඩවත්ත**
Hon. Keerthi Udawatte

ඒ නිසා මම අවසාන කරන්නම් මගේ කථාව. මම දවසක් අලවි මවුලානා සහෝදරයා ආණ්ඩුකාරතුමා සුමණාරාම පාරේ ගෙදර ඉන්න කොට මම දැනගෙන හිටියේ නැහැ මොකක්ද වෙලා තියෙන්නේ කියලා. මම ගෙදරට ගියා. යනකොට ගෙයි ඔක්කෝම බඩුමුට්ටු ටික එළියට දාලා එතුමාව ගෙදරින් පන්නලා. ගරු සභාපතිතුමනි, අද මේ දේශපාලනය තුළින් කෝටි ගණන් හරි හම්බ කර ගන්න මිනිස්සු ඉන්න යුගයක, මවුලානා ලා බොහොම සරළ අහිංසක ජීවිතයක් ගත කරපු මිනිස්සු. ඒ නිසා එතුමා වෙනුවෙන්, එතුමාට ගෞරවයක් හැටියට මේ වචන ටික මට කියන්න ඉඩ දීම ගැන ඔබතුමාට අනේක වාරයක් ස්තුතිවන්ත වෙමින් මම නිහඬ වෙනවා.

[පූ.භා. 10.58]

**ගරු ජගත් අංගගේ** (සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සමාජ සුභ සාධන හා කාන්තා කටයුතු, පරිවාස හා ළමා රක්ෂක සේවා සහ සභා කටයුතු අමාත්‍යතුමා)
Hon. Jagath Angage (Minister of Health, Indigenous Medicine, Social Welfare and Women's Affairs , Probation and Child Care Services and Council Affairs)

ගරු සභාපතිතුමනි, සභා කටයුතු පිළිබඳ අමාත්‍යවරයාගේ වගකීම පුරා වසර පහක අවසාන පළාත් සභාවේදී ආණ්ඩුකාරතුමාත්, සභාවත්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවත් පිළිබඳව තමන්ගේ වගකීම ඉෂ්ට කිරීමට. මම කනගාටු වෙනවා ඊට ප්‍රමාණවත් කාලයක් ඔබතුමාගේ න්‍යාය පත්‍රයෙන් මට වෙන් වෙලා නොමැති වීම පිළිබඳව. ඒ පිළිබඳ මගේ කනගාටුව -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු අමාත්‍යතුමා, මට සමාවෙන්න. ආණ්ඩු පක්ෂයේ න්‍යාය පත්‍රයේ කාලය වෙන් කිරීම කරන්නේ ආණ්ඩු පක්ෂයේ සංවිධායකතුමා. ඔබතුමාට විනාඩි දහයක් වෙන්

කරලා තිබුණා මේ න්‍යාය පත්‍රයේ. මට ලබා දීපු කථික ලැයිස්තුව තුළ. නමුත් අවසාන මොහොතේදී එතුමා මගෙන් ඉල්ලීමක් කළා විනාඩි පහක් කීර්ති උඩවත්ත ගරු මන්ත්‍රීතුමාට දෙන්නය කියලා. ඒ අනුව මම ඒ විනාඩි පහ වෙන් කළේ කීර්ති උඩවත්ත ගරු මන්ත්‍රීතුමාට. මම කනගාටු වෙනවා, ඒ සම්බන්ධයෙන්. ඔබතුමාට කාලය වෙන් කරලා තිබුණා, මගේ කථික ලැයිස්තුවේ, විනාඩි දහයක්. නමුත් මට 11 ට ගරු ප්‍රධාන අමාත්‍යතුමාගේ වැය ශීර්ෂය පටන් ගන්නත් ඕනෑ.

**ගරු ජගත් අංගගේ -** අමාත්‍යතුමා
Hon. Jagath Angage - Minister

මමත් ඔබතුමා කරපු කාර්ය භාරය ඉෂ්ට කරපු කෙනෙක් නිසා මම ඒක පිළිබඳව දන්නවා. නමුත් මේක සම්ප්‍රදායට පටහැනියි. මේ පළාත් සභාවේ අවුරුදු අටක් සභාපති ධුරයේ කටයුතු කරපු කෙනෙක් හැටියට මට ඒ ගැන ප්‍රකාශ කිරීමේ අයිතිය තියෙනවා.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

ගරු ඇමතිතුමාට එහෙම කරන්න එපා. ජ්‍යෙෂ්ට ඇමතිවරයෙක්.

**ගරු ජගත් අංගගේ**
Hon. Jagath Angage - Minister

ගරු සභාපතිතුමනි, ආණ්ඩුකාරතුමා පිළිබඳව මේ ගරු සභාවේ සියලුම ගරු මන්ත්‍රීවරුන් විසින කරන ලද ඒ යුක්ති සහගත වූ සාධාරණ සියලු විවේචනයන් නිවැරදි බව ප්‍රකාශ කරමින් එතුමාට තව විරාත් කාලයක් මේ පළාතේ ආණ්ඩුකාර ධුරය දරන්න ශක්තිය ධෛර්යය වාසනාව ප්‍රාර්ථනා කරමින් මේ වසර ගණනාව තුළ, මේ සභාව පවත්වා ගෙන යාමට කටයුතු කළ ඔබතුමාටත්, නියෝජ්‍ය සභාපතිතුමාටත්, මූලාසනාරූඪව කටයුතු කළ සියලු මන්ත්‍රීතුමන්ලාටත්, මගේ ගරු ආණ්ඩුකාරතුමාටත්, ආණ්ඩුකාර ලේකම්තුමාටත්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්තුමිය ඇතුළු සියලු සාමාජිකයන්ටත් අනෙකුත් සියලුම මේ සභාවේ අභිවෘද්ධිය, කීර්තිනාමය වෙනුවෙන් කැප වුණු සියලුම දෙනාටත් මගේ ගෞරවණීය ස්තුතිය, ප්‍රණාමය පුද කරමින් මා නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

*ඊට අනුකූලව පූ.භා. **11.00** ට, අංක **100, 101** හා **102** යන ශීර්ෂ පිළිබඳ සාකච්ඡාව අවසාන විය.*

*Accordingly discussion on the Expenditure Head Nos 100, 101 and 102 Was concluded* at *11.00 a.m.*.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාට බෙහෙවින්ම ස්තුතිවන්ත වෙනවා ගරු ජගත් අංගගේ අමාත්‍යතුමාට. ගරු අමාත්‍යතුමනි, මම මේ වැය ශීර්ෂය පිළිබඳව පොඩි පැහැදිලි කිරීමක් කරන්න ඕනෑ. ගරු ජගත් අංගගේ අමාත්‍යතුමනි, පොඩ්ඩක් අවධානය යොමු කරන්න. ඔබතුමා මට පෙර හිටපු අපේ ගරු සභාපතිතුමා. මේ වැය වැය ශීර්ෂය ආරම්භ කිරීමේදී ඔබතුමාට ගෞරවයක් වශයෙන් මම ආරාධනා කරන්න ලැහැස්ති වුණේ මුලින්ම ඔබතුමාගෙන්. ආණ්ඩු පක්ෂයේ වැය ශීර්ෂයේදී ඔබතුමාට මම ආරාධනා කළේ, ඒ නිසයි. ඔබතුමා එවෙලේ මට පණිවිඩයක් එව්වා, අවසාන කථාව කරන්නම් කියලා. ඒ කාලය පිළිබඳ ප්‍රශ්නයක් ඇතිවීම සම්බන්ධයෙන් - ආණ්ඩු පක්ෂ ප්‍රධාන සංවිධායකතුමා තමයි මේ කථික ලැයිස්තුව හදලා මට භාර දෙන්නේ.

ඔබතුමාගේ කාලයෙන් විනාඩි පහක් එතුමා කීර්ති උඩවත්ත ගරු මන්ත්‍රීතුමාට දෙන්න කිව්වා. මම හිතුවා එකඟතාවයකට ඇවිල්ලා සාකච්ඡා කරලා ඔබතුමාගේ කාලය ගන්න ඇති කියලා. මම දන්නවා. ඔබතුමා පළාත් සභා අමාත්‍යතුමා. ඉතින් ඔබතුමාට අනිවාර්යයෙන්ම කාලය දෙන්න ඕනෑ වැය ශීර්ෂය පිළිබඳව කථා කරන්න. මම ඒ නිසයි ගෞරවයක් වශයෙන් ඔබතුමාට මුලින්ම වැය ශීර්ෂය ආරම්භ කරන කොට ඔබතුමාට ආණ්ඩු පක්ෂයෙන් කථා කරන්න කියලා ආරාධනා කළේ. නමුත් ඒකට ඔබතුමා කාරුණිකව ඉල්ලා සිටියා මම අවසානයේ කථා කරන්නම් කියලා. මම කනගාටු වෙනවා, ඔබතුමාට ඒ කාලය ලබා දෙන්න බැරි වීම සම්බන්ධයෙන්. මගේ වරදක් නොවෙයි ගරු අමාත්‍යතුමනි. ඒක කථික ලැයිස්තුව සෑදීමේදී ආණ්ඩු පක්ෂ සංවිධායකතුමා තමයි - ඒකට කනගාටුව ප්‍රකාශ කරනවා ඔබතුමාට.

ශීර්ෂ අංක 100 ආණ්ඩුකාරවරයා, ශීර්ෂ අංක 101 බස්නාහිර පළාතේ පළාත් සභාව. ශීර්ෂ අංක 102 පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වැය ශීර්ෂ පිළිබඳ විවාදය අවසන් වෙනවා. සම්ප්‍රදායක අනුව මේ පිළිබඳව අපි බෙදීමකට යන්නේ නැහැ. ඒ නිසා මේ වැය ශීර්ෂ තුනම සභා සම්මත වූ වැය ශීර්ෂයන් බවට සලකා කටයුතු කරන බවට මම මේ අවස්ථාවේදී දැනුම් දෙනවා.

ශීර්ෂ අංක - 104 - **ඉඩම්, අධ්‍යාපන, පළාත් පාලන, මිනිස් බල හා රැකී රක්ෂා, විදුලිබල හා බශක්ති අමාත්‍යාංශය**

ශීර්ෂ අංක - 109 - **ප්‍රධාන ලේකම් කාර්යාලය**

ශීර්ෂ අංක - 110 - **ඉංජිනේරු කාර්යාංශය**

ශීර්ෂ අංක - 111 - **ආදායම් දෙපාර්තමේන්තුව**

ශීර්ෂ අංක - 112 - **ව්‍යාපාර නාම ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව**

ශීර්ෂ අංක - 113 - **අධ්‍යාපන දෙපාර්තමේන්තුව**

ශීර්ෂ අංක - 114 - **පළාත් පාලන දෙපාර්තමේන්තුව**

ශීර්ෂ අංක - 115 - **ඉඩම් දෙපාර්තමේන්තුව**

Head no - 104 - Ministry of Land, Education, Local Government, Manpower and Employment, Electricity, Power and Energy

Head no - 109 - Chief Secretary's Office

Head no - 110 - Engineering Organization

Head no - 111 - Department of Revenue

Head no - 112 - Department of Registration of Business Names

Head no - 113 - Department of Education

Head no - 114 - Department of Local Government

Head no - 115 - Department of Lands

***[සංකේත කපා හැරීම]***
*[Symbolic write-off]*

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා
Hon. U. George Perera - Chief Opposition Whip

ගරු සභාපතිතුමනි, *"ප්‍රධාන අමාත්‍ය, මුදල්. ක්‍රම සම්පාදන, නීතිය හා සාමය, ඉඩම්, අධ්‍යාපන, පළාත් පාලන හා පළාත් පරිපාලන, මිනිස්බල හා රැකී රක්ෂා, ආර්ථික ප්‍රවර්ධන හා විදුලිබල හා බලශක්ති හා වෙළඳ කටයුතු භාර අමාත්‍ය වැය ශීර්ෂ සම්බන්ධ විවාදය ආරම්භ කරමින් ශීර්ෂ අංක 104, 109,110, 111, 112, 113, 114, 115 යන වැය ශීර්ෂවලින් රුපියල් 10/- ක සංකේත මුදලක් අඩු කළ යුතු යැයි"* යෝජනා කරනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ශීර්ෂ අංක 104, 109,110, 111, 112, 113, 114, 115 යන වැය ශීර්ෂ පිළිබඳ විවාදය ආරම්භ කරමින් මම විපක්ෂයට ආරාධනා කරනවා සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා ගරු මන්ත්‍රීතුමාට. ඔබතුමාට විනාඩි 15 ක කාලයක් ලබා දෙනවා.

[පූ.භා. 11.02]

**ගරු සිරිකමල් ෆිලීසියන් ද සිල්වා**
Hon. Sirikamal Felician De Silva

ගරු සභාපතිතුමනි, පළාත් සභාවේ අවසාන මුදල් ප්‍රකාශයේදී ගරු ප්‍රධාන අමාත්‍යතුමා නියෝජනය කරන මේ වැදගත් අමාත්‍යාංශය පිළිබඳව විවාදය ආරම්භ කිරීමට ඉඩ ප්‍රස්ථාව ලැබීම පිළිබඳව මම සන්තෝෂ වෙනවා. විශේෂයෙන්ම මේ පළාත් සභාවේ තියෙන අමාත්‍යාංශ පහ අතුරින් වැදගත්ම අමාත්‍යාංශය හැටියට අපි කවදත් කථා කරපු ප්‍රධාන අමාත්‍යාංශය මේ මුදල් ප්‍රකාශයේදී සම්පූර්ණ මුදලින් 71% ක් වන ප්‍රමාණයක් මේ සඳහා වෙන් කරලා තියෙනවා. ඒ පිළිබඳව මම සන්තෝෂ වන අතරම, ඇත්ත වශයෙන්ම මට කිසි ගැටළුවක් නැහැ, එවැනි සුවිශාල මුදලක් වෙන් කිරීම පිළිබඳව. මොකද, අත්‍යවශ්‍ය අංශ කිහිපයක් මේ අමාත්‍යාංශයට වැටෙන නිසා. ඇත්ත වශයෙන්ම මම බලාපොරොත්තු වෙන්නේ, මේ මුදල මීටත් වඩා වැඩි වෙන්න ඕනෑය කියලා. අද බස්නාහිර පළාත් සභාවේ තියෙන අනෙක් අමාත්‍යාංශ වලින් සෞඛ්‍ය අමාත්‍යාංශයට 20% කුත්, ඉතිරි අමාත්‍යාංශවලට 2%, 3% වාගේ වෙන් වන කොට ඒවා ප්‍රමාණවත් කියන කථාව නොවෙයි මම මේ කියන්නේ. ඒවාටත් මීට වඩා විශාල මුදලක් වෙන් වන්න ඕනෑ. නමුත් අධ්‍යාපනය වැනි සුවිශේෂී අමාත්‍යාංශයක් මේ ගණයට වැටෙන නිසා මීට වඩා යමක් මේ බස්නාහිර පළාත් සභාව තුළ මේ ප්‍රධාන අමාත්‍යාංශයට කරන්නට නම් ඇත්ත වශයෙන්ම මීට වඩා සුවිශේෂී මුදලක් ලබන වර්ෂයට වෙන් කළ යුතුව තිබුණා. නමුත් අපේ පළාත් සභාව තවමත් ඉල්ලාගෙන කන, අනුන්ගෙන් යැපෙන පළාත් සභාවක් නිසා අපට සිද්ධ වෙලා තියෙනවා, අප විසින් උපයා ගත්ත මුදලත් අපට නොලැබෙන නිසා මේ මුදලට සීමා වෙන්න.

ගරු සභාපතිතුමනි, ගරු ප්‍රධාන ඇමතිතුමාට මම විශේෂයෙන්ම මේ අවසාන අවස්ථාවේදී ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා, විශේෂයෙන්ම අධ්‍යාපනය සම්බන්ධයෙන් ඉතාමත්ම වැදගත් විධිමත් වැඩ පිළිවෙළක් ඔබතුමාගේ කාලපරිච්ඡේදයේදී මේ කාල සීමාවේදී ක්‍රියාත්මක වුණු එක ගැන. ඒක නොරහසක්. ඒ පිළිබඳ ඔබතුමාට ස්තුති කරන්න මම කොයිම වෙලාවකවත් පසුබට

වන්නේ නැහැ. ඒකට හේතුව විශේෂයෙන්ම අපේ පළාත්වල තිබුණු, බස්නාහිර පළාතේ නොදියුණු පාසල්වල තිබුණු ගුරු පුරප්පාඩුව පිරවීම සම්බන්ධයෙන් ඔබතුමාට ස්තුතිය අපි පිරිනමන්න ඕනෑ. හැබැයි, අපි දැක්කා. උපාධිධාරී ගුරුවරුන්ට පත්වීම් ලබා දෙන කොට සෑම සති දෙක තුනකට සැරයක්ම ඔබතුමා අපට ආරාධනා කරනවා, උපාධිධාරී ගුරු පත්වීම් දෙනවා එන්නය කියලා. අපි නැවත පසු විපරමක් කරලා බැලුවාද, මේ ගන්න පත්වීම්වල අද වෙන කොට කී දෙනෙක් මේ සේවයේ ඉන්නවාද කියලා. මේ ගන්න ගුරුවරු. මේ උපාධිධාරී ගුරු වැටුපට ගන්න ගුරුවරු. එහෙම බඳවා ගැනීම් දිගින් දිගටම සිද්ධවීම නිසා මම හිතන්නේ, මේ වෙන කොට මේ පළාත් සභාව තුළ ගුරු පුරප්පාඩුවක් තිබෙන්න විධියක් නැහැ. නමුත් ඒකේ ඇත්ත කථාව මේ ගන්න පත්වීම් මම හිතන්නේ, බොහොම කෙටි කාලයකට සීමා වීම නිසා තමයි අපට දිගින් දිගටම මේ පත්වීම් දෙන්න සිද්ධ වුණේ. කොහොම වුණත්, අද වන කොට යම්තාක් ප්‍රමාණයකට මේ ගුරු පුරප්පාඩු අවම කිරීම පිළිබඳව අපි ස්තුති වන්ත වෙන්න ඕනෑ.

ඒ වාගේම තමයි, විශේෂයෙන්ම මේ සභාවේ අවුරුදු 15 ක් නියෝජනය කළ මන්ත්‍රීවරයෙක් විධියට හැමදාම මේ මුදල් ප්‍රකාශය වෙලාවේ මගේ හඬ මම අවදි කළේ අපේ පළාතේ තියෙන සුළු ආගමික, සුළු ජාතීන් නියෝජනය කරන පාසල් පිළිබඳව. විශේෂයෙන්ම කතෝලික පාසල්, මුස්ලිම් පාසල් සහ ද්‍රවිඩ පාසල්. ඒ අතින් වත්තල මැතිවරණ කොට්ඨාශය බොහොම සුවිශේෂී මැතිවරණ කොට්ඨාශයක් වෙනවා. මොකද, කතෝලික ජනගහනයේ බහුතරය ඉන්නවා. ඊළඟට මුස්ලිම්. ද්‍රවිඩ ජනගහනය ඉන්නවා. බෞද්ධ පාසල් අපේ ප්‍රදේශයේ දෙකක් තුනක් තියෙනවා. ඒවා ඉතාම හොඳ තත්ත්වයකට තියෙනවා. අපි ඉල්ලීම් කළා යම් යම් අවස්ථාවලදී, විශේෂයෙන්ම මාබෝලේ අල් අෂ්රෆ් විද්‍යාලයට පළමුවැනි ශ්‍රේණියක් ඇති කරන්න කියලා. උපදේශක කාරක සභාව හරහා. අද වෙන කොට පළමුවැනි ශ්‍රේණියේ පන්ති දෙකක් පවත්වන්න පුළුවන් තත්ත්වයකට ඒ විදුහල් තියෙනවා. දැන් තියෙන ප්‍රශ්නය තමයි ගොඩනැගිලි ප්‍රශ්නය. මොකද, එක පැත්තකින් කොළඹ කටුනායක පාර. අනෙක් පැත්තෙන් අධිවේගී මාර්ගය. අනෙක් පැත්තෙන් කර්මාන්ත ශාලා වලට යන පාර. ඒ නිසා මේ භූමියේ වෙන ඉඩක් නැහැ. උඩට නගිනවා මිසක්. ගොඩනැගිලි ඉදි කරන්න. මොකද, මම එහෙම කිව්වේ? ඒ ප්‍රදේශය අවට තියෙන අනෙක් පාසල්වලට විශාල තර්ජනයක් වෙලා තියෙනවා. මේක ඇත්ත වශයෙන්ම සමාජීය ප්‍රශ්නයක්. මොකද, මුස්ලිම් දරුවන්ට සිංහල ඉගෙන ගන්න ආසයි කියලා මතයක් ඇති කරලා තියෙනවා. එතකොට මුස්ලිම් දරුවෝ ඒ ප්‍රදේශයේ තියෙන බෞද්ධ කතෝලික විද්‍යාලවලට ඇතුළත් වෙනවා. ඒ ඇතුළත් වෙන කොට ඔවුන්ගේ සංස්කෘතිය අනුව ඔවුන්ගේ ඇඳුම සකස් කර ගෙන එන්න සිද්ධ වෙලා තියෙනවා. අද මේක විශාල ගැටළුවක් වෙලා.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

කුමන්ත්‍රණයක්.

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Felician De Silva

කුමන්ත්‍රණ තියෙන්නේ ඔය පැත්තේ. යටින් ඉඳන් පිහියෙන් අනින අය ඉන්නේ කොහේද කියලා බලාගන්න පුළුවන් මේ බජට් එකෙන්. ඒ නිසා ගරු සභාපතිතුමනි, මේ ප්‍රශ්නයේදී අපි විශාල වශයෙන් අසරණ වෙනවා. විශේෂයෙන්ම කතෝලික පාසල්වලට මේ දරුවෝ සාම්ප්‍රදායික ඇඳුම ඇඳගෙන ආවාම ඒ දරුවන් විශාල අපහසුතාවලට පත් වෙලා තියෙනවා. ඒ වාගේම නැති ප්‍රශ්නයක් මතු වෙලා තියෙනවා. ඒ නිසා මම ඔබතුමාගෙන් නැවත වතාවක් ඉල්ලනවා. විශේෂයෙන්ම මේ වත්තල මාබෝලේ තියෙන අල් අෂ්රෆ් විද්‍යාලය පිළිබඳව වැඩි අවධානය යොමු කරලා, වැඩි ඉඩකඩක් හදලා දෙන්න පුළුවන් විධියට කටයුතු සලසා දෙන්න කියලා. මුස්ලිම් දරුවන්ට, ද්‍රවිඩ දරුවන්ට තමන්ගේ භාෂාවෙන් ඉගෙන ගන්නා අතරතුරම - ඔවුන් කැමතියි,

***[විදුලිය ඇණහිටීම නිසා සභාවේ ඝෝෂා]***
*[Disturbances in Council due to power failure]*

ගරු සභාපතිතුමනි, ඒ නිසා ගරු ප්‍රධාන අමාත්‍යතුමාගේ අවධානය මේ පාසල පිළිබඳව යොමු කරන්න කියන අතරතුරම, අපි ඇමතිතුමාට ස්තුතිවන්ත වෙන්න ඕනෑ. අපට විශාල ප්‍රශ්නයක් තිබුණා, වත්තල තිබුණු ද්‍රවිඩ කතෝලික විද්‍යාලය පිළිබඳව. ඒකේ බොහොම සීමිත ඉඩකඩක් තිබුණේ. ඒ ඉඩකඩෙන් පල්ලිය අයිතිවාසිකම් කිව්වා, යම්කිසි බිම් ප්‍රමාණයකට. අද ඒක නිරවුල් කරලා දීලා තියෙනවා. හැබැයි, එහෙම නිරවුල් කර දීම අතරතුරම මේ ද්‍රවිඩ දරුවන්ට වඩා පහසුකම් තියෙන විද්‍යාලයක් හදන්න ඕනෑ. මොකද, මේ වත්තල අවට ඉන්න ද්‍රවිඩ

[ ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා ]

දරුවෝ විතරක් නොවෙයි මේ පාසලට එන්නේ. විශේෂයෙන්ම තොටළඟ පැත්තාම ඒක තියෙන්නේ කොළඹ දිස්ත්‍රික්කයේ. මට්ටක්කුලිය, මෝදර මේ ආදී ප්‍රදේශවලින්, එහෙම නැත්නම් කැලණිය ප්‍රදේශවලින්, මේ වත්තල තියෙන ද්‍රවිඩ පාසලට දරුවෝ එනවා. ඒක ද්‍රවිඩ කතෝලිකද, ද්‍රවිඩ බෞද්ධද කියලා නැහැ. එහෙම නැත්නම් ද්‍රවිඩ හින්දු ද කියලා නැහැ. ඒ නිසා පල්ලිය ළඟ තියෙන ඉස්කෝලෙ ද්‍රවිඩ කතෝලික විද්‍යාලයක්. ඒකට ද්‍රවිඩ කතෝලික දරුවන්ට ඇතුළත් වීමේ මූලික පරම අයිතිවාසිකම තියෙනවා. නමුත් අනෙක් ද්‍රවිඩ දරුවන්ටත් යන්න ඉස්කෝලයක් තියෙන්න ඕනෑ. මේක නිසා තමයි අපි බොහොම කාලෙකට ඉස්සෙල්ලා මේ සභාවේ ඔලියමුල්ලේ යම්කිසි රජයේ ස්ථානයක මුල්ගලක් තියලා පටන් ගත්තා. හැබැයි ඒක එතැනම නැතිව ගියා. ඒ වාගේම තමයි, අද සීඝ්‍රයෙන් දියුණුවන වත්තල මැතිවරණ කොට්ඨාශයේ ජාඇල මායිම තියෙන කුමුදුගම කියන ගම්මානය. පවුල් දෙදහසක් පමණ ඉන්නවා. මම ගියසැරෙත් මේක කිව්වා. මේ ගැන යෝජනාවක් ගෙනාවා මේ සභාවට.

මම හිතන්නේ අපේ ජානක සූරියබණ්ඩාර මන්ත්‍රීතුමා, නිමල් ලාන්සා ඇමතිතුමා මේ පිළිබඳව හොඳටම දන්නවා. මේ දරුවන්ටත් අද විශාල ප්‍රශ්නයක් තියෙනවා. පවුල් දෙදහසක දරුවෝ. අපි වෙල ගොඩ කරලා, ඉඩම් කෑලි කරලා බෙදලා දුන්නා තමයි. හැබැයි, එතැනින් එහාට ඒ තියෙන සමාජීය ප්‍රශ්නය පිළිබඳව කල්පනා කළේ නැහැ. අද මේ දරුවන් ඉන් සමහර අයව අල්ලපු වත්තේ තියනවා, කඳාන ශාන්ත සෙබස්තියන් පිරිමි විද්‍යාලය. බාලිකා විද්‍යාලය. ඒ දරුවෝ බෞද්ධ, එහෙම නැත්නම් පිටින් ආපු අය. ඡන්ද ලැයිස්තුවල නම නැහැ හරියට. අවුරුදු පහ නැහැ. ඒ ඕනෑකරන මූලික සුදුසුකම් නැහැ කියලා ඒ දරුවන්ව කොන් කළා. ඒ දරුවෝ යන්න ඕනෑ, කිලෝ මීටර් හතරක්, පහක්, හයක් ඈත විද්‍යාල හොයා ගෙන. ඒක නිසා ඕනෑතරම් ඉඩ තියෙනවා. මම ගිය වතාවේ යෝජනා කළා, කරුණාකරලා පළමුවැනි පන්තිය හරි පටන් ගන්න. මේ පල්ලියට එහා පැත්තේ තියෙනවා ඉඩම. බොහොම පැහැදිලිවම තියෙනවා. ඒ නිසා කරන්න කියලා. ඒත් ඒ පිළිබඳව මම හිතන්නේ අවධානය යොමු කළේ නැහැ. මේවා ප්‍රශ්න. ඉදිරියට එන ප්‍රශ්න. මිනිස්සුන්ව ගිහිල්ලා ජනාවාස ඇති කරන කොට ඔවුන්ට අනෙක් පහසුකම් දෙන්න ඕනෑ. යටිතල පහසුකම් දෙන්න ඕනෑ. ජලය, පාරවල්, විදුලිය දෙනවා වාගේම අධ්‍යාපනය ලබන්න සුදුසු පරිසරයක් නිර්මාණය කරලා දෙන්න ඕනෑ. ඒ නිසා මම හිතන්නේ, ඒ පිළිබඳව අවධානය යොමු කරන්න කියලා ඔබතුමාගෙන් මම ඉල්ලීමක් කරනවා.

ඒ වාගේම තමයි ගුරුවරුන්ව අවුරුදු පහක්, හයක්, දහයක් යන කොට ඒ විද්‍යාලයේ ගුරු මාරු කිරීමේ ප්‍රතිපත්තිය අනුව මාරු කළා. මට අද උදේ එද්දි අපේ මහර ප්‍රාදේශීය සභාවක මන්ත්‍රීවරයෙක් කථා කරලා කිව්වා, මන්ත්‍රීතුමා අද ඔබතුමා කථා කරනවාද අධ්‍යාපන අමාත්‍යාංශයේ වැය ශීර්ෂයට කියලා. මම කිව්වා ඔව් කියලා. එහෙමනම් කරුණාකරලා කථා කරන්න කිව්වා, වැබඩ උතුර විද්‍යාදීප මහා විද්‍යාලය පිළිබඳව. ඒකේ ඉන්න විදුහල්පතිවරයා ඒකෙම ගුරුවරයෙක් විධියට ඇවිල්ලා, වැඩ බලන විදුහල්පතිවරයෙක් වෙලා අදට අවුරුදු 34 ක්ද කොහේද එම විද්‍යාලයේම ඉන්නවාලු. මොකක්ද කියලා ඇහුවා මෙහි තියෙන සුවිශේෂී තත්ත්වය? මම ඇහුවා කවුරුත් මේ ගැන කථා කළේ නැද්ද කියලා. ඒක තමයි. ඒ නිසා විශාල අක්‍රමිකතාවන් ප්‍රමාණයක් ඒ විද්‍යාලයේ සිද්ධ වෙනවා. නමින්ම කියන්න කියලා නමත් දුන්නා. දැන් නම නම් කියන්න විධියක් නැහැ.

***[විදුලිය ඇණහිටීම නිසා සභාවේ ඝෝෂා]***
*[Disturbances in Council due to power failure]*

ලයිට් යන හින්දා. නම ජේන්නෙත් නැහැ මේකේ.

**ගරු ප්‍රසන්න රණතුංග** (ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රම සම්පාදන, නීතිය හා සාමය, ඉඩම්, අධ්‍යාපන, පළාත් පාලන හා පළාත් පරිපාලන, මිනිස්බල හා රැකී රක්ෂා, ආර්ථික ප්‍රවර්ධන සහ විදුලිබල හා බලශක්ති හා වෙළඳ විෂයය භාර අමාත්‍යතුමා)
Hon. Prasanna Ranathunga (Chief Minister and the Minister of Finance and Planning, Law and Order, Land, Education, Local Government, Provincial Administration, Manpower and Employment, Economic Promotion, Power and Energy and Trade Affairs)

මොකක්ද ඉස්කෝලේ?

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Felician De Silva

වැබඩ උතුර විද්‍යාදීප මහා විද්‍යාලය. ඒක මහර කොට්ඨාශයේ කැලණිය කලාපයට වැටෙන්නේ. ඒ නිසා ඒ පිළිබඳව - (බාධා කිරීමක්) රාජපක්ෂ කෙනෙක්. (බාධා කිරීම්) ඒක තමයි කෙළිය. ඒ නිසා මේක අවුරුදු පහද, දහයද, පහළොවද, විස්සද, තිහද - (බාධා කිරීමක්) ඉතින් මහ එක්කෙනාට ඉන්න පුළුවන් නම් කාලය දික් කර

ගෙන තව තව පොඩි උන් ගැන මොනවා කථා කරන්නද? ඒ නිසා ඔබතුමාගේ අවධානය මේ පිළිබඳව යොමු කරන්න කියලා ඉල්ලීමක් කරනවා. මම මීට වැඩිය අධ්‍යාපනය ගැන කථා කරන්නේ නැහැ. මොකද මේ පළාත් සභාවේ

**ගරු ප්‍රදීප් පෙරේරා**
Hon. Pradeep Perera

මන්ත්‍රීතුමා කව්ද?

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Felician De Silva

මහරද? වම් ලියනවඩු මන්ත්‍රීතුමා. එතුමන්ලා අපට කියනවා මිසක් වෙන කවුරුවත් කියන්න එන්නේ නැහැ නේ? තමුන්නාන්සේලාගේ අයත් කියනවා. ඒ කියන්නේ සභාපතිවරුන්ගේ තියෙන ගුණ දොස්. ඒ නිසා මම විශේෂයෙන්ම මේ අධ්‍යාපන අමාත්‍යාංශයේ බොහෝ කටයුතු අපිට සෑහීමකට පත් වෙන්න පුළුවන් විධියට සිද්ධ වුණා. ඒකට ප්‍රධාන හේතුව විධියට මම දකින්නේ, උපදේශක කාරක සභාව හැම මාසයකම නියමාකාරයෙන් පවත්වා ගෙන යාම නිසා බෙහෝ ගැටළු අඩු කරගන්න පුළුවන්කම ලැබුණා. ඒ පිළිබඳව අපේ ස්තූතියත් තියෙනවා. අපි විවේචනය කරන්න ඕනෑ තැන කිසිම බයක් සැකක් නැතුව නිර්දෙය ලෙස විවේචනය කරනවා. ඒ වාගේම ප්‍රශංසා කරන්න ඕනෑ තැන්වල ප්‍රශංසා කරනවා. ඒ නිසා කවුරුවත් අපේ පකෂයේ මන්ත්‍රීවරුන්ට කියන්නේ. නැත්නම් අන්තිමට කියාවි මහ ඇමතිතුමාට මුට්ටිය ඇල්ලුවා කියලා. අල්ලන්න දෙයක් නැහැ. මොකද, අල්ලලා ගන්න දෙයක් නැහැ. දැන් ලබන අවුරුද්දේ වෙන කොට ඡන්දයක් එනවා. එතුමා මහ ඇමතිකමේ ඉඳීද නැද්ද කියලා කවුද දන්නේ? ඒ නිසා ඒ ගැන ප්‍රශ්නයක් නැහැ. ඒ නිසා අල්ලනවා නම් කාටද අල්ලන්න ඕනෑ. එහෙම නැත්නම් අපි දන්නේ නැහැ. මගෙත් හඳහනේ තියෙනවා මහ ඇමති වෙනවා කියලා. ඒ නිසා මට ඒ ගැන ප්‍රශ්නයක් නැහැ.

ඊළඟට එතුමාගේ විෂය පථයට ගැනෙන, බරපතළම විෂයයක් හැටියට වැටෙන, මේ බස්නාහිර පළාත් සභාව දිහා බලන කොට අනෙක් පළාත් පාලන ආයතනයත් එක්ක බැලුවාම ඒ තරම් දහ ජරා ඕජස් ගලන, කුණු වුණු පළාත් පාලන පද්ධතියක් තමයි මේ බස්නාහිර පළාත් සභාවේ තියෙන්නේ. ඒකේ ප්‍රතිඵලයක් හැටියට තමයි මේ වෙන කොට 2014 මුදල් ප්‍රකාශයේ අයවැය ලේඛනය සම්මත කරන කොට ආණ්ඩු පක්ෂයේම මන්ත්‍රීවරු විරුද්ධව ඡන්දය දීලා ඒ ඉන්න සභාපතිවරයාව ගෙදර යවන තත්ත්වයට පත් වෙලා තියෙන්නේ. කැලණිය, පෑලියගොඩ නගර සභාව, මීරිගම ප්‍රාදේශීය සභාව, දැන් ඊයේ කැස්බෑව නගර සභාව, අද දවල් වෙනකොට වත්තල ප්‍රාදේශීය සභාවත් ඒ තත්ත්වයට පත් වෙනවාය කියන එක මම බොහොම වගකීමෙන් කියනවා. (බාධා කිරීම්) කුමන්ත්‍රණය කරන්න දෙයක් නැහැ. කුමන්ත්‍රණය කරනවා නම් කරන්න ඕනෑ අපේ මන්ත්‍රීවරුත් එක්ක නේ? අපි මොනවටද අනෙක් මන්ත්‍රීවරුත් එක්ක කරන්නේ? මේ තියෙන දහ ජරා වැඩ. නීතිවිරෝධී වැඩ. මේ සභාවේ තීන්දුවක් දුන්නාම, උපදේශක කාරක සභාවේ තීන්දුවක් දුන්නාම, පෙත්සම් කාරක සභාවේ තීන්දුවක් දුන්නාම ඒවා ගැන තුට්ටුවකට මායිම් කරන්නේ නැත්නම් මම අහන්නේ මොනවටද ඒ සභාපතිවරු තියාගෙන ඉන්නේ? කියලා ඔබතුමා කල්පනා කරන්න ඕනෑ.

විශේෂයෙන්ම දැලතුරේ ක්‍රීඩාංගණයේ අනවසර ඉදිකිරීම් කරලා උපදේශක කාරක සභාවෙන් තීන්දුවක් දුන්නා, පෙත්සම් කාරක සභාවෙන් තීන්දුවක් දුන්නා, මේක ගලවලා අයින් කරන්න කියලා. සභාපතිතුමා මොකද කළේ? ගලවලා අයින් කළේ නැහැ. වතුර ගන්න, විදුලිය ගන්න අනුමැතිය දීලා අපූරුවට පවත්වා ගෙන යනවා. තමුන්නාන්සේ නියෝජනය කළ පෙත්සම් කාරක සභාවේ මම ඇවිල්ලා කිව්වා. මොකක්ද මගෙයි තමුන්නාන්සේගෙයි තියෙන ආත්ම ගෞරවය? සත පහකටවත් ගණන් ගත්තේ නැහැ. එවැනි අත්තනෝමතික විධියට ක්‍රියා කරන සභාපතිවරු ඉන්නේ. ඒ නිසා තමයි අද මේ සිද්ධ වෙලා තියෙන්නේ. මේක දේශපාලන ප්‍රශ්නයක් නොවෙයි. මේවා පෞද්ගලික ප්‍රශ්න වෙන්න පුළුවන්. නමුත් නුසුදුසු පුද්ගලයින්ව ඒ තැන්වලට පත් කළාම, අද මේ පළාත් පාලනය හම්බකර ගෙන කන ස්ථානයක් බවට පත් වෙලා තියෙනවා.

අද මෙතැන ඉන්නවා යසපාල කෝරළගේ අපිත් එක්ක මේ සභාවල හිටියා. අශෝකා ලංකාතිලක මැතිණිය මෙතැන නොසිටියත්, ඉසුර දේවප්‍රිය. අදත් කිසි හිරිකිතයක් නැතුව අපට පාරේ බැහැලා යන්න පුළුවන්. කිසි කෙනෙක් අපට ඇඟිල්ල දික් කරලා කියන්නේ නැහැ. ඕකා හොරා. ඕකා දහ ජරාකාරයා. ඒකා අහවල් වැඩ කළා කියලා. හැබැයි, මේ ඉන්න පළාත් පාලන ආයතනවල සභාපතිවරුන්ට අද රෙද්දක් ඇඳගෙන බයක් සැකක් නැතිව

[ ගරු සිරිකමල් පිලීෂියන් ද සිල්වා ]

පාරේ බැහැලා යන්න බැහැ. දැන් අර ආණ්ඩු බලය තියෙන නිසා ආරක්ෂාවත් තියා ගෙන ඉන්නවා. මේවා නැතිවුණු දවසට ඔය මිනිස්සුන්ට ඉන්න හිටින්න තැන් නැතුව යනවා. ඒ තරම් දහ ජරා විධියට වැඩ කරන්නේ. කථා කරන්න ගියොත් Building Application එකක් දුන්නොත් ඉස්සෙල්ලා බලන්නේ සල්ලි ගන්න පුළුවන් කොයි තැනින්ද කියලා. මස් කඩ ටෙන්ඩර් කරන්න බැහැ කියලා බොහොම පැහැදිලිව ප්‍රතිපත්තිමය තීරණයක් අරගෙන නීතිය දුන්නා. නමුත් අද වෙන කොට ඒවා ශතපහක් ගණන් ගන්නේ නැහැ. පළාත් පාලන ආයතන තමන්ට හිතු හිතු විධියට. නීතිය බල්ලට ගිහිල්ලා. කිසි කෙනෙක් කථා කරන්නේ නැහැ.

මම හිතන්නේ එතැන්දී මේ පළාත් සභාව විධියට අපි ඉතාමත්ම දුර්වලයි. මහ ඇමතිතුමාගේ ක්‍රියා කලාපය - අර අධ්‍යාපනයට දක්වපු ආදරය පළාත් පාලනයට දැක් වූවා නම් - අද මේ තරම් දුරට දවස ගානේම ජනමාධ්‍යවලින් අපට අහන්න දකින්න ලැබෙන්නේ එක්කෝ සභාපතිවරයෙක් අච්චර ගත්තා. එක්කෝ දූෂණය කළා. එක්කෝ කාටහරි ගැහැව්වා. කුණු ටික විකුණාගෙන කෑවා. අවුරුදු ගණනක් තිස්සේ, මේ පළාත් සභාවට මම ඇවිල්ලා අවුරුදු පහළොවක්. ඊට ඉස්සෙල්ලා ඉඳලාම මේ පළාත් පාලන ආයතනවල තියෙන ඝන අපද්‍රව්‍ය පිළිබඳ ප්‍රශ්නය තිබුණා. අද වන කොට අවුරුදු 25 ක් ගිහිල්ලත් මොකක්ද අපි ලබා ගෙන තියෙන ජයග්‍රහණය? අද කඳාන නගරයෙන් උස්වැටකෙයියාව පැත්තට යන්න. ඌරොද, බල්ලොද, කුකුල්ලුද, පූසොද, හරක්ද. මහ පාරේ කුණු දාලා. දාන්න තැනක් නැහැ කියනවා. හැබැයි, ඒ දාන කොට පස් දාන්න කියලා පස්වලටත් සල්ලි වෙන් කර ගන්නවා. ඩෝසරයටත් සල්ලි වෙන් කර ගන්නවා. ඩෝසරයකුත් නවත්වලා තියෙනවා. දැන් යන්න. දැන් ගිහිල්ලා බලන්න. පහුගිය කාලයේ ජානක සූරියබණ්ඩා ගරු මන්ත්‍රීතුමා හිටියා, මටත් පස්සේ. අමාරුකම් තිබුණා. නමුත් ඒවා වලින් හරි හම්බ කර ගන්න ගියේ නැහැ. අද වෙන කොට කුණු ටිකෙන් හම්බ කර ගන්න - ඉඩම දාන තැනට සල්ලි ගිහිල්ලා ඉල්ලනවා. පස් ටික දැම්මොත් ඒකෙන් සල්ලි ඉල්ලනවා. ඩෝසරය දැම්මොත් ඒකෙන් සල්ලි ඉල්ලනවා.

පහුගිය කාලයේ වත්තල ප්‍රාදේශීය සභාවේ ට්‍රැක්ටර්වල කුණු පුරවලා තිබුණා. තැන් තැන්වල හන්දි හන්දි ගානේ කුණු පුරවලා තියෙනවා. තවම මේකට ස්ථිර විසඳුමක් හොයා ගන්න බැරි වෙලා තියෙනවා. අවුරුදු විසිපහක් තිස්සේ, අපි මේවා පළාත් සභාවේ කථා කරලා තියෙනවා. හැම රටකටම ගිහිල්ලා තියෙනවා. හැම මහ ඇමතිවරයෙක්ම. පින්ලන්තයටත් ගියා. කුණු දාන්නේ කොහොමද කියලා හොයන්න කියලා. කුණු කොහොමද නැවත ප්‍රතිචක්‍රීයකරණය කරලා මේක සම්පතක් බවට පරිවර්ථනය කරන්නේ කියලා. ඒකෙන් සියයට කීයද ප්‍රතිඵලය හම්බ වෙලා තියෙන්නේ? එක පාර ප්‍රාදේශීය සභාවක්, නගර සභාවක් දෙකක් විතර ඒ මන්ත්‍රීවරුන්ගේ තියෙන වැදගත්කමට, ඒකට තියෙන ආදරය නිසා ඒක කරනවා. අනෙක් අයට මේක ඕනෑ නැහැ. ඒවා අපි මේ සභාවේ කථා කළා. හැබැයි, මට කනගාටුව මොකුත් නොවෙයි. මේ පළාත් පාලන ආයතන පිළිබඳව මේ පළාත් සභාවෙන් නිසි නියාමනයක් සිදු වුණේ නැහැ. රෙජිනෝල්ඩ් කුරේ හිටපු ගරු ප්‍රධාන ඇමතිතුමාගේ කාලයේ එතුමා කඩා පනින හමුදාවක් දැම්මා. ඒකට ටිකක් බයේ හිටියා. අද කඩා පනින හමුදාවකුත් නැහැ. ගිහිල්ලා කථා කළාම හිතේ හැටියට කරනවා. තමුන්නාන්සේ දෙන තීන්දුවක් ක්‍රියාත්මක කරන්නේ නැත්නම් මොකක්ද එතැනින් එහාට තියෙන්නේ? කාගේද බලය? ඇයි මේ හිතුවක්කාර විධියට ක්‍රියා කරන්නේ? මේ පළාත් පාල ආයතන නිසා තමයි අද වර්තමාන රජයට යම්කිසි ගරුත්වයක් තිබුණි නම් ජනාධිපතිතුමාගේ යුද්ධය අවසන් කිරීමේ ක්‍රියාදාමය තුළ ඒක නැත්තටම නැති කළේ, මේ පළාත් පාලන ආයතනවල සභාපතිවරු සහ ඒආණ්ඩු පක්ෂයේ ඉන්න මන්ත්‍රීවරු කියලා මම මගේ කථාව අවසන් කරනවා. බොහොම ස්තුතියි.

[පූ.භා. 11.20]

**ගරු රෙහෙන්සිරි වරාගොඩ**
Hon. Rehensiri Waragoda

ගරු සභාපතිතුමනි, බස්නාහිර පළාත් සභාවේ පස්වන පළාත් සභාවේ අවසාන අයවැය විවාදයට සම්බන්ධ වීමට ලැබීම ගැන මම බෙහෙවින් ස්තුතිවන්ත වෙනවා. ගම්පහ දිස්ත්‍රික්කයෙන් බිහි වුණු අපගේ ගරු මහ ඇමතිතුමා නියෝජනය කරන, මමත් නියෝජනය කරන දිස්ත්‍රික්කය වශයෙන් එය තවත් අගය කොට සලකනවා. 2014 මුළු ඇස්තමේන්තුගත වියදම රුපියල් මිලියන 43747 යි. ඉන් පුනරාවර්ථන වියදම් රුපියල් මිලියන 87.08 යි. ප්‍රාග්ධන වියදම රුපියල් 12.91 යි. එනම් මේ ඇස්තමේන්තුගත මුදල සොයා ගැනීම සඳහා යෝජනා කරලා තියෙන අපේක්ෂිත ආදායම ජාතිය ගොඩ නැගීමේ බදු හා මුද්දර ගාස්තු ඇතුළුව

රැස් කිරීමට රුපියල් මිලියන 30952 කුත්, රුපියල් මිලියන 12755 ක් රජයේ ප්‍රදාන වශයෙන් බලාපොරොත්තු වෙනවා. මෙහිදී පැවති පළාත් සභාවලින් රජයේ ප්‍රදාන ලැබෙන ප්‍රමාණය ඉක්මවා යන්නට හැකි වෙලා තියෙනවා. මෙහි සඳහන් වෙනවා ගරු මහ ඇමතිතුමාගේ අයවැය කථාවේදී ඉදිරිපත් කළේ, 10% ක ප්‍රමාණය 2014 වර්ෂයේ ද එම තත්ත්වය පවත්වා ගෙන යාමට හැකි යැයි බලාපොරොත්තු වෙනවා කියලා. ගරු සභාපතිතුමනි, රටේ වැදගත්ම, පාර්ලිමේන්තුවට දෙවන සභාව වශයෙන් රටේ ආර්ථිකයට දායක වීමට සුවිශේෂී කාර්ය භාරයක් බස්නාහිර පළාත් සභාවෙන් සිදු කළ බව අපි සියලු දෙනාම එකහෙළාම පිළිගන්නට ඕනෑ.

විශේෂයෙන්ම අධ්‍යාපනය නගා සිටුවීම. රටක ආර්ථික සංවර්ධන වේගය මනින මිණුම් දඬුවල ප්‍රධාන දෙයක් අධ්‍යාපනය. ඒ වාගේම සෞඛ්‍ය සේවය. හොඳ මාර්ග පද්ධතිය. රැකියා විරහිත භාවය. විරැකියා අනුපාතය අඩුවීම. ඒක පුද්ගල ආදායම වැඩි වීමට දායක වීම. ඒ වාගේම සාක්ෂරතාවය ඉහළ අගයක් ගැනීම. මේ සියල්ල පසුගිය කාලය තුළ බස්නාහිර පළාත් සභාවෙන් අපූරුවට සිදු වුණා. විශේෂයෙන්ම පසුගිය කාලය තුළ බස්නාහිර පළාත් සභාවේ 2009 සිට 2013 දක්වා ගරු මහ ඇමතිතුමා රුපියල් මිලියන 74700 ක් 2009 සිට අධ්‍යාපනය වෙනුවෙන් වැය කරලා තියෙනවා. අධ්‍යාපනය වෙනුවෙන් වැය කරන මුදල දිගුකාලීන ආයෝජනයක්. බස්නාහිර පළාත් සභාවේ වැඩිම ජනගහන සංයුතියක් තියෙන ප්‍රදේශය. අධ්‍යාපනය වෙනුවෙන් වෙන් කිරීම රටේ සංවර්ධනයේ හෙට දවස වෙනුවෙන් සැලසුම් කරද්දී, පෙර දැක්මක් සහිත නායකයෙක් හැටියට එතුමා ඒ කටයුත්ත කිරීම පිළිබඳව මා බෙහෙවින්ම ස්තුතිවන්ත වෙනවා.

මා නියෝජනය කරන කැලණිය මැතිවරණ කොට්ඨාශය පහේ ශිෂ්‍යත්ව, ඒ වාගේම සාමාන්‍ය පෙළ, උසස් පෙළවල යම්කිසි වර්ධනයක් ලබා ගැනීමට හැකි වුණා. එයට දායක වෙන්න හැකි වුණා. විශේෂයෙන්ම මෙහිදී සිහිපත් කරන්නට ඕනෑ, වැහෙන්න ගිය පාසල් කැලණිය කොට්ඨාශය තුළ නැහැ ගරු සභාපතිතුමනි. දැනට අවුරුදු පහකට හයකට ඉස්සෙල්ලා එහෙම පාසල් කිහිපයක් තිබුණා. මා සිහිපත් කරන්න ඕනෑ, ඔබතුමාගෙන් ලැබුණු උදව් උපකාර. ඒ වාගේම රෙජිනෝල්ඩ් කුරේ හිටපු මහ ඇමතිතුමා. දැනට කැලණියේ තියෙන ජනප්‍රියම පාසලක් හැටියට වර්තමාන නමින් හඳුන්වන ජනාධිපති විදුහල 1999 පන්ති කාමර හතරක් ගස් යට හිටියා. වරහන්තුඩුව, මහර ආසනයේ පාසලකට අරගෙන යන්න ගියා. ඒ අවස්ථාවේ රෙජිනොල්ඩ් කුරේ මහ ඇමතිතුමාට මම ඇවිල්ලා, මොකද. ඇමතිතුමා මේකට කරන්නේ කියලා කිව්වාම මගේ ප්‍රතිපාදන වලින් ලක්ෂ දොළහමාරක් ගියා. එතුමාගේත් මුදල් අර ගෙන පන්ති කාමර හතරක් හදලා මාස තුන හතරක් ඇතුළත අර දරුවෝ ගොඩනැගිල්ලට දාලා අර වැහෙන්න ගිය පාසල නගා සිටුවන්න හැකි වුණා. ඒ සියලු දේ සිදු කළේ මේ පළාත් සභාවෙන් ලැබුණු ප්‍රතිපාදන හා අනුග්‍රහය යටතේ. ඒ වාගේම මේ මෑතක දිප්පිටිගොඩ රෝමාණු කතෝලික විද්‍යාලය. දැනට අවුරුදු හතරකට ඉස්සෙල්ලා ශිෂ්‍යයෝ පහයි ගුරුවරු පහයි හිටියේ. වහලම දාන්න කියන තත්ත්වයට වැටිලා තිබුණා. හොඳ විදුහල්පති කෙනෙක් පත් කළා අතුල කියලා. අද වන විට පන්ති කාමර දෙකයි. ඒ පාසලේ ළමයි 18 දෙනෙක් සියයට වැඩිය ගත්තා. ඒ වාගේම හෙලේනා විද්‍යාලය. කැලණි මහා විද්‍යාලය. ගම්පහ දිස්ත්‍රික්කයේ පළමුවැනි ස්ථානයයි දෙවැනියයි කැලණි විද්‍යාලයෙන් බිහි වුණා. ඒ අධ්‍යාපන සංවර්ධනය වෙනුවෙන් පළාත් සභාවේ අපි දායක වෙලා කරපු දේවල්. අපි සතුටු වෙනවා. අපි හැරිලා බැලුවාම දෙමව්පියෝ හැටියට පළාත් සභාවට හොඳ කියන සාධකයක් මේ ප්‍රතිඵල ඉහළ යාමට හැකිවීම. ඒ වාගේම දරුවන්ගේ අනෙකුත් පහසුකම් තුළින් උපන් හැකියාවන් තියෙන ක්‍රීඩාව, සෞන්දර්ය අතින් ඉහළ මට්ටමකට ගෙන එන්න හැකි වෙලා තියෙනවා. ඒ නිසා මම ඒ ගැන සඳහන් කළේ, මේ සියල්ල සිදු කළේ බස්නාහිර පළාත් සභාවෙන් දක්වන්නා වූ අනුග්‍රහය නිසයි. අපට දෙන්නා වූ ශක්තිය නිසයි. ඒ වාගේම අඩක් නිම කළ ගොඩනැගිලි කැලණිය කොට්ඨාශය තුළ නැතිම තරම්. අපට විටින් විට ගරු මහ ඇමතිතුමා ඒ දේ ලබා දුන්නා. ඒ වාගේම ගුරු භවතුන්ගේ තුලනය සිදු වෙලා තියෙනවා.

ගුරුවරු, ගුරු පුරප්පාඩු නැත්තටම නැති වෙන තත්ත්වයට තියෙනවා. එහිදී ගුරුවරුන් බඳවා ගැනීම පිළිබඳව පසුගිය කාලය තුළ ඉතාමත්ම සාර්ථක ලෙස, මා හිතනවා මුළු රටේ සමස්තයක් ලෙස ජාතික වශයෙන් ගත්තාම පළාත් සභා කිහිපයෙන්ම මධ්‍යම ආණ්ඩුවටත් ආදර්ශයක් වන විධියට උපාධිධාරී ගුරුවරුන් බඳවා ගෙන ඒ ගුරු පුරප්පාඩු පුරවන්නට හැකි වුණා.

මධ්‍යස්ථාන 89 ක ප්‍රාථමික අංශයේ නුපුහුණු ගුරුවරුන් පුහුණු කරනවා. ප්‍රාථමික අංශයේ ගුරුවරුන් උගන්වන්න

උගන්වනවා කියන්නේ, පුහුණුව ලබා දෙනවා කියන්නේ, ප්‍රාථමික අංශය නගා සිටුවනවා කියන්නේ, හෙට දවසේ මේ රටේ අධ්‍යාපනය වෙනුවෙන් ප්‍රාථමික අංශය නගා සිටුවනවා කියන්නේ ඉතාමත්ම දූරදක්නා නුවණින් කරන වැඩක්. ඒ වැඩ පිළිවෙළ මේ කාලය තුළ ගරු මහ ඇමතිතුමා ඉටු කරලා තිබෙනවා. ඒ සඳහා රුපියල් මිලියන 145 ක් වෙන් කරලා තියෙනවා. ඒ වාගේම විදුහල්පතිවරුන් 360 දෙනෙකුට විශේෂ පුහුණුවක් ලබා දීලා තියෙනවා. විෂය සාධන මට්ටම දුර්වල සිසුන්ගේ වෘත්තීය මාර්ගෝපදේශන වැඩ සටහන් සඳහා.

ගරු සභාපතිතුමනි, මධ්‍යම රජයේ හෝ අපේ හෝ වේවා සාමාන්‍ය පෙළ සමත් වෙන සියලු සිසුන්ට උසස් පෙළ සමත් වෙලා උසස් පෙළින් විශ්ව විද්‍යාලයට යන්න බැහැ. සමහර අය සාමාන්‍ය පෙළින් හැලෙනවා. අට සමත් අය හැලෙනවා. නමුත් සෑම දරුවෙක්ම යම් කිසි හැකියාවක් අරගෙන උපදිනවා. තවමත් මේ රටේ අධ්‍යාපන පද්ධතිය තුළ මේ රටේ ජාතික අධ්‍යාපනය තුළ මේවා තේරුම් ගත්ත හර පද්ධති හැදිලා නැහැ. සුද්දා අපට දීලා ගිය අධ්‍යාපන ක්‍රමය ජාතික අධ්‍යාපන ප්‍රතිපත්තියක් තුළ සකස් වෙලා නැහැ. අපේ රටේ සාරධර්මවලට, අපේ සංස්කෘතික උරුමයන්වලට, අපේ ජාතික සංවර්ධනයට දායක වෙන පොත පතට සීමා වෙන අධ්‍යාපනය තවමත් වෙනස් වෙලා නැහැ. මේ වන විට ඒ සඳහා කෙටුම්පත් අතිගරු ජනාධිපතිතුමා සකස් කර ගෙන යන බව මමත් සාමාන්‍යයෙන් දන්නවා. ඒක නිසා එය ඉතා හොඳ දෙයක්.

මෙහිදී මෙතැන ගරු ඇමතිතුමාගේ තොරතුරුවල තියෙනවා වෘත්තීය මාර්ගෝපදේශ වැඩ සටහන් පිළිබඳව. මම ඒ යටතේ තමයි කථා කරන්නේ. විශේෂයෙන් සාමාන්‍ය පෙළදී හැලෙන, උසස් පෙළදී හැලෙන දරුවන් වෙනුවෙන් වෘත්තීය අධ්‍යාපන වැඩ පිළිවෙළක්, ඒ සඳහා ප්‍රඥප්තියක් හදලා අධිකාරියක් හදලා ඔබතුමා ඊළඟ පළාත් සභාවේදී කරන්න කියන ඉල්ලීම මම ඉතාමත්ව ගෞරවයෙන් ඉල්ලා සිටිනවා. එතකොට උගතුන් බිහි කරන්න පුළුවන් නව ප්‍රවේශයක් බස්නාහිර පළාත් සභාවේ ආරම්භ කරන්න කියන ඉල්ලීම මම කරනවා.

එසේම කාලවේලාව ඉතුරු කර ගැනීම සඳහා අධ්‍යාපනය වෙනුවෙන් මීට වඩා කථා කරන්නේ නැහැ. පළාත් පාලන ආයතන වෙනුවෙන් යම් දෙයක් කථා කරන්න ගරු සභාපතිතුමනි, ඉඩ දෙන්න. ගරු සභාපතිතුමනි, මාගේ යෝජනාවක් අනුව ගරු මහ ඇමතිතුමාගේ පූර්ණ දායකත්වය සහ මග පෙන්වීම යටතේ නීති පද්ධති හදලා ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරුන්ට දුරකථන දීමනාව දෙන්න හැකි වුණා. එතුමාට ස්තුතිවන්ත වෙනවා, මේ පළාත් සභාවෙන් කරපු හොඳ දෙයක් හැටියට. පළාත් පාලන ආයතනයෙන් ආපු කෙනෙක් හැටියට. ඒ වාගේම ගරු සභාපතිතුමනි එම දීමනාව දෙගුණ කරන්න ඕනෑ. දැන් සිරිකමල් ගරු මන්ත්‍රීතුමා - මේ පළාත් පාලන ආයතනවල පිරිහීමට ව්‍යසනයක් වෙලා තියෙන්නේ අද එක හේතුවක් ඒක. ඒ වාගේම දීමනාව දෙගුණ කරනවා වාගේම - පළාත් පාලන ආයතනවල මුළු රටේ සමස්තයේ සිදුවන මහා ව්‍යසනය බස්නාහිර පළාත් සභාවේ අඩුයි. අද පත්තරේත් තියෙනවා ගරු සභාපතිතුමනි. එක්තරා හිටපු සභාපතිවරයෙක් අවුරුදු පහළොව බැගින් බරපතළ සිර දඬුවමක්. මේකේ වැදගත්කම මරිසිපාලගේ කාටූන් එකේ තියෙනවා. මේවා පළාත් පාලන ආයතන හැල්ලුවට උපහාසය ලක්වන ප්‍රශ්න නිසා මේ අයවැය විවාදයේදී මේවා මතක් කරන්න ඕනෑ. "ප්‍රාදේශිය සභාවට ගියාට සභාපති අල්ලන්න බැහැ නේ, ඉතින් හිර ගෙදරට ගිහිල්ලා බැලුවේ නැද්ද" කියලා. අද ප්‍රාදේශීය සභාවල රැස්වීම් සභාවේ තියන්නේ නැහැ. හිර ගෙදර තියන්න පුළුවන් මට්ටමට ඇවිල්ලා. අපි පක්ෂ භේදයෙන් තොරව මේවාට දැඩි අවධානය යොමු කරන්න ඕනෑ. අර ගරු මන්ත්‍රීතුමාගේ කථාව මම අගය කරලා සලකනවා. එතුමාත් ප්‍රාදේශිය සභාවේ හිටපු සභාපති කෙනෙක් නිසා. ඒ නිසා ගරු මහ ඇමතිතුමනි, ඔබතුමාගේ මේ කැපවීම, ඔබතුමාගේ වෙහෙසීම ඵලදායී වෙන්නට පළාත් පාලන ආයතනවල සමහර උදවිය කරන වැඩ බස්නාහිර පළාත් සභාවටත් සෘජු වගකීමක් තිබෙන බව සඳහන් කරමින් මගේ කථාව මෙයින් අවසන් කරනවා.

[පූ.භා. 11.31]

**ගරු ඩී.ඒ. චන්ද්‍රභානු**
Hon. D.A. Chandrabhanu

ගරු සභාපතිතුමනි, ප්‍රධාන අමාත්‍යතුමාගේ වැය ශීර්ෂය යටතේ වචන කිහිපයක් කථා කිරීමට අවස්ථාව ලැබීම පිළිබඳව ස්තුතිවන්ත වෙමින් පළමුවෙන්ම මා සිහිපත් කරන්න වෙනවා, මට මතකයි. ඊයේ පොදු කටයුතු වෙලාවේදී විපක්ෂය නියෝජනය කරන අපේම දිස්ත්‍රික්කයේ ගරු මන්ත්‍රීවරයෙක් වන ජනතා විමුක්ති පෙරමුණේ නලින්ද ජයතිස්ස ගරු මන්ත්‍රීතුමා සඳහන් කළා, අයවැය ලේඛනයේ සමස්ත වියදමෙන් 71% මහ ඇමතිතුමා

අරගෙන තියෙන්නේ කියලා. මම බොහොම සන්තෝෂයෙන් ප්‍රකාශ කරනවා, අයවැය ලේඛනයේ 71% න් සමස්තය ගරු ප්‍රධාන අමාත්‍යතුමාගේ විෂයයන් වලට යටත් වෙනකොට, එයින් 39.32% ක් මිලියන 43707 න් මිලියන 17186 කුත් නව ලක්ෂ තිස්දාහක් වෙන් වෙලා තියෙන්නේ අධ්‍යාපන දෙපාර්තමේන්තුවට. අපි දන්නවා. රටක ප්‍රධානතම ආයෝජනය තමයි, වඩාත් වැදගත්ම ආයෝජනය තමයි අධ්‍යාපනය වෙනුවෙන් කරන ආයෝජනය. ඒ වාගේම රටක වටිනාම සම්පත තමයි දරුවෝ. දරුවන්ට දිය යුතු හොඳම දේ මොකක්ද කියලා ඇහුවොත් ඕනෑම කෙනෙක් කියන්නේ, දරුවන්ට දිය යුතු වැදගත්ම දේ තමයි අධ්‍යාපනය කියලා. ඒ නිසා තමයි බස්නාහිර පළාත් සභාව මුදල් අමාත්‍යවරයා හැටියට ගරු ප්‍රසන්න රණතුංග ඇමතිතුමා තමන්ගේ අයවැය ලේඛනයෙහි 39.32 % ක ප්‍රමාණය මිලියන 17, 186 කුත් නව ලක්ෂ තිස් දාහක් අධ්‍යාපන දෙපාර්තමේන්තුව වෙනුවෙන් මේ බස්නාහිර පළාත් සභාවේ හත් ලක්ෂ දාහතර දහස් හත්සිය හතළිස් අටක් වන ශිෂ්‍ය පරපුර, ඒ වාගේම ඔවුන්ට ඉගැන්වීම් කරන්න තිස් තුන් දහස් පන්සිය පනස් දෙකක් වන ගුරු භවතුන්, පළාත පුරාවට පාසල්1264 ක් සඳහා අධ්‍යාපන දෙපාර්තමේන්තුවට පමණක් මේ මුදල වෙන් කළේ.

ගරු සභාපතිතුමනි, මේ ලොකයේ ඕනෑම ව්‍යාපෘතියක් සඳහා කරනු ලබන ආයෝජනයට ලැබෙන ප්‍රතිලාභය සංඛ්‍යාත්මකව, ප්‍රමාණාත්මකව, කාලීනව ගණනය කිරීමේ හැකියාව තියෙනවා. ඕනෑම ව්‍යාපෘතියක් වෙනුවෙන්. පාරක් හැදුවා නම්, කාපට් කළා නම්, ඒ කාපට් කිරීමට වැය කළ මුදල වෙනුවෙන් ඒ මාර්ගයේ ගමන් කරන වාහනවලට අමතර කොටස් ගෙවීම, ඒ වාගේම කාලය අඩුවීම නොයෙක් නිර්ණායක යටතේ ඒ සියලු වැයකළ මුදලත්, ලැබෙන ප්‍රතිලාභයත් ගණනය කරන්න පුළුවන්. විදුලිය දුන්නත් එහෙමයි. හැබැයි, අධ්‍යාපනයට කරන ආයෝජනයෙන් ලැබෙන ප්‍රතිලාභ අනන්තයි. අපිරිමිතයි. අප්‍රමාණයි. එය සංඛ්‍යාත්මකවද, ප්‍රමාණාත්මකවද, කාලීනවද ගණනය කළ නොහැකියි. ඒ නිසා තමයි බස්නාහිර පළාත් සභාව 2014 අයවැය ලේඛනයේදී සමස්ත වියදමෙන් 39.32 ක් අධ්‍යාපනය වෙනුවෙන් වෙන් කරලා තියෙනවයි කියන එක මේ වෙලාවේ සන්තෝෂයෙන් මතක් කරන්න ඕනෑ.

ඒ වාගේම අපි දැක්කා. පහුගිය කාලයේ අධ්‍යාපන කටයුතුවලට අමතරව, අලුත් ප්‍රවේශයකට පළාත් සභාව පිවිසුනා. ඒ තමයි, ප්‍රාථමික ගුරු පුහුණුව. මට මතකයි මීට මාස කිහිපයකට ඉස්සෙල්ලා රාත්‍රි මම ප්‍රවෘත්ති බලන කොට රූපවාහිනියෙන්, මම දැක්කා ප්‍රධාන අමාත්‍යතුමා, අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්තුමා එක උත්සවයකට යන කොට ගුරුවරු කණ්ඩායමක් පුංචි අරගලයකට පැටලිලා හිටියා. හැබැයි ඊට පස්සෙන් දැන් මේ දින කිහිපයකට ඉස්සෙල්ලා මම සහභාගී වුණා, කළුතර කලාප කාර්යාල බල ප්‍රදේශයේත්, මතුගම කලාප කාර්යාල බල ප්‍රදේශයේත් මේ විධියට පුහුණු කළ ගුරුවරුන් තමන්ගේ දක්ෂතාවයක් කලඑළි දක්වන උත්සවයකට. ඒකට ගියාම පුදුම හිතුනා. ඒ අයද මීට මාස කිහිපයකට ඉස්සෙල්ලා අර විධියට විරෝධතා දැක්වූවේ කියලා. ඔවුන්ගේ වචනවලින්ම, ඔවුන්ගේ ක්‍රියාවලින්ම පුදුමාකාර ඇගයීමක් කළා දින 38 ක එහෙම නැත්නම් පැය 300 ක පුහුණුව පිළිබඳව. ඒ තුළ අපි දැක්කා. ඔවුන් ප්‍රකාශ කළා. අපි විශ්ව විද්‍යාලයේදී සමහර විට විෂය ගණනාවක් ඉගෙන ගත්තා. ඒ කවදාවත් ඒ කිසිම විෂය ක්ෂේත්‍රයකට අවශ්‍ය නොවුණු, නමුත් දෛනික ජීවිතයේදී අපට බොහෝ අත්දැකීම් ලබන්න පුළුවන්, ඒ වාගේම ප්‍රාථමික දරුවන්ට අනිවාර්යෙන්ම ගුරුවරයෙක් විධියට විශ්ව විද්‍යාල දැනුමෙන් ලබා දෙන්න බැරි වුණු, එහෙත් මේ පුංචි ප්‍රාථමික දරුවන්ට ලබලා දෙන්න ඕනෑ, නැටුම්ද, ගැයුම් ද, රැඟුම්ද, කථා කරන්න, පිළිවෙලට වැඩ කරන්න මේ සියල්ලම ඒ ප්‍රාථමික ගුරු පුහුණුව තුළින් ලබා ගත්තා කියන සුවිශේෂත්වය පළ කළ බව මේ වෙලාවේ මතක් කරන්නට ඕනෑ. ඒ නිසා මම හිතන්නේ, ඒ කාර්යය වටිනා කාර්යයක් හැටියටත්, ගරු මහ ඇමතිතුමා ගත් පියවරක් හැටියටත් මේ වෙලාවේ මතක් කරනවා.

ඒ වාගේම මම අධ්‍යාපනය පිළිබඳව දීර්ඝව කථා කරන්න යන්නේ නැහැ. සාමාන්‍යයෙන් ගරු මහ ඇමතිතුමාගේ වැය ශීර්ෂය ගැන කථා කරන කොට ඉඩම් ගැන අඩුවෙන් කථා කළේ. හැබැයි මේ ඉඩම් කියන්නේ අපි දන්නවා, මේ ලෝකයේ සීමිත වූ සම්පත්වල අසීමිත වූ වුවමනාවන් ඉටු කිරීම වෙනුවෙන් කරන ක්‍රියාවලිය තමයි, ආර්ථික විද්‍යාවෙන් කියන්නේ. ඒ තුළ ව්‍යාපාරයක් ආරම්භ කරන්නට අවශ්‍ය බොහොම ඉස්සර ඉගෙන ගත්ත විධියට මූලිකම අවශ්‍යතා හතරක් තියෙනවා. භූමිය, සංවිධානය, ශ්‍රමය සහ ප්‍රාග්ධනය. මේ හතරින් මොන ක්‍රමයකින්වත් වැඩි කරන්න බැරි, විශාල කරන්න බැරි

[ ගරු ඩී.ඒ. චන්ද්‍රභානු ]

ඉතාමත්ම සීමිත සම්පත තමයි, ඉඩම. භූමිය. අද මේ රටේ මිලියන විස්සක් ජනතාව ඉන්නකොට පවුල් ඒකක හැටියට මිලියන පහක් විතර වෙන කොට මෙයිනුත් විශාල පිරිසක් ඉන්නවා, තමන්ගේය කියලා නිවසක් හදා ගන්නට, තමන්ගේ හිසට නිවසක් හදා ගන්නට ක්‍රමයක් නැතුව හිතට නිවනක් නැතිව ජීවත් වන මිනිස්සු. අන්න ඒ මිනිස්සුන්ට අපට පහුගිය අවුරුද්දේ ඉඳලා පුළුවන්කම ලැබුණා මේ අවුරුද්දේ ආරම්භයත් එක්ක, ඉඩම් පනතත් එක්ක පළාත් සභාවේ තිබුණු ඉඩම් ප්‍රඥප්තියේ ගැටීම් සියල්ල අහෝසි කර ගෙන ඒ අහිංසක මිනිස්සුන්ට තමන්ටම කියලා පුංචි ඉඩම් කැබැල්ලක උරුමය, හිමිකම ලබලා දෙන්නට. මට මතකයි. දැන් සති දෙක තුනකට උඩදී කළුතර දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේදී - කළුතර දිස්ත්‍රික්කයේ විතරක් ඉඩම් ඔප්පු 350 ක ප්‍රමාණයක් ලබලා දෙන්න කටයුතු කිරීමත් මම හිතන්නේ බස්නාහිර පළාත් සභාව මෑත ඉතිහාසයේ ලත් විශේෂ ජයග්‍රහණයක් හැටියට හඳුන්වනවා.

ඒ වාගේම අනෙක් කාර්යය තමයි, පළාත් සභාවේ අහිංසක මිනිස්සු ගැන, දුප්පත් මිනිස්සුන්ට හිසට සෙවනක් හදා ගන්න ඉඩම් කැබැල්ලක් දෙනවා වාගේම, පළාත් සභාවට බදු හැටියට අය වෙන්න තියෙන අති විශාල ධනස්කන්ධයකුත් එක පැත්තකින් මේ ඉඩම් නිසා අහිමි වෙලා තියෙනවා. සමහර වෙලාවලදී තිඹිරිගස්යාය,කොළඹ, වත්තල කියන ප්‍රාදේශීය ලේකම් කාර්යාල බල ප්‍රදේශ තුනේ තියෙන පළාත් සභාවට දීර්ඝකාලීන බදු අය කරන ඉඩම්වල හරියාකාරව වර්තමාන තක්සේරුව අනුව, කෘෂිකාර්මික නම් 2% ක්, කාර්මික නම් 4% ක් ආකාරයෙන් බදු හරියාකාරව වර්තමාන තක්සේරු වටිනාකමින් අය කළොත් මම හිතන්නේ, ජාතිය ගොඩ නැගීමේ බද්දෙන් මධ්‍යම රජයෙන් අපට ලැබෙන මුදලට වැඩි මුදලක් මේ බදු මුදල්වලින් හොයා ගන්න පුළුවන්කම ලැබෙනවා. හැබැයි ප්‍රශ්නය තියෙන්නේ, අපට තියෙන්නේ බදු අය කිරීමේ බලය විතරයි. බද්ද කීයද, කොපමණ කාලයකට දෙනවාද, මේ සියල්ල තීරණය ගැනීමේ බලය තියෙන්නේ, ඉඩම් කොමසාරිස්තුමා යටතේ. ඒ නිසා මම අර පොදු කටයුතු කථාවේදී මතක් කළා වාගේ, ගරු සභාපතිතුමනි, හරියාකාරව වර්තමාන තක්සේරුව අනුව අය වියයුතු බදු මුදල් අය කරන ක්‍රමවේදයක් හදන්නට දීර්ඝ කාලීන තිස් අවුරුද්දට, අනූ නව අවුරුදුවලට දීලා තියෙන සමහර ඒවායේ බදු සංශෝධන නැහැ. නමුත් බදු සංශෝධන කළ නොහැකියි කියලා කොන්දේසියකුත් නැහැ. එහෙනම් ඔබතුමාගේ මාර්ගයෙන් ගරු ප්‍රධාන අමාත්‍යතුමාගේ අවධානයට යොමු කරනවා. ඔබතුමා දේශපාලන අධිකාරියත් එක්ක කථා කර ගෙන පුළුවන් නම් පාර්ලිමේන්තුවේදී මේ ක්‍රමයට පොඩි සංශෝධනයක් ගේන්න කටයුතු කළොත් පළාත් සභාව හැටියට ඉඩම් බලතල ඉල්ලනවා නොවෙයි, පළාත් සභාව හැටියට බදු අය කිරීම තුළින් අපට ලැබිය යුතු උපරිම ප්‍රමාණය ලබා ගත්තොත් පළාත් සභාවට කිසිම කරදරයක් නැතුව ස්වාධීනව නැගී සිටීමේ ශක්තියකුත් ලැබෙනවයි කියන එක මේ වෙලාවේ මතක් කරන්න ඕනෑ.

ගරු සභාපතිතුමා
Mr. Chairman

මෙම වෙලාවේදී ඒ.එම්. යූසුෆ් ගරු මන්ත්‍රීතුමා මූලාසනයේ අසුන් ගන්නවා ඇති.

***ඊට අනුකූලව ගරු සභාපතිතුමා [සුනිල් විජේරත්න මහතා] මූලාසනයෙන් ඉවත් වූයෙන්, ඒ.එම්. යූසුෆ් ගරු මන්ත්‍රීතුමා මූලාසනාරූඪ විය.***
*Accordingly the Hon. Chairman [Mr. Sunil Wijeratne] left the Chair and Hon. Yoosuf M.P.C took the Chair*

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

ශ්‍රීනාත් පෙරේරා ගරු මන්ත්‍රීතුමාට විනාඩි 10 ක කාලයක් තිබෙනවා.

[පූ.භා. 11.31]

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ප්‍රථමයෙන්ම මේ අවස්ථාව ලබා දීම ගැන ස්තුතිවන්ත වෙනවා. විශේෂයෙන්ම අද මේ වැය ශීර්ෂය ගැන කථා කරද්දී, අපේ මහ ඇමතිතුමාගේ අමාත්‍යාංශ කිහිපයෙන් අධ්‍යාපනය ගැන කථා කරද්දී, පසු ගිය වසර පහ තුළ අධ්‍යාපනය පිළිබඳව විශේෂ අවධානයක් යොමු කරලා මම හිතන්නේ විශාල ප්‍රගතියක් පසුගිය අවුරුදු පහ තුළ ලබා ගෙන තිබෙනවාය කියන එක අපි මතක් කරලා දෙන්න ඕනෑ. ඒ එක්කම විශාල අඩුපාඩු ගොඩක් තියෙනවා. නමුත් මම හිතන්නේ එතුමා දරන උත්සාහය අපි අගය කොට සලකන්න ඕනෑ. පාසල් බහුතරයක් තුළ අද කිසිම Deal එකක් දාලා නැහැ. Deal දාන්න ඊළඟ පාර නැහැ නේ. අර කිව්වා වගේ. එතුමා එතුමාගේ අධ්‍යාපන අමාත්‍යාංශය තුළ

විශේෂයෙන්ම මීගමු කලාපයේ ජා-ඇළ ඒ පාසල් තුළ සංවර්ධනයක් ඇති වෙලා තියෙනවා කියලා මම හිතන්නේ අවුරුදු ගණනාවකට පස්සේ, අවුරුදු විස්සකට විතර පස්සේ එය සිදු වෙලා තියෙනවා කියන එක අපි මතක් කරලා දෙන්න ඕනෑ. අපිට නොයෙකුත් ප්‍රශ්න තියෙනවා. නොයෙකුත් ප්‍රශ්න අපි නොයෙකුත් වේලාවට කියනවා. නමුත් සමස්තයක් වශයෙන් ගත්තහම ඒ ප්‍රගතිය අපි මේ අවස්ථාවේදී අගය කොට සලකන්න ඕනෑ. ඒ එක්කම මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ පාසල් පද්ධතිය තුළ තවත් අඩුපාඩු රාශියක් තියෙනවා. අපි දැක්කා පාසල්වලට යද්දී, විශේෂයෙන්ම විද්‍යාගාරවල, එහෙමත් නැතිනම් ගණිතාගාරවල විශාල අඩුපාඩු ගොඩාක් තියෙනවා. මම හිතන්නේ, සමහර පාසල්වල දැන් විද්‍යාගාර හදන්න ආරම්භ කරලා තියෙනවා. ඒ ගැනත් අපි සතුටු වෙනවා. නමුත් සමහර තැන්වල අඩක් හදලා ගෙවා ගන්න බැරි තත්ත්වයකුත් තියෙනවා. ඉතින් ඔබතුමාගේ අවධානය එයට යොමු කරන්න.

මම හිතන්නේ, මධ්‍යම රජයෙන් තමයි මේ ආධාර ලැබිලා තියෙන්නේ. නමුත් සමහර පාසල්වල ඒ කොන්ත්‍රාත්කරුවන්ට තාම ගෙවලා නැහැ. ඒක නිසා අඩක් නිම කරලා නවත්තලා තියෙන තැන් බහුතරයක් තියෙනවා. ඒ ගැනත් ඔබතුමාගේ අවධානය යොමු කරන්න කියලා මම ඉල්ලා සිටිනවා. ඒ එක්කම විශේෂ අවධානයක් ඔබතුමාගෙන් යොමු වුණොත්, මම ඊයෙත් ප්‍රකාශ කරපු විධියට මේ පාසල තුළ ක්‍රීඩාව සම්බන්ධයෙන්, පළාත් සභාවක් හැටියට ක්‍රීඩා අමාත්‍යාංශයකුත් අපට තිබෙනවා. විශේෂ අවධානයක් යොමු විය යුතුයි කියලා මම විශ්වාස කරනවා. මොකද අපේ පළාත් සභා පාසල්වල ක්‍රීඩාව අතින් ගත්තහම ඉතාම පහත් මට්ටමක තමයි තියෙන්නේ. විශේෂයෙන්ම පෞද්ගලික පාසල්වල මම මතක් කරලා දුන්නා වගේ ඒ පාසල් තුළ ක්‍රීඩාව ඉතාම උසස් මට්ටමකට ගිහිල්ලා තියෙනවා. මොකද විශේෂඥ පුහුණුකරුවන් අරගෙන මාසෙකට රුපියල් විසිපන්දාහ, තිස්දාහ දීලා සෑම ක්‍රීඩාවකම ද මැසනඩ් විදූහල. ඒ වාගේම මාරිස්ටෙලා විදූහල. මේ පාසල්වල ඒක උසස් මට්ටමකට ගෙනිහිල්ලා තියෙනවා. අද අපට තවම බැරිවෙලා තියෙනවා, ඒ විශේෂඥ පුහුණුකරුවන් අපේ පාසල්වලට ලබා දෙන්න. අවම වශයෙන් අපි කොට්ඨාශයක් අරගෙන ඒ කොට්ඨාශයකට හරි එවැනි කිහිපදෙනෙක් දීලා ඒ තෝරා ගත් පාසල්වල ක්‍රීඩාව දියුණු කරන්න, අවශ්‍ය වැඩ පිළිවෙළක් සකස් කළොත් හොඳයි කියලා මම විශ්වාස කරනවා.

මම හිතන්නේ මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ පළාත් පාලන ආයතන ගැන විශාල වශයෙන් චෝදනා එල්ල වුණා. ඒවා ඉතාමත් සාධාරණ චෝදනා. නමුත් විශාල වශයෙන් අද මේ තත්ත්වයට පළාත් පාලන ආයතන පත් වෙලා තියෙන්නේ ඇයි කියලා අපි පොඩ්ඩක් කල්පනා කරලා බලන්න ඕනෑ. අද මෙතරම් දූෂිත තත්ත්වයකට පත් වෙලා තියෙන්නේ, මේ පළාත් පාලන ආයතන නියෝජනය කරන මන්ත්‍රීවරුන්ට, මහජන නියෝජිතයන්ට අද ඒගොල්ලන්ට මාසෙකටම හම්බවෙන්නේ රුපියල් පන්දාහයි. දැන් රුපියල් පන්දාහෙන් මම හිතන්නේ අඩුම ගානේ එක සුමානයක්වත් කන්න බැරි තත්ත්වයක් තමයි දැන් මේ ආර්ථික තත්ත්වය උඩ තියෙන්නේ. ඒක නිසා ඒ ගෞරවය, ඒ අභිමානය ඒ මන්ත්‍රීතුමන්ලාට නැහැ. ඒ මන්ත්‍රීතුමන්ලා තමයි අපේ ගම්වල විශේෂ රාජකාරියක් කරන්නේ. ඕනෑම දේකට ක්‍රීඩා උත්සවයකට එහෙම නැත්නම් මරණ ගෙයකට ගිහිල්ලා ඒ අවශ්‍ය පහසුකම් සියලුදේම ලබා දෙන්නේ ඒ මන්ත්‍රීතුමන්ලා. නමුත් රුපියල් පන්දාහෙන් මේවා කරන්න බැහැ. තමන්ගේ පවුලේ අයව සුමානයක්වත් ජීවත් කරන්න බැහැ.

ඒක නිසා අපි පළාත් පාලන ආයතනයට ඉහළින් ඉන්න පළාත් සභාව වශයෙන් මම යෝජනා කරලා සිටිනවා, අඩුම ගානේ අපේ පඩියට හා සමාන පඩියක්වත් මෙතුමන්ලාට ලබා දෙන්න කියලා. අපේ එකත් මදී. නමුත් අපේ එක හින්දා දෙන දීමනා බලපුවාහම අපෙනුත් එනවා, හැමදාම මොනවා හරි ඉල්ලන්න. ඉතින් අපිටත් දීගන්න විධියක් නැහැ. ඇත්තම කිව්වොත් අපිටත් දීගන්න විධියක් නැහැ. ඉතින් අපිත් අසරණ වෙනවා. ඉතින් මේ පළාත් පාලන ආයතන මන්ත්‍රීවරු හොරකම් කරන ඒක, දූෂණය කරන ඒක, වංචා කරන ඒක ඉතින් අහන්න දෙයක් නොවේ. මේකේ වැරැද්ද තියෙන්නේ එතුමන්ලාගේ නොවෙයි - (බාධා කිරීමක්) දැන් රටේ තියෙන ආර්ථික තත්ත්වය අනුව රුපියල් පන්දාහෙන් මොනවාද කරන්න පුළුවන්. දැන් ඔබතුමාලා වගේ පොහොසත්, සල්ලි තියෙන, පරම්පරාවෙන් සල්ලි තියෙන අයම මේ පළාත් පාලන ආයතනවල නැහැ නේ? ඉතින් ඒ නිසා මෙතුමා නිකන් බොරුවට කඩේ යන්න හදන්න එපා. හරිනම් මෙතුමා එතුමන්ලා වෙනුවෙන් කථා කරන්න ඕනෑ. මෙතුමා ඉඳගෙන විවේචනය කරනවා නේ ? මම හොඳ දෙයක් කිව්වාහම .

[සභාවේ ඝෝෂා]

[ ගරු ශ්‍රීනාත් පෙරේරා ]

මෙතුමා දැන් මේක වෙලා තියෙන්නේ මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දැන් මේ පළාත් පාලන ආයතනයේ ඉඳන් එන සභාපතිවරු ඉන්නවා නේ. මෙතැන්ට ආවාට පස්සේ අර කට්ටියට කැමති නැහැ. මෙතැන ඉඳලා පාර්ලිමේන්තුවට ගියාම පාර්ලිමේන්තුවේ ඉඳන් අපි ගැන කථා කරන්න කැමති නැහැ. ඒක තමයි වෙලා තියෙන්නේ. ඒක තමයි ඇත්ත තත්ත්වය. ඉතින් ඒ නිසා ඔබතුමා ඔබතුමාගේ වෙලාවෙන් ඔබතුමා කථා කරන්න කෝ. ඔබතුමාගේ වේලාවෙන් කථා කරන්න කෝ. ඉවරයි නේ. ඔබතුමාලා හොඳට මාටියා ගහලා මහ නගර සභාවේ ඉද්දී හොඳට හම්බ කරලා මෙතැනට එන්න ඇති. ඉතින් ඔබතුමාට ප්‍රශ්නයක් නැහැ. ඔබතුමාට ප්‍රශ්නයක් නැතුව ඇති.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

ගරු මන්ත්‍රීතුමා, තමුන්නාන්සේ මාතෘකාවට කථා කරන්න. අනවශ්‍ය විධියට වචන පාවිච්චි කරන්න එපා.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

හැබැයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, බහුතරයක් පළාත් පාලන මන්ත්‍රීවරුන්ට මේ ප්‍රශ්න තියෙනවා. මේ කිහිප දෙනෙකුට ඒක නැහැ. අපි දන්නවා. ඒ කාලේ ඉඩම් කට්ටි කරලා විකුණලා, හොරකම් කරලා ඒ ගෙවල් අරගෙන, ඒ ඉඩම් කට්ටි ඇතුළේ ගෙවල් අරගෙන, ඉඩම් අරගෙන කටයුතු කරපු අය ඉන්නවා. අපි දන්නවා. හැබැයි අර අසරණ පළාත් පාලන මන්ත්‍රීවරු ගැන කථා කරද්දී සමහර කට්ටියට පොඩ්ඩක් කැක්කුම එනවා. මට තේරෙන්නේ නැහැ, ඒ මොකද කියලා. එතැන්ට එන සභාපතිට තමයි මේ පළාත් පාලන ආයතනවල සම්පූර්ණ ඒකාධිපති බලය තියෙන්නේ. මේ සභාපති තමයි මේ සභාවේ සියලුම කොන්ත්‍රාත් කරන්නේ. එයාට තමයි මේ බලය තියෙන්නේ ඉතින් අනිත් මන්ත්‍රීවරු ඔක්කෝම අත්සන් කරන්න ඕනෑ. ඉතින් අනිත් මන්ත්‍රීවරුන්ට මොනවා හරි කරන්න වෙනවා, ජීවත් වෙන්න. ඉතින් ඕක තමයි සත්‍යය. ඒ නිසා තමයි දැන් අයවැය පරාද වෙන්නේ. මොකද සභාපති තනියම මාටියා ගහනවා. ඉතින් අනිත් එවුන් ටික එකතු වෙලා අයවැය පරද්දලා. ඒක තමයි අද වෙලා තියෙන්නේ. අද ඕක තමයි වෙලා තියෙන්නේ. ඉතින් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු මහ ඇමතිතුමාගෙන් මම ඉල්ලා සිටිනවා. අපි මේ පළාත් පාලන ආයතන නියෝජනය කරන මන්ත්‍රීවරුන්ට මම හිතන්නේ අඩුම ගානේ තමන්ගේ පවුල ජීවත් කරවන්න පුළුවන් වැටුපක්, එහෙම නැතිනම් දීමනාවක් ලබා දිය යුතුයි කියලා. එහෙම වුණොත් තමයි මේ පළාත් පාලන ආයතන පිරිසිදු කරන්න පුළුවන් වෙන්නේ. නැත්නම් අපි බොරුවට මෙතැන කෑ ගැහුවට ඉන් නේ ඔක්කෝම හොරු, මිනීමරුවෝ, අරුන් මුන් කියලා ඇති වැඩක් නැහැ. ඒ මිනිස්සුන් අපේ මළ ගෙදරකට Hut එකක් ගෙනාවොත්, ඒ මිනිහාට තමයි Hut එක ගහන්නේ. මළගෙදරට හැමදාම යන්නේ, call කරන්නේ. ජනතාව වෙනුවෙන් කාලය වැය කරන්නේත් වැඩිපුර ඒ මිනිස්සු. ඉතින් ඒ අය ගැනත් මම හිතන්නේ විශේෂයෙන් සැලකිල්ලක් දක්වලා අපි මේක පිරිසිදු කරන්න නම්, මේක පිරිසිදු ආයතනයක් කරන්න නම් මම හිතන්නේ පළමුවෙන්ම ඒ අයට සරිලන වැටුපක් ලබා දිය යුතුයි කියලා මම ඔබතුමාට යෝජනා කරනවා. මගේ කාලය අවසන්. තව විනාඩි 05 ක් විතර දෙන්න බැහැ නේ. එහෙනම් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා මට කාලය ලබා දීම ගැන.

[පූ.භා. 11.50]

**පූජ්‍ය ගරු තෙඹුවන පියනන්ද ස්ථවිර**
Hon. Revrn. Thebuwana Piyannada Thero

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අධ්‍යාපන අමාත්‍යවරයා හැටියට මහ ඇමතිතුමාගේ වැය ශිර්ෂයන් පිළිබඳව කථා කරන්න අවස්ථාව ලබා දීම පිළිබඳව ස්තුතිවන්ත වෙනවා. විශේෂයෙන්ම අවුරුදු තිහකට වැඩි කාලයක් ගුරුවරයෙක් හැටියට කටයුතු කරපු, ඒ වාගේම අධ්‍යාපනයේ තිඹිරිගෙය වුණු පිරිවෙන නියෝජනය කරපු කෙනෙක් හැටියට, භික්ෂූන් වහන්සේ නමක් හැටියට මේ වැය ශිර්ෂය යටතේ මම කථා කරන්න බලාපොරොත්තු වෙන්නේ, අධ්‍යාපන ක්ෂේත්‍රය පිළිඳව පමණයි. සාමාන්‍යයෙන් අමාත්‍යාංශයක ප්‍රගතිය වැඩ පිළිවෙළ සාර්ථකත්වය අපට මනින්න තියෙන්නේ, ලබලා තියෙන ක්‍රමානුකූල ප්රගතිය අනුව. මම හිතන්නේ, අධ්‍යාපනය ගැන කවුරුත් කථා කළා. රටක තියෙන ඉතාමත්ම වැදගත්ම ආයෝජනයයි කියන කාරණය. ඒ වගකීම, වගකීමක් හැටියට බාර අරගෙන අපේ මහ ඇමතිතුමා අනාගත දරුවන්ගේ ජීවිතවල වගකීම සාර්ථක වන විධියට මේ අමාත්‍යාංශය ගත වුණු කාල සීමාව තුළ දී හසුරුවලා තිබෙනවාය කියන කාරණය ඉතාමත් සතුටින් අපි ප්‍රකාශ කරන්න ඕනෑ. විපක්ෂයකට ඕනෑ තරම් කරුණු කියන්න පුළුවන්. විවේචනය කරන්න පුළුවන්. නමුත් අපි සලකා බැලිය යුත්තේ අමාත්‍යාංශයක ක්‍රමානුකූල ප්‍රගතිය.

මම හිතන්නේ, අධ්‍යාපන අමාත්‍යාංශය දිහා බලපුවාහම ඒ ප්‍රගතිය වර්ෂයෙන් වර්ෂය, වර්ෂයෙන් වර්ෂය ක්‍රමානුකූලව ඉදිරියට ඇවිල්ලා තියෙනවා. මම උදාහරණ කිහිපයක් කෙටියෙන් මතක් කරනවා නම්, විශේෂයෙන්ම අධ්‍යාපන සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගනයෙන් උසස් පෙළට සුදුසුකම් ලබා තිබෙන සංඛ්‍යාව බස්නාහිර පළාතේ 2008 වර්ෂයේ 65.77 % ක්. 2009 වර්ෂයේ 60.93 % ක්. ඒ වාගේම 2010 වර්ෂයේ 67.30% ක්. 2011 වර්ෂයේ 66.56 ක්. 2012 වර්ෂයේ 69.03 % ක්. මේ ප්‍රගතිය ඉතාමත්ම විශිෂ්ට ප්‍රගතියක්. ඒ වාගේම පස්වන ශ්‍රේණියේ ශිෂ්‍යත්ව විභාගය පිළිබඳව කල්පනා කළාම ලකුණු 70 ට වඩා ප්‍රතිශතය ලබා ගත්ත ළමුන්ගේ සංඛ්‍යාව එහෙත් එහෙමයි. 2008 දී 43.08 % ක් වුණු මේ තත්ත්වය 2012 වන කොට 66.71% ක් දක්වා වර්ධනය වුණු අතර, 2013 ප්‍රතිඵලය ඇවිල්ලා තියෙනවා. 71.74 % දක්වා වර්ධනය වෙලා තියෙනවා. මේ කුඩා දරුවන්ගේ අනාගතය සාර්ථකත්වයට පත්වීමේ පෙර නිමිති අපේ අධ්‍යාපන අමාත්‍යාංශය තුළින් නිරූපනය කරලා තියෙන ආකාරය විශිෂ්ටයි. උසස් පෙළ විභාගයෙන් විශ්ව විද්‍යාල ප්‍රවේශයට ඇතුළත් වන ළමුන්ගේ සංඛ්‍යාව පිළිබඳව කල්පනා කළොත් 2008, 59.04 % ක් වුණු මේ සංඛ්‍යාව 2012 දී 63.33 % දක්වා වර්ධනය වෙලා තියෙනවා.

මම මේ මතක් කළේ, ගරු මහ ඇමතිතුමා අධ්‍යාපන අමාත්‍යවරයා හැටියට තමන්ගේ කාල සීමාව තුළ දී, අපේ පළාත තුළ අපේ දරුවන්ගේ අනාගත වගකීම අධ්‍යාපනය හරහා ගොඩනගන්න කටයුතු කරලා තියෙන ආකාරයේ ක්‍රමානුකූල ප්‍රගතිය හා සාර්ථකත්වය අපට පෙන්නුම් කරලා තියෙන ආකාරයයි. ඒ නිසා අනිවාර්යයෙන්ම අපි පක්ෂ විපක්ෂ භේදයකින් තොරව හැම කෙනෙක්ම මේක අවිවාදයෙන් පිළිගත යුතු වෙනවා, පළාතේ වැදගත්ම අමාත්‍යාංශය හැටියට අපේ මහ ඇමතිතුමා අනුගමනය කරලා තියෙන මේ වැඩ පිළිවෙළ පිළිබඳව හැම කෙනෙක්ම කථා කරන විශේෂ කාරණා තියෙනවා. මමත් ඒ පිළිබඳව කෙටියෙන් කථා කරන්න බලාපොරොත්තු වෙනවා. නමුත් ඔබතුමා හරහා මම ගරු මහ ඇමතිතුමාගේ අවධානයට විශේෂ කාරණා තුනක් යොමු කරන්න බලාපොරොත්තු වෙනවා. ඉන් එකක් තමයි පෙර පාසල් අධ්‍යාපනය පිළිබඳව. ඒ වාගේම පාසල්වලට දරුවන් ඇතුළත් කර ගැනීම පිළිබඳව සහ උපකාරක පන්ති පිළිබඳව. මේ අපි ගම් මට්ටමින් දෙමව්පියොත් එක්ක සාකච්ඡා කරන කොට වැඩි දෙනෙකුගේ දැවෙන ප්‍රශ්න බවට පත් වෙලා තියෙන කාරණා තමයි මේ. පෙර පාසල් පාලිකාවන් එක්ක කථා කළාම මම හිතන්නේ, පෙර පාසල් ප්‍රඥප්තිය හරහා දැනට අධ්‍යාපන දෙපාර්තමේන්තුව මඟින් අවධානය යොමු කරලා අධීක්ෂණයට ලක් කරන තත්ත්වයට පෙර පාසල් 2013 ඉඳලා පත් කරලා තියෙනවා. නමුත් පෙර පාසල් මට්ටමේදී අපි දන්නවා, පෙර පාසල් ගුරුවරුන් සඳහා අවශ්‍යය කරන පුහුණුව ලබා දෙනවා. නමුත් පෙර පාසල් පත්වාගෙන යන්නේ ඉතාම අසීරු තත්ත්වයෙන් කියන එක අපි හොඳටම දන්නවා. විශේෂයෙන් ආගමික මධ්‍යස්ථාන ආශ්‍රිතව තමයි වැඩි පෙර පාසල් ප්‍රමාණයක් තියෙන්නේ. ඉතින් ඒවායේ තියෙන ගැටළු අපි හොඳාකාරව දන්නවා. ඒ පෙර පාසලක අවම වශයෙන් ගුරුවරු දෙන්නෙක්වත් වැඩ කරනවා. දැන් ගම්බද වුණාම එහි දරුවකුගෙන් අය කරන ප්‍රමාණය ඉතාමත්ම සුළු ගණනක්. සමහර විට විවිධ අපහසුතා නිසා නොගෙවන අවස්ථා තියෙනවා. ඉතාම අපහසුතා මැද්දේ තමයි පෙර පාසල් ගුරුවරු මේ පෙර පාසල් පවත්වා ගෙන යන්නේ. එතකොට මුල් ළමා වියේ දරුවන් හොඳ ශක්තිමත් පදනමකින් සකස් කර ගැනීමට, පෙර පාසල් පාලිකාවන්, ගුරුවරුන් දරන උත්සාහය අගය කළ යුතුයි. මම හිතන්නේ, අපට පෙර පාසල් පිළිබඳව මීට වඩා විශේෂයෙන්ම පෙර පාසල් ගුරුවරුන්ගේ ප්‍රශ්න නිරාකරණය කිරීම සඳහා මීට වඩා විධිමත් වැඩ පිළිවෙළක් ලබන වර්ෂයේ සිට ආරම්භ කරන්න පුළුවන් නම් හොඳයි කියන කාරණය පිළිබඳව මම ඔබතුමා හරහා ගරු මහ ඇමතිතුමාට යෝජනාවක් හැටියට ඉදිරිපත් කරනවා.

ඒ වාගේම පාසල්වලට දරුවන් ඇතුළත් කර ගැනීම. මම හිතන්නේ, වර්තමානයේ අපේ දෙමව්පියෝ මුහුණ දෙන ප්‍රශ්නවලින් ආහාරපාන පිළිබඳ ගැටළුව හැරුණාම මට නම් තේරෙන්නේ, අද සමහර දෙමව්පියෝ ඊටත් වඩා වද විඳින ප්‍රශ්නය තමයි පාසල්වලට දරුවන් ඇතුළත් කර ගැනීම පිළිබඳ ප්‍රශ්නය. මේකේදී කරන දේවල් පිළිබඳව බලපුවාහම මම හිතන්නේ, සමහර විට ඒ දරුවන්ටත් ලජ්ජයි, සමහර දෙමව්පියෝ මේ පිළිබඳව අනුගමනය කරන ක්‍රියා මාර්ග පිළිබඳව බැලුවාමත් එහෙමයි. කරන්න දෙයක් නැති තත්ත්වය තුළ, අසරණකම තුළ තමයි ඒ තත්ත්වයට ඒ දෙමව්පියනුත් පත් වෙලා තියෙන්නේ. ඒ නිසා මේ පිළිබඳව මීට වඩා විධිමත් වැඩ පිළිවෙළක්, ක්‍රමානුකූල වැඩ පිළිවෙළක්, දෙමව්පියන් අසීරු තත්ත්වයට පත් නොවන විධියේ ක්‍රමවත් වැඩ පිළිවෙළක් අවශ්‍යයයි කියන එක ඉතාම පැහැදිලියි. මොකද, මන්ත්‍රීවරු හැටියට අපිත් විශාල අපහසුතාවයන්ට පත් වෙනවා. මොකද,

[ පූජ්‍ය ගරු තෙඹුවන පියනන්ද ස්ථවිර ]

දෙමව්පියෝ අසීමිතව මුණ ගැහෙනවා. අපි ළඟට දෙමව්පියෝ එන ප්‍රශ්නවලින් වැඩිම ප්‍රශ්නය මම හිතන්නේ, තමන්ගේ දරුවන්, තමන්ට සුදුසු පාසලකට ඇතුළත් කිරීම පිළිබඳ ගැටළුව. ඉතින් ඒ නිසා මේ පිළිබඳවත් මම හිතන්නේ මීට වඩා ඒ දෙමව්පියන්ගේ ගැටළුව සහනදායි ලෙස නිරාකරණය කරන විධියේ වැඩ පිළිවෙළක් බස්නාහිර පළාත තුළ අතවශ්‍යායි කියන ඒක නම් ඉතාමත් පැහැදිලියි. ඉතින් ඒ නිසා ඔබතුමන් හරහා මම ගරු මහ ඇමතිතුමාට යෝජනා කරනවා, ඒ පිළිබඳව විශේෂ අවධානයක් යොමු කරලා ලබන වර්ෂයේදී යම් වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කිරීම සුදුසුයි කියන කාරණය අධ්‍යාපන උපදේශක කාරක සභාව හරහා සාකච්ඡා කරන්න කරලා.

ඒ වාගේම තමයි උපකාරක පන්ති පිළිබඳ ප්‍රශ්නය. උපකාරක පන්ති පිළිබඳ ප්‍රශ්නයත් දහම් පාසල් ක්ෂේත්‍රයත් එක්ක කථා කරන කොට, දහම් පාසල්වල කටයුතු කරන අපට විශාල ගැටළුවක් බවට පත් වෙලා තියෙනවා. දහම් පාසල්වල ශිෂ්‍ය සංඛ්‍යාව ඉතාමත්ම සීඝ්‍රයෙන් අඩු වන තත්ත්වයට අද පත් වෙලා තියෙනවා. පහ වසර ශිෂ්‍යත්වය ඉලක්ක කර ගෙන හතර පන්තියේ දරුවෝ දහම් පාසල් එන්නේ නැහැ. ඒ වාගේම සාමාන්‍ය පෙළ ඉලක්ක කර ගත්තාහම සමහර විට නවය පන්තියේ ඉඳලා දරුවෝ දහම් පාසලින් ඈත් වෙනවා. උපකාරක පන්ති යාම සඳහා. අපේ පළාත් සභාවේත් මේ පිළිබඳව පෞද්ගලික මන්ත්‍රී යෝජනාවක් ඉදිරිපත් කරලා සම්මත කර ගත්තා. ඉරු දිනයේ සහ පොහොය දිනවල උපකාරක පන්ති නතර කිරීම පිළිබඳව. නමුත් සාමාන්‍යයෙන් යෝජනාව සම්මත වීම පමණයි. ක්‍රියාවට නැගීමක් වෙන්නේ නැහැ. ඒ නිසා මේ පිළිබඳව විශේෂ අවධානය යොමු කරන්න කියන කාරණය විශේෂයෙන් මතක් කරන්න ඕනෑ. මම හිතන්නේ, දැන් අධ්‍යාපන අමාත්‍යාංශය අළුත් පියවරක් අද ඉඳලා ආරම්භ කරලා තියෙනවා සාමාන්‍ය පෙළ විභාගයට සතියකට කළින් මේක නතර කළ යුතුයි කියන ඒක. මම හිතන්නේ එය හොඳ ප්‍රවේශයක්. එහෙම කරන්න පුළුවන්, නම් මේක නීතිමය වශයෙන් ඉරිදා පෙරවරුවේ මේක නතර කරන්න පියවරක් ගන්න නීතිමය ඉඩකඩක් නැති වෙන්න බැහැ කියන එක අපට පැහැදිලිව පේනවා. ඒ නිසා ඒ පිළිබඳවත් විශේෂ අවධානය යොමු කරන්නය කියන කාරණය මතක් කරනවා.

මම පළාත් සභාවේ ඉන්න එකම භික්ෂුන් වහන්සේ හැටියට මම හිතන්නේ, සරුදම් අරුණැල්ල පිළිබඳව වචනයක් කථා නොකළොත් ඒක ලොකු අඩුවක් වෙනවා. දහම් පාසල, පළාත් සභාවට අයත් විෂයක් නොවුණත් මම හිතන්නේ, ඒ ගත්ත ක්‍රියා මාර්ගය ඉතාමත් අගය කළ යුතු වෙනවා. දහම් පාසල් ප්‍රධාන ආචාර්යවරයෙක් හැටියට අදත් මම කටයුතු කරන නිසා මේකේ වටිනාකම අපට තේරෙනවා.

මේ රටේ දහම් පාසල් ක්ෂේත්‍රයේ, ඒ ඉතිහාසය තුළ පෞද්ගලිකව යම්කිසි මන්ත්‍රීවරයෙක් තමන්ගේ ප්‍රතිපාදනවලින් දහම් පාසල්වලට රුපියල් ලක්ෂයක් දුන්නා හැරෙන්න ඉතිහාසය තුළ වෙන කවරදාකවත් මම හිතන්නේ, මේ විධියේ ප්‍රතිපාදනයක් දහම් පාසලකට ලැබිලා නැහැ. බෞද්ධ, ක්‍රිස්තියානි, කතෝලික, හින්දු, ඉස්ලාම් මේ සියළුම දහම් පාසල් මම හිතන්නේ 2016 ක් පමණ වන බස්නාහිර පළාතේ දහම් පාසල්වලට රුපියල් ලක්ෂය බැගින් ප්‍රදානය කිරීම මේ දහම් පාසල් ක්ෂේත්‍රයේ ඉතිහාසය තුළ නොමැකෙන වැදගත්ම අවස්ථාවක් කියන එක අනිවාර්යයෙන්ම මතක් කරන්නට ඕනෑ. මම හිතන්නේ ඒක අගය කිරීම භික්ෂුන් වහන්සේ කෙනෙක් හැටියට මගේ යුතුකමක්. ඒ නිසා මේ විධියේ ඉතාමත්ම ප්‍රගතිදායක අංශ රාශියක් අධ්‍යාපන අමාත්‍යාංශය තුළින් අපේ මහ ඇමතිතුමා ක්‍රියාත්මක කරලා තියෙනවා. ඒ පිළිබඳව අපේ හෘදයාංගම ආශිර්වාදය එතුමන්ට පිරිනමමින් මේ අවස්ථාව ලබා දීම පිළිබඳව මුලාසනය දරන ඔබතුමන්ට අපේ ස්තුතිය පුද කරමින් හැමදෙනාටම තෙරුවන් සරණ ප්‍රාර්ථනය කරමින් මගේ වචන කිහිපය අවසන් කරනවා.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

මුජිබුර් රහුමාන් ගරු මන්ත්‍රීතුමාට විනාඩි 10 ක කාලයක් තිබෙනවා.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

විදුලිබල හා බලශක්ති විවාදය මේ. විදුලිබල හා බලශක්ති ඇමතිතුමා Current එක නැහැ. වරප්‍රසාද ප්‍රශ්න. ආණ්ඩුවේ බැරිකම පේනවා.

**ගරු මොහොමඩ් මුජිබුර් රහුමාන්**
Hon. Mohamed Mujibur Rahuman

මට තිබෙනවා මෙතැන යම්කිසි සංඛ්‍යා ලේඛන වගයක් ඉදිරිපත් කරන්න.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

ජේනවානේ?

**ගරු මොහොමඩ් මුජිබුර් රහුමාන්**
Hon. Mohamed Mujibur Rahuman

ඇත්තමට මට පෙන්නේ නැහැ. නැත්නම් මම කථා කරනවා. ඒ ගැන ගැටළුවක් නැහැ. මට ජේන්නේ නැහැ. එහෙම කථා කරන්න බැහැ නේ.

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Felician De Silva

මහ ඇමතිතුමා ඉන්න පුටුවට යන්න දෙනවා නම් කථා කරනවා.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

ගරු මන්ත්‍රීතුමා වාඩි වෙන්න. මම පිළිගන්නවා. එහෙම නම් සභාව දිවා ආහාරය සඳහා පස්වරු 01.00 දක්වා කල් තබනවා.

*ඊට අනුකූලව පූර්ණ කාරක සභාව තාවකාලිකව අත්සිටුවන ලදින් අ.භා. **01.08** ට යළිත් රැස් විය.*

*Accordingly the Committee of the Whole Council Suspended and. it resumed at 01.08 p.m.*

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

මොහොමඩ් මුජිබුර් රහුමාන් ගරු මන්ත්‍රීතුමා ඔබතුමාට විනාඩි 10 ක කාලයක් වෙන් වී තිබෙනවා.

[අ.භා. 01.09]

**ගරු මොහොමඩ් මුජිබුර් රහුමාන්**
Hon. Mohamed Mujibur Rahuman

ස්තුතියි මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ ප්‍රධාන අමාත්‍ය ප්‍රසන්න රණතුංග මැතිතුමාගේ අමාත්‍යාංශ වැය ශීර්ෂයට කථා කිරීමට ලැබීම ගැන ස්තුතිවන්ත වෙනවා. මම එතුමාගේ වැය ශීර්ෂයේදී විශේෂයෙන්ම අධ්‍යාපනය පිළිබඳ කොළඹ කලාපය නියෝජනය කරන මන්ත්‍රීවරයෙක් හැටියට අපි පහුගිය කාලේ දිගින් දිගටම මේ පළාත් සභා අයවැය විවාදයේදීත් එතුමාට අපි පෙන්නලා දුන්නා, කොළඹ කලාපය තුළ අධ්‍යාපනය අතින් සැලකිය යුතු ගුණාත්මක සංවර්ධනයක් අපි දැක්කේ නැහැයි කියලා. නමුත් පහුගිය කාලේ වාගේම අපි දිගින් දිගටම එතුමාගේ අමාත්‍යාංශය යටතේ අධ්‍යාපනය වෙනුවෙන් වැය වන මුදල් හරහා ඒ පාසල්වල යටිතල පහසුකම් සංවර්ධනය කරන්න, ඒ පාසල්වල භෞතික සම්පත් දියුණු කරන්න එතුමා විශාල මුදලක් වියදම් කරලා තියෙනවා. ඒක ඇත්ත. නමුත් ඒ හරහා ඒ අපට ලබා ගන්න පුළුවන් ඉලක්කවලට - මොකද, අපි පාසල්වලට මොන සම්පත් දුන්නත්, මොන භෞතික සම්පත් දුන්නත් හැමදේම අවසාන ඉලක්කය වෙන්නේ, අධ්‍යාපනයේ දියුණුව හා අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනය වෙලා තියනවා ද කියන එකයි. එය තමයි අපේ අවසාන නිගමනය වන්නේ.

කොළඹ කලාපය තුළ පහුගිය අයවැය විවාදයේදීත් මම දිගින් දිගටම පෙන්වලා දුන්නා, විශේෂයෙන්ම ප්‍රාථමික අංශයේ සිංහල මාධ්‍යය ගුරුවරුන්ගේ විශාල හිඟයක් තියෙනවා. හැම පාසලකම. ඒක දෙමළ පාසලක් වෙන්න පුළුවන්. මුස්ලිම් පාසලක් වෙන්න පුළුවන්. සිංහල මාධ්‍ය පාසලක් වෙන්න පුළුවන්. දිගින් දිගටම හැමදාම උපදේශක කාරක සභාවේදී ඔබතුමාගේ ඉදිරියේදී අපි පෙන්නලා දීලා තියෙනවා. නමුත් ඒවාට නිසි ආකාරයේ පිළිතුරු හම්බ වුණේ නැහැ. ඒ තුළ විශාල වශයෙන් මම කියනවා, අධ්‍යාපනය අතින් කඩා වැටීමක් කොළඹ කලාපය තුළ තියෙනවා. මම ඔබතුමාට ඉදිරිපත් කරන්න කැමතියි 2010 ඉඳන් - විශේෂයෙන්ම ශිෂ්‍යත්ව විභාගයේ ප්‍රතිඵල මම ඉදිරිපත් කරන්න කැමතියි. අපේ කොළඹ කලාපය තුළ ළමයි 5,335 ක් විභාගය ලියලා තියෙනවා. නමුත් සමත් වෙලා තියෙන්නේ 279 යි. ප්‍රතිශතයක් හැටියට 5.2 % යි. 2011 දී 5,363 ක් විභාගයට පෙනී ඉඳලා තියෙනවා. සමත් වෙලා තියෙන්නේ 256 යි. ප්‍රතිශතයක් හැටියට 4.6 % යි. ඊළඟට 2012 දී ශිෂ්‍යත්වය විභාගය සඳහා ළමයි 3,720 ක් ඉදිරිපත් වෙලා තියෙනවා. සමත් වෙලා තියෙන්නේ 223 යි. ප්‍රතිශතයක් හැටියට 5.9 % යි සමත් වෙලා තියෙන්නේ. 2013 වර්ෂයේදී 5,658 ක් ළමුන් විභාගය සඳහා පෙනී සිටලා තියෙනවා. සමත් වෙලා තියෙන්නේ 232 යි. ප්‍රතිශතයක් හැටියට 4.1 % යි. මේක තමයි පහුගිය අවුරුදු හතර තුළ කොළඹ කලාපයේ ප්‍රාථමික අංශයේ පහේ ශිෂ්‍යත්වය විභාගයේ ප්‍රතිඵල. මේ ලැයිස්තුව තුළින් ඔබතුමාට පැහැදිලි වෙන්න ඕනැ, කොළඹ කලාපයේ ප්‍රාථමික අංශයේ මොන තරම් කඩා වැටීමක් තියෙනවා ද කියලා. මම මේ ඉදිරිපත් කළේ, පළාත් සභා පාසල් විතරයි. මම ජාතික පාසල්වල කිසිම ගණනයක් ඉදිරිපත් කළේ නැහැ. මොකද අපි දන්නවා, කොළඹ කලාපය තමයි බස්නාහිර පළාත් සභාව

[ගරු මොහොමඩ් මුජිබුර් රහුමාන් ]

තුළ තියෙන විශාලම අධ්‍යාපන කලාපය. විශාල පාසල් ප්‍රමාණයක් තියෙනවා. ඒ වාගේම ගුරුවරුන් විශාල ප්‍රමාණයක් ඉන්නවා. නමුත් දිගින් දිගටම මේ ප්‍රාථමික අංශය මේ ගුරු හිඟය පියවීමට පහු ගිය කාලේ අපේ ඇහට තේරෙන එහෙම දෙයක් වුණේ නැහැ. හැමදාම උපදේශක කාරක සභාවට ඇවිල්ලා අපි ඔබතුමාටත් පෙන්නලා දීලා තියෙනවා. හැමදාම මම ලේකම්, අධ්‍යක්ෂකවරුන් එක්ක විවාද කරලා තියෙනවා. ඇයි මේ ප්‍රාථමික අංශයේ අධ්‍යාපනය නඟා සිටවන්නේ නැත්තේ? ඇයි මේක කරන්නේ නැත්තේ? ඇයි මේ ගුරුවරු දෙන්නේ නැත්තේ කියලා මම අහනවා. නමුත් ඒක හැමදාම ලියවිලිවලට පමණයි පහුගිය කාලේම සීමා වුණේ.

ඊළඟට ගරු මහ ඇමතිතුමනි, කොළඹ කලාපයේ තියෙන විශාලතම ප්‍රශ්නය තමයි මේ පාසල්වල තියෙන තදබදය. ඒ කියන්නේ විශාල ඉල්ලුමක් තියෙනවා. අපි දන්නවා, කොළඹ කලාපයේ අපි දැක්කොත් ජනප්‍රිය පාසල් හැටියට අශෝක විද්‍යාලය තියෙනවා, ඊළඟට සංඝමිත්තා බාලිකා විද්‍යාලය තියෙනවා, යශෝදරාව තියෙනවා, කන්නන්ගර විද්‍යාලය තියෙනවා, රත්නාවලිය තියෙනවා, ක්ලිෆ්ටන් බාලිකාව තියෙනවා. අපි මුස්ලිම් අයගේ පැත්තෙන් බැලුවොත් කහිරියා බාලිකාව තියෙනවා. ෆාතිමා බාලිකාව තියෙනවා. St. Anthony's එක තියෙනවා. ඩිලාසාල් එක තියෙනවා. මේ වාගේ ඉතාමත් ජනප්‍රිය පාසල් කිහිපයක් තියෙනවා. එතකොට විශේෂයෙන්ම දෙමව්පියෝ මේ ජනප්‍රිය පාසල්වලට ඉල්ලුම් කළාම, පහුගිය අවුරුදු දහයම තුළ මේ පාසල් නොලැබුණාම, මේ දෙමව්පියෝ ගිහිල්ලා කරන්නේ, එකම දේ තමන්ගේ ළමයාට ජනප්‍රිය පාසල් ලැබුනේ නැති හින්දා, අර අපි කලින් කථා කරලා හැමදාම කියන අර සිල්ලර කඩ වගේ තියෙන ජාත්‍යන්තර පාසල්වලට ගිහිල්ලා තමන්ගේ ළමයාව ඇතුළත් කරනවා. කොළඹ නගරය ඇතුළේ ජාත්‍යන්තර පාසල්වල අද ළමයි පන්දාහකට වැඩිය ඉගෙන ගන්නවා. විශේෂයෙන් ඔවුන්ට ප්‍රාථමික අංශයේ, තමන්ට පළමුවන ශ්‍රේණියේ ඉඩ ප්‍රස්ථාව ලැබෙන්නේ නැති හින්දා විශේෂයෙන්ම හුඟක්ම මධ්‍යම පාන්තික දෙමව්පියෝ අද පුරුදු වෙලා තියෙනවා, හොරට ලියාපදිංචි කරපු අර හොර බිස්නස්කාරයෝ පටන් ගත්ත පාසල්වලට ගිහිල්ලා ළමයි ටික දාන්න. අද කොළඹ නගරය ඇතුළේ පාසල් සියයකට වඩා ගෙවල් කුලියට අරගෙන එක එක ගොඩනැඟිලි කුළියට අරගෙන අද මේ වගේ ජාත්‍යන්තර පාසල් පටන් අරන් තියෙනවා. අපි දන්නවා. විශේෂයෙන්ම රජයට විවේචනයක් තියෙනවා. ආණ්ඩුව උසස් අධ්‍යාපනය පෞද්ගලිකරණය කරන්න උත්සාහ කරනවා කියලා. එහෙම ලොකු චෝදනාවක් තියෙනවා. අපි දන්නවා, විශ්ව විද්‍යාල සිසුන් පවා ඒ චෝදනාව එල්ල කරනවා. නමුත් මම දන්නේ නැහැ, සමහර විට ප්‍රාථමික අධ්‍යාපනයේ සිට ද්විතීක අධ්‍යාපනය දක්වා පෞද්ගලිකරණය කිරීමේ අරමුණක් තියෙන හින්ද ද දන්නේ නැහැ. රජය මේ පාසල් පිළිබඳව තීරණය ගන්නේ නැතුව ඉන්නේ ඇයි කියන ප්‍රශ්නය අද අපි ඉදිරියේ තියෙනවා. මේවා දැක්කත් නොදැක්කා වගේ යන ගමනක් තමයි අද අපිට දකින්න තියෙන්නේ. මේ පාසල් පිළිබඳ තීරණයක් ගන්නේ නැහැ. ඇයි මේ පාසල් මෙහෙම අරින්න දෙන්නේ?

ඒකත් එක්කම අනිත් පැත්තෙන් රජයේ පාසල් ටික, දෙමව්පියන්ගේ තියෙන විශේෂ ඉල්ලීම උඩ - එක්කෝ ඒ පාසල් ටික විශාල කරන්න. පන්ති කාමර වැඩි කරන්න එහෙම, පහුගිය කාලේම ක්‍රියාත්මක කළේ නැහැ. අපි දැක්කා හෝමාගම මහින්ද රාජපක්ෂ විද්‍යාලයේ එක සමාන්තර පන්ති 16 ක් තියෙනවා. ඔබතුමා දන්නවා ඇති. නමුත් කොළඹ කලාපය තුළ විශාල ඉල්ලීමක් තියෙනවා. පාසල් ලැබෙන්නේ නැතුව විශාල ප්‍රමාණයක් අද එළියට යනවා මේ ජනප්‍රිය පාසල්වල තියෙන තරගය උඩ. එහෙම නැතිනම් මේ තියෙන පාසලක්වත් අළුතින් හදන්න කියලා අපි කිහිප වතාවක්ම කලාප කාර්යාලයේදී යෝජනා කරලා තියෙනවා. එක පාසලක් අරගෙන හදන්න. මේක හදන්න. තියෙන පාසල්වලටම සම්පත් ටික දෙන්න එපා. අද මේ නගරයේ ජීවත්වන, වතුවල ජීවත්වන ළමයි තමයි මේ පළාත් සභා ඉස්කෝලවලට එන්නේ. ඔය ජාතික පාසල් කොළඹ නගරයේ තිබුණට, ඒ එක ජාතික පාසලකටවත් ඇතුළත් වෙන්න මේ කොළඹ නගරයේ ජීවත්වන ළමයින්ට අවස්ථාව ඉතා අඩුයි. ඉතාම සීමිතයි. ඒවාට හම්බ වෙන්නේ නැහැ. අද මේ බස්නාහිර පළාත් සභාවේ ඉතාම ප්‍රසිද්ධ පාසල් දෙකක් වන අශෝක විද්‍යාලය අපි ගත්තත් නගරයේ ළමයි යන්නේ ඉතා සීමිත ප්‍රමාණයයි. මරදානයේ ඉන්න, ඒ අවට ඉන්න ළමයින්ට පවා ඒ අවස්ථාව ලැබෙන්නේ නැහැ. ගරු මහ ඇමතිතුමනි, අශෝක විද්‍යාලයෙත් ඉතාම තදබල ප්‍රශ්නයක් මේක. මම දන්නේ නැහැ මේක කොහෙන් කෙළවර වෙයිද කියලා. පළමුවන ශ්‍රේණියට ළමුන් ගැනීමේ ප්‍රශ්නය අද තදින් තියෙනවා. අද තවම මේකට විද්‍යාත්මක විසඳුමක් ලැබිලා නැහැ. සියළු දෙනාටම එක හා සමාන අධ්‍යාපනය ලැබිය යුතුයි කියන ඒ සංකල්පය මම නම් හිතන්නේ, තවම අපට ක්‍රියාත්මක කර ගන්න බැරි වෙලා තියෙනවා.

ඒකත් එක්කම මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එතුමාගේ විෂයයක් හැටියට මම යොමු කරනවා, නීතිය හා සාමය. නීතිය හා සාමය මෙන්ම ඉඩම් විෂයය. ඔක්කෝම ඔබතුමාගේ විෂයයන් හැටියට එන්නේ. ඔබතුමා දන්නවා පහුගිය කාලේ මේ කොළඹ නගරයේ විශාල වටිනාකමින් යුත් ඉඩකඩම් විදේශ කොම්පැනිවලට පවරා දීමේ හා ඒ ඉඩකඩම් විදේශ කොම්පැනිවලට ලබා දීමේ ක්‍රියාවලියක රජය නිරත වෙලා ඉන්න බව. කොම්පඤ්ඤ වීදියේ විශේෂයෙන්ම මැලේ Street ඒකේ තියෙන අක්කර හතරාමාරක ඉඩම අද වෙන කොට ඉන්දියාවේ ටාටා කොම්පැනියට පවරා දෙන්න රජය ගිවිසුම් අත්සන් කරලා තියෙනවා. ඒ විතරක් නොවෙයි කොම්පඤ්ඤ වීදියේ Station Passage එකේ තියෙන අක්කර දෙකහාමාරක ඉඩම පකිස්ථානු Company යකට ද පවරා දීමට අද ආණ්ඩුව කටයුතු කරලා තියෙනවා. ඒ විතරක් නොවෙයි ගංගාරාම පන්සල ඉස්සරහා තියෙන, ඉස්සර අපේ Commercial Company යේ ඉඩම අද ඉන්දියානු Waters Edge සමාගමට රජය පවරලා දීලා තියෙනවා. මේ වගේ කොළඹ නගරයේ ආර්ථික අතින් ඉතාම වටිනාකම් ඇති ඉඩම් ටික අද විදේශීය සමාගම්වලට පවරලා දෙන්න ආණ්ඩුව කටයුතු කරලා තියෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම හිතනේන් මහ ඇමතිතුමා, දැනුවත් වෙලා ඉන්නැති 2010 දී කොළඹ කොම්පඤ්ඤ වීදියේ ඩියුස් වීදියේ ගෙවල් 17 ක් තිබුණු බව. ඒ ගෙවල් 17 ම අනවසර ගෙවල් නොවෙයි. ඒ ගෙවල් රජය විසින් කඩා ඉවත් කරලා ආරක්ෂක අමාත්‍යාංශයට අයත් පාසලට ඒ ඉඩම පවරා ගත්තා. ඊළඟට ඒ මිනිස්සු, ඒ ජනතාව ශ්‍රේෂ්ඨාධිකරණයේ නඩුවක් දැම්මා, තමන්ට සිදු වුණු අසාධාරණය පිළිබඳව. ඒ නඩු අංකය ඇවිල්ලා SC/FR 349/2010. ඒ නඩු අංකය යටතේ මේ නඩුව විභාග වෙන කොට 2011.05.11 දා මේ නඩුව විභාගයට ගත්තාහම එතකොට ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිසුරුවන් හැටියට හිටපු අගවිනිසුරු ශිරානි බණ්ඩාරනායක මැතිනිය, ඒකනායක මැතිතුමා, ඉමාම් මැතිතුමා මේ විනිසුරු තුන් මඩුල්ල ඉස්සරහ තමයි 2011 පස්වන මාසේ එකොළොස් වෙනිදා මේ නඩුව විභාගයට පත් වුණේ. ඒ වෙලාවේ මම උසාවියෙන් ලබා ගත්තා මේ වාර්තාව. එදා නාගරික සංවර්ධන අධිකාරිය ඇවිල්ලා උසාවියට කියනවා, ඒගොල්ලෝ කියනවා, LDSG for the respondent informs court that he has received instruction that a decision has been taken to construct houses at the new block of the Dematagoda Housing Scheme කියලා ඒගොල්ලෝ කියනවා. ඒ අය agree වෙනවා. දෙමටගොඩ තියෙන බේස්ලයින් පාරේ හදපු මිහිදු නිවාස පුරයෙන් මේ මිනිස්සුන්ට ගෙවල් දෙනවා කියලා, 2011.05.11 දා ශ්‍රේෂ්ඨාධිකරණයට ඇවිල්ලා නාගරික සංවර්ධන අධිකාරියේ නිලධාරීන් පොරොන්දුවක් දෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ජනාධිපතිතුමා අපේ මේ නිවාස සංකීර්ණය පසුගියදා විවෘත කළා. මම හිතන්නේ, චෝගම් එක ඉවර වෙලා දවස් දෙකකින්. ගරු සභාපතිතුමනි, මේ මිනිස්සු මේ ගෙවල් ගන්න ගියා නාගරික සංවර්ධන අධිකාරියට. ගියාම නාගරික සංවර්ධන අධිකාරියේ ඉන්න ඉහළ නිලධාරීන් මේ මිනිස්සුන්ට කියනවා. මේ මිනිස්සු පසුව මෝසමක් දාල මේ නඩුව ආයිත් නැවත ගන්නවා. ගන්න කොට මේගොල්ලෝ මෝසමෙන් ශ්‍රේෂ්ඨාධිකරණයට ඉදිරිපත් කරලා තියෙනවා, in inquiring for the said Prasanna Ranaweera has to the allocation of alternative houses from new housing complex to alter surprise and the dismay of the petitioners. We were informed that we would not be granted alternative accommodation from the set completed housing scheme as the UDA had received instructions from higher up not to allocated houses to the petitioners from the new housing complex.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි,ගරු මහ ඇමතිතුමනි, ඔබතුමා මේ රටේ මේ පළාත් සභාව තුළ නීතිය භාරව ඉන්න ඇමතිවරයා. අද ගරු අපේ ජනාධිපතිතුමා චෝගම් එක ඉවර වෙලා මගේ ළඟ තියෙනවා 2013 චෝගම් නිල නිවේදනය. ඒ නිල නිවේදනයේත් ඒක තැනක තියෙනවා, පොදු රාජ්‍ය මණ්ඩලීය නියෝජනය කරන රටවල්වල ජනතාවට නීතිය, සාධාරණත්වය ඉටු කිරීම පිළිබඳ රාජ්‍ය නායකයන් යළි ප්‍රතිඥා ලබා දුන්නා. එසේම ස්වාධීන හා කාර්යක්ෂම නීති පද්ධතියක් ක්‍රියාත්මක කිරීම පිළිබඳව රාජ්‍ය නායකයෝ මෙහිදී නැවත වරක් එකඟ වූහ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අතිගරු ජනාධිපතිතුමා මේ issue කරපු චෝගම් නිවේදනයේ තියෙනවා, නීතියේ සාධාරණත්වය සියලු දෙනාටම ලබා දෙනවා කියලා එදා චෝගම් එකේ අවසානයේදී එතුමා ප්‍රතිඥා දුන්න බවට. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඊට පහුවෙනිදා දවස් දෙකකට පස්සේ ජනාධිපතිතුමා ගියා ඒ මිහිඳු පුර නිවාස විවෘත කරන්න. ඒ නිවාස ටික විවෘත කරලා නිවාස ලැබුණේ කාටද? නිවාස ටිකක් දුන්නා පවුල් 200 කට. දෙමටගොඩ ආරාමය පාරේ, පර්චස් 2 ½ ක හිටපු උදවිය ගෙනල්ලා දැම්මා ඒකට.

[ගරු මොහොමඩ් මුජිබුර් රහුමාන් ]

ඊළඟට දෙමටගොඩ පොලිසිය ඉස්සරහ Railway ඉඩමක් තිබෙනවා. ඒ Railway ඉඩමේ ගෙවල් 230 ක් තිබෙනවා. පවුල් 230 ක්. Railway quarters කියලා කියන්නේ. Railway දෙපාර්තමේන්තුවේ වැඩ කරන උදවියගේ නිවාස සංකීර්ණය ඒක. ඒ නිවාස සංකීර්ණයේ තියෙනවා අක්කර දෙකහමාරක ඉඩමක්. ඒ අක්කර දෙකහමාරක ඉඩම Carlton Company ට ගන්න මේ නිවාස සංකීර්ණයේ හිටපු පවුල් 230 අරගෙන ගිහිල්ලා දැම්මා බේස්ලයින් පාරේ නිවාස සංකීර්ණයේ. (බාධා කිරීමක්) මේ පවුල් 17, 2010 ඉඳන් අවුරුදු තුනක් තිස්සේ ඉඳන් බලාගෙන ඉන්නවා. මේ ගොල්ලන්ට ගෙවල් නැහැ. ශ්‍රේෂ්ඨාධිකරණය පොරොන්දුවක් දුන්නා ගෙවල් දෙනවා කියලා. ගෙවල් දුන්නේ නැහැ. එහෙම නම් අද නිවාස හා නාගරික සංවර්ධන අධිකාරිය තියෙන්නේ, ජනාධිපතිතුමාගේ අමාත්‍යාංශය යටතේ. එතුමාගේ සහෝදරයා තමයි එහි ලේකම් හැටියට වැඩ කරන්නේ. එහෙම නම් මේ රටේ රාජ්‍ය නායකයා ජනාධිපතිතුමාගේ සහෝදරයා ශ්‍රේෂ්ඨාධිකරණයට දීපු පොරොන්දුව අද කඩකරලා තියෙනවා. එහෙම නම් අපි මේ රටේ නීතිය, සාධාරණත්වය බලාපොරොත්තු වෙන්නේ කාගෙන්ද? මේ මිනිස්සු සිටිය ගෙවල් අනවසර ගෙවල් නොවෙයි. මේ ගෙවල් නිත්‍යානුකූලව හිටපු ගෙවල් 2010 දී කඩලා එළියට දැම්මේ. ඒ මිනිස්සුන්ව එළියට දැම්මට පස්සේ, උසාවි යනවා. උසාවි ගිහිල්ලා නඩුවක් දැම්මට පස්සේ ශ්‍රේෂ්ඨාධිකරණයට ඇවිල්ලා කියනවා. අවුරුදු දෙකකින් අපි ගෙවල් දෙනවා. එතකන් ඔබලාට අපි කුලී දෙනවා කියලා. අවුරුදු දෙකක් කුලී දුන්නා. අවුරුදු දෙකකින් ගෙවල් ඉල්ලන්න ගියාට පස්සේ කියනවා උඹලට මේකේ ගෙවල් නැහැ. තව අවුරුදු දෙකක් කුලී ගෙවල්වල ඉන්න කියලා කියනවා. කොහාටද දැන් යන්නේ? දැන් ජිනීවා ගියොත් කියයි කුමන්ත්‍රණකාරයෝ. දේශද්‍රෝහියෝ. මේ රටේ ශ්‍රේෂ්ඨාධිකරණය ඉහළම අධිකරණය. ඒ අධිකරණයෙන් දෙන නියෝගය ක්‍රියාත්මක කරන්නේ නැහැ. ඒ නියෝගය උල්ලංඝනය කරලා තියෙන්නේ, මේ රටේ ප්‍රධාන පුරවැසියගේ අමාත්‍යාංශයෙන්. ඒකේ ලේකම් මේ රටේ ජනාධිපතිතුමාගේ සහෝදරයා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම ප්‍රධාන අමාත්‍යතුමාගෙන් ඉල්ලනවා. ඔබතුමා මේ පළාත් සභාව තුළ ප්‍රධාන අමාත්‍යවරයා හැටියට, ඔබතුමාගේ විෂයය මේක. ඔබතුමා වහාම මේකට මැදිහත් වෙන්න ඕනෑ. ඔබතුමාගේ පළාතේ ජීවත්වන අසරණ මිනිස්සුන්ට මේ අසාධාරණය සිද්ධ වුණේ. ඒ හින්දා ඔබතුමා මහ ඇමතිතුමා හැටියට වහාම මේ අසරණ පවුල් 17 - ඒගොල්ලෝ අවුරුදු අසූ ගණන්, අනූ ගණන් ජීවත් වුණු ඒ නිවාස කඩා දාලා අද ඒ මිනිස්සු රුපියල් 10,000 කට රුපියල් 12,000 කට ගෙවල්වල කුලීයට ඉන්නවා. ස්ථිර නිවසක් නැතිව අභිකුණ්ඨකයෝ වගේ අවුරුද්දෙන් අවුරුද්ද තැනින් තැනට ඒ මිනිස්සු යනවා. උසාවිය දීපු පොරොන්දුව අද ඉෂ්ඨ කරන්නේ නැහැ. ඒ හින්දා ඔබතුමාගෙන් මම ඉල්ලා සිටිනවා. ඔබතුමාගේ මාර්ගයෙන් මහ ඇමතිතුමාගෙන් ඉල්ලනවා. ඔබතුමාගේ පළාතේ ජීවත්වන අසරණ නිවාසලාභීන්ට මේ සිදු වූ අසාධාරණය පැහැදිලිව පෙනී පෙනී ශ්‍රේෂ්ඨාධිකරණයේ වුණු පොරොන්දුව පවා ඉෂ්ට කරන්න නාගරික සංවර්ධන අධිකාරිය ඇතුලු දේශපාලන නායකත්වය අද අපොහොසත් වෙලා තියෙනවා. ඔබතුමා මේකට මැදිහත් වෙලා අසරණ ජනතාවට සාධාරණත්වය ඉෂ්ට කරන්න කියමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

[අ.භා. 01.23]

**ගරු යසපාල කෝරළගේ**
Hon . Yasapala Koralage

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු ප්‍රධාන අමාත්‍යතුමාගේ වැය ශීර්ෂය යටතේ විශේෂයෙන්ම අධ්‍යාපන, පළාත් පාලන වැය ශීර්ෂය යටතේ කථා කරන්න අවස්ථාව ලබා දීම පිළිබඳව සතුටුවෙනවා. මුජිබුර් රහුමාන් ගරු මන්ත්‍රීතුමාගේ කථාව අවසානයේ එතුමා බොහෝම ආවේගශීලීව, සාධාරණත්වය ඉෂ්ට කර දෙන්න කියලා කථාව අවසන් කරන කොට, මම පෙන්වා දෙනවා එතුමාගේ සංඛ්‍යා ලේඛන පිළිබඳව පොඩ්ඩක් මීට වඩා අවධානය යොමු කරලා කථා කරනවා නම් බොහෝම හොඳයි කියන එක පිළිබඳව. මුලින්ම ශිෂ්‍යත්ව ප්‍රතිඵල පිළිබඳව ගරු මන්ත්‍රීතුමා කථා කළා. බස්නාහිර පළාතේ කොළඹ දිස්ත්‍රික්කයේ එහෙම නැත්නම් කොළඹ කලාපයේ ශිෂ්‍යත්ව ප්‍රතිඵල අඩු වෙලා කියලා. මම එතුමාගෙන් අහන්න කැමතියි. මේ සංඛ්‍යා ලේඛන කොයි ආකාරයෙන් ගත්ත ඒවාද කියලා. මොකද ශිෂ්‍යත්වයක් දෙනවා කියන ප්‍රතිඵලය අපි නිර්ණය කළේ, ඒ ශිෂ්‍යාධාර දෙන්න පුළුවන් ප්‍රමාණය මත. ඔබතුමාගේ අවධානයට යොමු කරනවා මම ගරු සභාපතිතුමනි, පහ වසර ශිෂ්‍යත්ව ප්‍රතිඵල පද්ධතියක් වශයෙන් ලකුණු 70 ට වඩා වැඩි දරුවන් අරගත්ත ආකාරය බැලුවාම, 2008 දී 43.87 % ක් තිබ්බ ප්‍රතිඵලය, 2013 වන

කොට 71.74 % දක්වා ඉහළ නංවන්න පුළුවන්කමක් ලැබුණේ වර්තමාන මහ ඇමතිතුමාගේ සංකල්ප සහ වැඩ පිළිවෙළ මත මේ දියත් කරපු දැවැන්ත වැඩ සටහනත් එක්ක. ඒවා නිකම් ආවා නොවෙයි. අවුරුදු 30 ක් තිබුණු යුද්ධය අවසන් කළේ අතිගරු ජනාධිපතිතුමා ඇතුළු ත්‍රිවිධ හමුදාව විවිධ නම්වලින් මෙහෙයුම් ක්‍රියාත්මක කරලා. එදා රිවිරැස කිව්වා. ජනබලය කිව්වා. ජය සිකුරුයි කිව්වා. මේ වගේ විවිධ ආකාරයේ නම් වලින් ඒ බලවේග ක්‍රියාත්මක කරලා තමයි යුද්ධය අවසන් කළේ. ඒ වාගේම අධ්‍යාපනයේ තිබුණු කඩතොළු වසා දමලා සියලුම පළාත් සභා මන්ත්‍රීවරුන්ට ආණ්ඩු පක්ෂයේ, විපක්ෂයේ මන්ත්‍රීවරුන්ට තමන්ගේ බල ප්‍රදේශයේ අධ්‍යාපනය පිළිබඳව පළාත් පාලනය පිළිබඳව කොන්ද කෙළින් තියාගෙන ආයතනවලට ගිහිල්ලා කැපී පෙනෙන මන්ත්‍රීවරයෙක් වශයෙන් වැඩ කරන්න පුළුවන් වුණේ, ගරු මහ ඇමතිතුමා ඇති කරපු අලුත් සංකල්පවල ප්‍රතිඵලයක් නිසා කියන එක කවුරුත් අවිවාදයෙන් පිළිගන්න ඕනෑ කියන එකයි මම විශ්වාස කරන්නේ. අපි දැක්කා, සුපසන් නිම්තෙර කියලා වැඩ සටහන් ක්‍රියාත්මක කරලා ළමා මිතුරු සංකල්පය කියලා වැඩ සටහන් ක්‍රියාත්මක කරලා. කලාප කාර්යාල බල ගන්වලා කොට්ඨාශ කාර්යාල බල ගන්වලා මේ විවිධ ක්ෂේත්‍රවලින් ඇතුල් වෙලා තමයි මේ ප්‍රතිඵල ඉස්සරහට ගෙනි යන්න අපට පුළුවන්කමක් ලැබුණේ. ඒක නිසා අපට පුළුවන්කමක් ලැබුණා. අපේ කොට්ඨාශවල ආණ්ඩු පක්ෂයේ, විපක්ෂයේ මන්ත්‍රීවරු එකම මේසයක වාඩිවෙලා කලාප අධ්‍යාපන අධ්‍යක්ෂක, කොට්ඨාශ අධ්‍යාපන අධ්‍යක්ෂක ඇතුළු සියළු නිලධාරින් එකරාශි කරගෙන අපේ කලාපවල යම්කිසි ප්‍රගතියක් ඇති කරන්න. අපි අවිවාදයෙන්ම ගත්තා වූ තීන්දු හා තීරණ මත, බස්නාහිර පළාත් සභාවේ වර්තමානයේ ගත්තා වූ තීන්දු මත පාසල් පද්ධතියේ සැබෑ වෙනසක් කරන්න අපිට පසුගිය කාලේ පුළුවන් වුණාය කියන එක අපි ඉතාමත් ආඩම්බරයෙන් කියනවා.

ඒ නිසා තමයි අපට පුළුවන්කමක් ලැබුණේ පසුගිය අවුරුද්දේ බස්නාහිර පළාතේ පාසල් අතර තරගයේදී හොඳම පාසල් දෙකක් හොරණ කලාපයේ, හොරණ කොට්ඨාශයෙන් තෝරා ගන්න. ශිෂ්‍යත්ව ප්‍රතිඵල බැලුවායින් පස්සේ කළුතර දිස්ත්‍රික්කයේ පළමුවෙනියා, තුන්වෙනියා, පස්වෙනියා මේ වාගේ සියලු ජයග්‍රහණ එකම පාසලක ජයග්‍රහණය කරන්නත් - කුළුපන කියන ප්‍රාථමික විද්‍යාලය එදා වහපු විද්‍යාලයක්. අද අපට පුළුවන් වුණා, මේ පාර කළුතර දිස්ත්‍රික්කයේ පළමුවෙනියා, තුන්වෙනියා, පස්වෙනියා තෝරන පාසල බවට පත් කරන්න. ඒ විතරක් නොවේ බස්නාහිර පළාතේ වැඩිම ශිෂ්‍යත්ව ළමුන් සංඛ්‍යාවක් ඉහළට ඔසවා තැබූ පාසල වශයෙන් තෝරා ගත්තේ, හොරණ තක්ෂිලා ප්‍රාථමික විද්‍යාලය. එතකොට මේ පාසල් මේ ආකාරයෙන් දියුණු කරන්නත්, වසා දමා තිබුණු පාසල් නැවත ස්ථාපිත කරලා 2009 අවුරුද්දේ එකම දරුවෙක්වත් ඇතුළත් නොවුණු හොරණ කලාපයේ ගුරුගොඩ කණිෂ්ඨ විද්‍යාලයට දරුවන් ඇතුළත් කිරීමට ජනප්‍රිය පාසලක් බවට පත් කරන්න අද අපට පුළුවන්කමක් ලැබුණේ, මේ ගෙනියන දැවැන්ත වැඩ සටහනේ ප්‍රතිඵලයක් වශයෙන් කියන එකයි මම ආඩම්බරයෙන් කියන්න ඕනෑ. ඒ නිසා අපි දැක්කා පසුගිය කාල සීමාව තුළ දී ඒ විවිධ නම්වලින් ආපු වැඩ සටහන් පිළිබඳව.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගුරුවරු පිළිබඳව කථා කරනවා. අපි ගුරුවරු වශයෙන් වැඩ කරපු අය. අපි මේ යුගයේදී දැක්කා, සැබෑ වෙනසක් මේ ගුරු පද්ධතිය තුළ කරන්න පුළුවන් බව. ප්‍රාථමික අංශයේ ගුරුවරු මේසා විශාල සංඛ්‍යාවක් සැබෑ පුහුණු ගුරුවරුන් බවට පත් කරන්න, ක්‍රමවේද හැදුවේ මේ පළාත් සභාවේ කියන ඒක නම් අමතක කරන්න එපා. පසුගිය සෙනසුරාදා මට පුළුවන් වුණා, හොරණ කලාපයේ ගුරුවරුන් 1,200 කගේ පුහුණුව අවසන් කරන්න. පුහුණුව අවසන් කිරීමේ උත්සවය එහි තිබෙන ප්‍රධාන පෙළේ ව්‍යාපාරික ආයතනයක් අනුග්‍රාහක දායකත්වය ලබා දීලා, ගුරුවරු 1,200 ම Body Line කියන ආයතනයේ ඒක තැනක වාඩි කරවලා, විශේෂ දේශන සඳහා මහත්වරු ගෙන්නලා ඒ අයට සියලු සංග්‍රහ කරලා, ඒ අවස්ථාවේදී විසිර යෑමේ උත්සව වේලාවේදී අර අපේ මන්ත්‍රීතුමා කිව්වා වාගේ ගුරුවරු පුහුණුව අවසන් කරලා ගියේ පුදුමාකාර වින්දනයකින්. පුදුමාකාර සතුටකින්. ඒ ආකාරයේ වැඩ පිළිවෙළක් කරන්න පටන් ගත් අවස්ථාවේදී අපි දැක්කා, ගුරු පුහුණුව පටන් ගත්තු දවසේ අපේ හොරණ කලාපයේ කලාප අධ්‍යක්ෂකතුමියට, කොට්ඨාශ අධ්‍යක්ෂකතුමියට ඒ කැරලිකරුවන් සමඟ රණ්ඩුවෙන්න සිද්ධ වුණා. විශාල අරගලයක් කරන්න සිද්ධ වුණා. ඒ අරගලයේ ප්‍රතිඵලයක් වශයෙන් පුහුණුව ආරම්භ කරලා විසිර යෑමේ උත්සවයකදී ඒ ගුරුවරු පෙරළා ප්‍රශංසා කරන කොට අන්න තේරුම් ගත්තා ඇත්ත කථාව මොකද්ද කියන ඒක පිළිබඳව. විශාල මුදලක් දීලා, විශාල ශ්‍රමයක් පාවිච්චි කරලා මේ පුහුණුවේ ප්‍රතිඵලය ගුරුවරු සැබැවින්ම දැක්කා. ඒවා ලැබෙන්නේ දැන් තමයි. ඒ ගුරු පුහුණුවේ

[ගරු යසපාල කෝරළගේ ]

ප්‍රතිඵල එන්නේ දැන් තමයි. අපි විශ්වාස කරනවා, 2008 දී 43.08 % ක් තිබුණු ශිෂ්‍යත්ව ප්‍රතිඵල, 2013 වන කොට 71% ක් ගෙනාපු ප්‍රතිඵල, මේ පුහුණුවීම්වල ප්‍රතිඵල වශයෙන් 2014 වන කොට 80 % ට එහා පැත්තට ගෙන යන්න හැකියාවක් ඇති වන පළාත් සභාවක් කියන එක අපි භය නැතිව ප්‍රකාශ කරනවා. දැන් මේ වැඩ පිළිවෙළක් එක්ක ගිය, මේ වැඩ සටහන් එක්ක ගිය ඒවත් එක්ක තමයි සියලු ආයතන ලස්සන වුණේ.

තමුන්නාන්සේලාට කියන්න ඕනෑ. එදා පාසල් යන්න මේ ඉන්න සියලු මන්ත්‍රීවරු බොහෝම අකමැති වෙන්න ඇති, එදා පළවෙනි ශ්‍රේණියේ පන්තියට ගිය ආකාරය සිහිපත් කළාම. අම්මා පන්තියට ගිහිල්ලා දාන කොට අම්මාගේ අතේ එල්ලීලා ගේට්ටුවට දුවගෙන ආපු අපි. තාත්තා ඊළඟ දවසේ ගිහිල්ලා සැර කරලා නැවැත්තුවාම ගේට්ටුවට දුවගෙන ආපු අපි. අද දරුවෝ එහෙම නැහැ. අද දරුවෝ අවුරුදු තුනේ ඉඳන් කෑ ගහනවා පාසල් යන්න ඕනෑ කියලා. ඒක නිර්මාණය වුණේ කොහොමද? පෙර පාසල් පද්ධතිය සකස් වෙච්ච නිසා. පෙර පාසල් ප්‍රඥප්තියක් හරි ගස්සවලා, පෙර පාසල් වැඩ පිළිවෙළක් හරි ගස්සවලා, පෙර පාසල් ගුරුතුමීය පෙර පාසල අලංකාර ලෙස දරුවන්ට ඉතාමත්ම ප්‍රිය ඇති වන ආකාරයට සකස් කරලා තියෙනවා. ලස්සනට සිංදු කියලා, ලස්සනට නැටුම් නටලා, අවුරුදු තුනක් වයස දරුවා අවුරුදු හතරක් වයස දරුවා පෙර පාසලට භාර දුන්නට පසේස් පෙර පාසල් වේදිකාවේ අවුරුදු පහේ රංගන ඉදිරිපත් කරන කොට, ඊට බාල අවුරුදු තුනේ දරුවා එළියේ ඉඳන් ඒ නැටුම් බලාගෙන රංගන ඉදිරිපත් කරනවා, අපි දැකලා තියෙනවා. දරුවා එතැනින් ආස වුණේ පාසල් යන්න. එතැනින් ආස වුණේ තමන්ගේ වැඩ තමන් කර ගෙන යන්න. ඒ ආශාවෙන් එළියට ආපු දරුවෝ, රජයේ පාසලට ගියහම - රජයේ පළමුවන පන්තියේදී එදා අපි දැක්කේ දරුවන්ට අප්‍රසන්නතාවයක් පත් වෙලා තිබුණා. අර වගේ ආශාවකින් පාසල් ජීවිතය ආරම්භ කරන්න, පාසලට ආදරය කරන්න සකස් කරපු දරුවෝ, රජයේ පාසලට යැව්වට පස්සේ රජයේ පාසල කහළ ගොඩක් වාගේ වුණා නම්, රජයේ ගුරුවරු පුහුණුවක් නැතුව යක්කු වගේ වුණා නම්, මම වැරදි වචනයක් කියනවා වෙන්න පුළුවන්. එහෙම වුණා නම් මේ පාසල් මේ තත්ත්වයේ ගෙනි යන්න වෙන්නේ නැහැ. ඒක නිසා තමයි රජයේ පාසල් පද්ධතියක් වර්තමාන මහ ඇමතිතුමාගේ එක් එක් අදියර සහ තිබුණු සංකල්පත් එක්ක දරුවන්ට ආසා කරන, දෙමව්පියන්ට ආස කරන පාසල් පද්ධතියක් බවට පත් කරන්න පුළුවන් වුණේ කියලා මා ප්‍රකාශ කරනවා. ඒක නිසා අද රජයේ පාසලක පළමුවන ශ්‍රේණියට, දෙවන ශ්‍රේණියට ගිහිල්ලා බලන්න. පාසල් අතර තරඟයක් ඇති කරලා විදුහල්පති භූමිකාව ලස්සනට සකස් කරලා ඉතාමත්ම දැවැන්ත වැඩ සටහනක් කර ගෙන යනවා. මේ වැඩ සටහන පිටිපස්සේ ගරු මහ ඇමතිතුමාට අපි මන්ත්‍රී මණ්ඩලයට විශාල ශක්තියක් දුන්නා. පසුගිය කාලේ අපි දැක්කා හිටපු ප්‍රධාන අමාත්‍ය ලේකම්තුමිය දැන් ප්‍රධාන ලේකම්තුමිය, ප්‍රධාන අමාත්‍ය ලේකම්තුමා, සහකාර ලේකම්තුමා දැන් පළාත් සභා අධ්‍යාපනය අධ්‍යක්ෂකතුමා මේ දැවැන්ත වැඩ සටහනට මුදල් ලබා දුන්නා. අපේ ප්‍රධාන ගණකාධිකාරතුමා ඇතුළු නිලධාරි මණ්ඩලය පුදුමාකාර සහයෝගයක්, පුදුමාකාර කැප වීමක් අපි මේ ගෙන යන වැඩ සටහනට ලබා දුන්නා. අපි ඒ සියලුදෙනා සිහිපත් කරනවා. මේ අවස්ථාවේදී ස්තුතිවන්ත වෙනවා. ඒ විතරක් නොවේ පළාත් පාලන ආයතන පිළිබඳව කථා කරන්න වෙලාව මදී. නමුත් කියන්න ඕනෑ. අද මේ අවස්ථාව වන කොට පළාත් පාලන ආයතනවල සියලු සභාපතිවරු - ගරු ප්‍රධාන අමාත්‍යතුමා ගන්නා වූ තීන්දු හා තීරණ මත ඉතාමත් පැහැදිලිව මම ඊයේ කථාවේදී කිව්වා ගරු ප්‍රධාන අමාත්‍යතුමා ගෙන යන වැඩ සටහනක් එක්ක එතුමාට සහයෝගය දෙන්න, එතුමාට ආශිර්වාද කරන්න කළුතර දිස්ත්‍රික්කයේ ඉන්න සියළුම පළාත් පාලන සභාපතිවරු සූදානමින් ඉන්නවා කියන ප්‍රකාශ කරමින් මේ වැඩ සටහන තව තවත් සාර්ථක කරන්න ඔබ අප සියලුදෙනාටම ශක්තිය ධෛර්යය, වාසනාව ලැබේවා කියලා ප්‍රාර්ථනා කරමින් මම නිහඬ වෙනවා. බොහෝම ස්තුතියි.

[අ.භා. 01.34]

**ගරු එම්. ෂාෆි රහීම්**
Hon. M Shafi Raheem

බිස්මිල්ලාහිර් රහ්මානිර් රහීම්. ගරු ප්‍රධාන අමාත්‍යතුමාගේ මුදල් හා ක්‍රම සම්පාදන නීතිය හා සාමය ඉඩම්, අධ්‍යාපන, පළාත් පාලන විෂය සම්බන්ධව කථා කිරීම ගැන මම මුලින් ස්තුතිවන්ත වෙනවා. අද වර්තමාන ප්‍රධාන ඇමතිතුමාගේ වැඩ පිළිවෙළ ගැන අපි මේ සභාවේ දී කථා කරන්න අවශ්‍යතාවය පැන නැඟිලා තියෙනවා. ඒ හින්දා ශ්‍රී ලංකා මුස්ලිම් කොන්ග්‍රසය නියෝජනය කරන මන්ත්‍රීවරයෙක් වශයෙන් අද ගම්පහ දිස්ත්‍රික්කයේ, මුස්ලිම් පාසල්වල වැඩ

පිළිවෙළ ගැන කථා කරන විට එතුමා මුස්ලිම් පාසල්වලට අවශ්‍ය ගොඩනැගිලි ලබා දීලා තියෙනවා. මම හිතන්නේ, දැනටම නව ගොඩනැගිලි කිහිපයක් ආරම්භ කරලා දැන් ඒ ගොඩනැගිලිවල ඉදිරි වැඩ කොටස නිමා කිරීම ගැන මම ඇහින් දකිනවා. නමුත් මේ අවස්ථාවේදී මම ගරු ප්‍රධාන අමාත්‍යතුමාට ස්තුතිය පළ කරනවා. ඒ වාගේම මේ සභාවේ කථා කළා කොළඹ පාසල් අවට තියෙන අධ්‍යාපන ශිෂ්‍යාවගේ සමස්තය ගැන කථා කරන කොට ගම්පහ දිස්ත්‍රික්කයේ මම මුස්ලිම් පාසල්වල තියෙන අඩු පාඩු, ඒ කියන්නේ මුස්ලිම් ජනතාවගේ අධ්‍යාපන ක්ෂේත්‍රයේ අඩුපාඩු කිහිපයක් තියෙනවා. ගරු ප්‍රධාන ඇමතිතුමනි, ඔබතුමා ගොඩනැගිලි දීලා තියෙනවා.

ඒ වාගේම අවශ්‍ය අඩුපාඩු කිහිපයක් දීලා තියෙනවා. නමුත් අපට අවශ්‍ය වෙන්නේ, ඉදිරි පරපුරට අපේ දෙමව්පියන්ට අධ්‍යාපනය ගැන අත්‍යවශ්‍ය පැහැදිලි කිරීමට අපට මුදල් ටිකක් වෙන් කරලා දෙන්න. දෙමව්පියන් ළමයි හදා වඩා ගත්තත් අධ්‍යාපන ක්ෂේත්‍රයේ දුර්වලතා මම දකිනවා. ඒ උනන්දුව දෙමව්පියන්ට නැහැ. පාසල් යැව්වට ගෙදරදී ළමයින්ට දෙන්න ඕනෑ දේ හරියට නිසියාකාරව ලබා දීමේ, දුර්වලතාවය 90% ක් වනවා. ඒ ප්‍රතිශතය මම හොඳටම දැක්ක නිසා ඒ අත්දැකීම තියෙන නිසා මේ අවස්ථාවේදී මම ඉල්ලා සිටිනවා. දෙමව්පියන්ට අධ්‍යාපනය ගැන දැනුවත් කිරීමේ වැඩ සටහන අපි පාසල්වල අනිවාර්යයෙන්ම කළ යුතුයි. ඒ කියන්නේ, මෙදා පාර මීරිගම ආසනයෙන් අපේ ළමයි විශ්ව විද්‍යාලවලට යන සංඛ්‍යාව බලන කොට ශිෂ්‍යාවන් 67 ක් ගිහිල්ලා තියෙනවා. එක් ශිෂ්‍යයෙක් විතරක් තේරී පත් වෙලා තියෙනවා. ඒකෙදී අපිට තේරුම් ගන්න පුළුවන් ශිෂ්‍යාවන් වැඩිපුර 66 ක් යන්න පුළුවන් නම් පිරිමි පුතෙක් එක්කෙනෙක් තමයි තේරෙනවා කියන ඒක ලොකු අඩු පාඩුවක් මෙතන තිබෙන බව අපිට බලා ගන්න පුළුවන්. ඒ වගේම තමයි මේ ඉදිරියට අපේ ගම්පහ දිස්ත්‍රික්කයේ තියෙන පාසල්වල දියුණුව සඳහා මහ ඇමතිතුමාගෙන් අපි සාකච්ඡා කරලා එහේ තිබෙන අඩුපාඩු ටික අපිට කරලා දෙයි කියලා. අපට විශ්වාසයක් තියෙනවා. මහ ඇමතිතුමා කිසිදාවත් ජාති භේදයක් බලන්නේ නැහැ, කාටවත් අඩු සැලකිල්ලක් දක්වන්නේ නැහැ. එතුමාගේ අමාත්‍යාංශයේ දෙන හැම දෙයක්ම ඒ පාසලට ලබා දීලා තියෙනවා. නමුත් අඩුපාඩු කිහිපයක් තියෙනවා. නමුත් එතුමාට පුළුවන් ප්‍රමාණයට එතුමා කරලා තියෙනවා. ඒකටත් මම ස්තුතිය පළ කරන අතර මේ ඉදිරි කාලයේ 2014 තුළ මම ඉල්ලපු දෙමාපියන් දැනුවත් කිරීමේ වැඩ සටහන සඳහා අපිට හැම පාසලකටම මුදල් වෙන් කරලා දීලා, ඒ දෙමව්පියන්ව දැනුවත් කරමින් ළමයින්ව කොහොමද අධ්‍යාපන ක්ෂේත්‍රයේ ඇතුළත් කර ගෙන ඉදිරි කාලය තුළ කටයුතු කරමින් - අනිත් ඒක තමයි අපේ ගම්පහ දිස්ත්‍රික්කයේ තියෙන සමහර ප්‍රශ්න අද මේ කටාන ආසනයේ කටුනායක ඇවරිවත්ත ප්‍රදේශයේ කෝලාහලයක් ඇති වෙලා තිබෙනවා. නමුත් ඒක දිගින් දිගට ඒ ප්‍රශ්නය ඇති වී ගෙන තිබෙනවා. නමුත් මහ ඇමතිතුමා මේකේදී මැදිහත් වෙලා, ඒ ප්‍රශ්නය සමතයකට පත් කර දෙන්න කියමින් මම මේ අවස්ථාවේදී සභාපතිතුමා හරහා ඉල්ලුම් කරනවා. ඒ වාගේම පෙර පාසල්වල තිබෙන සමීක්ෂණයට යන කොට දෙමළ මාධ්‍ය දන්නේ නැති සමහර අය යනවා. සමහර ප්‍රශ්න කටින් කට ගිහිල්ලා ප්‍රශ්න දුර දිග යන අවස්ථාවල් උදා වෙලා තියෙනවා. එම නිසා පෙර පාසල්වලට සමීක්ෂණයට යවන කොට දෙමළ මාධ්‍ය දන්න කට්ටිය බඳවා ගත්තා. ඒ පෙර පාසල්වලට යවන පරීක්ෂක කට්ටිය සඳහා දෙමළ මාධ්‍යයෙන් කිහිපදෙනෙක් බඳවා ගෙන කටයුතු කරනවා නම් වඩා සුදුසු කියලා මම කියමින් මගේ වචන ස්වල්පය මෙතනින් අවසන් කරනවා.

[අ.භා. 01.40]

**ගරු මොරිස් විජේරත්න**
Hon.Morice Wejerathna

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, බස්නාහිර පළාතේ අපේ ප්‍රධාන අමාත්‍යතුමාගේ, අමාත්‍යාංශය යටතේ සිදු කරපු කාර්යය භාරය සම්බන්ධව වේලාව ලබා දීම සම්බන්ධව ස්තුතිය පුද කරනවා. අපි 2009 දී පළාත් සභා මන්ත්‍රීවරයෙක් හැටියට පත් වෙලා එන කොට මම මොරටුව ගැන කථා කරන්නම්. මොරටුවට කලාපයටම ගුරුවරු 144 ක් අඩු වෙලා තිබුණා. ඒ කියන්නේ දෙහිවල, රත්මලාන, ගල්කිස්ස, පිළියන්දල, මොරටුවට. මොරටුවට විතරක් 2009 වන කොට ගුරුවරු 209 ක අඩු පාඩුවක් වෙලා තිබ්බා. අපේ ගරු මහ ඇමතිතුමාගේ නායකත්වය යටතේ අපි මේ ගැන කරුණු පෙන්නලා දීලා, අද වෙන කොට ගුරු අඩුපාඩු අවමයකට 10 කට නැත්නම් 15 කට අඩු මට්ටමකට ගෙනැවිත් අපි මොරටුවේ අධ්‍යාපන තත්ත්වය ඉහළ නංවලා තියෙනවා. මොරටු අධ්‍යාපන ක්‍රමය තුළ

[ගරු මොරිස් විජේරත්න ]

සාමානය පෙළ, උසස් පෙළ සහ ශිෂ්‍යත්ව විභාග ප්‍රතිඵලත් එක්ක බලන්න ගියාම, අපි බස්නාහිර පළාතෙන් හිටියේ 34 වන ස්ථානයට. (බාධා කිරීමක්)

අනික් පැත්තට තමයි භෞතික සම්පත් බොහෝම අඩුවෙන් තිබුණේ. අඩක් නිම කරපු ගොඩනැගිලි සහ ගොඩනැගිලි අවශ්‍යතාවය විශාල වශයෙන් මොරටුවේ පේන්න තිබුණා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද වන කොට අපිට අඩක් නිම කරපු ගොඩනැගිලි 80% ක් විතර ඉවර කරන්න පුළුවන් හැකියාව ලැබිලා තිබෙනවා. තවත් සුළු වැඩ ටිකක් තියෙනවා. අවශ්‍යතාවය තියෙන්නේ අළුතින් ගොඩනැගිලි දෙකක් රාවතාවත්ත මෙතෝදිස්ත විද්‍යාලයට සහ මොරටු මහ විද්‍යාලයට තෙමහල් ගොඩනැගිලි දෙකක්. අපි පළවෙනි මහලේ වැඩ අවසන් කරලා තියෙනවා. මේ වාගේ විශාල වැඩ කොටසක් අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ කටයුතු කරන්නට අපට ඉවහල් වුණේ, විශේෂයෙන්ම අපේ මහ ඇමතිතුමාගේ තිබුණු ඒ ක්‍රියා කලාපයන් තුළ. මොකද, නායකයෙක් කියලා කියන්නේ, තමන්ගේ සංකල්ප හඳුන්වලා දෙමින්, ඒ සංකල්ප ඔස්සේ තමන්ගේ ජනතාවට තමන්ගේ ප්‍රදේශයට, තමන්ගේ පළාතට වැඩක් කරන්න පුළුවන් නායකත්වයක් ලබා දීම තුළින් කියලයි මම දකින්නේ. මේ තරම් විශාල වැඩ කොටසක් දැක්කේ පළවෙනි වතාවට අධ්‍යාපන අමාත්‍යාංශ ප්‍රධාන අමාත්‍යතුමාගේ උපදේශ කාරක සභාවට පැමිණි වෙලාවේ. එතුමා ඒ අධ්‍යාපන උපදේශක කාරක සභාව හසුරවන ආකාරයට අපි නවක මන්ත්‍රීවරු හැටියට ගොඩක් දේවල් අපි ඉගෙන ගත්තා. අධ්‍යාපනය ගැන ගොඩක් ඉගෙන ගත්තා, මොන ආකාරයට ද වැඩ කටයුතු කරන්නේ කියලා. අපි ගමේ තියෙන, කොට්ඨාශයේ තියෙන අඩුපාඩුකම්, තොරතුරු සොයා ගෙන ආවා. තොරතුරු සොයා ගෙන ඇවිල්ලා ඒ අවශ්‍ය කරන වැඩ කටයුතුවලට ඒ තොරතුරු දුන්නාම අපට කාලයක් යද්දී වසර දෙකක්, තුනක් යද්දී, ඒ නිවැරදි ක්‍රමය තුළට අධ්‍යාපන ක්ෂේත්‍රය ගෙන්න පුළුවන් වුණේ, අපේ මහ ඇමතිතුමාගේ තිබුණු ඒ පිරිපුන් නායකත්වය තුළයි. බස්නාහිර පළාතට ලබා දී තිබුණු සුවිශේෂ නායකත්වය තුළ කියන ඒක අපි මේ අවස්ථාවේදී අපි ඉතාමත් පැහැදිලිවම කියන්න ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම මේ අවස්ථාවේදී තව එකක් කියන්න ඕනෑ. අපි අධ්‍යාපනය පැත්තෙන් ඉදිරියට යද්දී, අපිත් එක්ක සමානව බස්නාහිර පළාතේ ගමන් කරන එකක් තමයි ක්‍රීඩාව කියන්නේ. මම හිතනවා මගේ අදහස හැටියට, අත්දැකීම් හැටියට අධ්‍යාපන අමාත්‍යාංශයක් එක්ක, ක්‍රීඩා අමාත්‍යාංශයත් එකට යන්න ඕනෑ කියලා. මොකද අධ්‍යාපනය තුළ තමයි යම් කිසි වැඩ කොටසක් ක්‍රියාත්මක වෙන්නේ. අද ක්‍රීඩා අමාත්‍යාංශය නිශ්චිත වැඩ පිළිවෙළක් නැතිව - මොකද, ක්‍රීඩාවේ ක්‍රීඩකයින් බිහිවන තෝතැන්න වෙන්නේ, මූලික තැන ලැබෙන්නේ පාසලට. ඒ පාසල අවශ්‍ය කරන තාක්ෂණය සහ මෙවලම් ලබා දෙන්න අවශ්‍ය කටයුතු කළේ නැත්නම් අපේ ජාතික මට්ටමට, දකුණු ආසියාතික මට්ටමට ආසියානු මට්ටමට යන්න ක්‍රීඩකයින් බිහිවීම බොහෝම අවම මට්ටමකට පත් වෙලා තියෙනවා. මෙන්න මේ හරහා තමයි මම හිතන්නේ, ක්‍රීඩා අමාත්‍යාංශය - අපේ ප්‍රධාන අමාත්‍යතුමා ඉදිරියේ මේ අවසන් අයවැය කථාව කරන මොහොතේ ප්‍රකාශ කරන්නේ, ක්‍රීඩා අමාත්‍යාංශය ප්‍රධාන අමාත්‍යාංශය යටතට අරගෙන, ප්‍රධාන අමාත්‍යතුමාට බස්නාහිර පළාතේ දරුවන් වෙනුවෙන් ක්‍රීඩාව පැත්තෙන් සකලවිධ කටයුතු කරන්න පුළුවන් කියලා මම විශ්වාස කරනවා.

ඒ වාගේම තමයි මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපගේ පළාත් පාලන ආයතනවල මේ වන කොට විශාල වශයෙන් යම් යම් දේවල් සිදු වෙමින් පවතිනවා. පළාත් පාලන ආයතනවල ඡන්ද විමසීම්වලදී පරාජයට පත් වෙලා තිබෙනවා. මේවා යම්කිසි කාල සීමාවක් තුළ, කාලයක් තිස්සේ ගොඩනැගෙමින් එන ප්‍රශ්න. මේ ව්‍යවස්ථා සංශෝධනයත් එක්ක තමයි මේ අර්බුධ මතු වුණේ. මොකද අපි දන්නවා, ගොඩක් තැන්වල මූලික වශයෙන්ම නගරාධිපතිවරුන්, සභාපතිවරුන් කටයුතු කරන්නේ තමන්ට සුදුසු පරිදි තමන්ගේ කණ්ඩායමත් සමඟ එකට කටයුතු කරන්න නොනවයි. ඒ නිසා සම්පත් සමානව බෙදා දීලා ඒ ආකාරයට තමන්ගේ නායකත්වයේ ප්‍රතිඵලය හරියට සියලු දෙනාටම ලබා දෙනවා නම්, මම හිතනවා අද වන කොට උද්ගත වෙලා තිබෙන තත්ත්වයන් ඇති වෙන්නේ නැහැයි කියලා. මොකද, බහුතර මන්ත්‍රීවරු දූෂණයට, වංචාවට විරුද්ධයි. ඒ විරුද්ධකම තියෙද්දීත් අර කලින් දීලා තිබෙන බලතල එක්ක අරගෙන ගියොත් ඒකමතිකව අරන් ගියොත් අයවැය පරාජයට පත් වුණත්, ඒ සභාපතිවරයාට, නගරාධිපතිටවත් ඉදිරියට යාමේ හැකියාව තිබ්බා. ඒ එක්කම මම දකිනවා, පළාත් සභාව තුළින් මේ වැඩ කටයුතු දැන් තියෙන ඒකට වැඩිය වැඩ කරන්න පුළුවන්. මේ ගැන Monitor කරන්න පුළුවන්. සොයා බලන්න පුළුවන්. ලබන වර පවත්වන පළාත් සභාවේදී හරි පළාත්

පාලන ආයතනවල ඒ සභාපතිවරුන්, නගරාධිපතිවරුන්ගේ ක්‍රියාකාරිත්වය සම්බන්ධව මීට වැඩිය තීක්ෂණව සොයා බැලිය යුතු, වැඩ කටයුතු කළ හැකි ආයතනක් බිහි කරන්න ඕනෑය කියන ඒක තමයි මම අදහස් කරන්නේ මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ඒ වාගේම තමයි අපේ ගරු මහ ඇමතිතුමාගේ මම කිව්වේ - නායකයෙක් වුණාම copy කරන්න හොඳ නැහැ. සංකල්ප copy කරන්න බැහැ. සංකල්පයක් හරියාකාරව ක්‍රියාත්මක වෙන්න ඕනෑ. සරුදම් අරුණැල්ල. අපි කුමන තැනක වුණත් කියනවා, දහම් පාසල් අධ්‍යාපනය ලැබූ දරුවෙක් බන්ධනාගාරගත වෙන්නේ නැහැයි කියලා. එහෙමනම් මෙතුවක් කල් සීමාවේදී එහෙම ජාතික හෝ පළාත් වැඩ පිළිවෙළක් තිබුණේ නැහැ. අද අමිල සේවයක් මේ සමාජයේ සාරධර්ම වෙනුවෙන් වැදගත් පරම්පරාවක් බිහි කරන්නට ශිෂ්‍ය පරම්පරාවක් බිහි කරන්න දත කන, මහන්සි වෙන, පැත්තක තියා ගෙන කථා කරපු අපේ දහම් පාසල් ගුරුවරුන් ගැන දහම් පාසල් කරන ආයතන ගැන, පන්සල් ගැන, පල්ලි ගැන අපි නිසි ඇගයීමක් තිබ්බේ නැහැ. අපි ඒකට නියම තැන හොයා ගෙන, අපිට දෙන්න පුළුවන් උපරිම ප්‍රමාණය, අපේ Budget එක අනුව දෙන්න පුළුවන් උපරිම ප්‍රමාණය - රුපියල් ලක්ෂය ගණනේ තීන්දු කර ගෙන ලක්ෂ දෙදහස් ගාණක් අපි මුළු බස්නාහිර පළාතටම දෙන්න වැඩ කටයුතු කළා. ඒ තුළින් විශාල පිබිදීමක් අපේ දහම් පාසල්වල ආචාර්ය මණ්ඩලයටත්, ස්වාමීන් වහන්සේලාට, පූජකතුමන්ලාට, හින්දු, මුස්ලිම් පූජකතුමන්ලාට විශාල ශක්තියක් වෙලා තිබ්බා. මොකද මෙතුවක් කල් සොයා නොබලපු දේ අපි පළාත් සභාව තුළින් අපේ මහ ඇමතිතුමාගේ සංකල්පයක් තුළින් මේ දේවල් කිරීම නිසා අපි ගැන ඇගයීමකට ලක් කරලා තියනවා කියන පණිවිඩය දීම තුළින් අපටත් යම් කිසි විධියකට පළාතේ මන්ත්‍රීවරු හැටියට, පළාත් සභාවේ මන්ත්‍රීවරු හැටියට අධ්‍යාපන ඇමතිතුමාගේ ප්‍රතිපත්තිය තුළින් ඒ වාගේම තමයි සම්පත් බෙදා දීම තුළින් වැඩි ජනතා ප්‍රසාදය ලැබිලා තියෙනවා. සම්පත් තනි තනිවම ඇමතිවරු ගොඩ ගොඩ බෙදා ගත්ත නම් එහෙම අපට මේ විධියට කථා කරන්න හම්බ වෙන්නේ නැහැ. මොකද, එතුමා ශිෂ්‍ය සංඛ්‍යාවත් එක්ක බලලා බොහෝම සාධාරණ ක්‍රම වේදයක් තුළ, ඒ සම්පත් බෙදා දීම තුළින් එතුමාගේ තියෙන නායකත්වයේ උදාර ගති පෙන්වා තිබෙනවා. ඒ විධියට වැඩ කටයුතු කරන, ඒවැනි නායකයෙක් යටතේ කටයුතු කිරීමට ලැබීම මම හිතන්නේ, අපට ලොකු ආඩම්බරයක්. අපට ලොකු ශක්තියක් ඒ හරහා ලබා දුන්නේ කියන ඒක මේ අවස්ථාවේදී මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමාට ප්‍රකාශ කරන ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපිට මේ වැඩ කටයුතුවලදී අවශ්‍ය කරන ඒ ශක්තිය ධෛර්යය ලබා දීම තුළින් මම හිතනවා, අපේ ආණ්ඩු පක්ෂයේ සියලුම මන්ත්‍රීවරුන්ට තමන්ගේ ප්‍රදේශය තුළ ගොඩනැගෙන්න පුළුවන් ශක්තිය ඒ නායකත්වය තුළ ලබා දී තිබෙනවා කියලා. අපි බොහෝම කනගාටුවෙන් වුණත් කියන්න ඕනෑ. සමහර ඇමතිවරු එනවා අපේ ආසනවලට. අපේ ආසනවලට අපේ ඇමතිවරු ඇවිල්ලා පළාතේ ඉන්න මන්ත්‍රීවරුන්ව ගණන් ගන්නේ නැතුව මම මෙච්චරක් දෙන්නම්, මම මෙච්චරක් දෙන්නම් කියලා යනවා. බොහෝම කනගාටුදායක තත්ත්වයක්. ඉතින් මෙවැනි තත්ත්වයන්වල අපි අපහසුතාවයට පත් වෙනවා. ඉදිරි මැතිවරණ වලදී අපි හය නැහැ. අපි ගම්වලට වැඩ කරලා තියෙන්නේ. අපි දන්නවා බොහෝම වේදනාවෙන් ඉන්නවා. අපේ Budget එකට අපි අත උස්සලා කටයුතු කරනවා. සමහර විට මේ තැන්වලදී අපිව නොසලකා හැරලා අපේ ගම්වල කටයුතු කරනවා, අපිට කැක්කුමක් තියෙනවා. ඒ අයට ඉදිරියේදී අපේ මොරටු ප්‍රදේශය තුළ -

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

කාලය අවසන්.

**ගරු මොරිස් විජේරත්න**
Hon.Morice Wejerathna

විනාඩියක් දෙන්න. ඉදිරියේදී ඒවැනි ආකාරයේ කටයුතු කරන අය ගැන වුණත් අපිට පුළුවන් හැකි ආකාරයේ අපි ඉදිරිය ගොඩ නඟනවා කියන පණිවිඩයත් ප්‍රකාශ කරමින් මා නිහඬ වෙනවා. අපි විශේෂයෙන්ම මෙය අවස්ථාවක් කර ගන්නවා - ගරු ප්‍රධාන අමාත්‍යතුමාගේ නායකත්වය තුළින් ගමේ සංවර්ධනය ඇති වෙලා තියෙනවා. අධ්‍යාපන ක්ෂේත්‍රයේ දියුණුව අපි දියත් කර තිබෙනවා. ඒක තමයි දේශපාලනයේ අපට තියෙන සන්තෝෂය. ඒ සන්තෝෂය තුළින් ඔබතුමාට ලබන වරත් මහ ඇමති ධූරයට පත් වෙන්න වාසනාව ලැබේවා කියා ප්‍රාර්ථනා කරනවා. ඔබතුමාගේ නායකත්වය තුළ නිරන්තරයෙන් අපි පෙනී සිටිනවා කියලා කියමින් මගේ වචන ස්වල්පය මෙයින් අවසන් කරනවා.

[අ.භා. 01.49]

**ගරු ගාමිණී තිලකසිරි**
Hon.Gamini Thilakasiri

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, බස්නාහිර පළාත් සභාවේ අවසාන වර්ෂයේ පැවැත්වෙන අයවැය සාකච්ඡාවේදී ප්‍රධාන අමාත්‍යතුමා වෙනුවෙන් එම වැය ශීර්ෂය යටතේ වචන ස්වල්පයක් කථා කිරීමට ලැබීම ගැන මම ඉතාමත් සතුටු වෙනවා. බස්නාහිර පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍යවරයා හැටියට වර්ෂ පහක කාලයක් නිම කරමින් යන මේ මොහොතේ මගේ කථාව ආරම්භ කිරීමට ප්‍රථම පහුගිය දවස්වල සිදු වූ සේවය පිළිබඳව වචන කිහිපයක් සඳහන් කළ යුතුයි. ඇත්තෙන්ම ඒක මේ මහ ඇමතිතුමාව පිම්බීමටවත්, ආදරේ ලබා ගන්න ඕනෑවටවත්, එහෙම නැතිනම් වාසි ලබා ගන්නවත් නොවේ, මම කථා කරන්නේ. සාමාන්‍යයෙන් හදවතට එකඟව මම ඕනෑම වේලාවක කථා කරනවා. මම කිසිම කෙනෙකුට බයත් නැහැ. ඇත්ත කියන තැන මම ඇත්ත කියනවා. බයත් නැහැ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි,පහුගිය අවුරුදු පහ කාල සීමාව තුළ බස්නාහිර පළාත් සභාව, මේ රටේ අනෙත් පළාත් සභා ගැන බලන කොට ඉතාමත්ම ඉහළ තත්ත්වයේ පැවැති පළාත් සභාවක්. ඒකට ප්‍රධානතම කාරණාව සිද්ධ වුණේ, ප්‍රධාන අමාත්‍යතුමා.

අපි දන්නවා නිරන්තරයෙන්ම අපේ පළාත් සභාවේ මන්ත්‍රීවරුන් හැටියට අපට යමක් කියලා කථා කරලා ඕනෑම අවස්ථාවක ප්‍රශ්නයක් විසඳා ගැනීමට අවස්ථාවක් එතුමා ලබා දීලා තිබුණු බව. සැමදාම සතියේ බදාදාවකම මේ බස්නාහිර පළාතේ තියෙන ප්‍රශ්න දහස් ගණන් බදාදා උදේට එක තැනක වාඩි වුණාම රෑ වන කොට ජනතාවගේ ඒ ප්‍රශ්න විසඳුවා. ඒ නිසා පහුගිය කාල සීමාව තුළ, මේ බස්නාහිර පළාත් සභාව පක්ෂ, විපක්ෂ සියළු මන්ත්‍රීවරුන්ගේ සහයෝගය මැද අපට ගෙනියන්න පුළුවන්කම ලැබුණේ, ප්‍රධාන අමාත්‍යතුමාගේ තිබුණු අවංක ගතිගුණ නිසා කියන එක මම මේ අවස්ථාවේදී සඳහන් කරන්න ඕනෑ. මම ඇත්තෙන්ම හදවතට එකඟව ප්‍රාර්ථනා කරනවා, ඊළඟ පළාත් සභා මැතිවරණය - අද මේ මොහොත වන කොට රටේ විවිධ ආකාරයේ මතිමතාන්තර පැවැතෙමින් පවතිනවා. ඒ මොනවා තිබුණත්, මට ඒකාන්ත විශ්වාසයක් තියෙනවා. ඊළඟ පළාත් සභාවේ දිස්ත්‍රික්ක තුනෙන්ම වැඩිම ඡන්ද ප්‍රමාණයක් ලබා ගෙන ඊළඟ පළාත් සභාවේත් ප්‍රධාන අමාත්‍යවරයා හැටියට පත් වෙන්න කියන ප්‍රාර්ථනාව මම පළමුවෙන් කර සිටිනවා.

අද අපේ මහ ඇමතිතුමාගේ විෂයයන් අතර ප්‍රධානම මාතෘකාවට ගැනෙන්නේ අධ්‍යාපනය. අධ්‍යාපනය ගැන කථා කරන කොට මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඉස්සර අපේ මන්ත්‍රීවරු මහ ඇමතිතුමා පස්සෙන් ගිය ප්‍රමාණය අනුව තමයි මන්ත්‍රීවරුන්ට මුදල් ලැබෙන්නේ. හිතවත්කම්වලට. මේ ක්‍රමය සම්පූර්ණයෙන් වෙනස් කරලා පහුගිය කාල පරිච්ඡේදය තුළ බස්නාහිර පළාත් සභාව නියෝජනය කරන මන්ත්‍රීවරුන්ගෙන් සැදුම්ලත් කලාප කාර්යාලය තුළ සිටින සියලුම මන්ත්‍රීවරුන්ගේ සහයෝගය ලබා ගෙන, කලාපය තුළට ලැබෙන ප්‍රතිපාදන අපි සියලුදෙනාම, පක්ෂ විපක්ෂ සියලු දෙනාම සාකච්ඡා කරලා තමයි අපි ඒ මුදල් ඒ ඒ පාසල්වලට බෙදා හැරීමට කටයුතු කළේ. එතැනදී අපි කිසිම පක්ෂයක්, පාටක් බැලුවේ නැහැ. අවශ්‍ය තැනට ඒ මුදල් ප්‍රතිපාදන වෙන් කරන්න අපි කටයුතු කළා. ඒ පිළිබඳව සාක්ෂි දරනවා ඇති පළාත් සභාවේ අපේ හිතවත් මංජු ශ්‍රී අරංගල ගරු විපක්ෂ නායකතුමා. ඒ නිසා ඒ ක්‍රමය තුළ අපට අපේ කළාපය තුළ අපිට යම්කිසි වැඩක් කරන්නට පුළුවන් ශක්තියක් ලබා දීමට කටයුතු කළාය කියන ඒක මම අධ්‍යාපනය වෙනුවෙන් කථා කළ යුතුයි.

මම විශේෂයෙන්ම ඉතාමත් ආඩම්බරයෙන්, ගෞරවයෙන් මම මේ අවස්ථාවේදී කථා කරන්න ඕනෑ, පහුගිය දවස්වල පැවැති ශිෂ්‍යත්වය ප්‍රතිඵල ගත්තහම මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ලංකාවෙන්ම දෙවැනි තැනට ආවේ හෝමාගම අධ්‍යාපන කොට්ඨාශයේ දරුවෙක්. සුභාරති විද්‍යාලයේ. ලංකාවේ හතරවෙනි තැනට ආපු දරුවා හෝමාගම අධ්‍යාපන කොට්ඨාශයේ මාගම්මන මහා විද්‍යාලයෙන් ආවේ. මම කියන්නේ නැහැ, ලංකාවේ දෙවැනියැයි කියලා හෝමාගම අපේ ගොඩගම සුභාරති විද්‍යාලයේ දරුවා. මම හැම රැස්වීමකම කියන්නේ පළමුවැනියට ආවේ ගොඩගම සුභාරති විද්‍යාලයේ දරුවෙක් කියලා. මොකද පළමුවැනි ස්ථානයට ආවේ ජාතික පාසලක දරුවෙක්. අපේ හෝමාගම අධ්‍යාපන කොට්ඨාශයේ දරුවෝ දෙන්නෙක් දෙවැනි ස්ථානය හා හතරවෙනි ස්ථානය ගත්තා. ශිෂ්‍යත්ව විභාගයේ ප්‍රතිඵල බලන කොට මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, හෝමාගම අධ්‍යාපන කලාපයේ, හෝමාගම කොට්ඨාශයේ ඉතාමත් ඉහළ තත්ත්වයකට පත් වෙලා තිබුණාය කියන ඒක මම සඳහන් කරන්න ඕනෑ. ඒ දරුවෝ පමණක් නොවෙයි. දරුවෝ විශාල ප්‍රමාණයක් - ශිෂ්‍යත්ව විභාගයේ කඩඉම් ලකුණ කියන්නේ, ලකුණු 160. මම දකින්නේ මේක මහා අසාධාරණ ක්‍රමයක්. ලකුණ 160 කියන්නේ ප්‍රශ්න පත්‍ර

දෙකකට හම්බ වෙන ලකුණු ප්‍රමාණයක්. එකකට ලකුණු 80 ගාණේ ගත්තොත් තමයි එකසිය හැට වෙන්නේ. ලකුණු 75 ගාණේ ගත්තොත් ලකුණු 150 මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ලකුණු 150 ක් ගත්ත දරුවා ශිෂ්‍යත්ව විභායෙන් අසමත්. මේක මහා අසාධාරණ ක්‍රමයක්. ලකුණු 75 ක් සාමාන්‍ය පෙළ විභාගයේදී ගන්නවා කියන්නේ මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි,A සාමාර්ථයක් දරුවෙකුට ලැබෙනවා. අද ලකුණු 75 ගත්තු දරුවාත් මේ ක්‍රමය අනුව ශිෂ්‍යත්ව විභාගයෙන් අසමත්. ලකුණු 160 කඩඉම් ලකුණ. කොයිතරම් දරුවෝ මේවායින් කනගාටු වුණාද? කොයි තරම් දුක් වින්ද ද? සමහර දෙමව්පියෝ යකඩ පුච්චලා රත් කරලා දරුවන්ගේ හැමතැනම පිච්චුවා. දරුවා රෝහලට ගියා. තාත්තා ගියා කුඩුවට. තව ගුරු මහත්මියක් ලකුණු 121 ක් ගත් දරුවෙක් බලු කුඩුවට දාලා පැය දෙකක් තිබ්බා. මේ විභාග ක්‍රමය අනුව ගරු සභාපතිතුමනි, මේක දරුවන්ටත් ප්‍රශ්නයක්. මේක දෙමව්පියන්ටත් ප්‍රශ්නයක්. මේ ශිෂ්‍යත්ව විභාගය නිසා දරුවෝ දෙමව්පියෝ පුදුම විධියට මහන්සි වෙනවා. කැප වෙනවා. මේවායේ ප්‍රතිඵල ආවහම දරුවෝ දුක් විඳිනවා. අපි ශිෂ්‍යත්වය පාස් දරුවා ගණන් ගන්නේ ලකුණු 160. ලකුණු 159 ගත්තු දරුවෝ දහස් ගාණක් මේ රටේ ඉන්නවා. 155, 157 ගත්තු දරුවෝ ඉන්නවා. මේ ක්‍රමය නිසා ඒ දරුවන්ගේ හිත් දූෂ්‍ය වෙලා, නැති වෙලා, විනාශ වෙලා යනවා. ඒ නිසා මම විශේෂයෙන්ම සඳහන් කරනවා මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පුළුවන් ක්‍රමයක් තියෙනවා නම්, මේ ක්‍රමය වෙනස් කරන්න. මේ ශිෂ්‍යත්ව ලකුණු දීමේ ක්‍රමය වෙනස් කරලා දරුවන්ගේ සිත් සතන් තලන්නේ පෙළන්නේ නැතිව ඒ දරුවන්ට ශිෂ්‍යත්ව විභාගයේ ප්‍රතිඵල ලබා දීමට වෙනත් ක්‍රමයක් යොදනවා නම් ඉතාමත් වටිනවා. ගරු ප්‍රධාන අමාත්‍යතුමනි, ඔබතුමාට හැකි වුණු අවස්ථාවක අධ්‍යාපන ඇමති නොවෙයි, ඊට වඩා ඉහළ කෙනෙකුට හරි කියලා මේ ක්‍රමය වෙනස් කරන්න උත්සාහ ගන්න. මේ ක්‍රමය නිසා දෙමව්පියොත් දුක් විඳිනවා. දරුවොත් දුක් විඳිනවා. ඒ නිසා ඒ පිළිබඳව මම ඊට වඩා කථා කරන්න යන්නේ නැහැ.

මම විශේෂයෙන්ම සඳහන් කරන්න ඕනෑ මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා මඟින් ගරු මහ ඇමතිතුමනි, අද බලන්න මහජනතාවගේ තේරී පත් වුණු සභාපතිවරු. මේ අයව මහජනතාව තමයි පත් කරලා යවලා තියෙන්නේ. වැඩිම මනාප ගත්ත පුද්ගලයා සභාවේ සභාපති වෙනවා. අවුරුදු දෙක පනින කොට මේ පනතක් ගෙනල්ලා සම්මත කරලා සල්ලි තියෙන මිනිහෙක් set වුණොත් සල්ලා තියෙන මිනිහෙකුට උප සභාපතිවරයා වෙන්න පුළුවන්. වෙනත් මන්ත්‍රීවරයෙක් වෙන්න පුළුවන්. සභාපතිතුමාට හැම ප්‍රාදේශීය සභාවකම බලය වැඩිපුර තියෙන්නේ එකයි, දෙකයි, තුනයි. උදාහරණයක් බලන්න මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඊයේ කැස්බෑව නගර සභාව එක ඡන්දයකින් පරාජයට පත් කළා. මේක මහ බරපතළ ප්‍රශ්නයක්. මේ ඉන්නේ. මේ මහජන මන්ත්‍රීවරු එකතු වෙලා මුදලට අල්ලසට පගාවට, දූෂණයට සම්බන්ධ වෙලා ජනාධිපතිතුමා පත් කරන සභාපතිවරයාව පන්නලා, ඊළඟ එකෙක් මේ තැනට එන්න හදනවා. මේ ක්‍රමය නවත්වන්න ඕනෑ මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මම බොහෝම කැමති වුණා ඇත්තෙන්ම ප්‍රේමදාස මහත්තයා 1991 ඉදිරිපත් කළ ප්‍රාදේශීය සභා පනත යටතේ මම එහි පළමුවෙනි සභාපති. කැස්බෑව ආසනයේ ප්‍රාදේශීය සභාවේ පළමුවැනි සභාපතිවරයා හැටියට මම කටයුතු කළා. බොහෝම ප්‍රතාපවත් සභාපතිවරයෙක් හැටියට මම කටයුතු කළේ. මට බියක් සැකක් තිබුණේ නැහැ. හොඳ දේ කළා නම් සියලු දෙනාගේම සහයෝගය ලබනවා. අද එහෙම බැහැ. අද සභාපතිවරයා දෙකට නැවිලා ප්‍රාදේශීය මන්ත්‍රීවරු පස්සේ යන්න සිද්ධ වෙලා තියෙනවා. මේ ක්‍රමය නවත්වන්න ඕනෑ. සල්ලි ටිකක් දුන්නේ නැහැ. සල්ලි අඩුවෙන් දුන්නැයි කියලා නොවෙයි මේක. සල්ලි තියෙන ඒකාට පුළුවන් සභාව වෙනස් කරන්න. සභාව වෙනස් කරලා බලය ගන්න පුළුවන්. ඊටත් වඩා වැඩේ කියන්නේ විරුද්ධව ඡන්ද දෙන ඒකා සභාපති වෙනවා. මේක මහා අසාධාරණ ක්‍රමයක්. එහෙම නම් විරුද්ධව ඡන්ද දීපු ඒකා පැත්තකට දාලා නීති ගරුකව හිටපු කණ්ඩායමේ මිනිහෙක් පත් කරන්න ඕනෑ.

ඒ නිසා මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමාගේ මාර්ගයෙන් මම ගරු ප්‍රධාන අමාත්‍යතුමාට මේ පිළිබඳව අවධානය යොමු කරනවා. මේක මට තියෙන ප්‍රශ්නයක් නොවේ. පෞද්ගලිකවත් නොවේ. මුළු රටටම තියෙන ප්‍රශ්නයක්. අනාගතයේ තව ප්‍රාදේශීය සභා ගණනාවක්ම - අපි හීනෙකින්වත් හිතුවේ නැහැ කැස්බෑව ප්‍රාදේශීය සභාව ඊයේ පරාජයට පත් වෙයි කියලා. ඒ නිසා මේ ක්‍රමය පිළිබඳ අපේ නම් බලවත් කනගාටුව. සමහර විට ඉදිරි මැතිවරණවලදී මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ අද අවසාන අයවැය ලේඛනය. කියලාම යන්න ඕනෑ. ඉදිරි මැතිවරණවලදී කොට්ඨාශ ක්‍රමය තුළ අපි බලාපොරොත්තු වුණු දේ ආණ්ඩුවට නොඑන්න පුළුවන්, මේ කොට්ඨාශ ඡන්ද ක්‍රමය තුළ. ඒ නිසා මම ගරු මහ ඇමතිතුමාට

[ගරු ගාමිණී තිලකසිරි ]

කියනවා, මේ පිළිබඳව කල්පනා කරලා, සාකච්ඡා කරලා, තමුන්නාන්සේ මේ පිළිබඳව දැනුවත් කරන්න කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම ගිය අයවැය ලේඛනයේදී ගරු මහ ඇමතිතුමාගෙන් ඉල්ලීමක් කළා මේ මන්ත්‍රීවරුන්ට නිවහනක් හදලා දෙන්න කියලා. ඇත්තේන්ම ඇත මන්ත්‍රීවරුන්ට අනේ මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට විනාඩි දෙකක් දෙන්න. අවසර දෙන්න කාගෙන් හරි කමක් නැහැ. මේ වෙනුවෙන්. මහ ඇමතිතුමා මේ පිළිබඳව අවධානය යොමු කරලා - මම කිව්වේ මට ඉන්න නොවේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, තමුන්නාන්සේ බේරුවල ඉඳලා එන්න පුළුවන්. තමුන්නාන්සේට අසනීපයක් වෙන්න පුළුවන්. තමුන්නාන්සේට වෙනත් අසනීපයක් වෙන්න පුළුවන්. ඉන්න තැනක් නැහැ. මම කිව්වා මන්ත්‍රීවරුන්ට අඩුම තරමේ කාමර හතක් අටකින් යුත් අපේ ගොඩනැගිල්ලක් හදලා පහසුකම් ටිකක් සලසලා දෙන්න කියලා. මම බොහෝම ස්තුතිවන්ත වෙනවා ගරු මහ ඇමතිතුමාට. මහ ඇමතිතුමා ඒ කාර්යය භාරය මට ලබා දුන්නම සභාපතිවරයාට - තමුන්නාන්සේ සාමාජික වරයෙක්. අපි තුන් හතර දෙනෙක් එක්ක ඒ කටයුත්ත ඉෂ්ට කරලා අපි ලබා දීලා තියෙනවා, මේ කටයුත්ත කරන්න කියලා. මම දන්නේ නැහැ මොන හේතුව මත ද කියලා. අපි දීපු වාර්තාව තවමත් එළියට ඇවිල්ලා නැහැ. ඒ නිසා මම ගරු ප්‍රධාන ඇමතිතුමාගේ මාර්ගයෙන් කියනවා. ඒ කටයුත්ත පිළිබඳවත් අවධානය යොමු කරලා කටයුතු කරන්නැයි කියලා මම ඉල්ලා සිටිනවා මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

විශේෂයෙන්ම කරදියාන කුණු ප්‍රශ්නය මට බලපානවා මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මම ඉන්නේ බොරලැස්ගමුවේ කටුවාවල ගමේ. ඒ නිසා මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම ඉන්නේ කරදියාන ඉඳලා හැතැප්ම ගාණක් මෙහායින්. හවස් වෙන කොට ගෙදර ඉන්න පුළුවන්කමක් නැහැ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ මාර්ගයෙන් මම දන්වා සිටිනවා ගරු මහ ඇමතිතුමාට. ගරු මහ ඇමතිතුමනි, මේ කුණු ප්‍රශ්නය මම දන්නේ නැහැ. කුණු ප්‍රමාණය වැඩි වෙලා ද? කුණු උඩින් පස් දමන්නේ නැද්ද? කුණු තව එකෙක් කනවාද දන්නේ නැහැ. ඒක නිසා මේ කරදියාන කුණු ප්‍රශ්නය පිළිබඳවත් අවධානයක් යොමු කරලා කටයුතු කරන්නැයි කියන ඉල්ලීම ඔබතුමාගේ මාර්ගයෙන් මා ඉල්ලා සිටිනවා.

මම සන්තෝස වෙනවා, අධ්‍යාපන ඇමතිකම ඔබතුමාට හොඳට ගෙනියන්න පුළුවන්කම තිබුණේ, වැඩි වශයෙන් තමුන්නාන්සේ ළඟ හිටපු නිලධාරීන් නිසා. ඕනෑම දේශපාලඥයෙකුට මොන තනතුර ගත්තත් ඒ දේශපාලඥයාගේ තැන නගින්නේ බහින්නේ තමන් ළඟ ඉන්න නිලධාරීන් නිසා. ඒක අපිට ඕනෑ වේලාවක උපහැරන වලින් කියන්න පුළුවන් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම බොහෝම සනේතාෂ වෙනවා, ගරු ප්‍රධාන අමාත්‍යතුමා සමඟ හොඳ නිලධාරි මඩුල්ලක් හිටියා. අපි විශේෂයෙන්ම සඳහන් කරන්න්නේ හිටපු ලේකම්තුමිය, වර්තමාන ලේකම්තුමා, පළාත් අධ්‍යක්ෂකතුමා, අධ්‍යාපන අතිරේක අධ්‍යක්ෂකතුමා ඇතුළු මේ විශාල ප්‍රමාණයක් මේ අධ්‍යාපනය සම්බන්ධයෙන් කටයුතු කළා. ඒ වගේම පළාත් පාලන කොමසාරිස්තුමිය. ඒ වගේ උදව්ය විශාල වගකීමක් ඉෂ්ට කළා, ප්‍රධාන අමාත්‍යතුමාගේ. සමහර අවස්ථාවල ප්‍රධාන අමාත්‍යතුමාට අමතක වෙන්න පුළුවන්. මේ ක්‍රමය යන්න සකස් කරලා දුන්නා. උදව් පදව් කළා. අපි ඒ අය කවදාවත් අමතක කරන්න හොඳ නැහැ. අපි දැක්කා සමහර පළාත් සභාවල වුණු දේවල්. සමහර පළාත් සභාවල අධ්‍යාපන ඇමතිකමත් ගැලව්ලා ගියා. තව ඇමතිවරයෙකුට දෙන්න සිද්ධ වුණා. ඒ නිසා මම අවසාන වශයෙන්ම මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ උදව් පදව් කළ සියලුම නිලධාරින්ටත් මම මේ අවස්ථාවේදී මගේ ප්‍රණාමය පුද කරනවා. අවසාන වශයෙන් මගේ කලාපයේ අධ්‍යක්ෂකතුමා ඇතුළු ඒ කලාපයේ ඉන්න සියලුම නිලධාරී මහත්වරු සියලුමදෙනා අපට අපේ වැඩ කටයුතු කරගෙන යාමට විශාල සහයෝගයක් ලබා දුන්නායි කියලා මතක් කර සිටිමින් මම නිහඬ වෙනවා. ඔබතුමාට ස්තුතියි. (බාධා කිරීමක්)

[අ.භා. 02.00]

**ගරු නිමල් චන්ද්‍රරත්න**

Hon. Nimal Chandraratna

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි,ඇත්තටම කළුතර දිස්ත්‍රික්කයේ පළාත් සභා මන්ත්‍රීවරයෙක් හැටියට මම ඉතාමත් සනේතාෂ වෙනවා, අපේ භාග්‍යයක් කොට සලකනවා ප්‍රසන්න රණතුංග ප්‍රධාන ඇමතිතුමා යටතේ මේ දෙවැනි පළාත් සභාවේ මන්ත්‍රීවරයෙක් හැටියට කටයුතු කරන්න ලැබීම පිළිබඳව. අපේ රෝස් ප්‍රනාන්දු

ගරු මන්ත්‍රීතුමිය එතුමියගේ කථාවේදී සඳහන් කළා, පාසල් වැසෙන කතන්දරයක් ගැන. මම එතුමියට ආරාධනා කරනවා, ඇත්තටම බණ්ඩාරගම ආසනයට එන්න. අපේ බණ්ඩාරගම ආසනයේ වැහුණු පාසල් අපි ඇරියා. පහුගිය කාලේ වහපු පාසල් හතරක් ඇරලා තියෙනවා. බටගොඩ කණිෂ්ට විද්‍යාලය -

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

කවුරු වහපුවද? තමුන්නාන්සේලා වහපුවා නේ?

**ගරු නිමල් චන්ද්‍රරත්න**
Hon. Nimal Chandraratna

කවුරු වහපුවා හරි අපේ ප්‍රසන්න රණතුංග ඇමතිතුමාගේ කාලේ ඇරලා තියෙනවා. ඒකයි කියන්න තියෙන්නේ.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

අපි වහපුවා නොවෙයි. තමුන්නාන්සේලා වහපුවා.

**ගරු නිමල් චන්ද්‍රරත්න**
Hon. Nimal Chandraratna

ඔබතුමියට කියන්න තියෙන්නේ ඒකයි. බටගොඩ කණිෂ්ට විද්‍යාලය, කැටගොඩ කණිෂ්ට විද්‍යාලය, ලෝකවෙල ලක්ෂ්මී විද්‍යාලය, ඉඹුලගේන ප්‍රාථමික විද්‍යාලය කියන විද්‍යාල හතරම ප්‍රසන්න රණතුංග මහ ඇමතිතුමාගේ කාලේ පළාත් සභා මන්ත්‍රීවරුන් හැටියට අපට නිලධාරින්ගේ සහයෝගය අරගෙන ඒ පාසල් අරින්න අපට හැකිවෙලා තියෙනවා. අද හොඳ පාසල් බවට ඒ පාසල් පත් වෙලා තියෙනවා. ඒ වගේම 50 ට අඩු පාසල් හැටියට තිබුණු පාසල් තුනක් බොල්ගොඩ කණිෂ්ට විද්‍යාලය, ඒ වාගේම කිමන්දුරා කණිෂ්ට විද්‍යාලය සහ තලහිටිය කණිෂ්ට විද්‍යාලය කියන විද්‍යාල තුනම 50 ට අඩු පාසල් හැටියට තිබුණේ. අද සම්පත් ලබා දීලා අවශ්‍ය පහසුකම් ලබා දීලා ඒ පාසල් තුනම 50 ට වැඩි පාසල් බවට පත් කරන්න අපට හැකි වෙලා තිබෙනවා. ඒ වගේම අපේ ෂාෆි රහීම් ගරු මන්ත්‍රීතුමා සඳහන් කළා වගේ අපි අද අළුත්ම ඉස්කෝලයක් මුස්ලිම් පාසලක් අලුතින්ම ගොඩනහාගෙන යනවා. අළුත්ම ඉස්කෝලයක්. ඒ වාගේම ද්‍රවිඩ පාසල් දෙකක්. අපේ බණ්ඩාරගම ආසනයේ තිබෙනවා නිව් වැව්ල් විද්‍යාලය. ඒ වාගේම දික්හේන කණිෂ්ට විද්‍යාලය. මේ විද්‍යාල දෙකම අද ද්‍රවිඩ පාසල් දෙකක් හැටියට සංවර්ධනය කරලා තියෙනවා. ලස්සන ඉස්කෝල බවට පත් කරලා තියෙනවා.

ඒ වාගේම අපි සඳහන් කරන්න ඕනෑ. බණ්ඩාරගම ආසනයේ බණ්ඩාරගම කොට්ඨාශයේ ද්වීතික පාසල් පහක් විතරක් මේ වන කොට ඇති කරලා තියෙනවා. ඒ පාසල්වල විද්‍යාගාර හදලා අද විවෘත කරන මට්ටමට ගෙනල්ලා තියෙනවා. මේ පාසල් පද්ධතිය හදන්න අපට දායකත්වය දුන්නේ ප්‍රසන්න රණතුංග මහ ඇමතිතුමා කියන ඒක අපි නිහතමානීව සඳහන් කරන්න ඕනෑ. මොකද ප්‍රධාන ඇමතිතුමා අපි එකතු කරගෙන මේ පාසල් හදන කොට, පාසල් වැහිලා තියෙන ඒවා අරින කොට වහන්න තියෙන පාසල් පවත්වා ගෙන යන කොට අපේ පාසල් පද්ධතියට ලොකු දායකත්වයක් ලබා දෙන කොට අපේ බැසිල් රාජපක්ෂ ඇමතිතුමා ඒ වගේම අතිගරු මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමා සෘජුවම මේ පාසල්වලට උදව් දෙන්න කටයුතු කරලා තියෙනවා. ඒ සම්බන්ධයෙන් එතුමන්ලා දෙපළටත් අපේ ස්තූතිය පුද කරන්න ඕනෑ.

ඒ වාගේම අද බණ්ඩාරගම ඉතිහාසයේ බණ්ඩාරගම කුඩා පාසල් හතරක් - පාර්ලිමේන්තුවේ හැන්සාඩ් ගත වෙලා තියෙනවා. වහපු ඉස්කෝල හතරක් ඇරපු පාසල් හැටියට අද හැන්සාඩ් ගත වෙලා තියෙනවා, බන්දුල ගුණවර්ධන ඇමතිතුමා හරහා. ඒ ගෞරවයත් හිමි වෙන්න ඕනෑ, අපේ ප්‍රසන්න රණතුංග මහ ඇමතිතුමාට. ඇත්තටම බණ්ඩාරගම ආසනයේ අපේ කොට්ඨාශය ගැන විතරයි මම කථා කරන්නේ.

ඇත්තටම මම මේ අධ්‍යාපනය ගැන විතරයි කථා කරන්නේ වෙන විෂයයක් ගැන කථා කරන්නේ නැහැ. මොකද අපේ පාසල් පද්ධතියට මහ ඇමතිතුමා ලබා දුන්නු දායකත්වය එය, නොවෙන්න අපේ ඒ වහපු පාසල් හතර අදත්, හරක් ළඟින පාසල් බවට පත් වෙලා තියෙන්නේ. වහන්න තියෙන පාසල් අද වහලා අවසානයි. මේ සඳහා දායකත්වය දුන්නේ මහ ඇමතිතුමා. ඒ වගේම නිලධාරින් අපට හොඳ දායකත්වයක් ලබා දුන්නා. අපේ කොට්ඨාශ අධ්‍යක්ෂකතුමා, කලාප අධ්‍යක්ෂකතුමිය ඇතුළු නිලධාරීන් ලොකු සහයෝගයක් අපට ලබා දුන්නා. ඒ සම්බන්ධයෙන් අපේ ස්තූතිය පුද කරන්න ඕනෑ. මේ පළාත් සභාවේ මේ බස්නාහිර පළාත් සභාවේ දැන් ඡන්දයක් එනවා හෙට අනිද්දා. ඒ ඡන්දේ එන කොට ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරු, ඇමතිවරු එනවා කියලා කියාගෙන යාවී. සමහර මන්ත්‍රීවරු

[ගරු නිමල් චන්ද්‍රරත්න ]

සමහර වෙලාවට කියනවා පළාත් සභාවෙන් වැඩ කරන්න බැහැ. පළාත් සභාව සුදු අලියෙක්. පළාත් සභාවෙන් වැඩක් කරන්න බැහැයි කියලා කියනවා. නමුත් ඒක අද ප්‍රසන්න රණතුංග මහ ඇමතිතුමා ඒක බොරු කරලා තියෙනවා කියන ඒක මම මේ අවස්ථාවේදී සඳහන් කරන්න ඕනෑ. මම මෙහෙම සඳහන් කරන්නේ, මේ පළාත් සභාවේ වැඩක් කරන්න ඇමතිවරයෙක් වෙන්නම අවශ්‍යකමක් නැහැ. මේ පළාත් සභාවේ ප්‍රසන්න රණතුංග මහ ඇමතිතුමා යටතේ පළාත් සභා මන්ත්‍රීවරයෙක් වීම ප්‍රමාණවත්. මන්ත්‍රීවරයෙක් විධියට ඇමතිවරයෙකුගේ වැඩ කරන්න පුළුවන් අපට. මේ පළාත් සභාව තුළ ඒක අපි නොබියව සඳහන් කරන්න ඕනෑ. අපි පළාත් සභා මන්ත්‍රීවරු හැටිය අද කොන්ද කෙළින් තියා ගෙන අපේ ආසනයේ කටයුතු කරන්නේ මේ ප්‍රධාන අමාත්‍යතුමාගේ කාර්යය භාරය නිසා කියන එක අපි සඳහන් කරන්න ඕනෑ. අද බණ්ඩාරගම ආසනයට පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක් නැති වුණත් බණ්ඩාරගම ආසනයේ පළාත් සභාවේ කරන වැඩ කොටස නිසා තමයි අද බණ්ඩාරගම ආසනයේ මේ පාසල් පද්ධතිය නංවගෙන, පාරවල් පද්ධතිය හදලා මේ සෞඛ්‍ය පහසුකම් ලබා දීලා අවශ්‍ය සියළු දේ ලබා දෙන්න හැකි වුණේ පළාත් සභාව තුළින් කියන එක මම මේ අවස්ථාවේදී සඳහන් කරන්න ඕනෑ. බණ්ඩාරගම ආසනය හැටියට අපේ ස්තුතිය අපේ ප්‍රසන්න රණතුංග මහ ඇමතිතුමාට හිමි කරලා දෙන්න ඕනෑ. ප්‍රධාන අමාත්‍යතුමනි, අපේ මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා මාර්ගයෙන් ඔබතුමාට දැනුම් දෙනවා එක කාරණයක්. ඒ පාසල් පද්ධතිය තුළ පුංචි පුංචි අඩුපාඩුකම් තියෙනවා. මේ අඩුපාඩුකම් අතර අද දරුවන්ගේ සහ ගුරුමහත්ම මහත්මීන්ගේ විනය ප්‍රශ්නය, ටිකක් බරපතළ ප්‍රශ්නයක් බවට පත් වෙලා තියෙනවා.

සමහර පාසල්වල මගේ බණ්ඩාරගම ආසනයේත් ඊයේ පෙරෙයිදා ගුරුවරයෙක් සම්බන්ධයෙන් විනය ප්‍රශ්නයක් මතු වුණා. දරුවන් සම්බන්ධයෙනුත් විනය ප්‍රශ්න මතු වෙලා තියෙනවා. සමහර ඒක පාසලක දෙකක. අපි ඔබතුමාගෙන් එය ඉල්ලා සිටින්නේ ඇත්තටම මේ විනය කඩ කරන කවුරු හෝ නිලධාරියෙක් වේවා, ගුරුවරයෙක් වේවා, දරුවෙක් වේවා ඒ අයට නිසි මහ පෙන්වලා දඬුවම් පමුණුවලා මේ අය නිසි මහට ගන්න කියන ආරාධනාව කරන්නේ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා මාර්ගයෙන් මහ ඇමතිතුමාට. මේක තමයි මම දකින විශාල අඩුව. මේ පළාත් සභාව තුළ මේ පාසල් තුළ අඩුපාඩු වෙනවා ඇති. අපිට දකින්න තියෙන අඩුව මේ දරුවන්ගේ සහ ගුරුවරුන්ගේ සහ නිලධාරීන්ගේ විනය පිළිබඳ ප්‍රශ්න කියන ඒක අපි සඳහන් කරන්න ඕනෑ.

මම දීර්ඝ වශයෙන් කථා කරන්න බලාපොරොත්තු වෙන්නේ නැහැ. මේ අවසාන පළාත් සභාව තුළ මේ අධ්‍යාපනයට කරපු සේවය සම්බන්ධයෙන්, මහ ඇමතිතුමා කරපු සේවය සම්බන්ධයෙන් අපි කථා නොකළොත් ඒක අඩුපාඩුවක් හැටියට දකින නිසා තමයි අපි මේ අවස්ථාව අද උදේ ඉල්ලගෙන කථා කරන්න මා කටයුතු කළේ. කොහොම වුණත් අපි කියන්න කැමතියි අවසාන වශයෙන්, ඊළඟ පළාත් සභාවේ නැවත වරක් අපට පළාත් සභා මන්ත්‍රීවරු වුණාම ඇති. අපිට ඇමතිකම් අවශ්‍යකමක් නැහැ. අපට තාන්නමාන්න අවශ්‍යකමක් නැහැ. හැබැයි, අපි ආසයි එක දෙයකට. ලබන පළාත් සභාවත් ප්‍රසන්න රණතුංග මහ ඇමතිතුමා යටතේ පළාත් සභා මන්ත්‍රීවරයෙක් වෙන්න අපි ප්‍රාර්ථනා කරනවා කියන ඒක සඳහන් කරමින් මේ පළාත් සභාව තුළින් කරපු කාර්යය භාරයට ස්තුතිය පුද කරමින් අපි නිහඬ වෙනවා. බොහෝම ස්තුතියි.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

හෙක්ටර් බෙත්මගේ ගරු මන්ත්‍රීතුමා විනාඩි 10යි.

[අ.භා. 02.10]

**ගරු හෙක්ටර් බෙත්මගේ**
Hon. Hector Bethmage

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම ඉතාමත් සතුටු වෙනවා, 26 වන මුදල් ප්‍රකාශය වෙනුවෙන් ගරු ප්‍රධාන අමාත්‍ය ප්‍රසන්න රණතුංග ප්‍රධාන අමාත්‍යතුමාගේ වැය ශීර්ෂය වෙනුවෙන් වචන ස්වල්පයක් කථා කරන්න ලැබීම පිළිබඳව. අද පෙරවරුවේ ඉඳන් මේ මොහොත වෙන කල් මේ වැය ශීර්ෂය පිළිබඳව කථා කරන කොට, හැම කෙනෙක්ම කථා කළේ මුව නොසෑහෙන තරම් ස්තුති භාවයකින් යුක්තවයි. ප්‍රධාන අමාත්‍යතුමා තමාගේ කාර්යය භාරය, භූමිකාව හරියට කළ නිසා මේ පළාත් සභාවේ අවසන් භාගයේ අවසන් අයවැය වෙලාවේදී, අපිට සතුටු සිතින් කථා කරන්න පුළුවන් කියන කාරණාව මේ අවස්ථාවේදී ප්‍රකාශ කරන්න ඕනෑ. දැන් මේ අවස්ථාවේදී විපක්ෂය දිහා බලන කොට, විපක්ෂයේ මන්ත්‍රීවරු හුඟක්ම අඩුයි. ඒක ස්වාභාවය. මොකද විපක්ෂයට මේ කියවන දේවල් දරා ගන්න බැහැ. නිදර්ශන

හැටියට බැලුවොත් අපේ හිතවත් විපක්ෂ නායකතුමා වුවත්, තමන්ගේ seat එකේ ඉන්නේ නැහැ. පිටිපස්සට වෙලා ඉන්නේ, මේවා විඳ දරා ගන්න බැහැ.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

ඔරොත්තු දෙන්නේ නැහැ.

**ගරු මංජු ශ්‍රී අරංගල - විපක්ෂ නායකතුමා**
Hon. Manju Sri Arangala - Leader of the Opposition

හරි අමාරු ඇති නේද ඔයාට.

**ගරු හෙක්ටර් බෙත්මගේ**
Hon. Hector Bethmage

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි ඊයේ කථාවේදී අහන කොට ජනතා විමුක්ති පෙරමුණේ මේ පළාත් සභාවේ ඉන්න නායකයා ප්‍රකාශයක් කළා, මේ 2014 මුදල් ප්‍රකාශනයේ මුදල් වෙන් කරලා තියෙන්නේ, අවස්ථාවාදිවයි කියලා. ගරු ප්‍රධාන අමාත්‍යතුමාගේ වැය ශීර්ෂයට 71 % කට අධික ප්‍රමාණයක් වැය කරලා තියෙනවා. අනෙක් අමාත්‍යාංශවලට ඉතාමත් සුළු මුදල් ප්‍රමාණයක් කියලා හුවා දැක්වූවා. නමුත් එතුමා, එතුමාගේ පක්ෂයේ ඒ වැඩ පිළිවෙල තුළ ඒ විධියේ ප්‍රකාශයක් කළත්, අපි මේ අවස්ථාවේදී ප්‍රකාශ කරන්න ඕනෑ එහි යථාර්ථය මොකක්ද කියන කාරණාව. ඒක කෙහේ හරි ලියවිලා තියෙන්න ඕනෑ. ගරු ප්‍රධාන අමාත්‍යතුමාගේ විෂයය පථය, පුළුල් විෂයය පථයක්. විෂයයන් හැටියට බලපුවාම හතරක්, පහක්, හයක් වෙන්න පුළුවන්. නමුත් දැවැන්ත සමාජ සත්කාරයකට යොමු වෙන වැඩ පිළිවෙළක් තමයි ඒ විෂයය පථයේ තියෙන්නේ. අධ්‍යාපනය. අධ්‍යාපනයට විශාල මුදලක් වෙන් කිරීම අවශ්‍යයයි කියන කාරණාව අමුතුවෙන් කියන්න ඕනේ නැහැ. නමුත් එතුමා ඒක කොළය වහලා මේ සභාව නොමඟ යවන්න මේ මුදල් ප්‍රකාශනය තුළ ප්‍රධාන අමාත්‍යතුමාගේ අමාත්‍යාංශයට විශාල මුදලක් වෙන් කරලා තියෙනවා කියන කාරණාව ප්‍රකාශ කළා. මේකම තමයි අද පාර්ලිමේන්තුවෙත් වෙන්නේ. අද පාර්ලිමේන්තුව තුළ කථා බහට ලක් වෙන්නේ, මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමා මේ රටේ සංවර්ධනය වෙනුවෙන් මේ රට ලෝකයේ ඉතාමත්ම ප්‍රභාමත් රටක් බවට පත් වෙන කොට ඒක ඉවසගන්න බැරි අය සංඛ්‍යා ලේඛනවලින් බොරු ගණන් මිනුම් පෙන්නලා තමයි ජනප්‍රිය වෙන්න බලාපොරොත්තු වෙන්නේ.

ඇතැම් මාධ්‍යවලට ඔහු කථා කරනවා. ඇතැම් මාධ්‍යවල කියන කථාවල හැඩ වැඩ දාලා අමූලික බොරු කියනවා. අන්න ඒ වගේ බොරුවක් තමයි ඊයේ ජනතා විමුක්ති පෙරමුණේ නායකයා මේ බිත්ති හතරෙදී ප්‍රකාශ කළේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ මාර්ගයෙන් ගරු ප්‍රධාන අමාත්‍යතුමා කළ වැඩ පිළිවෙළවල් පිළිබඳව එකින් එක කියන්න, මම තවත් බලාපොරොත්තු වෙන්නේ නැහැ. හෘද සාක්ෂියට එකඟව ඒක අප කවුරුත් දන්නවා. හොඳ පුළුල් වැඩ පිළිවෙළක් කළා කියන කාරණාව. ඒ ඇරුණු කොට මගේ හිතේ සනිටුහන් වුණු කාරණා කිහිපයක් පිළිබඳව ඔබතුමා මඟින් ගරු ප්‍රධාන අමාත්‍යතුමා වෙත යොමු කරන්න බලාපොරොත්තු වෙනවා.

ඊළඟ අවුරුද්ද 2014 අවුරුද්ද. අපේ අළුත් පළාත් සභාවකට ප්‍රවිෂ්ට වෙන්නේ. සමහර විට මේ සභා ගර්භය තුළ අපි ඉන්න පුළුවන්, නොපුළුවන් වෙන්න පුළුවන්. නමුත් ගරු ප්‍රධාන අමාත්‍යතුමා ඔබතුමා ප්‍රධාන අමාත්‍යවරයා හැටියට නියත වශයෙන් මේ සභාව නියෝජනය කරන නිසා ඔබතුමාට මේ පිළිබඳව මට මතක් කිරීමක් කිරීමට අවශ්‍ය වෙනවා. ගරු ප්‍රධාන අමාත්‍යතුමනි, අපි අපේ සේවකයාව රැක ගැනීමේ, රැකවරණය ලබා දීමේ විශේෂ උනන්දුවක් කාර්යය භාරයක් අපේ තියෙන්න ඕනෑ. ඒක දේශපාලන අධිකාරියෙන් වෙන්න ඕනෑ. ඒක ඔබතුමාගෙන් වෙන්න ඕනෑ. ඒක මේ සභාවෙන් වෙන්න ඕනෑ. මම මේ කියන්න යන කාරණාව මොකද්ද? ඇතැම් විට අධ්‍යාපන ක්ෂේත්‍රයේ විදුහල්පතිවරු හොඳට වැඩ කරගෙන යන කොට ඒක නුරුස්සන අපේ විපක්ෂයේ අය ඇතුළු ඒ වගේම අසම්මතවාදී සංවිධාන ඊර්ෂ්‍යා කුහකත්වයෙන් ඒක කඩා වට්ටවන්න කටයුතු කරනවා. හොඳ විදුහල්පතිවරයෙක් හෝ හොඳ විදුහල්පතිනියක් හරියට වැඩ කර ගෙන යනවා නම්, ඒකට පෙත්සම් ගහනවා. නොයෙක් කැළෑ පත්තර ගහනවා. ඒ අවස්ථාවේදී එකපාරටම ඒ පාසලට ගිහිල්ලා කඩා පැනලා විමර්ශනයක් කරන්න පෙර එහි සත්‍යතාවයක් තියෙනවා ද කියන කාරණාව අපි හරියට හොයලා බලන්න ඕනෑ. දැන් ඔබතුමාලා අහන්න පුළුවන් එකේ වරදක් තියෙනවාද කියලා. ඒකේ වරදක් නැති වුණත් ස්වභාවයේ වරදක් තියෙනවා. හොඳ තැනක හොඳ වැඩක් කරගෙන යන කොට කවුරු හරි ඇවිල්ලා ඒක විමර්ශනය කරනවා නම්, මතයක් යනවා එතන දූෂණයක් තියෙනවා කියන කාරණාව. ඒ නිසා ඒ තැන විශාල මානසික කඩා වැටීම් ඇති වෙනවා.

[ගරු හෙක්ටර් බෙත්මගේ ]

මම මේක වහෙන් ඕරෝ භාෂාවෙන් නොකිව්වට කෙළින්ම කියන්නේ, අද අපේ අධ්‍යාපන ක්ෂේත්‍රයේ එවැනි අඳුරු කාල පරිච්ඡේදයක යම් යම් සෙවණැලි තියෙනවා කියන කාරණාව ප්‍රකාශ කරන්නයි.

ඊයේ පෙරෙයිදා අපේ ශ්‍රී ජයවර්ධනපුර අධ්‍යාපන කලාපයේ එක්තරා අවාසනාවන්ත සිද්ධියක් වුණා. ඒ ශ්‍රී ජයවර්ධනපුර අධ්‍යාපන කලාපයේ වැඩ කරන අපේ ප්‍රධාන අංශයක සේවිකාවට ජාතික පාසලක ගුරුවරියක් ඇවිල්ලා තර්ජනය කරලා ඇයව මානසික අසහනයට පත් කළා විතරක් නොවෙයි, ඒ ආපු ගුරුවරිය කිව්වා මම අහවල් මාධ්‍ය ආයතනයේ වැඩ කරන්නේ. මට අහවල් මාධ්‍ය ආයතනයේ සම්බන්ධකම් තියෙනවා. ඒක නිසා බලා ගන්න, මම අනිවාර්යයෙන් ගෙදර යවලයි ඉවර වෙන්නේ කියලා. ඊට පස්සේ පොලිසියට යෑමේ ප්‍රශ්නයක් වුණා. පොලිසියෙන් ඇවිල්ලා ශ්‍රී ජයවර්ධනපුර අධ්‍යාපන කලාපයේ නිසි අවසරයක් නොගෙන, අර සේවිකාවගෙන් කට උත්තර ගත්තා. මේ නිසා එතැන විශාල ව්‍යාකූල තත්ත්වයක් ඇති වුණා. එතැන වැරදි දෙකක් වුණා. එකක් තමයි පොලිසියේ කිසි කෙනෙකුගේ නිසි අවසරයක් නැතිව කලාපයට ඇවිල්ලා ඒ සේවිකාවගෙන් කට උත්තරයක් ගත්තා. මම මේ වගේ දේවල් කියන්නේ ගරු ප්‍රධාන අමාත්‍යතුමනි, අපි මේකට යම් කිසි නෛතික වැඩ පිළිවෙළක් ඇති කළ යුතුයි කියන කාරණාවයි. ඔබතුමා මේ පාසල් පද්ධතිය ඉතාම හොඳින් නඟා සිටවන අවස්ථාවේදී මේක නුරුස්සන අය මෙවැනි වැඩ කටයුතු කිරීමේදී අපි බලාපොරොත්තු වන දේ වෙන්නේ නැහැ. ඒ වගේම සේවකයන්ගේ සිත් කඩා වැටීම් ඇති වෙනවා කියන අවධානය යොමු කරන්නයි මම මේක අවස්ථාවක් කර ගන්නේ.

ඒ වගේම මම ඉතාමත් සතුටින් ප්‍රකාශ කරන්න ඕනෑ. අද උදේ මම ඔබතුමාගේ ශිෂ්‍යත්ව සහතික ප්‍රධාන උත්සවයකට ගියා. එතනදී සුපසන් නිමේතර තුළ ඔබතුමාගේ වැඩ සටහන තුළ පින්තාරුව සඳහා මුදල් ලබා දෙන අවස්ථාවේදී පැවැති සාකච්ඡාවේදී එතැන ගුරුවරු සහ දෙමව්පියන් විශාල ඇගයීමකින් කථා කළා. මම මේ කාරණාව කියන්නේ, මේක අපි සුළු කර සලකන්න බැහැ. මොකද අද විශේෂයෙන්ම අපේ බස්නාහිර පළාත් සභාවේ පාසල් පද්ධතිය ආකර්ශනීය තත්ත්වයකට පත් කරලා තියෙනවා. ඒ තත්ත්වය තුළ අද දරුවන්ගේ දෙමව්පියන්ගේ, නිලධාරීන්ගේ, ගුරුවරුන්ගේ මානසිකත්වය ඉතා ඉහළට ඇවිල්ලා තියෙනවා. ඒ අවස්ථාවේදී මම කල්පනා කළා, අද මේ අයවැය විවාදයේදී ඔබතුමා වෙනුවෙන් ඒ පිළිබඳව සඳහන් කරන්න. ඔබතුමාට කරන ගෞරවයක් හැටියටයි ඒ අවස්ථාව මේ අවස්ථාවේදී මා ප්‍රකාශ කර සිටින්නේ. එතැනින් එහාට මා කථා කරන්න බලාපොරොත්තු වෙන්නේ නැහැ.

මගේ ගාමිණී තිලකසිරි හිටපු අමාත්‍යතුමා ප්‍රකාශ කළා වගේ මේ වැය ශීර්ෂයේ එහෙම නැතිනම් අපේ පළාත් සභාවට විශාල සේවයක් කළ සියළුම නිලධාරීන්ට මම නම් වශයෙන් කියන්න යන්නේ නැහැ. නම් වශයෙන් කියන්න ගිහිල්ලා නමක් දෙකක් අත හැරුණොත් යම් යම් සිත් තැවීම් ඇති වෙන්න පුළුවන්. සමස්ත බස්නාහිර පළාත් සභාවේ ඔබට සහාය දෙන සියලු කාර්යය මණ්ඩලයට මගේ ස්තුතිය පුද කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා ස්තුතියි.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

මෙම අවස්ථාවේදී අශෝකා ලංකාතිලක ගරු මන්ත්‍රීතුමිය මූලාසනාරූඪ වෙනවා.

***ඊට අනුකූලව මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා [ඒ.එම්. යූසුෆ් මහතා ] මූලාසනයෙන් ඉවත් වූයෙන්, අශෝකා ලංකාතිලක ගරු මන්ත්‍රීතුමිය මූලාසනාරූඪ විය.***

*Accordingly Hon. Presiding Member [Mr. A.M. Yoosuf M.P.C] left the Chair and Hon. Asoka Lankathilaka M.P.C took the Chair*

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමිය**
Hon. Presiding Member

රොස් ප්‍රනාන්දු ගරු මන්ත්‍රීතුමිය, ඔබතුමියට විනාඩි 08 ක් තියෙනවා.

[අ.භා. 02.21]

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

ස්තුතියි මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මේ අවස්ථාවේ මම තාක්ෂණය දියුණු වෙලා අපි යාන වාහනවල ගමන් කළාට, මම මතක් කරන්න කැමතියි. අපි ඉස්සර කාලේ ගමන් කළේ කරත්තෙන්. මේ කරත්තෙන් ගමන් කරන කොට අපි හරකාට දානවා නාස් ලණුවක්. මේ නාස් ලණුවෙන් තමයි අපි මේ සතාව පාලනය කරලා ගමන

අරගෙන යන්නේ. එතකොට අපට යන්න, අපි ලණුව බුරුල් කළාම ගොනා යනවා. අපි හයියෙන් අල්ල ගත්තහම එක තැන නවතිනවා. ඒ කියන්නේ -

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

ගොනා ඉස්සෙල්ලා යන්නේ නැද්ද ?

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

නහය විදලා තමයි මේ ගමන - (බාධා කිරීමක්) අද ගම්පහ දිස්ත්‍රික්කයේ වටිනා කාර්යය භාරයක් කරන්න අපේ මහ ඇමතිතුමා පත් වෙලා ඉන්නවා. අපේ රාජ්‍ය සමයේත් අපේ මහ ඇමතිවරු මේ රාජ්‍ය පාලනයට දායක වෙලා ඉතා විශාල වැඩ කොටසක් කළා. නමුත් මෙතැන ප්‍රශ්නයකට තියෙන්නේ, ගම්පහ දිස්ත්‍රික්කයේ ඇත්ත වශයෙන්ම හම්බන්තොටින් දාපු නාස් ලණුවලින් තමයි මේ ගම්පහ දිස්ත්‍රික්ක පමණක් නොවෙයි කළුතර, කොළඹ කියන දිස්ත්‍රික්ක ඔක්කෝම, හම්බනේතාටින් දාපු නාස් ලණුවලින් තමයි පාලනය කරන්නේ. එතකොට ගොනා කවුද කියලා තමුන්නාන්සේලා හිතා ගන්න. එතකොට මට කියන්න තියෙනවා මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අද අපේ ඇතැම් මන්ත්‍රීවරු කියනවා, මේ විපක්ෂයේ සහභාගිත්වය අඩුයි කියලා. අඩු වශයෙන් මහ ඇමතිතුමා දැවැන්ත කාර්යය භාරයක් කරන මහ ඇමතිතුමාගේ අයවැය විෂයය ගැන කථා කරන්න අනික් ඇමතිවරු තුන්දෙනාත් නැහැ.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

මේ එහා පැත්තේ ඉන්නවා.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

අඩු ගානේ අපි මන්ත්‍රීවරු ගැන කථා කරන්න ඉස්සෙල්ලා තමුන්ගේ පක්ෂයේ ඇමතිවරු ටිකත් නැහැ.

[සභාවේ ඝෝෂා]

ඒක හින්දා තමුන්නාන්සේලාට මම කියන්න ඕනෑ. ගම්පහ දිස්ත්‍රික්කයේ මන්ත්‍රීවරියක් හැටියට මම දන්නවා, විශාල රාජ්‍ය සේවක සංඛ්‍යාවක් ඉහළ අධ්‍යාපනයෙන් ඉහළට ගිය, ඉතාම උගත් පිරිසක් ඉන්න ප්‍රදේශයක් ගම්පහ දිස්ත්‍රික්කය. අපි අනිත් දිස්ත්‍රික්කවලට අගෞරවයක් කරනවා නොවෙයි. නමුත් මේ ප්‍රදේශයේ දියුණුව, ප්‍රදේශයේ වැඩ පිළිවෙළ ගැන කථා කරන්න ඒ ප්‍රදේශයේ ඉන්න ඒ උගතුන්ගේ ඒ දක්ෂතා තියෙන අයගේ ඒ විද්වතුන්ගේ පිට කොන්ද කඩන්නේ නැතුව ගම්පහ දිස්ත්‍රික්කයේ අයට ඉස්සරහට ඇවිල්ලා කටයුතු කරන්න අවස්ථාව ලබලා දෙන්න ඕනෑ. යම්කිසි කෙනෙක් යම් කිසි බලයකට යම් පිරිසක් යටත් කරගෙන ඉන්නවා නම්, ඒ සඳහා සටන් කරන්න මේ සියළුම මන්ත්‍රීතුමන්ලාට පිට කොන්දක් ඇති වේවායි මම ප්‍රාර්ථනා කරනවා. ඒ එක්කම මම කියන්න ඕනෑ අපේ මහ ඇමතිතුමාගේ විෂයයන් - (බාධා කිරීම්)

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමිය**
Hon. Presiding Member

රොස් ගරු මන්ත්‍රීතුමියට කථා කරන්න දෙන්න. බාධා කරන්න එපා.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

අපේ ගරු මහ ඇමතිතුමාගේ විෂයයන් ගැන කථා කරන කොට ගොඩක් දෙනෙක් අධ්‍යාපනය ගැන තමයි අවධානය යොමු කළේ. නමුත් විශේෂයෙන්ම මේ ආර්ථික ප්‍රවර්ධනය කියන ක්ෂේත්‍රය ගැනත්, වෙළඳ ක්ෂේත්‍රය ගැනත් මම කථා කරන්න බලාපොරොත්තු වෙනවා. මම අහගෙන හිටියා අපේ ගරු මන්ත්‍රීතුමන්ලා ගොඩ දෙනෙක් අධ්‍යාපනය ගැන විතරයි කථා කළේ. ඉතින් අපි දන්නවා. රටක් දියුණුවට ගෙනියන කොට විශාල කාර්යයභාරයක් කරන පළාත් සභාවක් හැටියට අපි ආර්ථික ප්‍රවර්ධනය ඇති කර ගැනීම අවශ්‍යයි. මේ ආර්ථික ප්‍රවර්ධනයේ දී අපි දකිනවා, ශ්‍රී ලංකාවේ නිෂ්පාදන කර්මාන්ත ඇති වෙලා තියෙනවා ඉතාමත් අඩුයි. ඉතින් මහ ඇමතිතුමාට පුළුවනි ඉස්සරහට පියවරක් ඉදිරියට තියන්න. අපි යම් කිසි නිෂ්පාදනයක් මේ ප්‍රදේශය තුළ ඇති කරලා, අපිට පුළුවන් පිටරටක ඉල්ලුමක් ඇති වෙන ආකාරයට යමක් නිෂ්පාදනය කරන්න විශාල ආදායමක් ලබා ගන්න පුළුවන් එවැනි කර්මාන්ත තියෙනවා. විශේෂයෙන්ම ලංකාවේ ඉබේ වැවෙන ගස් කොළන්වල තියෙනවා ඉතා වටිනා ගුණාත්මක පළතුරු. ඒ එක්කම ඉබේ වැවෙන ගස් කොළන් සමඟ තියෙනවා බෙහෙත් වර්ග. මේවා ගැන අපේ කිසිම අවධානයක් යොමු වෙන්නේ නැහැ. ඒවා හැදෙනවා, බිමට වැටෙනවා. සමහර දේවල් පොළොවට පස් වෙලා යනවා. දැන් උදාහරණයක්

විධියට ලංකාවේ වැවෙන පළතුරු කන්න උන්නදුවක් නැහැ. ලංකාවේ අය පිටින් ගේන ඒවා කනවා. සමහර විට ගුණාත්මක බව ඉතා අඩුයි. බෙහෙත් වර්ග ගල්වලා තියෙන්නේ. නමුත් මේ ස්වාභාවික පළතුරු අපි පාවිච්චි කරන්නේ නැහැ. ඉතින් අඩුම වශයෙන් මෙවැනි දේවල් ටින් කරලා විදේශයකට යවන්න, මේවායේ තියෙන ගුණාත්මකභාවය ගැන ප්‍රචාරයක් කරලා. එහෙම කරන්න අපි යම් කිසි වැඩ පිළිවෙළක් ආරම්භ කරන්න අවශ්‍යයි.

විශේෂයෙන් මේ වන කොට අපේ ජල මූලාශ්‍ර විනාශ වෙමින් යනවා. ලංකාවේ ජීවත් වෙන හැම පුරවැසියෙකුටම ජලය, විදුලිය ඉතාමත් අවශ්‍යයි. අද වැඩ කරන කොට හිටපු ගමන් විදුලිය නැතුව ගියා. මේ විදුලිය ඉතාම මිල අධික දෙයක් බවට පත් වෙලා තියෙනවා. අපිට පුළුවන් නම්, මේ අපද්‍රව්‍ය වලින් හරි විදුලිය උත්පාදනය කරලා ඉතාම අඩු මිලකට දෙන්න, ඒ තුළින් අපට නිෂ්පාදනය වැඩි කර ගන්න පුළුවන්. අද විදුලිය භාවිතා කරලා කරන නිෂ්පාදන ගොඩක්ම ඇණ හිටිලා තියෙනවා, මේ විදුලිය මිල අධිකයි. ඒ නිසා මම ඔබතුමාගේ අවධානය යොමු කරනවා මේ අපේ මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමිය හරහා. මේ විදුලිය මිල අඩු කරන භාණ්ඩයක් බවට පත් කරලා ජනතාව නිෂ්පාදනයට දායක කර ගන්න පුළුවන්. ඒ කියන්නේ කර්මාන්තකරුවන් කුඩා කර්මාන්තකරුවාගේ ඉඳලා මහා පරිමාණය දක්වා විදුලිය අවශ්‍ය වෙනවා. ඇත්ත වශයෙන්ම මෙවැනි භාර ධුර විෂයයන් ගැන පැයක්වත් කථා කරන්න අවශ්‍යයි. විනාඩි අටකින් කථා කරන්න බැහැ.

විශේෂයෙන්ම අපේ රජයේ ඉඩම් ඉතාම පරිපාලනයක් නොමැතිව නාස්ති වෙලා ගිහිල්ලා තියෙනවා. මේ ඉඩම් මැනලා සීමා මායිම් ලකුණු කරලා, වැව්, පොකුණු, ගංගා මේවා සියල්ලම මායිම් සලකුණු කරලා රජය යම්කිසි පරිපාලනයක් කිරීම අවශ්‍යය වෙලා තියෙනවා මේ සම්බන්ධයෙන් අවධානය මා යොමු කර සිටිනවා.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමිය**
Hon. Presiding Member

පංචරත්න මන්ත්‍රීතුමාගේ විනාඩි දෙකත් එක්ක තව විනාඩි දෙකහාමාරයි.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

විශේෂයෙන්ම අපි දකිනවා, හරියට මේ රජයේ ඉඩම් සම්බන්ධයෙන් නීති ප්‍රශ්න මතු වෙනවා. ඒක ආයතනයකට ගියාම කියනවා මේක අපට අදාළ නැහැයි කියලා. තව ආයතනයකට ගියාම කියනවා අපට තාම පවරලා දීලා නැහැයි කියලා. සමහර ඉඩම්වල මිනිස්සු පදිංචි වෙලා ඉන්නවා. ඔප්පු මොකුත් ලබා දීලා නැහැ. තවත් සමහර ඉඩම්වල පුද්ගලිකව කර්මාන්ත පවා පවත්වා ගෙන යනවා. සමහරු මැටි, වැලි කපලා රජයේ ඉඩම් විනාශ කරනවා. මේ ගැන කිසිම විධිමත් සැලැස්මක් ක්‍රියාත්මක වෙනවා පේන්නේ නැහැ. දැන් සමහර නිලධාරීන් විසින් ව්‍යාජ ලියකියවිලි හදලා රජයේ ඉඩම් යම් අයට පවරලා දීලා තියෙනවා. අපිට අවස්ථා කිහිපයකම දැන ගන්න ලැබිලා තියෙනවා. මීනුවනේගොඩ නගර සභාවේ ඉඩමකත්, දැන් පුද්ගලයෝ පදිංචි වෙලා තියෙනවා. මම ඒ ගැනත් කළින් අවස්ථාවක අවධානය යොමු කළා. මෙවැනි කාරණා ගැන නිසි අවධානයක් යොමු කරලා මේ ඉඩම්වලින් විශාල ප්‍රයෝජනයක් ගන්න පුළුවන්. මේ රජයේ ඉඩම් නිකන් කැළෑ වැවිලා තියන්න දෙන්නේ නැතුව. මේ නිෂ්පාදන කාර්යයට දායකත්වය ගන්න පුළුවන්. ලබන වර ඔබතුමා මහ ඇමතිතුමා වෙන්න කියලා හැම කෙනෙක්ම ප්‍රාර්ථනා කළා. එහෙම වුණොත් මෙම නිෂ්පාදන ක්‍රියාවලිය ගැන විශේෂ අධ්‍යයනයක් කරන්න. මේ උගතුන්ගෙන්, විද්වතුන්ගෙන් සමන්විත කමිටුවක් පත් කරලා, ඒ නිෂ්පාදන ක්‍රියාවලියත් විදේශගත සමාගම් එක්ක සම්බන්ධ කරලා - අඩු වශයෙන් අපේ විටමින් සහිත වතුර තියෙනවා. අපිට අහසෙන් නිකන් ලැබෙන්නේ. මේ ලංකාවෙත් වතුර බෝතලයක් අපි රුපියල් සීයයකට ගන්නවා. විදේශයේ මුහුදු වතුර පෙරළා බොන රටවල් තියෙනවා. මේ ස්වාභාවික වතුර. විටමින් සහිත වතුර වුණත් විදේශිකයන්ට රුපියල් පන්සීයයකට වුවත් අළෙවි කරන්න පුළුවන්කම තියෙනවා. මේ ගැන කල්පනා කරලා යම්කිසි නිෂ්පාදනයක් කරලා මේ රටට විදේශ මුදලක් ලබා ගන්න පුළුවන් විධියට මේ ආර්ථික ප්‍රවර්ධනය සිදු කරන්න කියලා මා යෝජනාවක් කරනවා.

එත් එක්කම රැකී රක්ෂා නැතිව ඉන්න පිරිස. රැකී රක්ෂාත් ඔබතුමාගේ අමාත්‍යාංශයට වැටෙන්නේ. රැකිරක්ෂා නැති පිරිස මේ කාර්යයට අපිට දායක කර ගන්න පුළුවන්. ඒ එක්කම ගුණාත්මක සේවාවක් සපයන්න පුළුවන්. ඔබතුමා මේ දේ කලොත් සමහර විට මේ රටේ තියෙන රැකියා ගැටළුවට විශාල දායකත්වයක් බස්නාහිර පළාතෙන් ලබා දුන්නොත්, ඔබතුමා බස්නාහිර මහ ඇමති නොවෙයි, ඊළඟට අගමැති ධූරයට පවා යන්න සුදුසුකම් ලැබෙනවා. ඒ නිසා අපි කියනවා ඉතාම දූරදර්ශීව, මේ දෙපැත්තට

බෙදීලා පිල් බෙදා ගෙන කෑ ගහන දේශපාලනයක් නොවෙයි. මේ විපක්ෂ දායකත්වය - ලබන පාර ඔබතුමන්ලා විපක්ෂයේ ඉන්න පුළුවන්. ඒ සියළු දෙනාගේම දායකත්වය

[සභාවේ ඝෝෂා]

අරගෙන මේ කාර්යය හරියට කරන්න කියලා ඉල්ලීමක් කරමින්, ඒ එක්කම තමුන්නාන්සේලාගේ අර නාස් ලණුව කපා ගන්නත් උනන්දු වෙන්න කියමින් මා නිහඬ වෙනවා.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමිය**
Hon. Presiding Member

බොහෝම ස්තුතියි මන්ත්‍රීතුමිය. ඊළඟට ගුණසිරි ජයනාත් ගරු මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 10 ක කාලයක් තියෙනවා.

[අ.භා. 02.30]

**ගරු ගුණසිරි ජයනාත්**
Hon. Gunasiri Jayanath

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, බස්නාහිර පළාත් සභාවේ වැදගත්ම විෂයය වන ප්‍රධාන අමාත්‍ය සහ අධ්‍යාපන අමාත්‍යාංශ වැය ශීර්ෂය සාකච්ඡා වන වෙලාවේ ඉතාම සතුටින් සඳහන් කරන්න කැමතියි අද විපක්ෂය පැත්තෙන් අදහස් දක්වපු ගරු මන්ත්‍රීතුමන්ලා බොහෝ විට සඳහන් කළේ අධ්‍යාපනයේ දියුණුව ගැන. කිසිවිටකවත් මේ අමාත්‍යාංශයට අයත් ප්‍රධාන විෂයය වන අධ්‍යාපන කාරණාව පිළිබඳ විෂයය ගත්තහම, පළාතේ අධ්‍යාපනය වැටුනයි කියන්න කිසිවිටෙකත් කීවේ නැහැ. කිසිදු සාධකයක් මේ අයට ඉදිරිපත් කර ගන්න හැකියාවක් තිබුණේ නැහැ. අපේ ගෞරවනීය ස්වාමීන් වහන්සේ ඉදිරිපත් කළ විශ්ලේෂණය අනුව 2008 වසරේ සහ 2012 වසරේ අපොස සාමාන්‍ය පෙළ සහ ශිෂ්‍යත්වය. ඒ වගේම උසස් පෙළ සහ විශ්ව විද්‍යාල ප්‍රවේශය කියන කාරණා එක්ක ගත්තහම 2008 ඉඳන් 2012 වන කොට සියයට ගණනින් ඉතා විශාල ඉලක්කයන් අභිබවා ගිහින් ඉතා විශිෂ්ට ආකාරයට බස්නාහිර පළාත් සභාවේ අධ්‍යාපන විෂයය ඉතා ක්‍රමිකව උසස් මට්ටමකට පත් වෙන්නට වර්තමාන ප්‍රධාන අමාත්‍යතුමාගේ වකවානුව තුළ කටයුතු කරලා තියෙනවා. එතුමා මේ විෂයය භාර ගත්තේ 2009 වසරේ. එදා සිට අද දක්වා අ.පො.ස සාමාන්‍ය පෙළ සහ ශිෂ්‍යත්වය විභාග කඩඉම් සමත් වීමේ ප්‍රවනතාවය සීඝ්‍ර ලෙස ඉහළ ගිහිල්ලා තියෙනවා.

දැන් මීට පෙර අදහස් දක්වපු රෝස් මන්ත්‍රීතුමිය අධ්‍යාපන විෂයය ගැන කථා කරන්නේ නැහැයි කිව්වා. මොකද, කථා කරන්න බැහැ. කථා කරන්න දෙයක් නැහැ. වරදක් පෙන්නලා දෙන්න විධියක් නැහැ. වරදක් පෙන්නන්න දෙයක් නැහැ. එවැනි විශිෂ්ට ආකාරයට ඒ අමාත්‍යාංශයේ කාර්යය භාරය අපේ ප්‍රධාන අමාත්‍යතුමා ගෙනිහිල්ලා තියෙනවා. ඒ වාගේම මුජිබුර් රහුමාන් ගරු මන්ත්‍රීතුමා අදහස් දැක්වීමේ දී - මහා ආණ්ඩුවට අයිති කාරණයක් අපේ විෂයයක්, එක්ක ගලපන්න එතුමා උත්සාහ කරන්න යෙදුවා. අපේ පළාත් සභාවේත් එතුමාට සඳහන් කරන්න වෙන්නේ, ප්‍රධාන අමාත්‍යතුමාගේ වැය ශීර්ෂයය කථා කිරීමේදී කිසිදු ආකාරයේ වරදක් පෙන්වා දෙන්නට නොහැකියාව උඩ මහා ආණ්ඩුව හරහා සිද්ධ වෙන යම් යම් හේතු කාරණා පෙන්වා දෙමින්, ඉතා සාරගර්භ අදහස් රාශියක් ඒ පැත්තෙන් එතුමා ඉදිරිපත් කළා. ඒ නිසා අපි සතුටුවෙනවා අද අපේ ප්‍රධාන අමාත්‍යතුමා බස්නාහිර පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍ය සහ අධ්‍යාපන අමාත්‍යවරයා හැටියට අපේ පළාත් සභාවට අයිති පාසල් පද්ධතිය සංවර්ධනය කරන්න, මහජන නියෝජිතයෙක් හැටියට එතුමාට දෙන්න පුළුවන් උපරිම කැපවීම දායකත්වය, මේ අධ්‍යාපන අමාත්‍යාංශය හරහා ක්‍රියාත්මක කරලා දීලා තියෙනවා. ඒ වාගේම මම ඉතාම ස්තුතිවන්ත වෙනවා. ඉතා ආදර්ශමත් ආකාරයෙන්, මුළු රටටම ආදර්ශයක් සපයමින් බස්නාහිර පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍යවරයා හැටියට එතුමා මහජන දිනය වන බදාදා දින මේ රටේ තිබිය නම් කිසිදු දිනයක් වරද්දන්නේ නැතුව ඒ අමාත්‍යාංශයේ විෂයය පථයට අයිති සියළුම නිලධාරී මණ්ඩලයත්, ඒ වාගේම එතුමාගේ පෞද්ගලික කාර්යය මණ්ඩලයත් උපරිමයෙන් යොදා ගෙන බස්නාහිර පළාතේ මහජනතාවගේ අවශ්‍යතාවයන් විසඳන්න අති විශාල කැප වීමක් එතුමා මේ පළාත් සභා කාලය තුළ පියවර ගත්තයි කියන කාරණය මතක් කරන්න කැමතියි.

ඒ හරහා මම දකින්නේ, එතුමා මේ විධිමත් වැඩ පිළිවෙළ පළාතේ සංවර්ධනයට, පළාතේ අධ්‍යාපනය දියුණු කරන්නට මේ තුළ එතුමාට අත්දැකීම් රාශියක් ලැබුණු බවයි. එක පැත්තකින් අර කලාප කමිටුව හරහා මහජන නියෝජිතයෝ කලාප කමිටුවේ නිලධාරීන් එක්ක ඉඳගෙන ඒ ප්‍රශ්න සාකච්ඡා කරලා ගන්න අදහසත්, ඒ වාගේම අමාත්‍යාංශ උපදේශක කාරක සභාව හරහා ඒ ගන්නා වූ

[ගරු ගුණසිරි ජයනාත් ]

අදහසුත්, ඒ වාගේම පළාත තුළ ඉන්න සාමාන්‍ය පුරවැසියන්ගෙන් එල්ල වෙන ගැටළු හා ප්‍රශ්න සහ යෝජනා බදාදා දිනය අරගෙන මේ සියල්ල සංකලනය කරගෙන තමයි එතුමා මේ වැඩ පිළිවෙළ බස්නාහිර පළාත් සභාව තුළ දියත් කරන්න කටයුතු කළේ. ඒක ඉතාමත් විශිෂ්ට ක්‍රියාවක්.

මේ සභාවේ දිගින් දිගටම අපේ මන්ත්‍රීතුමන්ලා අපේ නිලධාරී මහත්ම හා මහත්මියන්ට ස්තුතිවන්ත වුණා. ඒක සැබෑවක්. ප්‍රධාන ලේකම්තුමිය ප්‍රධාන අමාත්‍යාංශ ලේකම්තුමා. ඒ වාගේම මම විශේෂයෙන්ම ස්තුතිවන්ත වෙනවා. එතුමාගේ මේ ගමන ශක්තිමත් කරන්නට ඒ වගේම කැපවීමක් කරන එතුමාගේ පෞද්ගලික කාර්යය මණ්ඩලය - අර අපේ ගාමිණී තිලකසිරි ගරු හිටපු ඇමතිතුමා කිව්වා වගේ අමාත්‍යාංශ ලේකම්තුමා ප්‍රධාන නිලධාරීන්ගේ හොඳකම වගේම එතුමා වැටෙන්න ප්‍රධාන හේතුවක් වෙනවා, පෞද්ගලික කාර්යය මණ්ඩලය කාර්යක්ෂම, හරි උපදෙස් දෙන, හරි මඟ පෙන්වන හොඳ කාර්යය මණ්ඩලයක් හිටියේ නැත්නම්. ඒ සාර්ථකත්වය පිටුපස මම මේ වෙලාවේ අපේ මහජන නියෝජිතයෝ වෙනුවෙන් ස්තුතිවන්ත වෙනවා. එතුමාගේ පෞද්ගලික ලේකම්තුමා ප්‍රධාන කාර්යය මණ්ඩලයත් මේ වැඩ පිළිවෙළ ශක්තිමත් කර ගන්න අතිවිශාල කාර්යය භාරයක් ක්‍රියාත්මක කරන්න යෙදුනා.

ඒ වාගේම තමයි අධ්‍යාපන විෂයයේ අද අපි ඉතාම සතුටු වෙනවා. අපේ පළාත් ගත්තහම මම නියෝජනය කරන බියගම අධ්‍යාපන කොට්ඨාශයේ කැලණි කලාපයේ අද අපි අඩක් නිම කරපු ගොඩනැඟිලි මේ වෙන කොට සම්පූර්ණයෙන් හදලා ඉවර කරලා තිබෙනවා. විශේෂයෙන් බියගම අධ්‍යාපන කොට්ඨාශය. ඒ වගේම සතුටු වෙනවා. මීට අවුරුදු දෙක තුනකට එහා විදුහල්පතිවරු සහ දෙමව්පියෝ අපිට කළ චෝදනාවක් තමයි පන්ති කාමරයේ දරුවන්ට උගන්වන්නට ගුරුවරු නැහැයි කියලා. අතිවිශාල චෝදනාවක් අපට ඉදිරිපත් කළා. අද ඉතාම සතුටු වෙනවා. මෙතුමාගේ තියෙන දක්ෂ වැඩ පිළිවෙළ තුළ අද විශ්‍රාම යන කොට මාසෙන් දෙකෙන් අවශ්‍ය ගුරු සම්පත නැවත පාසල් පද්ධතියට එකතු කරන නිර්මාණශීලී වැඩ පිළිවෙළක් හඳුන්වා දීලා, අද උපාධිධාරීන් 7,000 කට වැඩි ප්‍රමාණයක් මෙතුමාගේ මේ කෙටි කාලය තුළ පාසල් පද්ධතිය තුළ එකතු කරලා තියෙනවා.

ඊළඟ කාරණය තමයි මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මේ දිනවල අපි පාසල්වල යනවා, අර සුපසන් අධ්‍යාපනික වැඩ පිළිවෙළ තුළ පාසල්වල ප්‍රතිඵල විශ්ලේශණය කරමින්. බොහෝවිට ඇතැම් විදුහල්පතිවරු, මහත්ම මහත්මීන් කියන්න උත්සාහ කළා, යම් යම් අවුරුදුවල ප්‍රතිඵල අඩු වීමට හේතු කාරණා. අපි විමසුවාම ඒ අය බොහෝ විට පෙන්වා දෙන්න කටයුතු කළා අවුරුදු දහයේ ගුරුමාරු ප්‍රතිපත්තිය නිසා දක්ෂ ගුරුවරු ටික අපේ පාසලෙන් ගියා. මේ උපාධිධාරී පත්වීම් ගත්ත අය ආවා. ඒ අයට උගන්වන්න බැහැ. ඒ නිසා ප්‍රතිඵල අඩු වුණා කියලා කිව්වා. ඒකට ප්‍රතිකර්මයක් හැටියට ප්‍රධාන අමාත්‍යතුමා මහ ආණ්ඩුවත් එක්ක සාකච්ඡා කරලා, අති විශාල මුදලක් අරගෙන අපේ නිලධාරී මණ්ඩලය මෙහෙයවා ගෙන අර වෘත්තීය සමිති කඩා කප්පල් කරන්න හදද්දී, ගුරුවරු පාරට බැහැලා පිකටින් කරන්න හදද්දී, ඉතා වෙහෙසක් දරලා ඉතා ආයාසයකින් ඒ අවශ්‍ය ගුරු මණ්ඩලයට උපාධිධාරී ගුරුභවතුන් අති විශාල ප්‍රමාණයකට ගුරු පුහුණුව දීලා දැන් යාවත්කාලීන කරලා පන්ති කාමරයට එවලා තියෙනවා, අපේ දරුවන්ට ගුණාත්මක අධ්‍යාපනයක් ලබා දෙන්න. ඒක ඉතා විශිෂ්ට ක්‍රියාවලියක්.

ඒ වාගේම 2014 වසරේ එතුමා බලාපොරොත්තු වෙනවා ඉංග්‍රීසි, විද්‍යාව, ගණිතය කියන විෂයයන් පිළිබඳවත් විශේෂ ගුරු පුහුණු වැඩ පිළිවෙළකට අවතීර්ණ වෙන්නට. මේ තුළ අපි බලාපොරොත්තු වන ඉලක්කයන් කරා යන්නට අපට හැකියාව ලැබෙනවා. බස්නාහිර පළාත් සභාවේ සාක්ෂරතාවය 96% දක්වා ගෙන යන්නට පුළුවන් වැඩ පිළිවෙළක් එතුමා යොදවලා තිබ්බ නිසා තමයි අද 96% ක සාක්ෂරතාවයක් අපේ බස්නාහිර පළාතේ ඇති වෙලා තියෙන්නේ. එතුමා බලාපොරොත්තු වෙනවා, එය 2016 වන කොට 98% දක්වා යන්නට. ඒ වගේම අද අපේ පළාතේ දරුවෝ විශිෂ්ට දරුවෝ බවට පරිවර්තනය කරන්නට, හොඳ පෞරුෂයක් තිබෙන ගුණාත්මක හැදියාවක් තියෙන දරුවෝ බවට පරිවර්තනය කරන්න ගත්තු සුවිශේෂ ක්‍රියා මාර්ගයක් තමයි වෙනත් පළාත් සභාවක් එක්ක සංසන්දනය කරද්දී දරුවන් දහම් පාසල් ගත කරන වැඩපිළිවෙළ. දරුවන් දහම් පාසල් ගත කරන වැඩ පිළිවෙළ පමණක් නොවෙයි, කවුරුත් නොකළ එතුමාගේ ඉතා හොඳ අදහසක් අනුව දහම් පාසල් සංවර්ධනය කරන්නත් මේ විෂයය පථය හරහා මූලික ආරම්භයක් හැටියට බස්නාහිර පළාතේ සෑම දහම් පාසලකටම රුපියල්

ලක්ෂය බැගින් ලබා දෙන වැඩ පිළිවෙළක් තුළින් දහම් පාසල් දියුණු කරන්න එතුමා ක්‍රියාත්මක කළා. මේවා ඉතා හොඳ වැඩ පිළවෙළවල්. මේ සියලු දෙනාට මම මතක් කරන්න කැමතියි. මහ සමාජවාදයක් ගැන කථා කරන ජනතා විමුක්ති පෙරමුණට කවදාක්වත් මේ පළාත් සභාවේ අදහසක් දීලා නැහැ, මෙන්න මේක ක්‍රියාත්මක කරන්න කියලා. මොනවා හරි ගොඩක් අල්ල ගෙන විවේචනය කළ එක තමයි හැමදාම කළේ. එහෙම නැතුව මේ වගේ අදහසක් ඉදිරිපත් කළේ කවද්ද කියලා මම ජනතා විමුක්ති පෙරමුණෙන් අහනවා, මහ ලොකු සමාජවාදයක් ගැන කථා කරනවා. රටේ ජනතාව ගැන ආදරයෙන් කථා කරනවා. නමුත් මොකක් හරි කුණු ගොඩක් අල්ල ගෙන විවේචනය කරනවා මිසක් එලදායි කිසිම යෝජනාවක් මේ අධ්‍යාපන විෂයය සංවර්ධනය කරන්න කවදාකවත් ඇති කරලා ඉදිරිපත් කරලා නැහැයි කියන කාරණය මම මේ වෙලාවේ මතක් කරනවා.

ඒ වාගේම තමයි අපේ ප්‍රධාන අමාත්‍යතුමාට මම ඔබතුමියගේ මාර්ගයෙන් අවධානය කරනවා, මේ ගුරු මාරු ප්‍රතිපද්තිය ක්‍රියාත්මක කරද්දී වෘත්තීය සමිති මේකට ප්‍රධාන පාර්ශවයක් හැටියට සහභාගි වෙනවා. බොහෝ විට මේ ගුරු මාරු සිද්ධ වෙද්දී වෘත්තීය අයිතිවාසිකම් කියා ගෙන මේ වෘත්තීය සමිති මහ නොපනත් ක්‍රියා මේ තුළ කරනවා. ඒ නිසා අපේ ප්‍රධාන අමාත්‍යතුමාගේ කාරුණික අවධානය මම යොමු කරනවා, මේ ගුරු මාරු ප්‍රතිපත්තිය හරහා මේ වෘත්තීය සමිති කරන හිතුවක්කාරි, සුදුසු නැති නොගැළපෙන ඒ අයගේ පෞද්ගලික අවශ්‍යතා ඉෂ්ට කර ගන්නා වූ වැඩ පිළිවෙළවල් නැවැත්වීමේ වැඩ පිළිවෙළක් තුළ මේ ගුරු මාරු ප්‍රතිපත්ති ක්‍රියාත්මක කරන කොට ඔබතුමාගේ අවධානය ඒ සඳහා යොමු කරන්න කියන කාරණය මම මේ වෙලාවේ මතක් කරනවා.

ඒ වාගේම තමයි මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමිය මාර්ගයෙන් ගරු ප්‍රධාන අමාත්‍යතුමාගේ අවධානයට මා යොමු කරනවා, අපේ පළාත් සභාව තුළ පාසල් පද්ධතියේ අද විශාල ලෙස අඩු නොවුණත් යම් ප්‍රමාණයක අඩුවක් පවතිනවා. අපට ශාරීරික අධ්‍යාපන ගුරුභවතුන්. මේ ශාරීරික අධ්‍යාපන ගුරුභවතුන්ගේ අවශ්‍යතාවය අද ඉතා වැදගත් කොට මම සලකනවා. මොකද අද ජීවිතයේ අපේ දරුවෝ පොතපතේ දැනුම ලබා ගත්තට මදී. හොඳ පෞරුෂයක් තියෙන අනාගත අභියෝග ජය ගන්න පුළුවන් නිර්මාණශීලී දරුවන් බිහිවන්නට හොඳ ශරීර සෞඛ්‍යක් තියෙන, හොඳට හිතන්න පුළුවන් දක්ෂ කාර්යය ශූර දරුවන් බිහි කර ගන්නට නම් අපි අපේ දරුවන් අනිවාර්යයෙන් ක්‍රීඩාවට යොමු කරන්න අවශ්‍ය වෙනවා. අද අපේ පොඩි ගැටළුවක් තියෙනවා. දරුවෝ අඩු පාසල්වලට ශාරීරික අධ්‍යාපනය උගන්වන්නට ගුරුවරුන් අඩුයි. විද්‍යාපීඨවලින් ලැබෙන ගුරුවරුන්ගේ අඩුකම නිසා මේ අඩුව අපට පියවා ගන්නට හැකියාවක් නැහැ. මා ඒ නිසා මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමිය මාර්ගයෙන් ගරු ප්‍රධාන අමාත්‍යතුමාගේ අවධානයට යොමු කරනවා. කිසියම් විකල්ප වැඩ පිළිවෙළක් යොදා ගෙන ක්‍රීඩා අමාත්‍යාංශයත් එක්ක සාකච්ඡා කර ගෙන ජාතික මට්ටමේ සිට ජාත්‍යන්තර මට්ටමේ ක්‍රීඩා ජයග්‍රහණ ලබා ගත් දරුවන් හඳුනා ගෙන යම් ක්‍රමවේදයක් හදා ගෙන පුහුණු පාඨමාලාවන්ට යොමු කරමින් අපේ පාසල් පද්ධතියේ දරුවන්ගේ සංඛ්‍යාව තකන්නේ නැතුව සියලුම පාසල්වලට ශාරීරික අධ්‍යාපන විෂය සඳහා -

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමිය**
Hon. Presiding Member

ඔබතුමාට තව විනාඩියක් විතරයි.

**ගරු ගුණසිරි ජයනාත්**
Hon. Gunasiri Jayanath

ගුරුභවතුන් ලබා දෙන වැඩ පිළිවෙළක් ආරම්භ කරන්න කියන කාරණය මම මතක් කරනවා. ඒ වාගේම අවසාන වශයෙන් වැඩි වෙලාවක් නැති නිසා ගරු ප්‍රධාන අමාත්‍යතුමාගේ අවධානයට මම යොමු කරනවා, අද පළමුවෙනි ශ්‍රේණියට දරුවන් ඇතුළත් කර ගැනීමේදී අපි විශේෂයෙන් ලොකු ගැටළුවකට පත් වෙලා ඉන්නවා. මම බියගම අධ්‍යාපන කොට්ඨාශය පිළිබඳව කථා කළ යුතුයි. බියගම මැතිවරණ කොට්ඨාශය කියන්නේ, ඉතාම සීඝ්‍රව නාගරීකරණය වුණු ප්‍රදේශයක්. මේ ප්‍රදේශයේ මේ වන කොට ජාත්‍යන්තර පාසල් පහක් ක්‍රියාත්මක වෙනවා. මේ ජාත්‍යන්තර පාසල් පහක් ක්‍රියාත්මක වෙන්නේ, යම් විශාල ගැටළුවක් තිබෙන නිසා. අද ප්‍රදේශයේ නාගරීකරණය වීම මත අපේ රජයේ පාසල්වලට ඇතුළත් වෙන්න තියෙන ඉඩකඩ ඉතාම අවම වෙලා තියෙනවා. විශේෂයෙන් බියගම ප්‍රාථමික විද්‍යාලය සහ සපුගස්කන්ද සෝභිත විද්‍යාලය කියන විද්‍යාලවල විශාල ජන සනත්වය වැඩි වෙලා කිසිදු පාසලකට ලකුණු කැපෙන්නේ නැති දරුවෝ විශාල ප්‍රමාණයක් ඉන්න නිසා අද International පහක් අපේ කොට්ඨාශයේ ක්‍රියාත්මක වෙනවා. අපි දැඩි

[ගරු ගුණසිරි ජයනාත් ]

ස්ථාවරයක ඉන්නවා සමාන්තර පන්ති වැඩි කරන්නේ නැහැයි කියලා. අපේ මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමිය මාර්ගයෙන් අපේ ප්‍රධාන අමාත්‍යතුමාගේ අවධානයට මම යොමු කරනවා, මේ දැඩි තීරණයේ ඉන්නේ නැතුව ප්‍රායෝගිකව හිතන ප්‍රධාන අමාත්‍යවරයෙක් හැටියට ඔබතුමා මේ පිළිබඳව කල්පනා කරලා - එහෙම නොවුණොත් කවදා හෝ දිනක අපේ ජනතාව අපට චෝදනා කරාවි, පාරට බැහැලා පෙළපාළි යාවී International කාරයොත් එක්ක අපි හොර ගිවිසුම් ගහලා නිසා රජයේ පාසල්වලට ඇතුළත් වෙන්න තියෙන ඉඩ කඩ අපි වහලා තියෙනවා කියලා. ඒ චෝදනාව ඉතා ඉක්මනින් අපට එල්ල කළා වී කියන සැකය මා තුළ තියෙනවා ගරු ප්‍රධාන අමාත්‍යතුමනි. ඒ නිසා ඔබතුමා මේ පිළිබඳව ලබන වසරේ සිට අපේ සැලසුම් කලාපයේ තියෙනවා සැලසුම් අංශයක්. ඒ සැලසුම් අංශය දැනුවත් කරලා සෑම වසරකම ඒ පිළිබඳ තක්සේරුවක් හදා ගෙන, සැලසුම් හදන වැඩ පිළිවෙළකට අපේ කලාප කාර්යයාල අනුගත කරන වැඩ පිළිවෙළකට, අවතීර්ණ වෙන්නැයි කියන කාරණය මතක් කරමින් සියලු දෙනාට ස්තුතිවන්ත වෙමින් මම නිහඬ වෙනවා. බොහෝමත්ම ස්තුතියි.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමිය**
Hon. Presiding Member

ඊළඟට විකුම් ගුණසේකර මන්ත්‍රීතුමා ඔබතුමාට විනාඩි 10 ක කාලයක් තියෙනවා.

[අ.භා. 02.43]

**ගරු විකුම් ගුණසේකර**
Hon. Wikum Gunasekara

බොහෝමත්ම ස්තුතියි මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමිය, අපගේ ප්‍රධාන ඇමතිතුමාගේ අධ්‍යාපන අමාත්‍යාංශ වැය ශීර්ෂයේදී අපිට විශේෂයෙන්ම මතක් කරන්න ඕනෑ, මොකද ගම්පහ දිස්ත්‍රික්කයේ සියළුම ආණ්ඩු පක්ෂයේ සහ විපක්ෂයේ මන්ත්‍රීවරු එතුමා වෙනුවෙන් එතුමා ගැන බොහෝම විශිෂ්ට විධියට අගේ කළා. එතුමාගේ කටයුතු පිළිබඳව ඉතින් අපට බොහෝම ආඩම්බරයි. එතුමා ඒ දක්වලා තියෙන සහයෝගය පිළිබඳව.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

අන්තිම අයවැය නේ? ඒකයි.

**ගරු විකුම් ගුණසේකර**
Hon. Wikum Gunasekara

අන්තිම අයවැය නොවෙයි. කොහොම වුණත් මම හිතන විධියට විපක්ෂයේ, ආණ්ඩු පක්ෂයේ කිසිම මන්ත්‍රීවරයෙක් මේ සභාවේදී විවේචනය කළේ නැහැ. හොඳ ආදර්ශමත් ප්‍රධාන අමාත්‍යවරයෙක් හැටියට අපට සන්තෝෂයි. පස්වන පළාත් සභාවේ මොකද අපි ආධුනික මන්ත්‍රීවරු. අපි දන්නවා හිටපු මහ ඇමතිවරුත් එක්ක - කවදාවත් ඒ දිස්ත්‍රික්කයේ මන්ත්‍රීවරයෙක් ඒ මහ ඇමතිතුමාව අගය කරලා කථා කළේ නැහැ. ඒ වුණාට අපේ මහ ඇමතිතුමාව හැමෝම, විපක්ෂයේ සහ ආණ්ඩු පක්ෂයේ දෙගොල්ලෝම එකතු වෙලා බොහෝම හොඳට අගය කළා. අපි ඒ පිළිබඳව සන්තෝෂ වෙනවා.

ඉතින් අධ්‍යාපනය පිළිබඳව කථා කරන කොට මම ඇත්තටම අධ්‍යාපන උපදේශක කාරක සභාවට සෑම දවසකම සහභාගී වන මන්ත්‍රීවරයෙක්. අපි දන්නවා අධ්‍යාපනය පිළිබඳව අද තියෙන දියුණුව. මම හිතන්නේ, බස්නාහිර පළාතේ පළාත් සභා පාසල්වලින් හොඳම පාසල තියෙන්නේ, පානදුර කොට්ඨාශයේ, පානදුර බාලිකා විද්‍යාලය. හැබැයි, තෝර ගත්ත ළමයි ප්‍රමාණයක් තමයි ඒකට ඇතුළත් කරලා කටයුතු කරලා තියෙන්නේ. ඒ වගේම හොඳම ක්‍රීඩා පාසල තියෙන්නේත් පානදුර කොට්ඨාශයේ, පානදුර රාජකීය විද්‍යාලය. ඇත්තටම අපි බොහෝම සතුටු වෙනවා. එතුමාගේ ගම්පහ දිස්ත්‍රික්කයේ පමණක් නොවෙයි කළුතර දිස්ත්‍රික්කයෙත් ඒ සියළුම පාසල්වලට ඒ සමානව සැලකීම පිළිබඳව. අපිට බොහෝම අගයක් තියෙනවා. ඇත්ත වශයෙන්ම අපි අද ගත්තාම මතුගම කොට්ඨාශයේ, ඒ වාගේම හොරණ කොට්ඨාශයේ, මතුගම කලාපයේ, හොරණ කලාපයේ , කළුතර කලාපයේ ඒ සියළුම කලාප තුනේම අධ්‍යාපන සම්බන්ධයෙන් දැනට දැවැන්ත කාර්යය භාරයක් කරලා තියෙනවා.

ඒ වාගේම කලාප කාර්යාල. ඇත්ත වශයෙන් මට සන්තෝෂයි. කළුතර කලාපයට අපේ කලාප අධ්‍යක්ෂකතුමිය පුදුම විධියට වෙනසක් කරලා තියෙනවා. එදා තිබ්බට වඩා අද මම හිතන්නේ, අපේ විපක්ෂයේ යූසුෆ් හිටපු ඇමතිතුමා දන්නවා. පුදුම විධියට ලොකු වෙනසක් කරලා තියෙනවා. ඒ නිසා අපිට හරි සතුටුයි. ඔබතුමා මුදල් දීලා තියෙනවා. ඒ දීලා හරියට කළමනාකරණය කරලා බොහෝම හොඳ සුපසන් තැනක් හැටියට එතන හදලා තියෙනවා. කළුතර කලාපයට අද ආසාවෙන් ගිහිල්ලා

කටයුතු කරගෙන එන්න පුළුවන් තත්ත්වයක් ඇති කරලා තියෙනවා. විශේෂයෙන්ම අපි වැහෙන පාසල් අපේ කොට්ඨාශයේ කිහිපයක් තිබ්බා. පානදුර පිංවත්ත විද්‍යාලය වැහෙන්න අභියෝගයකට ලක් වෙලා තිබුණා. ඊට පස්සේ ගුණවර්ධනය. අද ඒවා ඔක්කෝම පුදුම විධියට දියුණු වෙලා. ඇත්ත වශයෙන්ම දැන් ගුණවර්ධන විද්‍යාලය වගේ පාසල් අපි ජනප්‍රිය පාසල්වලට නොවෙයි ඒකාබද්ධ කළේ. පානදුර ශාන්ත අන්තෝනි බාලිකා සහ බාලක පාසල් දෙකට ඒකාබද්ධ කළේ. ඒවා ජනප්‍රිය පාසල් නොවෙයි. ඒ වුණාට ඒකාබද්ධ කිරීම තුළ අද විශාල ශිෂ්‍යය සංඛ්‍යාවක් ඉන්නවා. පින්වත්ත විද්‍යාලය ඒකාබද්ධ මහා විද්‍යාලයක් හැටියට තිබ්බේ. අද ප්‍රාථමික විද්‍යාලයක් කරලා එහි දැවැන්ත විධියට දියුණුවක් ලබා තිබෙනවා. මේ සැරේ ශිෂ්‍යත්ව ප්‍රතිඵලත් ඉතා විශිෂ්ට අන්දමින් ජය ගෙන තිබ්බා. ඉතින් කවදාක්වත් ගුණවර්ධන විද්‍යාලය ශිෂ්‍යත්වය සමත් වෙලා තිබ්බා කියලා අපට දැනගන්න ලැබිලා නැහැ. නමුත් මේ සැරේ ශිෂ්‍යත්වය පාස් වුණු ළමයි සහ කඩඉම් ලකුණු ළඟට ආපු ළමයි විශාල ප්‍රමාණයක් සිටියා. අධ්‍යාපනයේ තිබුණු දියුණුව පිළිබඳව අපි බොහෝම සතුටු වුණා.

ඒ වාගේම විශේෂයෙන්ම සඳහන් කරන්න ඕනෑ, පළාත් පාලන විෂයය පිළිබඳව. අපේ අපද්‍රව්‍ය කළමනාකරණය ඇත්තටම උපදේශක කාරක සභාවකට මම යෝජනාවක් ගෙනාවා. අපේ පානදුර ප්‍රාදේශීය සභා බල සීමාවේදී කුණු ඇදීම පිළිබඳවයි. එතන්දී අපේ ප්‍රධාන ඇමතිතුමා අමාත්‍යාංශයේ වැඩ සටහනක් හදලා, අපද්‍රව්‍ය කළමනාකරණය තුළ අපට ට්‍රැක්ටරයක් ලබා දීලා වැඩ සටහනක් දියත් කළා. ඇත්ත වශයෙන්ම බොහෝම කනගාටුයි කියන්න. දැන් අපේ වාද්දුව ප්‍රදේශයට තමයි විශේෂයෙන්ම මේ පිළිබඳව ගැටළු තියෙන්නේ. මම සහ ජගත් අංගගේ ඇමතිතුමා නියෝජනය කරන්නේ ඒ ප්‍රදේශය. කවදාක්වත් කුණු ටික හරියට කෙරෙන්නේ නැති හින්දා තමයි මේ යෝජනාව ගෙනාවේ. අපි අවශ්‍යය කටයුතු කරලා අන්තිමේදී ඔබතුමා ට්‍රැක්ටරයක් එහෙමත් ලබා දීලා, අවශ්‍යතාවය ඉෂ්ට කළාට, දැන් ඒ ට්‍රැක්ටරය තියෙන තැනක්වත් හොයා ගන්න නැහැ. අද ඒ වැඩ සටහනවත් ක්‍රියාත්මක වෙන්නේ නැහැ. බොහෝම කණගාටුයි මේ පිළිබඳව. ඔබතුමා ඇත්ත වශයෙන්ම මේ පළාත් පාලන ආයතන ගොඩනඟන්න පුදුම කැප කිරීමක් කරනවා. ඔබතුමා ඒක කළාට වැඩක් නැහැ. ඔවුන් ඒවායින් නිසි ප්‍රයෝජන ගන්නේ නැහැ. ඒවා තුළ ලොකු ගැටළුවකට මුහුණ දෙනවා. ඒ වාගේම අපි ක්‍රීඩා අමාත්‍යාංශයෙන් මම පහුගිය කාලේ වාද්දුව මහජන ක්‍රීඩාංගනයට ක්‍රීඩාගාරයක් හදලා දුන්නා. දිවා රාත්‍රි සෙල්ලම් කරන්න වොලිබොල් ක්‍රීඩාංගනයක් හදලා දුන්නා. දැන් ඒකේ light බිල ගෙවන්න බැහැයි කියලා ඒක පවර ගන්නේ නැහැ. ඉතින් මේ වාගේ බොහෝම ගැටළු තියෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීවරිය මාර්ගයෙන් මම ප්‍රධාන ඇමතිතුමාට මේ ගැන අවධානය යොමු කරනවා. මම එතුමාත් එක්ක පෞද්ගලිකව සාකච්ඡා කළා. අපේ පළාත් පාලන කොමසාරිස්වරියත් එක්ක ඒ පිළිබඳව කථා කළා. ඇත්ත වශයෙන්ම මේවා ඔක්කෝම කැලයට යනවා. අපරාදේ මේවාට වියදම් කළ ලක්ෂ දාහතර. මේවා ගැන අවධානය යොමු කරලා, පළාත් පාලන ආයතන මීට වඩා වගකීමක් දරන්න කියන එක පැහැදිලිවම ඔබතුමාගේ මාර්ගයෙන් මා ඉල්ලා සිටිනවා.

ඒ වගේම විශේෂයෙන්ම කියන්න ඕනෑ, රණවිරු ඉඩම්. රණවිරුවන්ට ඔප්පු ලබා දීමේ කටයුතු අතපසු වෙලා අවුරුදු ගාණක්ම තිබ්බා. දොඹගොඩ රණවිරු ගම්මානය. බණ්ඩාරගම මිල්ලනිය ආසනය. මිල්ලනිය ප්‍රාදේශීය කොට්ඨාශය. අද ඇත්ත වශයෙන්ම අපි බොහෝම සතුටු වෙනවා. රණවිරුවන් හැට පස් දෙනෙකුට ඒ ඉඩම් ලබා දීලා තියෙනවා. සම්පූර්ණ නිත්‍යානුකූල ඔප්පු. රාජ්‍ය සේවකයෝ නිසා ඔවුන් 10% ක් ගෙවන්න ඕනෑ. ඒ අවශ්‍යතාවය මතු කරලා තියනවා. මම හිතන්නේ, තව පෙන්ෂන් තියෙන්නේ තුන හතරයි. ඒකත් මම හිතනවා ඉදිරියේදී කටයුතු කරයි. ඒ වාගේම කළුතර දිස්ත්‍රික්කයේ ඉතා විශාල ප්‍රමාණයක් ඉඩම් ඔප්පු පහුගිය දවස්වල බෙදලා දුන්නා. අපි බොහෝම සන්තෝෂ වෙනවා. මොකද, හැමදාම කෑ ගහනවා ඉඩම් බලතල ප්‍රශ්න අරවා මේවා කිය කියා. ඒ වුණාට ඇත්ත වශයෙන්ම යථාර්ථවාදීව ප්‍රධාන ඇමතිතුමාගේ ඉඩම් කොමසාරිස්තුමිය හරහා ඒ අවශ්‍ය කටයුතු කරලා තියෙනවා. අපි බොහෝම සන්තෝෂයි. අපි පහුගිය දවස්වල කළුතර කච්චේරියේ ඒ ඉඩම් බෙදා දීමේ වැඩ සටහන තිබ්බා. ඉතා සාර්ථක අන්දමින් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ දහහතරටම ඉඩම් ලබා දීමට අවශ්‍ය කටයුතු කළා.

ඒ වගේම විශේෂයෙන්ම කියන්න ඕනෑ දැන් මෙතන කථා නොකරපු වැය ශීර්ෂය ඇතුළේ තමයි විදුලි බලය හා ජලය ලබා දීම. අපි බොහෝම සතුටුයි. ඇත්ත වශයෙන්ම 99 % ක් ම පානදුරේ විදුලි බලය තිබුණා. ඒ වුණාට අපි දන්නවා වෙනත් ආසනවල, වෙනත් තැන්වල තිබුණේ

[ගරු විකුම් ගුණසේකර ]

නැහැ. ඒ තැන්වල සෑම තැනකටම විදුලි බලය ලබා දෙන්න අවශ්‍යා කටයුතු කළා අපේ ඇමතිතුමා, විදුලිබල ඇමතිවරයා හැටියට. අපි බොහෝම සතුටුයි. ඒ වගේම ජලය ලබා දීම. විදුලි බලය සහ ජලය ලබා දීම පිළිබඳව අපි හුඟක් -

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

වැලිවේරියටත් ජලය දුන්නා. උණ්ඩවලින්.

**ගරු විකුම් ගුණසේකර**
Hon. Wikum Gunasekara

ඒකට පිළිතුරු අපි පස්සේ දෙන්නම්. දැන් ඒ කට්ටිය කවුරුත් නැහැ නේ? කවුද ඉන්නේ කිසිම කෙනෙක් නැහැ නේ? කිසිම කෙනෙක් නැහැ. ඒ බොරු කථා කරන්නේ. ඇත්ත වශයෙන්ම අපි පැහැදිලිවම අපේ කළුතර දිස්ත්‍රික්කයේ 99 % කට විදුලි බලය දීලා තියෙනවා. අපි බොහෝම සතුටු වෙනවා. මොකද අපට අගලවත්ත පැත්ත ගත්තහම විදුලි බලය නැතුව බොහෝම දුෂ්කර තත්ත්වයක් තිබුණා.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

වෙඩි තිබ්බේ එංගලන්තයේ.

**ගරු විකුම් ගුණසේකර**
Hon. Wikum Gunasekara

ඒක හින්දා විදුලි බලය ලබා දීලා තියෙනවා. ඒක හින්දා අපි ජලය ලබා දුන්නෙත් එහෙමයි. ඇත්ත වශයෙන්ම අපේ රණවිරු ගම්මානවල ගැටළු තිබුණා. එතුමා සම්පූර්ණයෙන්ම ජලය ලබා දීමට අවශ්‍යා කටයුතු සලසා දුන්නා. එතුමා ඒ දක්වපු සහයෝගය පිළිබඳව අපි බොහෝම සතුටු වෙනවා. ඒ වාගේම ඉඩම් ඔප්පු. මම හිතන විධියට තව කිහිපදෙනෙක් ඉන්නවා. ඇත්ත වශයෙන්ම භූමිය ගත්තහම කළුතර දිස්ත්‍රික්කයේ වැඩිම භූමි ප්‍රමාණයක් තියෙන්නේ අගලවත්ත ආසනයේ. ඉතින් භූමිය හැටියට ලොකුයි. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ තුනක් තියෙනවා. ඒ භූමියේ අපේ රණවිරු ගම්මානයක් තියෙනවා. රණවිරු ගම්මානයේ ඉඩම් කොටස් හයසිය ගාණක් තිබුණා. ඒ වුණාට ඉඩම් ඔප්පු ලබා දෙන්න පුළුවන් වුණේ, එකසිය ගාණකටයි. ඉතිරි කටයුතු ටිකත් ඔබතුමාගේ මාර්ගයෙන් මේ අවශ්‍යාය කටයුතු කරලා ඒ රණවිරුවන්ට බෙදලා දෙන මෙන් ඉල්ලා සිටිනවා. ඒ වාගේම මදුරාවලත් ඒ ගැටළුව තියෙනවා. ඒකත් අර දොඹගොඩ කළා වාගේ හැකි ඉක්මණින්ම කරලා දෙන මෙන් ඉල්ලා සිටිනවා. ඒ වාගේම පාසල් පද්ධතිය ගැන ඇත්ත වශයෙන්ම මම බොහෝම සතුටු වෙනවා. දෙමළ මාධ්‍යය ගුරුවරු. ඔබතුමා ඒ සම්බන්ධයෙන් කළුතර දිස්ත්‍රික්කයට ඉතා විශිෂ්ට ක්‍රියා මාර්ග ගත්තා. ගුරුවරුන් 130 ක්. ඇත්ත වශයෙන්ම අපි බොහෝම සතුටු වෙනවා. කළුතර දිස්ත්‍රික්කය තුළ අනිවාර්යයෙන් ම අවුරුදු පහක් සේවය කරන්න ඕනෑ කියලා නිර්ණායකයක් දාලා ගුරුවරු 130 ක් බඳවා ගත්තා. බොහෝම වැදගත් වැඩ සටහනක්. ඒ පිළිබඳව අපි බොහෝම සතුටු වෙනවා. ඇත්ත වශයෙන්ම මම නියෝජනය කරන පානදුර ආසනයේ දෙමළ මාධ්‍යය පාසල් පහක් තියනවා. ඇත්ත වශයෙන්ම පාසල් පහේම ඉතා විශිෂ්ට විධියට ගුරුවරු ලබා දීලා දෙමළ මාධ්‍යය ඉතා ඉහළ තත්ත්වයකට, ප්‍රතිශතාත්මකව ඉතා ඉහළ තත්ත්වයක් අරන් තියෙනවා. අම්බලන්දුව මුස්ලිම් විද්‍යාලයේ 2008 අ.පො.ස. සාමාන්‍ය පෙළ ප්‍රතිශතය තිබුණේ 19 % යි. මේ සැරේ 79 % දක්වා -

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමිය**
Hon. Presiding Member

ඔබතුමාට තව විනාඩියක් විතරයි.

**ගරු විකුම් ගුණසේකර**
Hon. Wikum Gunasekara

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ඒ ප්‍රතිඵල 79 % දක්වා වැඩි කරලා තියෙනවා. කොච්චර වටිනවාද බලන්න. ඒ වාගේම මම විශේෂයෙන්ම සඳහන් කරන්න ඕනෑ. පානදුර බාලිකා විද්‍යාලය 2012 අ.පො.ස. සාමාන්‍ය ප්‍රතිඵල සටහන මම අද සභාගත කරනවා[1], මෙය කාටත් දැන ගන්න පුළුවන් විධියට. කොච්චර හොඳට අධ්‍යාපනය කටයුතු කරලා තියෙනවා ද කියලා පැහැදිලිවම දැන ගන්න පුළුවන් මේ ප්‍රතිඵල සටහන මම සභාගත කරනවා. මේ අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමියට සහ අපේ ප්‍රධාන ඇමතිතුමාට ස්තුතිවන්ත වෙමින් නවතිනවා. ස්තුතියි.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමිය**
Hon. Presiding Member

ස්තුතියි ගරු මන්ත්‍රීතුමා. මීළඟට පියල් නිශාන්ත ගරු මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 10 ක කාලයක් තියෙනවා.

[1] සභා ලේකම් කාර්යාලයේ තබා ඇත.

[අ.භා. 02.52]

**ගරු පියල් නිශාන්ත**
Hon. Piyal Nishantha

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ඒ වගේම සහෝදර මන්ත්‍රීවරුනි, අද මම හිතන්නේ, ඉතාමත්ම වැදගත් විවාදයකට සම්බන්ධ වෙන්න ලැබීම පිළිබඳව මම ඉතාමත්ම සන්තෝෂ වෙනවා. එයට හේතුව මේ පළාත් සභාවේ වටිනාම අමාත්‍යාංශය, ඒ වගේම වගකීව යුතු අමාත්‍යාංශය හැටියට මම දකින්නේ අධ්‍යාපන අමාත්‍යාංශය. මේ අමාත්‍යාංශය මුල් කර ගත් අමාත්‍යාංශ කිහිපයක් භාරව කටයුතු කරන අපේ ප්‍රසන්න රණතුංග ගරු ප්‍රධාන අමාත්‍යතුමාගේ අමාත්‍යාංශ පිළිබඳව කථා කරන්න ලැබීම පිළිබඳව මම ඉතාමත් සතුටට පත් වෙනවා. ඒ වගේම තමයි මම හිතන්නේ, මේ වන විට පක්ෂ විපක්ෂ මන්ත්‍රීවරු සියළුදෙනාම එතුමා පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍යවරයා හැටියටත්, අධ්‍යාපන අමාත්‍යවරයා හැටියටත් ආරම්භක මොහොතේ ඉඳලා කළා වූ සේවය පිළිබඳව ඉතාමත්ම හොඳ ඇගයීමට ලක් කළා. ඒ නිසා මම එක එක විෂයයන් පිළිබඳව අටුවා, ටීකා, ගැට, ටිප්පනි යොදලා කථා කරන්න බලාපොරොත්තු වෙන්නේ නැහැ.

අපි පැහැදිලිව දන්නවා. කොට්ඨාශයක් හැටියට කලාපයක් හැටියට මේ මුළු බස්නාහිර පළාත් සභාවේම ඉතාමත් පසුබට අධ්‍යාපනික කලාපයක් හැටියට තිබුණු කළුතර අධ්‍යාපන කලාපය අපට ඉතාමත් ආඩම්බරයෙන් කථා කරන්න පුළුවන් තත්ත්වයකට පත් වෙලා තියෙනවා. ඒ අහිංසක දරුවන්ගේ දෙමාපියන්ගේ ඉදිරියට ගිහිල්ලා බොහෝම ආඩම්බරයෙන් කෙළින් හිට ගෙන කථා කරන්න පුළුවන් වාතාවරණයක් නිර්මාණය කළේ, ගරු අපේ ප්‍රධාන අමාත්‍යතුමා. අධ්‍යාපන අමාත්‍යතුමා. එහිදී විශේෂයෙන්ම ගුරු සම්පත ලබා දීමේදී. අපි සන්තෝෂ වෙනවා, උපාධිධාරී ගුරුවරු 7,795 ක් මේ ක්ෂේත්‍රයට අළුතින් බඳවා ගැනීම සම්බන්ධව. මම තාමත් වෘත්තීයෙන් ගුරුවරයෙක් හැටියට, අළුත්ගම මහා විද්‍යාලයේ සේවය තියෙන කෙනෙක් හැටියට අපි දන්නවා, පාසලක පරිපාලනය කිරීමේදී මේ ගුරු සම්පත නැතුව මොන සම්පත තිබුණත් ඒ පාසල සංවර්ධනය කරන්න බැහැයි කියලා. ඒ පාසල ඉහළට ගන්න බැහැයි කියලා. අන්න එවැනි මට්ටමක් නැති කිරීමට අපේ ප්‍රධාන අමාත්‍යතුමා ගත්ත පියවර පිළිබඳව මම මගේ ගෞරවනීය ප්‍රණාමය, ස්තුතිය අපේ දරුවන් වෙනුවෙන් අපේ පාසල් වෙනුවෙන් මේ අවස්ථාවේදී එතුමාට පුද කර සිටිනවා. ඊට අමතරව අපි දන්නවා. දරුවන්ට අධ්‍යාපනය ලබා ගැනීමට නම්, භෞතික සම්පත් තියෙන්න ඕනෑ. දරුවන්ට අඩුම ගාණේ අකුරු කරන්නට සෙවනක් තියෙන්න ඕනෑ. බේරුවල කොට්ඨාශය ගත්තට පස්සේ අඩු පහසුකම් තිබුණු අධ්‍යාපනික කොට්ඨාශයක් හැටියට අද සෑම පාසලකටම අංග සම්පූර්ණ ගොඩනැගිලි ලබා දීලා මේ දරුවන්ට තියෙන භෞතික සම්පත් ටික වැඩි කරලා ඒ සියළු කාර්යයන් කිරීමට අපට හැකියාව ලැබුණා. ඒ නිසා අද අපට අධ්‍යාපන ක්ෂේත්‍රය පිළිබඳව ආඩම්බරයෙන් කථා කරන්න පුළුවන්. සුපසන් නිම්තෙර කියන වැඩ සටහන තුළ ගරු අමාත්‍යතුමාගේම සංකල්පයක් නිර්මාණය කරමින් ප්‍රසන්න පරිසරයක්, ප්‍රසන්න රණතුංග ප්‍රධාන අමාත්‍යතුමා පාසල තුළ නිර්මාණය කළා.

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Felician De Silva

සල්ලි ඉතුරු වෙලා නැහැ, තව දෙන්න.

**ගරු පියල් නිශාන්ත**
Hon. Piyal Nishantha

ඊළඟට සුපසන් ගුරු පවුර පිළිබඳව කථා කරන්නට දැන් මැත කාලයේ පටන් අරගෙන තියෙනවා ප්‍රධාන අමාත්‍යතුමනි. තාමත් ගුරුවරු හරියාකාරව මේ පිළිබඳව දැනුවත් වෙලා නැහැ. ගුරුවරුන්ගේ රක්ෂණය පිළිබඳව හරියට දැනුවත් වෙලා නැහැ. ඒ නිසා අපට ලොකු වගකීමක් සහ යුතුකමක් තිබෙනවා, මේ වැඩ සටහන පිළිබඳව කොට්ඨාශ මට්ටමින් හෝ කලාප මට්ටමින් හෝ ගුරුවරුන් දැනුවත් කිරීමේ වැඩ පිළිවෙළක් දියත් කරන්න. එහෙම කරන්න පුළුවන් නම් මම හිතන්නේ, ඉතාමත් කෙටි කාලයක් ඇතුළත ගරු ප්‍රධාන අමාත්‍යතුමා නිර්මාණය කරපු හැම සංකල්පයකම ප්‍රතිඵල ජනතාවට දැනෙන, පාසල්වලට දැනෙන මට්ටමකින් උද්ගත වෙයි කියලා අපි විශ්වාස කරනවා.

ඊළඟට මම කථා කරන්න උත්සාහ ගන්නේ, සරුදම් අරුණැල්ල පිළිබඳව. මේ වන විට අපේ ශ්‍රී ලංකාවේ වැඩිහිටි නිවාස සංඛ්‍යාව බොහෝම සීඝ්‍රයෙන් ඉහළ ගිහිල්ලා තිබෙනවා. ශ්‍රී ලංකාවේ වැඩිහිටි නිවාස සංඛ්‍යාව 8400 ඉක්මවා ගිහිල්ලා තිබෙනවා. ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ලියාපදිංචි වැඩිහිටි නිවාස සංඛ්‍යාව. හැබැයි, ඊටත් එහාට ගියපු වැඩිහිටි නිවාස සංඛ්‍යාවක් තිබෙනවා. ඒක ගණන් හදලා මෙන්න මෙපමණයි කියලා සංඛ්‍යාත්මකව ඉදිරිපත් කරන්න බැරි මට්ටමක් තිබෙනවා.

[ගරු පියල් නිශාන්ත ]

දරුවන් හොඳට ඉගෙන ගෙන දෙමව්පියෝ සියලු සැප සම්පත් දීලා, ණය වෙලා, ඉඩම් උගස් තියලා මේ දරුවාව නිර්මාණය කළාට පස්සේ, ඒ දරුවා හොඳ තනතුරු ලැබුණාට පස්සේ ලොකු රැකියාවක් කරන විට අර දෙමව්පියන්ට නොසලකා, තමන් ජීවත් වන සුඛෝපභෝගී නිවසට පිටිපස්සට වෙන්න පුංචි මඩුවල ඉන්න අම්මලා, තාත්තලාගේ සංඛ්‍යාව වැඩි වෙලා තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ඒ සංඛ්‍යාව අපට ගණනය කරන්න බැරි මට්ටමට මේ ලංකාවේ ඉහළ ගිහිල්ලා තිබෙනවා. එහෙම නම් මෙවැනි තත්ත්වයක් නිර්මාණය වෙලා තිබෙද්දී, සරුදම් අරුණැල්ල කියන වැඩ සටහන මම හිතන්නේ, මේ තත්ත්වය මග හරවා ගැනීමට ඉතාමත්ම ලොකු ශක්තියක් වෙනවා.

අපි දන්නවා. අපේ අතිගරු ජනාධිපතිතුමා අධිවේගී මාර්ග නිර්මාණය කරනවා. ජාත්‍යන්තර ගුවන් තොටුපළවල් නිර්මාණය කරනවා. ජාත්‍යන්තර වරායන් නිර්මාණය වෙනවා. මේ සියලුම දේ ජාත්‍යන්තර වෙද්දී එතුමා ඒ සියල්ල එසේ ක්‍රියාත්මක කරද්දී, මේ දරුවන්ගේ හදවත නිර්මාණය කරන්න, හදවත පෝෂණය කරන්න වැඩ පිළිවෙළක් දියත් කරපු එකම ප්‍රධාන අමාත්‍යවරයා ප්‍රසන්න රණතුංග මැතිතුමා කියන එක මම අවිවාදයෙන් මේ අවස්ථාවේදී කියනවා. මේ සරුදම් අරුණැල්ල පිළිබඳව අපට වචනයෙන් දෙකෙන් කථා කරලා අවසන් කරන්න බැහැ. ඒ තරම් ඉතාමත්ම වටිනා වැඩ සටහනක් හැටියටයි මම දකින්නේ.

මම දීර්ඝ වශයෙන් කථා නොකළත් මට අධ්‍යාපන සංවර්ධනය සම්බන්ධව යෝජනා කිහිපයක් කරන්න තිබෙනවා. ගුරු ගැටළු පිළිබඳව අපි කථා කරනවා. මේ සියල්ලම කථා කරන ගමන් අද තිබෙන අපට ප්‍රධානම ගැටළුව තමයි අපේ වැඩ බලන විදුහල්පතිවරුන්ව වසර ගණනාවක් තිස්සේ ස්ථිර කිරීමට අපට හැකියාවක් නොලැබීම. ඒ නිසා අපි ඉතාමත්ම කඩිනම් විසඳුම් ලබා දීලා ඉතාමත්ම හොඳින් සේවය කරන, හොඳ ප්‍රතිඵල ලබා දුන්න විදුහල්පතිවරු අපි දැකලා තිබෙනවා. ඒ නිසා ඒ අයට ඒ ශක්තිය ලබා දෙන්නය කියලා මම ඉල්ලා සිටිනවා.

ඊළඟට අපේ බස්නාහිර පළාත් සභාවේ විමර්ශනය ඉතාමත්ම හොඳින් ඉටු කර ගෙන යනවා. ඒ නිසා අපේ අධ්‍යාපන ලේකම්තුමාට අපේ ස්තුතිය පුද කරනවා. ඒ වාගේම කසිප්පු පොළකට අර පොලීසියෙන් පනිනවා වාගේ පාසලට පනින්නේ නැතිව, අපේ විදුහල්පතිවරුන්ගේ ගරුත්වය ආරක්ෂා කරන පරිදි මේ කටයුත්ත සිදු කරනවා නම් ඉතාමත්ම හොඳයි කියලා මම ප්‍රකාශ කරනවා. මොකද, ඒකට හේතුව සමහර විදුහල්පතිවරු මේ පාසල් නිර්මාණය කරන්න මහා පුදුම කැප කිරීමක් කරනවා. ඒ කැප වීමත් එක්ක ඒ අයට එවැනි තත්ත්වයක් උදා වුණොත් මම හිතන්නේ, වැදගත් විදුහල්පතිවරයෙකුට දෙමව්පියන්ට මුහුණ දෙන්න බැහැ. දරුවන්ට මුහුණ දෙන්න බැහැ. ඒ නිසා ඒ බවත් ප්‍රකාශ කරනවා.

විශේෂයෙන්ම අද අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ මම බොහොම ආදරය කරන කෙනෙකු හැටියට සිසු නැණ ප්‍රදීප කියන මගේ සංකල්පය තුළ අපේ ප්‍රධාන අමාත්‍යතුමාගේ ආශිර්වාදයත් එක්ක පෙර පාසල් දරුවෝ දහම් පාසල් දරුවෝ, ඒ වාගේම පාසල් දරුවෝ නංවන්නට විධිමත් විශේෂ වැඩ පිළිවෙළක් අපි දියත් කර ගෙන යනවා. ඒ සියල්ලටම ගරු ප්‍රධාන අමාත්‍යතුමාට මගේ ගෞරවනීය ප්‍රණාමය මගේ අහිංසක දරුවන් වෙනුවෙන් පුද කර සිටිමින් මම නිහඬ වෙනවා. ඔබ සියලු දෙනාටම බුදු සරණයි.

[අ.භා. 03.00]

**ගරු ජේම්ස් ප්‍රිමිලස් කොස්තා**
Hon. James Primilus Costa

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ප්‍රධාන අමාත්‍යතුමාගේ වැය ශීර්ෂය සම්බන්ධව විනාඩි පහක කාලයක් මට ලබා දීම සම්බන්ධව ප්‍රථමයෙන්ම මගේ ස්තුතිය පුද කරන්න කැමැතියි. ගරු ප්‍රධාන ඇමතිතුමාගේ වැය ශීර්ෂය යටතේ අමාත්‍යාංශ කිහිපයක් තිබෙනවා. ඒකෙන් ප්‍රධානම දේ තමයි අධ්‍යාපනය. මම සියලුම කලාප අධ්‍යාපන රැස්වීම්වලට නොවරදවාම සහභාගී වන කෙනෙකු හැටියට මේ අවුරුදු දෙක තුළදී මම හිතන්නේ, විශාල අත්දැකීමක් මම ලබා ගත්තේ නැහැ. අවුරුදු හතරක කාලයේදී මම අවුරුදු දෙකයි මේ සභාවේ හිටියේ. නමුත් මගේ දැනුම හැටියට මටත් හිතුණා, සමහර කාරණා මෙතැන අවධාරණය කළ යුතුයි කියලා.

විශේෂයෙන් කොළඹ පාසල් දිහා බලන කොට කොළඹ නගරය නියෝජනය කරන අපට විශාල ප්‍රශ්න රාශියක් තිබෙනවා. ඒ කියන්නේ මහ ඇමතිතුමාගේ ප්‍රතිපත්ති තීන්දුවක් කියලා රැස්වීම්වලදී කියනවා. ගොඩනැගිලි ප්‍රශ්න

තිබෙනවා. අපි ගොඩනැගිලි ප්‍රශ්න පිළිබඳව කථා කළාම අලුත් ගොඩනැගිලි ලබා දෙන්නේ නැහැයි කියලා කියනවා. නමුත් අලුත් ගොඩනැගිලි අවශ්‍යතාවය තිබෙන පාසල් කිහිපයක් තිබෙනවා. ඒ සම්බන්ධව මම මහ ඇමතිතුමාට පෞද්ගලිකව ඉල්ලීම් කරලා නැහැ. නමුත් කලාප අධ්‍යාපන කාර්යාල රැස්වීම්වලදී මම නිතරම මේක යොමු කරලා තිබෙනවා. නමුත් මේ අවුරුදු දෙක තුළදී ඒ සම්බන්ධව කිසිම විසඳුමක් ලැබුණේ නැහැ. මොකද, මම හැම රැස්වීමටම සහභාගී වන මන්ත්‍රීවරයෙක් හැටියට. රැස්වීම් දිහා බැලුවාම ඔබතුමන්ලා දන්නවා, ඒවාවල තිබෙන සහභාගීත්වය. ඉතාම වුවමනා කරන මන්ත්‍රීවරුන් පමණයි ඒ රැස්වීම්වලට යන්නේ. බහුතර මන්ත්‍රීවරුන් හරියාකාරව රැස්වීම්වලට සහභාගී වෙන්නේ නැහැ. නමුත් වරප්‍රසාද දිහා බලන කොට සමහර මන්ත්‍රීවරුන්ට ආණ්ඩු පක්ෂය කියලා කිව්වාම වැඩි ප්‍රතිපාදන ලැබෙනවා. වරප්‍රසාද හම්බ වෙනවා. ඒක වැරැද්දක් නොවෙයි. මම වැරැද්දක් හැටියට කථා කරන්නෙත් නැහැ. නමුත් නිතරම රැස්වීම්වලට සහභාගී වන අපට ඉතාම අපහසුයි. ලක්ෂ 35 ක ප්‍රතිපාදන මුදලින් තමයි අපට, පාසල්වලටත් උදව් කරන්න වෙලා තිබෙන්නේ. ගරු මහ ඇමතිතුමා ගිය වසරේදී මට මතකයි. මම ආපු අවුරුද්දේ. එතුමා 40% ක් අධ්‍යාපනය සඳහා වෙන් කළ යුතුයි කියලා ලිපියක් තිබුණා. නමුත් මේ අවුරුද්දේ එහෙම දෙයක් තිබුණේ නැහැ. ඒක මම දැක්කේ නැහැ. නමුත් අපේ යුතුකම තමයි පාසල්වලට පුළුවන් ආකාරයට අපේ අතින් උදව් කරන එක.

නමුත් මේ අවුරුද්දේ මැතිවරණ කාලය නිසා ගොඩාක් මන්ත්‍රීවරු මම හිතන්නේ අධ්‍යාපනයට නැතිව මහජනයාට යම්කිසි දෙයක් බෙදා දීමට තමයි උත්සාහ දැරුවේ. ඒකත් වැරැද්දක් නැහැ. නමුත් මම විශාල මුදලක් පාසල් සම්බන්ධව වෙන් කරලා තිබෙනවා. නමුත් ගොඩනැගිල්ලක් හදන්න තරමට මට මුදල් නැහැ. මුදල් දෙන්න විධියකුත් නැහැ. නමුත් මම කියන්නේ, මේ වාගේ අඩුපාඩු ගරු මහ ඇමතිතුමා පක්ෂ විපක්ෂ භේදයෙන් තොරව විසඳිය යුතුයි. කොළඹ 13 ශාන්ත අන්තෝනි පිරිමි විද්‍යාලයේ විශාල විධියට මේ ප්‍රශ්න තිබෙනවා. ළමයින්ට පන්ති කාමරවල ඉන්න ඉඩ නැහැයි කියන ප්‍රශ්නය විදුහල්පතිතුමා අවුරුදු කීපයක් තිස්සේම කියනවා. ඒ සම්බන්ධව ආණ්ඩු පක්ෂයට අදාළ මන්ත්‍රීවරයෙකුත් ඒ විදුහල්පතිතුමාට නිතරම පොරොන්දු වෙලා තිබුණා, මේක ඉෂ්ට කරලා දෙන බවට. නමුත් මම ඒ වැඩෙත් කරලා දුන්නා. ප්‍රශ්නයක් නැහැ. කොයි පැත්තෙන් හරි වැඩේ ඉටු කරනවා නම් අපි සතුටුයි. නමුත් මේ අවුරුදු දෙකක කාලයේදී මට ඒක ඉටු කරලා දෙන්නට බැරිව ගියා. ඒකට මම කනගාටු වෙනවා. ඒ වාගේම කොළඹ නගරයේ පාසල් කිහිපයකම ඔය වාගේ ප්‍රශ්න රාශියක් තිබෙනවා. ඒ නිසා මම හිතන්නේ, ගරු මහ ඇමතිතුමා මේ සම්බන්ධව පක්ෂ විපක්ෂ භේදයකින් තොරව කටයුතු කරන්න ඕනෑ.

ඒ වාගේම මට මතකයි කොළඹ නගර සභාවේ නාගරික මන්ත්‍රීවරයෙක් වශයෙන් මම සිටිද්දී, ඒ කාරක සභාවල සභාපතිකම තෝරන කොට ඒ සුදුසුකම අනුව එක්සත් ජාතික පක්ෂ පාලනය තුළදී අපට අවස්ථාව ලබා දුන්නා. වෛද්‍ය කාරක සභාවේ දුන්නේ - මන්ත්‍රීවරයෙක් වශයෙන් කවුරු හරි වෛද්‍යවරයෙක් හිටියා නම් එතුමාව වෛද්‍ය කාරක සභාවේ සභාපති හැටියට අපි තේරුවා. එතුමා මොන පක්ෂයේද කියලා අපි බැලුවේ නැහැ. නමුත් මේ අධීක්ෂණ මන්ත්‍රීවරු කියලා මන්ත්‍රීවරු දාලා තිබෙනවා. ඒගොල්ලෝ අපේ මිත්‍රවරු. මිත්‍රයෝ. ඒකේ ප්‍රශ්නයක් නැහැ. නමුත් මම හිතන්නේ ඉදිරියේදී ඔය වාගේ අධ්‍යාපන සම්බන්ධව අධීක්ෂණ කටයුතු දීමේදී අධ්‍යාපනය සම්බන්ධව අත්දැකීමක්, එක්කෝ සුදුසුකමක් - හැමෝම අධ්‍යාපනය හදාරලා තිබෙනවා. ඒකේ ප්‍රශ්නයක් නැහැ. නමුත් ඒ වාගේ ස්ථානවලට දෙන කොට ඒ සම්බන්ධව උනන්දුවක් තිබෙන සුවිශේෂී අයට දුන්නා නම් බොහොම වටිනවා.

තව විශේෂ ඉල්ලීමකුත් මම කරන්න කැමැතියි. පළාත් පාලන සම්බන්ධව මම කථා කරන්න කැමැතියි. අද නාගරික මන්ත්‍රීවරු විශාල අසහනයට පත් වෙලා තිබෙනවා. ඒගොල්ලන්ගේ දීමනාව හැටියට හය දහස් ගණනක් තිබෙන්නේ. ඉදිරියේ පළාත් සභා මැතිවරණයක් ආවොත් අපේ පළාත් සභා මන්ත්‍රීවරු නාගරික මන්ත්‍රීවරුන්ගේ උදව් ඉල්ලනවා. ඡන්ද ඉල්ලනවා. අපට ඡන්දයට උදව් කරන්න කියනවා. නමුත් අද නාගරික මන්ත්‍රීවරයෙකුගේ දීමනාව තිබෙන්නේ මාසයකට රුපියල් හයදහස් ගණනයි. ඒ නිසා ඒක බොහොම සාධාරණව ගරු මහ ඇමතිතුමා මේ සම්බන්ධව සලකා බලලා මේගොල්ලන්ට සාධාරණයක් ඉටු කර දිය යුතුයි කියමින් මගේ වචන ස්වල්පය මම අවසන් කරනවා. බොහොම ස්තුතියි.

[අ.භා. 03.08]

**ගරු ලයනල් ජයසිංහ**
Hon. Lional Jayasinghe

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, විසි වසරකට වඩා දීර්ඝ ඉතිහාසයක් ඇති බස්නාහිර පළාත් සභාවේ 2014 වර්ෂයේ

[ගරු ලයනල් ජයසිංහ ]

අයවැය ලේඛනය පිළිබඳව අදහස් දැක්වීමට අවස්ථාව ලබා දීම සම්බන්ධයෙන් ඔබතුමියට මාගේ ස්තුතිය පුද කරනු ලබනවා. ඒ වාගේම 2014 වර්ෂයේ අයවැය ලේඛනයේ අධ්‍යාපන අමාත්‍යාංශය සහ ප්‍රධාන අමාත්‍යතුමාගේ අමාත්‍යාංශ සමඟ අනිකුත් අමාත්‍යවරුන්ගේ අමාත්‍යාංශ සංවර්ධනය කිරීමට, 2014 වර්ෂයේ අයවැය ලේඛනයෙන්, එතුමා ඉදිරිපත් කරපු අයවැය ලේඛනයෙන් කටයුතු කිරීම පිළිබඳව මා එතුමාට මාගේ කෘතවේදී ස්තුතිය මේ අවස්ථාවේදී පුද කරනු ලබනවා. ඒ වාගේම මේ කාර්යභාරය ඉෂ්ට කර ගැනීමට ශක්තිය ධෛර්යය ලබා දුන්, දේශපාලන වශයෙන් ධෛර්යයක් ලබා දුන් මග පෙන්වීමක් ලබා දුන් මාගේ දිවංගත නායක රෙජී රණතුංග මැතිතුමාවත් අවසාන පළාත් සභාවේ අවසාන අයවැය ලේඛනය තුළදී මා සිහිපත් කරනු ලබනවා.

විශේෂයෙන්ම අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ මහින්ද චින්තනයට අනුගත වෙමින් ඉදිරි වර්ෂය සඳහා රටේ සංවර්ධනයත්, බස්නාහිර පළාතේ සංවර්ධනයත් වෙනුවෙන් අනිකුත් පළාත් සභාවලට වඩා විශාල පළාත් සභාවක් වශයෙන්, සුවිශාල වැඩ කොටසක් කිරීමට තිබෙන පළාත් සභාවක් වශයෙන් මහින්ද චින්තනයට අනුගතව මේ අයවැය ලේඛනය ඉදිරිපත් කර ඇති බව එය අධ්‍යයනය කිරීමේදී අප කාටත් පෙනී යනවා.

විශේෂයෙන්ම දරුවා මූලික කර ගෙන, දරුවාගේ අධ්‍යාපනය නංවාලිය යුතුයි කියන තේමාව තුළ ඉදගෙන, විශේෂයෙන්ම 71% කට වැඩි මුදල් ප්‍රමාණයක් එතුමාගේ අමාත්‍යාංශයට වැය කරලා, එතුමා මේ ගෙන යන කාර්යභාරය මම හිතන්නේ අපි සියලු දෙනාම, බස්නාහිර පළාතේ ජනතාව වශයෙනුත්, මන්ත්‍රීවරු වශයෙනුත් අපි සියලු දෙනාම ආඩම්බරයට පත් විය යුතු කරුණක්. විශේෂයෙන්ම මාගේ මිත්‍ර අපේ සිරිකමල් පිලීෂියන් ද සිල්වා ගරු මන්ත්‍රීතුමා හැම අවස්ථාවකදීම, හැම අයවැය ලේඛනයකදීම වැදගත් හරවත් දේශනයක් කරන පුද්ගලයෙකු වශයෙන් අද එතුමා සහ ජා-ඇළ අපේ ශ්‍රීනාත් පෙරේරා ගරු මන්ත්‍රීතුමාත් මේ අයවැය ලේඛනයේ තිබෙන ඒ මුදල් වෙන් කිරීම පිළිබඳව එතුමන්ලාගේ ගෞරවය, එතුමන්ලා ඉතාම පැහැදිලිව විරුද්ධ පක්ෂයේ පුද්ගලයන් වශයෙන් -

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

වැඩිම එල ප්‍රයෝජන ගන්න අය.

**ගරු ලයනල් ජයසිංහ**
Hon. Lional Jayasinghe

නැහැ. ඒක නොවෙයි. එතුමා දැක්කා, මේ අයවැය ලේඛනයේ දරුවා වෙනුවෙන්, දරුවා මූලික කර ගෙන මුදල් ප්‍රතිපාදන වෙන් කර ඇති බව. මම හිතන්නේ එතුමා බුද්ධිමත් පුද්ගලයකු වශයෙන් එය දැකලා තිබෙනවා. එතුමා හැම අවස්ථාවකදීම විරුද්ධව ප්‍රකාශ කරන අදහසුත් තිබෙනවා. නමුත් එතුමා දැක්ක නිවැරදි දැක්ම තුළ ඒ අදහස් ප්‍රකාශ කිරීම මම හිතන්නේ, එතුමාගේ අදහස්වලට ගරු කිරීමක් වශයෙන් මම සලකනවා.

විශේෂයෙන්ම බස්නාහිර පළාතේ ප්‍රධාන අමාත්‍යවරයා වශයෙන් දරුවාට 96% ක පමණ සාක්ෂරතාවයක් ලබා දෙන්න කටයුතු කර තිබෙනවා. එතුමා උපාධිධාරීන් 8000 කට පමණ රැකියා ලබා දීලා තියෙනවා. විශේෂයෙන් ඒ උපාධිධාරීන්ට පත්වීම් ලබා දීම තුළින් ඒ සාක්ෂරතාවය ලබා ගන්න මම හිතන්නේ එය මහඟු පිටිවහලක් වෙලා තිබෙනවා. ඒ වාගේම ජාත්‍යන්තර මට්ටමට අනුව දරුවන් දහ අට දෙනෙකුට එක ගුරුවරයකු ලබා දීමේ පරමාර්ථය තුළ අද මේ වන විට බස්නාහිර පළාත් සභාව තුළ ඒ ක්‍රියාවලිය ඉදිරියට රැගෙන යන්න බස්නාහිර පළාතේ ප්‍රධාන අමාත්‍යවරයා වශයෙන් විශාල කටයුත්තක් කර තිබෙනවා. ඒ වාගේම අනෙකුත් අමාත්‍යාංශ කෙරෙහි තමන්ගේ අවධානය යොමු කරලා, සමසේ ඒ අමාත්‍යාංශවලට අවශ්‍ය ආකාරයට මුදල් බෙදී යන ආකාරයට එතුමා ඒ කටයුත්ත කිරීම මම හිතන්නේ, බස්නාහිර පළාතේ ප්‍රධාන අමාත්‍යවරයා වශයෙන් එතුමා ගත් සුවිශාල වැඩ කොටසක් කියන එකයි මම මේ අවස්ථාවේදී දකින්නේ.

ඒ වාගේම බස්නාහිර පළාත් සභාව තුළ පාසල් පද්ධතිය දියුණු කරන්න, හොඳ පාසල් පද්ධතියක් තුළින්, දරුවාට හොඳ අධ්‍යාපනයක් ලබා දෙන්න, හොඳ ප්‍රියමනාප හොඳ පාසලක් ඇති කරන්න එතුමා සුපසන් නිම්තෙර කියන වැඩ සටහන ක්‍රියාත්මක කරලා, මම හිතන්නේ, ඒ තුළින් මේ වන විට අලංකාර පාසල් පද්ධතියක් ඇති කරන්න සුවිශාල වැඩ කොටසක් කරලා තිබෙනවා. මිනුවන්ගොඩ කලාපය තුළ එතුමාගේ ඒ මුදල් ප්‍රතිපාදන ලබා දීලා මේ වන

විට අපි ගිය සතිය පුරාම ඒ පාසල්වලට ගිහිල්ලා දරුවන්ට ඒ මුදල් ප්‍රතිපාදන ශිෂ්‍ය සංඛ්‍යාව අනුව ලබා දීලා දෙමව්පියන්ගේ හොඳ පිබිදීම තුළින් හොඳ ඇගයීමකට ලක් කරන්න ඒ දෙමව්පියෝ සූදානම් වෙලා තිබෙනවා. අද ඒ තිබුණු පාසල් පරිසරය තුළ තීන්ත ආලේප කරලා, අනිකුත් කඩතොළු මකලා ඒ අවශ්‍ය ආකාරයට ඒ පාසල් සකස් කරලා දරුවාට හොඳ අධ්‍යාපනයක් ලබා දෙන්න මේ පියවර තුළින් ක්‍රියාත්මක කරලා තිබෙනවා.

ඒ වාගේම සුපසන් නිම්තෙර වැඩ සටහන හා සරුදම් අරුණැල්ල වාගේ වැඩ සටහන තුළින් සියලුම ආගම් භේදවලින් තොරව සෑම ආගමකටම අවශ්‍ය ආකාරයේ ප්‍රතිපාදන ලබා දීලා ආගම දහමට හුරු සමාජයක් මේ රටේ බිහි කරන්න ආරම්භ කරපු ඒ ක්‍රියාවලිය තුළින් මම හිතන්නේ, මේ වන විට ඉතාම අලංකාර ආකාරයට ඒ ආගමික ස්ථාන හදා ගන්න ඒ ස්වාමීන් වහන්සේලාට, ඒ පියතුමන්ලාට මේ තුළින් හැකියාව ලැබිලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, පියල් නිශාන්ත ගරු මන්ත්‍රීතුමා ප්‍රකාශ කළ පරිදි උගත් බුද්ධිමත් දරුවෙකු බිහි කරනවා වාගේම අපට අවශ්‍ය වෙනවා, අපේ රටේ සාරධර්මවලින් පිරි, ගුණගරුක, විනයගරුක දූ පුතුන් පිරිසක් බිහි කර ගන්න. එතකොට තමයි අපේ සමාජය යහපත් සමාජයක් කරා ගෙන යන්නට අපට හැකියාව ලැබෙන්නේ. අද අපි විද්‍යුත් මාධ්‍ය තුළින්, පුවත්පත් තුළින් දකිනවා, තමාගේ නිවසේ ඉන්න උදවිය පවා මේ අසරණ දරුවන්ට කරන හිරිහැර. මම හිතන්නේ, දහම් පාසල් අධ්‍යාපනය නොලබපු දරුවන් තමයි ඉදිරි අනාගතයේදී මෙවැනි තත්ත්වයකට පත් වෙලා අපේ සමාජය දූෂිත සමාජයක් බවට පත් කරන්නේ.

ඒ වාගේම දරුවාගේ අධ්‍යාපනය ලබා දෙන කොට ගුරුවරයා මූලික කර ගෙන අධ්‍යාපනය ලබා දිය යුතුයි. ඒ අනුව ගරු ප්‍රධාන අමාත්‍යතුමා අනෙකුත් කිසිම පළාත් සභාවකට නොදෙවෙනි ආකාරයට පළමු වතාවට ගුරු පවුර වැඩ සටහන ආරම්භ කරලා, ඒ තුළින් දරුවාට හොඳ අධ්‍යාපනයක් ලබා දෙන්න ඒ ගුරුවරුන්ට අවශ්‍ය රක්ෂණ ක්‍රමයක් ඇති කරලා දීලා, ඒ ගුරුවරුන් මනා අවබෝධයක් තුළ දරුවන්ට හොඳ අධ්‍යාපනයක් ලබා දෙන්න උනන්දු කරවීමේ ක්‍රියාවලියක් අද මේ වන විට ආරම්භ කරලා තිබෙනවා. ඒ තුළින් අපි බලාපොරොත්තු වෙනවා ඉදිරියේදී අපේ දරුවාට අවශ්‍ය හොඳ අධ්‍යාපන ක්‍රමයක් ලබා දීලා, ඒ තුළින් දරුවාව මේ සමාජයේ හොඳ පුරවැසියෙක් බවට පත් කරන්න.

ඒ වාගේම මම මීනුවන්ගොඩ කලාපය තුළ කථා කළොත් අපේ වැසීගිය පාසල් රාශියක් තිබුණා. ඒ පාසල් මේ වන විට අපි ආරම්භ කරලා තිබෙනවා. ඒ ආරම්භ කරපු ප්‍රාථමික පාසල් තුළ අද දරුවන් හොඳ ආකාරයේ අධ්‍යාපනයක් ලබා දීලා තිබෙනවා. මම දේශපාලනයක් කථා කරනවා නොවෙයි. පසුගිය ප්‍රේමදාස ජනාධිපතිතුමාගේ කාලයේදී එස්.එල්. යටගම පාසලට තරුණයන් 50 ක් විතර ගෙනැල්ලා, පුළුස්සලා, ඒ පාසලේ අධ්‍යාපනය හදාරපු දරුවන්ට ඒ අධ්‍යාපනය ලබා ගැනීමට නොහැකි ආකාරයේ තත්ත්වයක් උදා කරලා තිබුණා. නමුත් අද මේ වන විට අපි ප්‍රසන්න රණතුංග මැතිතුමාගේ මූලිකත්වයෙන් රුවන් රණතුංග මැතිතුමා සහ අපි සාකච්ඡා කරලා ජනවාරි මාසය වන විට අධ්‍යාපනය ලබන්න අවශ්‍ය ආකාරයට ප්‍රතිපාදන ලබා දීලා, අපි ඒ පාසල සූදානම් කරලා තියෙනවා. ඒ දරුවන්ට අවශ්‍ය ආකාරයට ඒ වැසී ගිය පාසල නැවත ආරම්භ කරන්නට අපි කටයුතු කරලා තිබෙනවා. විශේෂයෙන්ම මීනුවන්ගොඩ කලාපයේ තිබුණු පාසල් අතුරින් ගනේගොඩ පාසල, දෙවොලපොලට අනුබද්ධ පාසල ආරම්භ කරන්න අපි කටයුතු කරලා තිබෙනවා. ඒ වාගේම දෙමහල්, තෙමහල් ගොඩනැගිලි ලබා දීලා, භෞතික සම්පත් ලබා දීලා දරුවන්ට අවශ්‍ය ආකාරයට පාසල් පද්ධතිය සකස් කර ගන්න, මම හිතන්නේ ගරු ප්‍රධාන අමාත්‍යතුමාගේ නායකත්වයෙන් යුක්තව අපි මේ වන විට කටයුතු කරලා තිබෙනවා. එහෙම නම් ඉදිරියේදී එතුමාට ලබන පළාත් සභාවේදී මේ පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍ය ධූරය හොබවන්න හැකියාව, ශක්තිය, ධෛර්යය ලැබේවා. ඉදිරි කාල සීමාව තුළදී මේ රටේ පාර්ලිමේන්තුව නියෝජනය කරලා මේ රටේ සියලුම දරුවන්ට හොඳ අධ්‍යාපනයක් ලබා දෙන්න එතුමාට අධ්‍යාපන අමාත්‍ය ධූරය ලබා ගැනීමට වාසනාව, ශක්තිය, ධෛර්යය ලැබේවායි ප්‍රාර්ථනා කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා. බොහොම ස්තුතියි.

[අ.භා. 03.16]

**ගරු යූ.ජී. චන්ද්‍රසෝම සරණලාල්**
Hon. U.G. Chandrasoma Saranalal

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, පස්වන පළාත් සභාවේ අවසන් අයවැය විවාදය පැවැත්වෙන මේ අවස්ථාවේදී වචන කිහිපයක් හරි කථා කරන්න අවස්ථාව ලබා දීම පිළිබඳව මම

[ගරු යූ.ජී. චන්ද්‍රසෝම සරණලාල් ]

ස්තුතිවන්ත වෙනවා. අද මේ පළාත් සභාව දිහා බැලුවාම මම දකින්නේ, එදා 1993 වර්ෂයේදී චන්ද්‍රිකා කුමාරතුංග මැතිනිය ඒ දායාද කරපු, ඒ උත්පත්තිය ලබපු ඒ පළාත් සභාවේ අවසන් මළ ගම හැටියට තමයි අද අපට දකින්නට පුළුවන්කම ලැබෙන්නේ. ඒ මොකද, ඒක පැහැදිලි වෙනවා. අද ප්‍රධාන අමාත්‍යවරයාගේ වැය ශීර්ෂය යටතේ අවසන් භාගයේ ඒ විවාදය පැවැත්වෙන අවස්ථාවේදී ඒ සඳහා සහභාගී වන මන්ත්‍රීවරු කවුද? ජොෂ්ටයෝ කවුද? කවුද කථා කරන්නේ කියන එක පිළිබඳව අද අපි හැම දෙනාටම මේ අවස්ථාවේ දකින්න පුළුවන්කම ලැබෙනවා. ඒ වාගේම අද දකින ආකාරයට මට පේන්නේ නම් අර අපි සහභාගී වන අවමංගල්‍යාවල, මළ ගෙවල්වල -

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ඔබතුමා දැන්නේ ආවේ. උදේ ඉඳන් ඉන්න එපැයි. ඔබතුමා දැන්නේ ආවේ.

**ගරු යූ.ජී. චන්ද්‍රසෝම සරණලාල්**
Hon. U.G. Chandrasoma Saranalal

ඒ දේහය තියා ගෙන අවසන් ගරු බුහුමන් දක්වන කථාව හැටියට තමයි අද මන්ත්‍රීවරු කථා කරනවා අපට දකින්නට තිබෙන්නේ. (බාධා කිරීමක්) හැම කෙනාම මහ ඇමතිතුමාව මෙතැන තියා ගෙන ඒ වර්ණනාව තමයි කරන්නේ. ඉතින්, අපට සැකයක් තිබෙනවා, ඊළඟට මේ තිබෙන තත්ත්වය මොකක්ද කියන එක පිළිබඳව. අද පැහැදිලි වශයෙන්ම මේ රටේ ජනතාව, බස්නාහිර ජනතාව තේරුම් අරන් තිබෙනවා වසර 20 ක කාල සීමාව තුළ මේ පළාතේ අධ්‍යාපනය, සෞඛ්‍ය, ඒ වාගේම පළාත් පාලන ආයතන, ඒවා කඩා වැටුණේ කොහොමද කියන එක පිළිබඳව. අද ජනතාව යම් තීන්දුවක් දෙන්න බලාපොරොත්තුවෙන් ඉන්නවා. ඒ අනුව මේ ආණ්ඩු පක්ෂයේ, සන්ධානයේ හැම මහජන නියෝජිතයෙක්ම අද ඒ බව තේරුම් අරගෙන කථා කරන බවක් තමයි අද මේ සභාව තුළ අපට දකින්නට තිබෙන්නේ කියන එක මම මේ අවස්ථාවේ පැහැදිලිව ප්‍රකාශ කරනවා.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

අවුරුදු හතරකට පස්සේ ආවේ.

**ගරු යූ.ජී. චන්ද්‍රසෝම සරණලාල්**
Hon. U.G. Chandrasoma Saranalal

මම කල්පනා කරලා බලන කොට, මන්ත්‍රීවරු අද එතුමාගේ මේ කාල සීමාව පිළිබඳව නොයෙකුත් ගුණ ගායනා කළා. නමුත් මම මේ අවසන් මාස හතර තුළ, පළාත් සභාව නියෝජනය කරන්න පැමිණීම තුළ මම මන්ත්‍රී රයක් නොමැති කෙනෙක් හැටියට මම දැක්ක කොටසක් තිබෙනවා. මම හිතන්නේ, ආණ්ඩු පක්ෂයේ ගරු මන්ත්‍රීවරුන්ට ඒ පැත්ත පේන්නේ නැති එකයි මට කනගාටුව. මේ වන විට මේ පළාතේ පාසල් ගණනාවක් අද වැහිලා ගිහිල්ලා තිබෙනවා. මගේ ගමේ පාසලත් අද වැහිලා ගිහිල්ලා තිබෙන්නේ. (බාධා කිරීම්)

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

නම් කරන්න.

**ගරු ගුණසිරි ජයනාත්**
Hon. Gunasiri Jayanath

ඔබතුමාව ජනතාවට පෙනුනෙත් නැහැ.

**ගරු යූ.ජී. චන්ද්‍රසෝම සරණලාල්**
Hon. U.G. Chandrasoma Saranalal

ඒ සියල්ලම වැහිලා තිබෙන්නේ, මේ වර්තමාන මහ ඇමතිතුමාගේ පාලන කාලයේ බව (බාධා කිරීම්)

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

අත්තනගල්ලේ ජනතාව දැක්කෙත් නැහැ, ඔබතුමාව ඒ කාලේ.

**ගරු යූ.ජී. චන්ද්‍රසෝම සරණලාල්**
Hon. U.G. Chandrasoma Saranalal

මම මේ අවස්ථාවේ පැහැදිලිව ප්‍රකාශ කරනවා. ඒ වාගේම පාසල්වලට දරුවන් දැමීමේදී ලොකු අර්බුද අද නිර්මාණය වෙලා තිබෙනවා. මේ වන කොට මේ වර්තමාන පළාත් සභාවට කිසිම විකල්පයක් නැති තත්ත්වයට පත් වෙලා තිබෙනවා. අද අපි දකින එකම දේ තමයි සීමාවක් නැතිව පාසල්වලට දරුවන් ඇතුළත් කිරීමයි. ඒ වාගේම පොරොත්තු ලේඛනයෙන් වැඩක් නැහැ. ඒ අධීක්ෂණ මන්ත්‍රීවරු තමයි ඒ පාසල්වලට ඒ දරුවන් ඇතුළත් කරන්නේ. අධීක්ෂණ මන්ත්‍රීවරු නැහැයි කියන එක අපට

පසුගිය දවස්වල අහන්නට ලැබුණා. නමුත් මේ හැම දෙයක්ම කරන්නේ අධීක්ෂණ මන්ත්‍රීවරු හරහා දේශපාලනීකරණය වීමෙන් අපි දැක්කා පසුගිය කාල සීමාව තුළදී විදුහල්පතිවරුන්ට එක පාසලකට රුපියල් පනස්දාහ ගණනේ දීලා, මහ ඇමතිතුමා නියම කරලා තිබුණා සන්ධානයේ, ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරු දෙන්නෙක් ගෙනැල්ලා ඒ උත්සව පවත්වන්නය කියලා. මෙන්න මේ විධියට තමයි කටයුතු කරලා තිබෙන්නේ. නමුත් උත්සව පැවැත්වූවා. අද වන තෙක් ඒ රුපියල් පනස්දාහ නොලැබුණු පාසල් මේ බස්නාහිර පළාත් සභාව තුළ තිබෙනවා. ඒක මම පැහැදිලිව ප්‍රකාශ කරනවා.

ඒ විතරක් නොවෙයි. අධ්‍යාපනය, මේ කියන හැම අංශයකම කඩා වැටීම තුළ - මේ පාලන කාලය තුළ තමයි පළාත් පාලන ආයතන බහුතරයක අද අර්බුද නිර්මාණය වෙලා තිබෙන්නේ. ගම්පහ දිස්ත්‍රික්කය ගත්තොත් පැලියගොඩ, කැලණිය, ඒ වාගේම වත්තල, අත්තනගල්ල, මීරිගම - මීරිගම අද ලොකු අස්ථාවර තත්ත්වයකට පත් වෙලා තිබෙනවා. අත්තනගල්ලේ ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයාට තමන්ගේ අභිමතය අනුව ඒ කටයුතු කරන්න පුළුවන්කමක් නැහැ. අපි දන්නවා මොන තරම් අපහසුතාවයට පත් වෙලා තිබෙනවාද කියන එක පිළිබඳව. ඒ වාගේම අද මීරිගම ප්‍රාදේශීය සභාවේ ආණ්ඩු පක්ෂයේ සියලුම මන්ත්‍රීවරු එක පැත්තකට වෙලා සභාපතිවරයා තනි වෙලා තිබෙනවා. මේ කාගේ කාල සීමාවේද කියලා අපි ප්‍රශ්න කරනවා. ප්‍රධාන අමාත්‍යවරයා හැටියට මේ පළාත් පාලන ආයතනවල කටයුතු පිළිබඳව වග කියන්න ඕනෑ.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමිය**
Hon. Presiding Member

ඔබතුමාට නියමිත කාලය අවසන්.

**ගරු යූ.ජී. චන්ද්‍රසෝම සරණලාල්**
Hon. U.G. Chandrasoma Saranalal

ඒ කෙසේ වෙතත් අද මේ සභාව තුළ මම දැකපු දේ, ගම්‍ය වන දේ තමයි අද අර මම කලින් කිව්වා වාගේ අපි යන මළ ගෙවල්වල ඒ දේහය තියාගෙන අවසන් කටයුතු කරනවා වාගේ, ඒ කරන කථාව හා සමාන කථාවක් තමයි අපටත් කරන්න තිබෙන්නේ. (බාධා කිරීම්)

**ගරු ගුණසිරි ජයනාත්**
Hon. Gunasiri Jayanath

දැන් ඔයාට සුදු කොඩි පේනවා නේ?

**ගරු යූ.ජී. චන්ද්‍රසෝම සරණලාල්**
Hon. U.G. Chandrasoma Saranalal

ඒ කෙසේ වෙතත් මම ප්‍රාර්ථනා කරනවා පෞද්ගලිකවම මගේ මිත්‍රයා හැටියට මහ ඇමතිතුමාට (බාධා කිරීම්)

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

ඔය බටර් ගාන්නේ ඇයි?

**ගරු යූ.ජී. චන්ද්‍රසෝම සරණලාල්**
Hon. U.G. Chandrasoma Saranalal

එතුමාට එතුමාගේ විපක්ෂ නායක ධූරය ඉදිරි පළාත් සභාව තුළත් රැක ගැනීමේ ලොකු අර්බුදයක් තිබෙනවාය කියන එක මම මේ අවස්ථාවේදී පැහැදිලිව ප්‍රකාශ කරනවා. බොහොම ස්තුතියි.

[අ.භා. 03.25]

**ගරු නෙලුක් මල්ලව**
Hon. Neluk Mallawa

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අවසන් වරට විපක්ෂයෙන් අදහස් දක්වපු අපේ අසරණලාල් - සමාවෙන්න. සරණලාල් මන්ත්‍රීතුමා අදහස් දක්වපු විධියට ආණ්ඩු පක්ෂය තුළින් දිස්වන්නේ මළගමක කථාවක් කිව්වා. මළ ගෙවල්වල විතරක් ගිහින් දේශපාලනය කරන අයට හැම තැනම මළ ගෙවල් වාගේ පෙනෙනවා. ඒකට කරන්න දෙයක් නැහැ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමිය මගින් දැනුම් දෙන්න කැමැතියි. දේශපාලනයේ යෙදෙන කොට මළ ගෙවල්වල ගිහිල්ලා තමන්ගේ මනාප රැස් කර ගැනීමේ ප්‍රතිඵලය මෙතුමා අවුරුදු හතරක් තිස්සේ කල්පනා කරන්න ඇති. පස්වන අවුරුද්දේ සභාවට පැමිණීම සම්බන්ධව සතුටු වෙනවා. ඒ ආවේත් දැන්. මමත් නවක මන්ත්‍රීවරයෙක් හැටියට ඔබතුමාගේ පැමිණීම පිළිබඳව යම් යම් නිරීක්ෂණයන් කළා. නමුත් අධ්‍යාපන කටයුතු සංවර්ධනය කරන්න ඔබතුමාට ඔය තරම් කැක්කුමක් තිබෙනවා නම්, කලාප අධ්‍යාපන කමිටු හරහා එන්න පුළුවන්. ගමේ ඉස්කෝලේ සංවර්ධනය කිරීමේ වගකීම ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරයාට වාගේම විපක්ෂයේ මන්ත්‍රීවරයාටත් තිබෙනවා. ඒ නිසා වැහුණු පාසල් (බාධා කිරීම්) ඔබතුමාට පුළුවන්කමක් තිබෙනවා, අඩු ගණනේ කලාප කමිටුවට ගිහිල්ලා, ව්‍යූහ කමිටුවට ගිහිල්ලා, ව්‍යූහ කමිටුවේදී අදහස් දක්වලා පාසල් නගා සිටුවීම වෙනුවෙන් කටයුතු කරන්න පුළුවන්. ඒ සියලු දේ නොකරමින් විපක්ෂයේ මන්ත්‍රීවරයාගේ විපක්ෂයේ වගකීම ඉෂ්ට කරමින් -

**ගරු යූ.පී. චන්ද්‍රසෝම සරණලාල්**
Hon. U.P. Chandrasoma Saranalal

අපට කථා කළා නම් මම කියනවා, කලාප අධ්‍යක්ෂවරයා යනවාලු - ඊයේ පත්තරේ තිබුණා. අපි කියන්නම් ගම්පහ -

**ගරු නෙලුක් මල්ලව**
Hon. Neluk Mallawa

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, එතුමන්ලාගේ වගකීම නිසි ලෙස ඉෂ්ට සිද්ධ කරන්නේ නැතිව මේ කටයුත්ත කරන්න බැහැ. වගකීම ඉෂ්ට සිද්ධ කරන විපක්ෂයේ මන්ත්‍රීවරු අපි නිරීක්ෂණය කරලා තිබෙනවා. කොහොම වුණත් අපේ විපක්ෂයේ මුජිබුර් රහුමාන් ගරු මන්ත්‍රීතුමා කථා කරන කොට කිව්වා, නිවාස අහිමි වූ පුද්ගලයන් සම්බන්ධයෙන්. එය සංවේදී ජනකයි. ඒ පිළිබඳව මා එකඟ වෙනවා. හැබැයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, එතුමාගේ එක කොටසක කිව්වා, මේ මිනිස්සුන්ගේ ප්‍රශ්න අරගෙන අපි ජිනීවා ගියොත් අපි කුමන්ත්‍රණකාරයෝ කියනවා කියලා. හැබැයි, එක දෙයක් තිබෙනවා. ඒ මිනිස්සුන්ගේ ප්‍රශ්න ඒගොල්ලෝ ජිනීවා අරන් යන්නේ නැහැ. රටේ අනෙකුත් ප්‍රශ්න, රට බෙදන, බෙදුම්වාදී වුවමනාවන්ට ජිනීවා අරන් ගිහිල්ලා මේ තිබෙන රාජ්‍ය නායකත්වය වට්ටන්න ඕනෑ කරන අනෙකුත් වැඩ කටයුතු සියල්ල කරනවා. ඒ නිසා ජිනීවා යා යුතු ප්‍රශ්නය ජිනීවා නොගිහින්, රට එකමුතු කරන, රට එක්සේසත් කරන ස්වෛරීය රාජ්‍යයක් බවට පත් වෙලා තිබෙන මේ රට නගා සිටුවන ජන නායකයන් ජිනීවා යවා ගැනීමේ වුවමනාවක් නම් එතුමන්ලාට තිබෙනවා.

ඒ වාගේම අපේ රෝස් ප්‍රනාන්දු ගරු මන්ත්‍රීතුමිය. මම දන්නේ නැහැ වෘත්තීමය හරි පාරම්පරිකව හරි කරත්ත දක්කනවාද කියලා. ඒගොල්ලොන්ගේ එහෙම වෘත්තීය හැකියාවක් ගැන දැන් කිව්වා. ලණුව අදින කොට යනවා. බුරුල් කරන කොට එනවා. ඒ වාගේ කථාවක් කිව්වා. බොහොම පළපුරුද්දක් තිබෙනවා. එක දෙයක් තිබෙනවා. රාජපක්ෂලාගේ තෝන් ලණුවට අනුවය මේ ආණ්ඩුව පළාත් සභා යනවා කියලා. රාජපක්ෂ කියන්නේ, මහින්ද රාජපක්ෂ මැතිතුමාව ගත්තාම මේ රටේ රාජ්‍ය නායකයා. විධායක ජනාධිපතිවරයා. විධායක ජනාධිපතිවරයාගේ ඒ දේශපාලන උවමනාවට තමයි, ඒ වැඩ පිළිවෙළට තමයි ආණ්ඩු පක්ෂය ක්‍රියාත්මක වෙන්නෙත්. පළාත් සභා ක්‍රියාත්මක වෙන්නෙත්. ඒකේ වෙන කථාවක් නැහැ. හැබැයි, ඒකේ එකම දේ අවසානයේ ගොනා කාණුවට පැන්නා. ඒගොල්ලන්ට කියා ගන්න බැරිව ගියා. ඒගොල්ලන්ට අමතක වුණා. (බාධා කිරීම්)

ඉතිහාසයේ ඉල්ලා අස්වීම් ලිපි අරගෙන තමයි රාජ්‍ය නායකයෝ මේ ආණ්ඩු කළේ. ඉල්ලා අස්වීම් ලිපි අරගෙන. එහෙම කොන්දක් නැති එක්සත් ජාතික පක්ෂයේ මන්ත්‍රීවරු මේවාට ඇවිල්ලා රාජ්‍ය නායකයන්ගේ උවමනාවට ක්‍රියාත්මක වන පළාත් සභා කියලා කථා කරනවා. ඒ නිසා ඇත්ත තත්ත්වය, යථාර්ථය එයයි. මේ යථාර්ථයෙන් වහන් වෙන්න පුළුවන්කමක් නැහැ. (බාධා කිරීමක්) මෙතැනදී මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ඔබතුමිය මඟින් මතක් කරලා දෙන්න ඕනෑ. මෙතැනදී බොහෝ වෙලාවට අපි ප්‍රතිඵල ගැන කථා කළා. අධ්‍යාපන සංවර්ධනය ගැන කථා කළා. මේ හැම දෙයක් ගැනම කථා කරන කොට ආකල්පමය වෙනසක් අපි ඇති කළ යුතුව තිබෙනවා. බොහෝ වෙලාවට මම පහ වසර ශිෂ්‍යත්ව විභාගයට එකඟ නැහැ. රජයේ හා මේ තිබෙන වැඩ පිළිවෙළවල්වල මේ තිබෙන සැලසුම්වලට මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අපට හැකියාවක් ලැබිලා නැහැ ඉතිහාසයේ ඉඳලාම ජනප්‍රිය පාසල්වලට දරුවන් ඇතුළත් කර ගන්න.

එහෙම නැත්නම් අනික් පාසල් සියල්ල ජනප්‍රිය කරන්න. ජාතික වශයෙන් වැඩ පිළිවෙළක් ඕනෑ. ජනප්‍රිය පාසල් තුළට දරුවන් ඇතුළත් කර ගන්න යන කොට ඒ ඇතුළත් කර ගැනීමේ තරඟ විභාගය පහ වසර ශිෂ්‍යත්වය වීම නිසා දෙමව්පියන්ගේ වුවමනාවට දරුවන්ගේ ජීවිතය හැඩ ගස්වන්න, දෙමව්පියන්ට විඳින්න නොලැබුණු, දෙමව්පියන්ට ලබන්න බැරි වුණු, දෙමව්පියන්ට ලබා ගන්න බැරි වුණු ජයග්‍රහණ දරුවා තුළින් ලබා ගන්න අද පහ වසර ශිෂ්‍යත්වය කඩඉමක් බවට පත් කර ගෙන තිබෙනවා. දෙමව්පියන්ගේ ඉතිහාසය තුළ ඔවුන්ගේ අභිමතය පරිදි, ඔවුන්ගේ දැකපු හීනය, වෘත්තියක් තුළින් ලබා ගන්න බැරිව ගියාම, ඒ වෘත්තිය දරුවා තුළින් ලබා ගන්න බලනවා. ඔවුන්ගේ ජීවිතය තුළ පාසල් කඩඉම ජය ගන්න බැරිව ගියාම, දරුවා තුළින් ඒ පාසල් කඩඉම ජය ගන්න ඒ හීන මවනවා. ඒ තිබෙන ආවේණික අවශ්‍යතාවය යථාර්ථයක්. හැබැයි, ඒ යථාර්ථයට උල්පන්දම් දෙන්න අපි මෙහෙන් පහ වසර ශිෂ්‍යත්වය හා අනෙකුත් කඩඉම්, දරුවන්ට මානසික වදයක් වන ආකාරයට පවත්වන්න හොඳ නැහැ. ඇත්තමට මම හිතන්නේ, පහ වසර ශිෂ්‍යත්වය වෙනුවට වෙනත් විකල්පයක් පැමිණිය යුතුයි. දරුවාගේ ඒ මානසික තත්ත්වය, දරුවාගේ ළමා කාලය හොරකම් කරපු, ළමා

කාලය පැහැර ගත්ත දරුවෙක් නිර්මාණය වුණොත්, ඒ පැහැර ගත් ළමා කාලයෙන් දරුවා සමාජයෙන් පළි ගන්නවා. අපට ඉංජිනේරුවෝ හදන්න පුළුවන්. වෛද්‍යවරු හදන්න පුළුවන්. නීතිඥයෝ හදන්න පුළුවන්. ගණකාධිකාරීවරු හදන්න පුළුවන්. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපට මනුස්සයෙක් හදන්න බැහැ. රටට ආදරය කරන, ජාතියට ආදරය කරන, තමන්ගේ මාතෘ භූමියට, තමන්ගේ සංස්කෘතියට ආදරය කරන මිනිහෙක් නිර්මාණය කර ගන්න නම් මේ අධ්‍යාපන ක්‍රමය තුළ විද්‍යාව, ගණිතයට හා සියලු දේට විවර වුණු දේවල්වලට වඩා සෞන්දර්යාත්මක ළමයෙක් නිර්මාණය කරන්නට ඕනෑ. තෙත් පපුවක් ඇති මිනිහෙක් නිර්මාණය කරන්න ඕනෑ. මෙන්න මේ ගමනේදී අපේ අධ්‍යාපන ක්‍රමය හා මේ විභාග කඩඉම් මම හිතන්නේ, මීට වඩා සුවිශාල විධියට වෙනස් විය යුතුයි. ඒ නිසා මේ කඩඉම් වෙනස් කිරීමේදී අපට පළාත් සභාව හැටියට සමහර තීන්දු තීරණ ගන්න බැහැ. පළාත් සභාව හැටියට කළ හැකි උපරිම දේ පළාත් සභාව පැත්තෙන් වෙනවා. අද ප්‍රසන්න වූ පරිසරයක් පාසල් පද්ධතියේ හදන්න, ඒ පරිසර පද්ධතිය දරුවාට චිත්ත ආකර්ශනීය විධියට ලබා දීලා දරුවාට ප්‍රියමනාප පරිසරයක්, ගෙදරට වඩා හොඳ පරිසරයක් පාසලේ හදන්න පළාත් සභාව හැටියට සියලුම උත්සාහයන් දරනවා.

චන්ද්‍රසෝම සරණලාල් ගරු මන්ත්‍රීතුමා කථා කරන කොට කිව්වා, හැම පාසලකටම පනස් දාහක් දෙනවා කියලා. පනස්දාහ නොවෙයි, අපි ලක්ෂයත් දෙනවා. එක් ලක්ෂ පනස් දාහත් දෙනවා. නොදෙන පාසල්, මේ පාසල් පද්ධතියේ නැහැ. එහෙම නම් ඉතින් International school එකක් වෙන්න ඕනෑ. එහෙම නැත්නම් වෙනත් අර්ධ රාජ්‍ය පාසලක් වෙන්න ඕනෑ. පළාත් පාසල් සියල්ලටම දෙනවා. එතුමා සුපසන් නිම්තෙර කියන වැඩ සටහන ගැන නොදැන සිටීම මන්ත්‍රී වරප්‍රසාද පාවිච්චි කරලා එම වැඩ සටහන විවේචනය කිරීම මම හිතන්නේ නැහැ උචිතයි කියලා. නොදන්නවා නම්, නොදන්න දේ නොකියා ඉන්නවා නම් හොඳයි. දන්නවා වාගේ කථා කිරීම තුළ යම් අසාධාරණයක් මේ පළාත් සභාවේ වැඩ පිළිවෙළට සිද්ධ වෙනවා. ඒ නිසා සුපසන් නිම්තෙර යටතේ ඒ සුපසන් වූ පරිසරය දරුවන්ට නිර්මාණය කරන්න කටයුතු ඉටු වෙනවා. ඊළඟ සිද්ධිය ඒ දරන උත්සාහය තුළ මම හිතන්නේ, පළාත් සභාව අද ශ්‍රී ලකාවේ පළාත් සභාවන් අතර අංක එකට ඉන්නවා. පළාත් පාසල් හැටියට, අපේ පළාත් පාසල් දරුවෝ බොහොම අභිමානයෙන්, ආඩම්බරයෙන් ඒ පාසල් පරිසරයේ ඉන්නවා. ඒ විතරක් නොවෙයි. මෙතැන්දී අපි ගුරු භවතුන්ගේ හා ඔවුන්ගේ වෘත්තීය සමිති ක්‍රියාවලිය තුළ අද ආකල්පමය වෙනසක් ඇති කරන්න ඕනෑ. වෘත්තීය සමිතිවල පැවැත්ම තිබෙන්නේ, විශේෂයෙන් ජනතා විමුක්ති පෙරමුණ මූලික කර ගත් වෘත්තීය සමිතිවල පැවැත්ම තිබෙන්නේ, නඩත්තු වෙන්නේ, වෘත්තීය සමිති සාමාජිකයාගේ සාමාජික මුදලින්. ඔවුන් ළඟ ඉන්නවා පූර්ණකාලීනව දේශපාලනයේ යෙදෙන අය. පූර්ණ කාලීනව දේශපාලනයේ යෙදෙන අයගේ පවුල් නඩත්තු වෙන්නේ, ඒ සල්ලිවලින්. ඒ මුදලින් නඩත්තු වෙන්න නම්, වෘත්තිය සමිති ක්‍රියාකාරිකයා, ඒ කම්කරුවන්ගේ වැටුපෙන් කොටසක් ඒවාට යන්න ඕනෑ. ඒ මුට්ට කාසිවලින් යැපෙන වෘත්තීය සමිති ව්‍යාපාරය පළාත් සභාව හරහා ගෙනෙන්නා වූ සෑම යෝජනාවකටම එරෙහි වෙනවා. මතක ඇති ගුරු පුහුණු වැඩ පිළිවෙළ. ගුරු පවුර වැඩ පිළිවෙළ. ගුරු පවුර වැඩ පිළිවෙළ තුළ ගොඩ නැගුණු රක්ෂණය මම හිතන්නේ, ගුරුවරයෙකුට තම ජීවිතය තුළ, තම ජීවිතය පිළිබඳ සුරක්ෂිත භාවයක්, තමන්ගේ ජීවිතයේ තමන්ට එළැඹෙන රෝගාබාධ පිළිබඳ සුරක්ෂිත භාවයක් ඇති වෙනවා. එයින් මිදෙන්න, ජය ගන්න තිබෙන ඉඩකඩ වැඩි වෙනවා. අනෙකුත් රක්ෂණ ක්‍රම සියල්ල පරදවා, මෙතෙක් කාලයක් රාජ්‍ය සේවකයන්ට තිබුණු අනෙකුත් සහන පරදවා ඒ රක්ෂණ ක්‍රමය ඉදිරියට ගිහිල්ලා තිබෙනවා. මේ ඉදිරියට ගිය රක්ෂණ ක්‍රමය වැළඳගන්න ගුරුවරුන්ට නොදී වෘත්තීය සමිති සටන් පාඨයක් බවට පත් කරමින්, මෙය ප්‍රධාන ඇමතිවරයාගේ දේශපාලන වැඩ පිළිවෙළක් බවට ප්‍රකාශ කිරීම, මම හිතන්නේ ඔවුන්ගේ තිබෙන දේශපාලන බංකොලොත් භාවයයි.

ඒ නිසා බස්නාහිර පළාත් සභාව හැටියට, පළාත් සභාවේ අධ්‍යාපන අමාත්‍යාංශය, ප්‍රධාන අමාත්‍යතුමා ප්‍රමුඛව ඒ සියලු නිලධාරීන්, ඒ සියලු කාර්ය මණ්ඩලයන් එක්සත්ව, එක්සිත්ව මේ කර ගෙන යන වැඩ පිළිවෙළ මම හිතන්නේ ආදර්ශවත්. එය තමයි අධ්‍යාපනය පෙරට තබා දරුවන්ට හොඳම දේ දෙමින්, දරුවන්ට මුල් තැන ලබා දෙමින්, දරුවා ගොඩ නගමින් රට ගොඩ නගන්න, දරුවා තුළින් රටේ අනාගතය ගොඩ නගන්න දරන මේ උත්සහය තමයි මම හිතන්නේ විශිෂ්ට වන්නේ.

ඒ වාගේම මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, පසුගිය දවස්වල මමත් සහභාගී වුණා අපේ පළාත් ඉඩම් අංශය මගින් කරන ලද වැඩ සටහනකට. එතැනදී මා නියෝජනය

[ගරු නෙලුක් මල්ලව ]

කරන කොට්ඨාශය වාගේම ගම්පහ දිස්ත්‍රික්කය - ඒ වාගේම බස්නාහිර පළාතේ බොහෝ වෙලාවට තිබෙනවා, අනවසරයෙන් පදිංචි වුණු ඉඩම්. ඒ වාගේම රජයෙන් ඉඩම් ලබා නොදුන් අය. බලපත්‍ර නොදුන් අය. ඒ වාගේම ස්වර්ණභූමි ඔප්පු ප්‍රදානය නොකරපු අය. මේ සියල්ලන්ට මම හිතන්නේ ගරු ප්‍රධාන අමාත්‍යතුමාගේ නායකත්වය යටතේ ඉදිරියේදී සහන සැලසෙනවා. මේ වන කොට ඒ වැඩ පිළිවෙළ ආරම්භ වෙලා අවසානයි. අද තමන්ගේ බිමට, උපන් දා සිට අවුරුදු තිහ හතළිහ ජීවත් වුණු බිමට නෛතික ලියවිල්ලක් ලැබෙනවා. ඒ නෛතික ලියවිල්ල තුළ ඔවුන්ගේ දේපලේ සුරක්ෂිත භාවය තිබෙනවා. දේපල සුරක්ෂිත වීම තුළ ඒ කාලාන්තරයක් මුළුල්ලේ ජීවත් වුණු වැඩිහිටියන්ට තමන් විසින් තමන්ගේ දරුවන්ට පවරා දෙන්න යම් දේපළක්, වස්තුවක් උරුම වෙලා තිබෙනවා. ඒ නිසා එම වැඩ පිළිවෙළ සාර්ථක කර ගන්න ඒ සියලු දෙනාට වාසනාව, ශක්තිය, ධෛර්යය හැකියාව ලැබේවායි කියා ප්‍රාර්ථනා කරමින්, බස්නාහිර පළාත් සභාවේ මේ අයවැය ඉදිරිපත් කිරීම තුළ, මේ ඉදිරිපත් කළ සියලු වැය ශීර්ෂයන්ට නැවත වාරයක් ලබන වසරේදී නායකත්වය දෙන්න ගරු ප්‍රධාන අමාත්‍ය ප්‍රසන්න රණතුංග මැතිතුමාට හැකියාව ලැබේවා කියලා ප්‍රාර්ථනා කරමින් මම නිහඬ වෙනවා.

[අ.භා. 03.32]

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ගරු ප්‍රධාන අමාත්‍යතුමාගේ, ඒ වාගේම ප්‍රසන්න රණතුංග මැතිතුමාගේ අයවැය වෙනුවෙන් කථා කරන්න අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමියට ස්තුතිවන්ත වෙනවා. ප්‍රථමයෙන්ම බැලුවොත් අද පෙරවරු 11.00 ට පටන් අරගෙන, මේ වන කොට විශාල මන්ත්‍රීවරු සංඛ්‍යාවක් ආණ්ඩු පක්ෂයේත්, විපක්ෂයේත් කථා කළා. මීට ඉහත කථා කළ චන්ද්‍රසෝම සරණලාල් ගරු මන්ත්‍රීතුමා, මම හිතන්නේ විවාදය පෙරවරු 11.00 ට පටන් ගත්තාට 3.15 ට ඇවිල්ලා 3.30 ට එළියටත් ගියා. එතුමා දන්නෙත් නැහැ මෙතැන විෂයන් ගැන, එක් එක් මන්ත්‍රීවරු කථා කළ අදහස් ගැන. ඒ නිසා අද ආණ්ඩු පක්ෂයේ, විපක්ෂයේ සියලුම ගරු මන්ත්‍රීවරු අධ්‍යාපන විෂය සම්බන්ධයෙන් කථා කරන කොට ප්‍රධාන අමාත්‍යතුමා විවේචනය නොකර, එතුමා කරපු වැඩ සටහන් ගැන සියලු දෙනාම වර්ණනා කරලා කථා කළේ ඒ වැඩ සටහන් දැක්ක නිසා.

අපි ඉතිහාසය ගත්තොත් එතුමා 1993 දී පළාත් සභාවට ඇවිල්ලා, එක අවුරුද්දක මන්ත්‍රීවරයෙක් හැටියටත්, ඒ වාගේම 1994 ඉඳලා 1999 දක්වා ප්‍රවාහන හා ක්‍රීඩා අමාත්‍යවරයා හැටියට පළාත සහ දිස්ත්‍රික්කය නියෝජනය කරන මන්ත්‍රීවරයෙක් හැටියටත්, අමාත්‍යවරයෙක් හැටියටත් වැඩ කොටස් රාශියක් කළා. ඒ වාගේම නැවතත් එතුමා පළාත් සභා මන්ත්‍රීවරයෙක් හැටියට පසු පෙළේ ඉඳගෙන පළාත් සභාව තුළ පළාත් සභා මන්ත්‍රීවරයෙක් හැටියට ක්‍රියා කළා. ඒ වාගේම 2004 දී ඇවිල්ලා 2009 දක්වා සෞඛ්‍ය අමාත්‍යවරයා හැටියට බස්නාහිර පළාතට, දිස්ත්‍රික්කයට නායකත්වය දෙමින් වැඩ කොටස් රාශියක් කළා. අවුරුදු 16 ක් තුළ පළාත් සභා මන්ත්‍රීවරයෙක් හැටියටත්, අමාත්‍යවරයෙක් හැටියටත් ප්‍රධාන විෂයයන් වන ප්‍රවාහන, ක්‍රීඩා, සෞඛ්‍ය කියන ප්‍රධාන විෂයයන් පිළිබඳව අත්දැකීම් සම්භාරයක් තිබෙන මන්ත්‍රීවරයෙක් හැටියට තමයි 2009 දී පළාත් සභා මැතිවරණයට ගම්පහ දිස්ත්‍රික්කයෙන් අපේක්ෂකයකු හැටියට අවස්ථාව ලබා ගෙන ඉදිරිපත් වුණේ. එදා මේ ගම්පහ දිස්ත්‍රික්කයේ ජනතාව එතුමා ගැන විශාල විශ්වාසයක් තැබුවා.

ඒ නිසා තමයි ප්‍රධාන අමාත්‍යවරයා හැටියට එක් ලක්ෂ අසූ හය දාහක් මනාප ලබා ගෙන ජනතා විශ්වාසය දිනා ගෙන කටයුතු කරන්නට එතුමාට ඒ අවස්ථාව ලැබුණේ. අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමා වැඩිපුරම පළාතේ ජනතාව, දිස්ත්‍රික්කයේ ජනතාව විශ්වාසය තැබූ නිසා ප්‍රධාන අමාත්‍ය ධූරයත් - ඒ වාගේම අද පූජ්‍ය තෙබුවන පියනන්ද හිමියන් කිව්වා වාගේම වටිනාම, වැදගත්ම අමාත්‍යාංශය එතුමාට ලබා දුනනේ. එහෙම කියන්න හේතුව හත් ලක්ෂ එකොළොස් දාහක් මේ වන කොට දරුවන් ඉගෙන ගන්නවා, බස්නාහිර පළාතේ පාසල් එක් දහස් දෙසිය හැට හයක් තුළ. ඒ වාගේම පළාත් රාජ්‍ය සේවයේ ඉන්න 71,000 න් 40,511 ක් අධ්‍යාපන විෂයට අයිති අය තමයි ඉන්නේ. එක පැත්තකින් බලන කොට ගුරුවරු 31,531 ක්. ඒ වාගේම විදුහල්පතිවරු හැටියට 3,000 කට ආසන්න සංඛ්‍යාවක්. ඒ වාගේම දෙපාර්තමේන්තු, අමාත්‍යාංශය, කලාප 11, කොට්ඨාශ 38 තුළ ඉන්න නිලධාරීන් හැටියට ගත්තොත් 40,511 ක්. 60% ක් අධ්‍යාපන අමාත්‍යාංශය හරහා ඉන්න නිලධාරීන්, විදුහල්පතිවරු සහ ගුරුවරු හැටියට ඉන්නේ. ඒ නිසා අද එක පැත්තකින්

නලින්ද ජයතිස්ස ගරු මන්ත්‍රීතුමා පෙන්නුවා 71% ක් මුදල් වෙන් කරලා තිබෙන්නේ, ප්‍රධාන අමාත්‍යතුමාගේ අමාත්‍යාංශයට කියලා. අද බස්නාහිර පළාත තුළ අධ්‍යාපන අමාත්‍යාංශය හැටියට දරුවන් සහ නිලධාරීන් වැඩිපුරම සංඛ්‍යාවක් අද මේ අධ්‍යාපන අමාත්‍යාංශය යටතට වැටෙන නිසා ඒ මුදල් වෙන් කිරීම තුළ අපි දකිනවා, අමාත්‍යාංශයට තිබෙන වටිනාකම, වැදගත්කම කොපමණද කියලා. ඒ වාගේම තමයි අද අපි කල්පනා කරලා බැලුවොත් මෙතුමා 2009 වසරේ අධ්‍යාපන අමාත්‍යාංශය භාර ගත්තාම අධ්‍යාපන විෂය ගැන එතුමා මීට ඉස්සෙල්ලා කරලා තිබුණේ නැහැ. නමුත් එතකොට අත්දැකීම් සම්භාරයක් තිබුණා. එකක් තමයි රෙජී රණතුංග තමන්ගේ පියාණන් ආණ්ඩුකාරවරයකු හැටියට, අමාත්‍යවරයකු හැටියට පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු හැටියට කටයුතු කරමින් සිටින විට ලැබූ අත්දැකීම් සහ රෙජී රණතුංග අධ්‍යාපන ශිෂ්‍ය සංවර්ධන අරමුදල තුළ වැඩ සටහන් රාශියක් ක්‍රියාත්මක කරලා තිබුණා. ඒක ක්‍රියාත්මක කරන්න පටන් ගත්තේ වර්ෂ 2000 දී අංක 28 දරන පාර්ලිමේන්තු පනත යටතේ ලියාපදිංචි කරලා. ඒ ශිෂ්‍ය වැඩ සටහන් යටතේ මෙතුමාට අධ්‍යාපනය ගැන 2000 සිට 2009 දක්වා වසර නවයක් අත්දැකීම් සම්භාරයක් තිබුණා. දරුවන් වෙනුවෙන් ක්‍රියාත්මක වන වැඩ සටහන් නිසා.

ඒ වාගේම තමයි 2009 වසරේ එතුමා පත් වුණාට පස්සේ අධ්‍යාපන අමාත්‍යාංශයේ නිලධාරීන්, අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ නිලධාරීන්, ඒ වාගේම කලාපයේ ඉන්න නිලධාරීන්, කොට්ඨාශයේ ඉන්න නිලධාරීන්, ඒ වාගේම ආණ්ඩු පක්ෂයේ විපක්ෂයේ සියලු මන්ත්‍රීවරු එකතු කර ගත්තා. ඒ වාගේම ඒ විතරක් නොවෙයි, පාසල්වල ඉන්න විදුහල්පතිවරු, ඒ වාගේම ආදි ශිෂ්‍ය සංගම්, ඒ වාගේම පාසල් සංවර්ධන සමිති, ඒ වාගේම දෙමව්පියෝ ශිෂ්‍යයෝ සම්බන්ධ කර ගෙන සුපසන් නිම්තෙර වැඩ සටහන පටන් ගත්තේ ඒ ක්‍රියාකාරීත්වය තුළ. හැම සිකුරාදාම පාසලටත්, තමන්ගේ අමාත්‍යාංශයටත් ගෙන්වා ගෙන ඉස්සෙල්ලාම අධ්‍යාපන සංවර්ධනය ක්‍රියාත්මක කළ වර්ෂය හැටියට නම් කරන්න නම්, තමුන් මේ ගැන අවධානය යොමු කරලා, තමුන්ම මේක හඳුනා ගැනීමට අවශ්‍ය නිසා තමයි මේ වැඩ සටහන් ක්‍රියාත්මක කරන්න පටන් ගත්තේ. හැම සිකුරාදාම ගෙනැල්ලා පාසල්වල අවශ්‍යතාවය, දරුවාගේ අවශ්‍යතාවය, ගුරුවරුන්ගේ අවශ්‍යතාවය, විදුහල්පතිවරුන්ගේ අවශ්‍යතාවය අපි හඳුනා ගත්තා. එතුමා ඒ හඳුනාගෙන ඒ වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම තුළ තමයි සුපසන් නිම්තෙර වැඩ සටහන පටන් ගත්තේ. ඒ තුළ අද වැඩ සටහන් රාශියක් පටන් ගත්තා. ඒකේ ප්‍රතිඵලයක් හැටියට තමයි අද අවුරුදු පහක්, මේ එතුමාගේ පස්වන අයවැය. අද පූජ්‍ය තෙබුවන පියනන්ද හිමියන් ප්‍රතිඵල ගැන සාකච්ඡා කළා. අපේ චන්ද්‍රභානු අදිකාරම් මන්ත්‍රීතුමා එක් එක් විෂයන් ගැන කථා කරන කොට ප්‍රතිඵල ගැන කිව්වා. ගුණසිරි ජයනාත් ගරු මන්ත්රීතුමා ප්‍රතිඵල ගැන කථා කරන කොට, වෙනත් විෂයයන් ගැන පැහැදිලිව සඳහන් කළා ශිෂ්‍යත්ව ප්‍රතිඵල, සාමාන්‍ය පෙළ, උසස් පෙළ ප්‍රතිඵල. මේ හැම දේම අවුරුදු පහක් තුළ යම්කිසි ප්‍රතිශතයක් ගොඩ නගා ගන්න පුළුවන් වුණේ එතුමා සුපසන් නිම්තෙර වැඩ සටහන යටතේ ක්‍රියාත්මක කරපු නිසා. ඒකට තමන්ගේ පෞද්ගලික කාර්ය මණ්ඩලය, ඒ වාගේම ප්‍රධාන ලේකම්තුමිය, අධ්‍යාපන ලේකම්තුමා, පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂතුමා, කලාප කාර්යාලය, විෂය අධ්‍යක්ෂවරු, ගුරු උපදේශකවරු. මේ හැම කෙනෙක්ම සම්බන්ධීකරණය කරලා වැඩ කටයුතු කළ නිසා තමයි එතුමාට ඒ අවුරුදු පහක ඉලක්කය කරා යන්න පුළුවන් වුණේ. ඒක තමයි මේ වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම තුළින් අපි දැක්කේ.

මෙතැන සමහර ගරු මන්ත්‍රීවරු අපේ පාසල අපේ දෑතින් සුරකිමු කියන වැඩ සටහන මම හිතන්නේ තවම මේ අවුරුදු පහ තුළ වත් දැකලා නැහැ, මොනවාද වෙලා තිබෙන්නේ කියලා. අවුරුදු පහට පටන් ගත් වැඩ සටහනක්. 2009 වසරේ බස්නාහිර පළාතේ පාසල් 370 කට මිලියන 52.9 ක් ලබා දුන්නා. 2010 වසරේ පාසල් 613 කට මිලියන 44.9 ක් ලබා දුන්නා. නමුත් ගරු ප්‍රධාන අමාත්‍යතුමා කල්පනා කරලා බැලුවා. එක් එක් මන්ත්‍රීවරුන්ගේ ඉල්ලීම පිට, නැත්නම් කලාපයේ, කොට්ඨාශයේ, එහෙම නැත්නම් විදුහල්පතිවරුන්ගේ, එහෙම නැත්නම් දෙපාර්තමේන්තුවේ ඉල්ලීමට තමයි මුල් කාලයේ පාසල් වෙන් කර ගත්තේ. නමුත් 2011 වසරේ ඉඳලා එතුමා මුළු පාසල් පද්ධතියටම සිසු අනුපාතය අනුව - සිසු අනුපාතය අනුව තමයි ගොඩනැගිලි තිබෙන්නේ. ඊයේ ශ්‍රීනාත් ගරු මන්ත්‍රීතුමා පොදු සාකච්ඡාව අවස්ථාවේදී කථා කළා තීන්ත ගාන්න ගොඩනැගිලිවලට බාගෙට දීලා කියලා. සිසු අනුපාතය අනුව තමයි ගොඩනැගිලි තිබෙන්නේ. ගොඩනැගිලි අනුව තමයි මුදල් වෙන් කෙරුවේ. සිසු අනුපාතය අනුව ළමයින් 500 ට අඩු නම් රුපියල් 50,000 ක්, ළමයින් 500 – 1000 දක්වා රුපියල් 100,000 ක් සහ ළමයින් 1000 ට වැඩි නම් රුපියල් 150,000 ක් හැටියට තමයි මුදල් වෙන් කරලා

[ගරු මෙරිල් පෙරේරා ]

දුන්නේ. 2011 වසරේ සිට මේ වන කොට පාසල් 1260 ක පාසල් සංඛ්‍යාවකට මිලියන 85.5 ක් වෙන් කරලා දුන්නා. 2012 වසරේ පාසල් 1272 කට මිලියන 94.1 ක් වෙන් කරලා දුන්නා. ඒ වාගේම 2013 වසරේ පාසල් 1272 ටම මුදල් වෙන් කරලා දුන්නා. මේ සුපසන් නිම්තෙර වැඩ සටහනත් එතුමා ක්‍රියාත්මක කළ එක්තරා වැඩ සටහනක්. සරණලාල් ගරු මන්ත්‍රීතුමා මෙතැන ඇවිල්ලා බොරු කියලා ගියා. චක්‍රලේඛයක් යවලා තිබෙනවා ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරු සම්බන්ධ කර ගෙන මේ වැඩ සටහන ක්‍රියාත්මක කරන්න කියලා. මා ළඟ තිබෙනවා ඇරපු ලියුම. අපේ ලේකම්තුමා ඇරලා තිබෙන මේ ලියුමේ තිබෙන්නේ, පළාත් සභා මන්ත්‍රීවරුන් හැටියට මෙම රැස්වීම සඳහා කලාප හා ව්‍යුහ කමිටු නියෝජනය කරන පාසල ඇතුළත් කොට්ඨාශයේ ගරු පළාත් සභා මන්ත්‍රීවරු සම්බන්ධ කර ගෙන කරන්න කියලා. එතැන ආණ්ඩු පක්ෂය කියලා ලියලා නැහැ. ඕනෑම මන්ත්‍රීවරයෙකුට සහභාගී වෙන්න පුළුවන්.

**ගරු විකුම් ගුණසේකර**
Hon. Wikum Gunasekara

ඒගොල්ලෝ එන්නේ නැහැ. අපේ යූසුෆ් මන්ත්‍රීතුමා නම් එනවා.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

අපි කොට්ඨාශයේ රැස්වීමක් තිබෙනවා. කොට්ඨාශයේ රැස්වීමට සියලුම මන්ත්‍රීවරුන්ට සහභාගී වෙන්න පුළුවන්. කලාප රැස්වීමක් තිබෙනවා. කලාපයට ඕනෑම කෙනෙකුට සහභාගී වෙන්න පුළුවන්. අමාත්‍යාංශයේ උපදේශක කාරක සභාව තිබෙනවා. උපදේශක කාරක සභාවට ඕනෑම කෙනෙකුට සම්බන්ධ වෙන්න පුළුවන්. ඒ වාගේම මේ උත්සවයටත් සහභාගී වෙන්න ඕනෑම කෙනෙකුට අවස්ථාව ලබා දීලා තිබෙනවා. නමුත් කනගාටුයි කියන්න. මේ රුපියල් පනස් දාහ, නැත්නම් එක් ලක්ෂ පනස් දාහක චෙක් එක ලබා දීම නොවෙයි, මේ උත්සවයේ අරමුණ. උත්සවයේ අරමුණ වුණේ කොට්ඨාශයේ ඉන්න අධ්‍යක්ෂතුමියත් එක්ක මන්ත්‍රීවරු සාකච්ඡා කරලා, විදුහල්පතිවරු ගෙනැල්ලා, පාසල් සංවර්ධන සමිති, ආදි ශිෂ්‍ය සංගමය, දෙමව්පියෝ ගෙනැල්ලා තමුන් වසර තුළ තමුන්ගේ පාසලේ ප්‍රගතිය ලබා ගත්තා නම්, ඒ ප්‍රගතිය අගයන්නත්, ඒ වාගේම ප්‍රගතිය නොලබා තිබෙනවා නම් එය 2014 වර්ෂයේ සංවර්ධන සැලැස්මට ඇතුළත් කරලා, එය ක්‍රියාත්මක කරන්න කියන එක සඳහා තමයි මේ වැඩ සටහන ක්‍රියාත්මක කරන්න පටන් ගත්තේ. ඒ තුළ තමයි මේ මුදල් ටික දුන්නේ.

ඊළඟට මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියගේ මාර්ගයෙන් ගරු ප්‍රධාන අමාත්‍යතුමාගෙන් මම ඉල්ලීමක් කරනවා. මේ වැඩ සටහන ක්‍රියාත්මක කළා වාගේම තව අත්‍යවශ්‍යම කරුණු දෙකක් තිබෙනවා. මේ අමාත්‍යාංශය වෙනුවෙන් පාසල් සඳහා වෙන් කරන්න ඕනෑ වැඩ සටහන් දෙකක්. එකක් තමයි ආපන ශාලා වැඩ සටහන. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමිය මාර්ගයෙන් ගරු ප්‍රධාන අමාත්‍යතුමාගෙන් ඉල්ලනවා. අධ්‍යාපනය හැටියට මේ හැම පාසලකම තිබෙනවා ආපන ශාලාවක්. මේ ආපන ශාලාව මෙපමණ කාලයක් මුදල් හම්බ කළාට, මුදල්වලින් ටෙන්ඩර් කරලා මුදල් ගත්තාට ඒ ලැබෙන මුදල්වත් අඩුම ගණනේ පාසලේ ආපන ශාලා වැඩි දියුණු කිරීමට යෙදවලා නැහැ. ඒක වෙනත් දේවල්වලට තමයි වියදම් කරලා තිබෙන්නේ. ඒ නිසා අපි ඉල්ලීමක් කරනවා. මේ මුදල් ටික ආපන ශාලා වැඩි දියුණු කරනවා වාගේම, හැම පාසලකම ආපන ශාලාවක්, යම්කිසි ක්‍රමවේදයකට, අපේ පාසල අපේ දැතින් සුරකිමු වැඩ සටහන වාගේම මුදල් වෙන් කරලා ආපන ශාලා වැඩි දියුණු කරන්න ක්‍රියා කරන්න ඕනෑ. මොකද, අද අපි සමහර පාසල්වලට ගියාම දකිනවා දරුවන්ට, ගුරුවරුන්ට ආපන ශාලාවල මේසයක් පුටුවක් නැහැ. වතුර ටිකක් නැති ආපන ශාලා තිබෙනවා. මේවා ක්‍රියාත්මක කරලා එක්තරා ක්‍රමවේදයකට හැදුවා නම්, මේ වැඩ සටහන් වාගේ ආපන ශාලාත් ක්‍රියාත්මක කරන්න පුළුවන්.

ඒ වාගේම තමයි ගුණසිරි ජයනාත් ගරු මන්ත්‍රීතුමා ඉල්ලීමක් කළා. ක්‍රීඩා නිලධාරීවරු ක්‍රීඩා අභ්‍යාස ගුරුවරු හැටියට - අපි ගරු ප්‍රධාන අමාත්‍යතුමාගෙන් ඉල්ලීමක් කරනවා. උපාධිධාරීන් හැටියට ගුරු විභාගය ලියුවත් ඒ ගුරු විභාගය පාස් නොවුණු උපාධිධාරීන් කොටසක් ඉන්නවා. අපි දෙමළ මාධ්‍යයට නැති නිසා පත්තරේ දාලා, නිර්නායකයන් හදලා, ඒ ගුරුවරුන් බඳවා ගැනීමේ වැඩ කටයුතු කළා. ඒ වාගේම ක්‍රීඩාවට - ක්‍රීඩා අභ්‍යාස ගුරුවරු හැටියට පත්තරේ දාලා, විභාගය පාස් නොවුණත් ක්‍රීඩා කුසලතා තිබෙන, කැමැත්ත ප්‍රකාශ කරන ගුරුවරුන් හැටියට බඳවා ගෙන, ගුරු පත්වීමක් ලබා දීලා, විද්‍යාපීඨවලට යවලා පුහුණුවීම් කරලා නැවත පාසලට ලබා දෙන්න පුළුවන් නම් අපට මේ ක්‍රීඩා අභ්‍යාසා ගුරුවරුන්ගේ

ප්‍රශ්නයත් විසඳගන්න පුළුවන් කියන එක මේ වෙලාවේ මතක් කරනවා. බොහොම ස්තුතියි.

[අ.භා. 03.43]

**ගරු ඒ.එම්. යූසුෆ්**
Hon. A M Yoosuf

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ඔබතුමියට මම ස්තුතිවන්ත වෙනවා ගරු ප්‍රධාන අමාත්‍යතුමාගේ අමාත්‍යාංශය පිළිබඳව අදහස් කිහිපයක් ඉදිරිපත් කරන්න අවස්ථාව ලබා දීම ගැන. විශේෂයෙන්ම දෙමළ මාධ්‍ය ගුරුවරුන් පිළිබඳව ගරු ප්‍රධාන අමාත්‍යතුමා යම්කිසි පියවරක් ගත්තා. ඒක 100% ක් සාර්ථක නැහැ. ඒ වුණාට 80% ක 90% ක ප්‍රගතියක් අපි ලබා ගෙන තිබෙනවා. විශේෂයෙන්ම මම සඳහන් කරන්න ඕනෑ. මේ ගුරුවරු බඳවා ගැනීමේදී ඉස්ලාම් ධර්මය ඉගැන්වීම පිළිබඳව තවමත් ඒ ප්‍රශ්නය නිරාකරණය වෙලා නැහැ. පසුගිය කාලයේ අපි පෙන්නුම් කරලා දුන්නා. උපාධිධාරී ගුරුවරුන්ගෙන් ඉස්ලාම් ධර්මය ඉගැන්වීම පිළිබඳව විෂය ධාරාව සමත් වෙලා තිබෙනවා නම්, ඒ අය විභාගය සමත් වෙලා තිබෙනවා නම් ඒ අයට ඉස්ලාම් ධර්මය ඉගැන්වීම සඳහා අවශ්‍ය ගුරු පත්වීම් ලබා දෙන්නය කියලා. නැත්නම් විෂය ධාරාවක් හැටියට ඒක වෙනම සඳහන් කරලා මේ පත්වීම් ලබා දෙන්නය කියලා නැවත වරක් මම විශේෂයෙන් මතක් කරන්න ඕනෑ. ඒ වාගේම තවමත් පාසල්වල දෙමළ මාධ්‍ය ගුරුවරුන්ගේ අඩුපාඩුකම් තිබෙනවා. විශේෂයෙන්ම මීනුවන්ගොඩ පවා මතක් කරන්න ඕනෑ. තවමත් ඒ ප්‍රශ්නයට විසඳුමක් නැහැ.

ඒ නිසා ඉදිරි කාලයේදී මම දන්නවා. නැවත වරක් 12 වැනිදා කැඳවලා තිබෙනවා. ඒ වාගේම දෙමළ මාධ්‍ය පාසල් තිබෙනවා. වතුවල තිබෙන. ඒ පාසල්වලටත් අවශ්‍ය ගුරු සංඛ්‍යාවක් අපි අනුයුක්ත කරන්න වෙනවා. මම අර සඳහන් කළා වාගේ ඉස්ලාම් ගුරුවරු උගන්වනවා වාගේම හින්දු ආගම පිළිබඳව ඒ බඳවා ගැනීමේදී විශේෂයෙන්ම ඒ විෂය ධාරා පිළිබඳව සමත් වෙලා තිබෙන උදවියට එවැනි පත්වීමක් ලබා දෙන්න අපට හැකියාවක් තිබෙනවා. ඒ පත්වීම පිළිබඳවත් ඔබතුමාගේ අවධානය යොමු කරන්නට ඕනෑ. ඒ වාගේම දෙමළ මාධ්‍ය විදුහල්වල විශ්‍රාම යන විදුහල්පතිවරු වෙනුවෙන් අද අපට විදුහල්පතිවරු හිඟයත් ලොකු ගැටළුවක් බවට පත් වෙලා තිබෙනවා. විශේෂයෙන්ම ගරු ප්‍රධාන අමාත්‍යතුමාගේ අවධානය ඒ පිළිබඳව මම යොමු කරනවා. ඒ වාගේම අපි මොන තරම් ප්‍රගතියක් ලබා ගත්තත්, මතක් කරන්න ඕනෑ, විශේෂයෙන්ම දෙමළ මාධ්‍ය උගන්වන පාසල්වල අඩුපාඩුකම් තිබෙනවා. භෞතික සම්පත් පිළිබඳව අඩුපාඩුකම් තිබෙනවා. ඒ නිසා විශේෂයෙන්ම ඒ පිළිබඳව අවධානය යොමු කරන්න.

ඒ වාගේම මට අද ලිපි දෙකක් පාසල් දෙකකින් ඉදිරිපත් වෙලා තිබෙනවා. එකක් තමයි, තොටවත්ත අල් ෆහ්රියා මධ්‍ය මහා විද්‍යාලය. අනික ජීලාන් මහා විද්‍යාලය. විශේෂයෙන්ම මතක් කරන්න ඕනෑ, ජීලාන් මහා විද්‍යාලයේ පුස්තකාලයේ අඩුපාඩුකම් සම්බන්ධව ගරු ප්‍රධාන අමාත්‍යතුමාගේ අවධානය මම යොමු කරන්න කැමැතියි. විශේෂයෙන්ම පුස්තකාල සහායකවරයෙක්, අවශ්‍ය පොත්පත්, ඒ වාගේම ගුරු මේස පුටු සම්බන්ධව ඒ අයගේ ඉල්ලීමක් තිබෙනවා. ඒ වාගේම අල් ෆහ්රියා විද්‍යාලයේත් පුස්තකාල ගොඩනැගිල්ල අලුත් වැඩියා කිරීම සම්බන්ධව. ඒ අය ලිපි ඉදිරිපත් කර තිබෙනවා. විශේෂයෙන්ම ඔබතුමාගේ අවධානය මම යොමු කරනවා. මේ අවුරුද්දේ නැත්නම් ඉදිරි කාලයේදී මේ සම්බන්ධව ප්‍රමුඛතාවය දීලා කටයුතු කරන්නය කියලා ඉල්ලා සිටිනවා.

ඒ වාගේම පළමු වසරට ළමුන් ඇතුළත් කිරීම පිළිබඳව. පළමු වැනි වසරට ළමයින් ඇතුළත් කිරීම පිළිබඳව මේ අවුරුද්දේ තිබුණේ පන්තියකට 35 ක්. ලබන වසරේ 32 ක් කියලා ආරංචියක් තිබෙනවා. මේ පිළිබඳව ඔබතුමාගේ අවධානය යොමු කරනවා. මේක ලොකු ගැටළුවක් වෙනවා. විශේෂයෙන්ම බේරුවල කලාපය තුළ තිබෙන මුස්ලිම් පාසල් - මාගොඩ, මාළිගාහේන, මරදාන යන ප්‍රදේශය තුළ පන්ති කාමර වැඩි කරන්න සිද්ධ වෙනවා. ඒ ළඟ ළඟ පාසල් නැති නිසා. ඒ පාසල් තුනටම අතිරේක පන්තියක් ලබා දෙන්න කටයුතු කරන්නය කියන ඉල්ලීම මම විශේෂයෙන්ම මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමිය මාර්ගයෙන් මතක් කරන්න ඕනෑ.

ඒ වාගේම මේ පාසල්වල පළමු වන වසර පිළිබඳව ගැටළු මතු වෙලා තිබෙන්නේ ජාත්‍යන්තර පාසල් - පාසල්වලට ළමයින් ඇතුළත් කරන්න බැරි වුණාම ඒ දෙමව්පියෝ බලන්නේ කොහේ හරි ඉස්කෝලයකට ඒ ළමයින් යවන්න ඕනෑ. ඒ නිසා තමයි ජාත්‍යන්තර පාසල් විශාල සංඛ්‍යාවක් දැන් බිහි වෙලා තිබෙන්නේ. එහෙම නම් මේකට අපි පහේ ශිෂ්‍යත්වය පිළිබඳවත්, උසස් ප්‍රතිඵල පිළිබඳවත් අපි උදම් අනනවා, ඉතා ආඩම්බරයෙන් කථා කරනවා. ඒ තත්ත්වයට අද විශේෂයෙන්ම අපිව තල්ලු වෙලා තිබෙනවා. අපේ

[ගරු ඒ.එම්. යූසුෆ් ]

පළාත් සභාව නැත්නම් ජාතික රජය වග කියන්න ඕනෑ මේ දරුවෝ පිළිබඳව ගන්නා වූ තීරණ සම්බන්ධයෙන්. පහේ ශිෂ්‍යත්වය නම් මමත් කැමැති නැති විභාගයක්. දෙමව්පියන්ට වද දෙන විභාගයක් පහේ ශිෂ්‍යත්වය. ඒ වාගේම දරුවන්ට දුක දෙන පහේ ශිෂ්‍යත්වයක්. ළමයි කිහිප දෙනයි සමත් වෙන්නේ. ඉතිරි දහස් ගණන්, ලක්ෂ ගණන් ළමයින් ඉතාමත් කනගාටුවෙන් අඬ අඬා ඉන්න කාලයක් තිබෙනවා. අර ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරයෙක් සඳහන් කළා වාගේ ඔවුන්ගේ මානසික මට්ටම පස්සට තල්ලු වෙනවා. විශේෂයෙන්ම පළාත් සභාවක් හැටියට අපි මේ පහේ ශිෂ්‍යත්ව ක්‍රමය අහෝසි කරලා, වෙනත් විකල්පයකට යන්න පුළුවන් නම් ගරු ප්‍රධාන අමාත්‍යතුමනි, අපි ඒ පිළිබඳව අවධානය යොමු කරන්න වෙනවා. එක දවසකට ළමයි කිහිප දෙනයි පාස් වෙන්නේ. අනික් ළමයි ඔක්කෝම අපි කුඩා කාලයේ ඉඳලාම, අම්මලා අවුරුදු තුනේ ඉඳලාම පහේ ශිෂ්‍යත්වයට ළමයින්ව සූදානම් කරනවා. අවසානයේ ප්‍රතිඵල ආවාට පස්සේ ඒ ළමයින්ට අඬ අඬා ඉන්න සිද්ධ වෙලා තිබෙනවා. මේක අද සමාජයේ ලොකු ගැටළුවක් වෙලා තිබෙනවා. ලොකු සංවාදයක් ඇති වෙලා තිබෙනවා.

ඒ නිසා විශේෂයෙන්ම ඒ කරච්චලයේ යෙදෙන පහේ ශිෂ්‍යත්වය පිළිබඳව ඔබතුමාගේ අවධානය යොමු කරන ගමන්ම ඉල්ලා සිටිනවා, පහේ ශිෂ්‍යත්වයේදී අපි කොතරම් කථා කළත්, පහේ ශිෂ්‍යත්වය සඳහා හැම දරුවෙක්ම බාහිර පන්තිවලට යනවා. තුනේ වසරේ ඉඳලා උපකාරක පන්තිවලට යනවා. මේ මන්ත්‍රීවරුන්ගේ දූ දරුවෝ යනවා. ඒ වාගේම රජයේ නිලධාරීන් මෙතැන වාඩි වෙලා ඉන්නවා. හැමෝගේම බැලුවොත් අපි පහේ ශිෂ්‍යත්වයට දරුවා පන්ති ගෙනියන්න ඕනෑ. ඒ මාතෘකාවේ ඉන්නේ. එහෙම නම් මේක තනිකර එක කණ්ඩායමක් නොවෙයි, පොදුවේ ඒ අධ්‍යාපන ප්‍රතිඵලයේදී බාහිර අංශයේ හැකියාව නිසා බොහෝ දුරට උසස් මට්ටමට ඇවිල්ලා තිබෙනවා. ඒ ළමයින්ගෙන් කොයි පන්තියටද පුතේ ගියේ කියලා ඇහුවොත් අර සර්ගේ පන්තියට ගියා. මේ සර්ගේ පන්තියට ගියා කියලා ඒ දරුවෝ කියනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අධ්‍යාපනය පිළිබඳව ගරු ප්‍රධාන අමාත්‍යතුමා කරන වැඩ පිළිවෙළ, විශේෂයෙන් පාසල්වල විනය පිළිබඳව මට යොමු කරන්න වෙනවා. පසුගිය කාල පරිච්ඡේදයේදී පාසල් කිහිපයකම දරුවන්ගේ එහෙම නැත්නම් ගුරුවරුන්ගේ එහෙම නැත්නම් වෙනත් ප්‍රශ්න ඇති වී තිබෙනවා. විනය පිළිබඳව, අපචාර පිළිබඳව පාසල්වල වාර්තා වෙනවා. මේ පිළිබඳව අපි මොන තරම් කථා කළත්, අපි ඒ තත්ත්වයට ගියා නම් පාසල් අධ්‍යාපනයේ ඉතා කඩා වැටීමක් සිද්ධ වන බව මම මතක් කරන්න ඕනෑ.

ඒ වාගේම පළාත් පාලන ආයතන පිළිබඳව මේ සභාවේ කථා කළා. අද පළාත් පාලන ආයතනවල තිබෙන්නේ හිතුවක්කාර පාලනයන්. හිතුවක්කාර පාලනයන් නිසා තමයි අද අර ගරු මන්ත්‍රීතුමා සඳහන් කළා වාගේම සභාපතිතුමා පන්නන්න ආණ්ඩු පක්ෂයේ උදවිය අනික් පැත්තට ඡන්දය දෙන්නේ. ඒකයි තිබෙන ප්‍රශ්නය. සභාපතිතුමා ඒකාධිකාරී වෙනවා. අනික් මන්ත්‍රීවරු ඒකට විරුද්ධව කටයුතු කරනවා. අද අභ්‍යන්තර අර්බුදය මතු වෙලා තිබෙනවා. සීතල යුද්ධයක් අද මේ තුළ පවතින බව මතක් කරන්න ඕනෑ.

විශේෂයෙන්ම ගරු ප්‍රධාන අමාත්‍යතුමාගේ අවධානය මම යොමු කරනවා. කළුතර දිස්ත්‍රික්කයේ පළාත් පාලන ආයතන කිහිපයකත් අද උසාවි ප්‍රශ්න මතු වෙලා තිබෙනවා. ඒ අයගේ අල්ලස් සම්බන්ධව. එහෙම නැත්නම් වෙනත් කටයුතු සම්බන්ධව. ඒ පිළිබඳව පළාත් පාලන විෂය භාර අමාත්‍යවරයෙක් හැටියට මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමිය මාර්ගයෙන් ගරු මහ ඇමතිතුමාගේ අවධානය මම යොමු කරනවා. මෙන්න මේ පළාත් පාලන ආයතන කර ගෙන යන මේ වැඩ පිළිවෙළ - අඩු තරමින් බස්නාහිර පළාත් සභාවටවත් වගකීමක් නැහැ. බස්නාහිර පළාත් සභාවට කිසිම පියවරක් ගන්න ක්‍රමයක් නැති නිසා මේ පළාත් පාලන ආයතන ප්‍රතිසංවිධානය සඳහා, එහෙම නැත්තම් මේ නීතිමය තත්ත්වය පිළිබඳව ගරු ප්‍රධාන අමාත්‍යතුමාගේ අවධානය මම යොමු කරනවා. කාලය ලබා දීම පිළිබඳව මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියට ස්තූතිවන්ත වෙමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තූතියි.

**ගරු කීර්ති කාරියවසම්**
Hon. Keerthi Kariyawasam

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මට 36(1) යටතේ වරප්‍රසාද ප්‍රශ්නයක් මතු කරන්න අවස්ථාව ඉල්ලා සිටිනවා. මම ඊයේ දවසේ ඒ කියන්නේ 03 වැනිදා ගරු ප්‍රධාන අමාත්‍යතුමාගේ සුපසන් නිම්තෙර වැඩ සටහන යටතේ පාසල්වල ඒ කටයුතු වෙනුවෙන් තිබුණු උත්සවයක් සඳහා

සහභාගී වුණා. මතුගම අධ්‍යාපන කලාපයේ බෙල්ලන මහා විද්‍යාලයට. මේ බෙල්ලන මහා විද්‍යාලයේ ඒ උත්සවයට ගිය අවස්ථාවේ, මමත් ඉන්න අවස්ථාවේ අපේ නියෝජ්‍ය සභාපතිතුමා ඒ කොට්ඨාශ භාර අධ්‍යක්ෂකතුමිය, ගුරු උපදේශකතුමිය, විදුහල්පතිතුමිය සහ ගුරු මණ්ඩලය, ඊට අමතරව 200 ක් පමණ දෙමව්පියන් විශාල පිරිසක් රැස්ව හිටපු අවස්ථාවක්. ශබ්ද විකාශන යන්ත්‍ර යොදලා තමයි එතැන ඒ උත්සවය පවත්වන්නට යෙදුණේ. ඒ උත්සවයේ මූලාසනය ගෙන කටයුතු කරපු විදුහල්පතිතුමිය රැස්වීම ආරම්භයේදීම මාව ඉතාමත් අශෝභන අන්දමට, ඉතාමත් අපහාසාත්මක වන විධියට තදබල විවේචනයකට ලක් කළා. මම පුද්ගලික රැස්වීමකටවත්, පුද්ගලික කටයුත්තකටවත් නොවෙයි ගියේ. නිල වශයෙන් සංවිධානය කළ උත්සවයකට, නිල වශයෙන් ලැබුණු ආරාධනයක් මත. කලාපය සංවිධානය කළ උත්සවයකටයි සහභාගී වුණේ. ඒ උත්සවයේදී එවැනි රජයේ නිලධාරිනියක් හැටියට, විදුහල්පතිනියක් හැටියට ඇය ඉතාමත් අශෝබන ආකාරයට හැසිරෙමින් මට අපහාස වන අන්දමට කටයුතු කරලා මගේ වරප්‍රසාද කඩ වීමක් ඒ අවස්ථාවේ සිදු කරපු බව කියන්න ඕනෑ.

විශේෂයෙන්ම ඒ සඳහා ඇය පාදක කර ගත්තේ මීට කලකට පෙර මෙම පාසල පිළිබඳව චෝදනා තිබෙනවා. ළමයින්ගෙන් මුදල් අය කර ගන්නවාය කියලා. එවැනි සිද්ධියක් පිළිබඳව එක දෙමව්පියන් පිරිසක් මට ඉදිරිපත් කරපු පැමිණිල්ලක් මම පළාත් අධ්‍යාපන ලේකම්තුමාට ඉදිරිපත් කරලා, උපදේශක කාරක සභාවේත් මේ පිළිබඳව සාකච්ඡා කිරීමෙන් අනතුරුව පළාත් සභාවේ විමර්ශන කණ්ඩායමක් ගිහිල්ලා, ඒ පිළිබඳව විමර්ශනයක් කරලා එතැන මූල්‍ය අක්‍රමිකතා සිද්ධ වෙලා තිබෙනවාය කියන එක පැහැදිලි වෙලා, මා දන්නා තරමට අපේ අමාත්‍යාංශයේ ලේකම්තුමිය ඇයට අවවාදාත්මක ලිපියකුත් නිකුත් කරලා තිබෙනවා. මෙවැනි දෙයක් මම පළාත් සභාවට ඉදිරිපත් කිරීමෙන් ඇයව අපහසුතාවයට පත් කළාය කියලා ඉතාමත්ම තදබල විධියට මෙම විවේචනය, අපහාසාත්මක විධියට කථා කරන්න හේතුව වශයෙන් ඇය සඳහන් කළේ. මට පුළුවන්කමක් තිබුණේ නැහැ - වෙනත් තැන්වලදී නම් අපි දැකලා තිබෙනවා. මන්ත්‍රීවරු ගියා නම්, මෙවැනි අවස්ථාවකදී මීට වැඩිය බරපතළ තත්ත්වයක් ඇති වෙන්න ඉඩ තියනවා. නමුත් මම ඉතාමත්ම ඉවසීමෙන් යුතුව ඒ කියන දේ අහගෙන ඉඳලා ඒකට පිළිතුරක් දුන්නා. නමුත් පිළිතුරටත් නැවත උත්තරයක් දීලා අපහාස වන විධියට කථා කරපු අවස්ථාවේ කොට්ඨාශ අධ්‍යක්ෂකතුමිය ඒක නවත්වන්න යෙදුණා. ඒ නිසා මම ඉල්ලා සිටිනවා. මේ පිළිබඳව ගරු ප්‍රධාන අමාත්‍යතුමා මාර්ගයෙන් පරීක්ෂණයක් කරලා, මේ පිළිබඳව සාධාරණත්වයක් ඉෂ්ට කරන්න කටයුතු කරන්නය කියලා. මේ සම්බන්ධයෙන් අද දින මම බස්නාහිර පළාත් අධ්‍යාපන ලේකම්තුමාට ලිඛිතව පැමිණිල්ලක් කළා. මේ පිළිබඳව වැඩි දුරටත් පරීක්ෂා කිරීම සඳහා මම ඒ ලිපිය සභාගත කරනවා.[2]

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමිය**
Hon. Presiding Member

මහ ඇමතිතුමා ඒ පිළිබඳව ක්‍රියා කරාවි. මීළඟට මහේෂ් අල්මේදා ගරු මන්ත්‍රීතුමාට අවස්ථාව.

[අ.භා. 03.55]

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ඔබතුමියට ස්තුතිවන්ත වෙනවා අපේ පළාත් සභා වැය විෂයයන්වල ඉතාම වැදගත් අමාත්‍යාංශයක් වන අධ්‍යාපන, පළාත් පාලන, විදුලිබල හා බල ශක්ති, ඉඩම් හා මිනිස් බල හා රකී රක්ෂා අමාත්‍යාංශය පිළිබඳව වචන කිහිපයක් කථා කිරීමට මේ අවස්ථාව සලසා දීම ගැන. ඒ වාගේම ගරු ප්‍රධාන අමාත්‍යතුමාගේ වැය ශීර්ෂය විධියටත් අපි ඉතාම සතුටු වෙනවා, මේ පළාත් සභාවේ වැඩියෙන්ම මුදල් වියදම් කරන, වැඩිම අවධානය යොමු වුණු, වැඩිම සංවර්ධන කාර්යයන් ඉෂ්ට කරන, වැඩිම ප්‍රයෝජනය තිබෙන අමාත්‍යාංශය විධියට මේ අමාත්‍යාංශය පිළිබඳව වචන කිහිපයක් කථා කරන්න අවස්ථාව ලබා දීම ගැන.

විශේෂයෙන්ම පස්වන පළාත් සභාවේ අවසන් අයවැයට තමයි අපි මුහුණ දෙන්නේ. අපි දන්නවා, මේ අයවැය විවාදයෙන් පස්සේ පළාත් සභාව විසුරුවලා, නැවත හය වන පළාත් සභාව පිහිටවනු ලබනවා. ඒ පිහිටුවන හය වන පළාත් සභාවේත් නියත වශයෙන්ම ප්‍රධාන අමාත්‍යවරයා වෙලා, ඒ වාගේම මේ පළාත් සභාවේ අධ්‍යාපන ඇමතිවරයාත් වන ප්‍රසන්න රණතුංග මැතිතුමාට මම හිතන්නේ හොඳම කියලා විතරක් මදි. යම් අඩුපාඩුවක්, යමක් මතක් කළොත් එහෙම මම හිතන්නේ ඊළඟ පළාත් සභාවේ අලුතින් යමක් කරන්න පුළුවන් වෙයි කියන විශ්වාසය ඇතිව තමයි මම මේ කථාව කරන්නේ.

[2] සභා ලේකම් කාර්යාලයේ තබා ඇත.

[ගරු මහේෂ් අල්මේදා ]

විශේෂයෙන්ම අපේ මේ ගරු ප්‍රධාන අමාත්‍යතුමාගේ අමාත්‍යාංශය යටතේ තිබෙන ප්‍රධානම විෂය හැටියට තිබෙන්නේ අධ්‍යාපන විෂය. අද අපි දන්නවා, විශේෂයෙන්ම අසීමිත කැප වීම මත විශාල සංවර්ධනයක් ලබලා, පළාතේ දරුවන්ට තමන්ට අවශ්‍ය කරන නිදහස් අධ්‍යාපනය රිසි සේ ලබා ගන්න පුළුවන් පරිසරය නිර්මාණය වෙලා තිබෙනවා කියලා. ඒ නමුත් අපි දන්නවා, අධ්‍යාපනයේ යම් යම් සුළු අඩුපාඩු කිහිපයක් තිබෙනවා. අපි ඒ අඩුපාඩු එකක් දෙකක් මතක් කරන්න කැමැතියි. විශේෂයෙන්ම අපි මතක් කරන්න ඕනෑ කාරණය තමයි. අධ්‍යාපනය කියන්නේ, වරප්‍රසාදයක් නොවෙයි. ඒක අයිතියක්. අධ්‍යාපනය වරප්‍රසාදයක් කියලා විශ්වාස කළොත් වරප්රසාද ලත් පන්තියට විතරක් අධ්‍යාපනය දීලා, වරප්‍රසාද ඉල්ලා සිටින අයට විතරක් අධ්‍යාපනය දීලා, අනෙක් අයට අධ්‍යාපනය නොදී අධ්‍යාපනයේ පන්ති පරතරයක් නිර්මාණය වෙන්න පුළුවන්කම තිබෙනවා. ඉතිහාසයේ එහෙම පන්ති පරතරයක් නිර්මාණය වුණා. අවසානයේ ඒවා මහා සමාජ බේදවාචක විධියට තමයි මේ සමාජය මත දිග ඇරුණේ. ඒ නිසා මේවා අවම කිරීම සඳහා අධ්‍යාපනයේ සැලසුම් නිර්මාණය කළ යුතුයි කියන කාරණය තමයි අපි මතක් කරන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අපේ සංඛ්‍යා ලේඛනවල කියන විධියට පාසල් ගත වීම කියන එක 96.8% යි බස්නාහිර පළාතේ සිද්ධ වෙලා තිබෙන්නේ. ඒකෙන් පැහැදිලි වෙන්නේ, 3.2% ක් අදත් පාසල් යන්නේ නැහැයි කියන කාරණය. මේකේදී මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මම මතක් කරන්න යන්නේ, පාසල්වලට ඇතුළත් කිරීමේදී මතු වන ප්‍රශ්නය ගැන මේ සභාවේ බොහෝ මන්ත්‍රීවරු කථා කරද්දී, මේ ප්‍රශ්නය මතක් කළා. අපි දන්නවා, ප්‍රධාන අමාත්‍යතුමා එතුමාගේ පෞද්ගලික අවධානය යොමු කරලා සුවිශේෂ වැඩ සටහන් නිර්මාණය කරලා, හැම දරුවෙකුම පාසල්ගත කරන්න අවශ්‍ය පහසුකම සලසලා දීලා තිබෙනවා. නමුත් අධ්‍යාපන සැලසුම්වල තිබෙන යම් අඩුපාඩු නිසා මේ තත්ත්වය තවමත් නිසි ලෙස සිද්ධ වෙන්නේ නැහැයි කියන කාරණය තමයි අපට මතක් කරන්න ඕනෑ.

අපි දන්නවා, බස්නාහිර පළාතේත් පළාත් අධ්‍යාපන අමාත්‍යාංශයට සැලසුම් අංශයක් තිබෙනවා. පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවට සැලසුම් අංශයක් තිබෙනවා. කලාප අධ්‍යාපන කාර්යාල ඇතුළේ සැලසුම් අංශ තිබෙනවා. නමුත් මේ සැලසුම් අංශ කරන කාර්යභාරය මොකක්ද කියන එක ගැන ප්‍රශ්නයක් තිබෙනවා කියන කාරණය තමයි මම මතක් කරන්නේ. මේකට උදාහරණයක් විධියට මම මතක් කරන්නේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ඔබතුමිය දන්නවා. හැම අවුරුද්දේම අගෝස්තු මාසය වන කොට එක වසරට දරුවන් ඇතුළත් කර ගන්න අවශ්‍ය අයදුම් පත්‍ර ටික පාසල්වලට වැටෙනවා. හැබැයි, කවදාවත් කලාප අධ්‍යාපන කාර්යාල මේ අයදුම්පත්‍ර සමාලෝචනය කිරීම සැලසුම් අංශය ලවා කරවන්නේ නැහැ. මේක බරපතළ අඩුපාඩුවක්. බරපතළ ප්‍රශ්නයක්. හැමදාම දරුවෝ ඇතුළත් කරන්න ගියාට පස්සේ අවසාන දින කිහිපයේ මේ කාරණය නිසා ලොකු ප්‍රශ්නයක් මතු වෙනවා. ඒ නිසාම බොහෝ අය ලිංගිකව ප්‍රශ්නවලට මැදි වෙනවා. මුදල් අල්ලස්වලට අහු වෙනවා. විදුහල්පතිවරුන්ට රස්සාව නැතිව යනවා. ගුරුවරුන්ට ප්‍රශ්න මතු වෙනවා. දෙමව්පියන්ට මහා පීඩාකාරී ප්‍රශ්නවලට මුහුණ දෙන්න වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අපට පුළුවන්කම තිබෙනවා හැම අවුරුද්දකම පාසල්වලට ගම්වලින් ඇතුළත් වෙන්න ඉන්න දරුවෝ සංඛ්‍යාව කොපමණද කියලා සංගණනයක් කරන්න, ගම ඇතුළේ ඉන්න මීට වගකිවයුතු නිලධාරීන් සම්බන්ධ කර ගෙන. හැබැයි, කලාප කාර්යාලවල සැලසුම් අංශය මේ කාර්යය කරන්නේ නැහැ. ජනගහනය කොයිතරම් වැඩි වෙලාද, ව්‍යාප්ත වෙලාද කියන කාරණය විග්‍රහ කරන්නේ නැහැ. අපි දන්නවා, අද ගෝලීය සංවර්ධන ආර්ථිකයක් ලෝකයේ තිබෙනවා. මේ ගෝලීය සංවර්ධනය නිසා සමහර තැන්වලට වැඩියෙන් වරප්‍රසාද ලැබෙනවා. සමහර තැන් සංවර්ධනය වෙනවා. මේ සංවර්ධනයත් එක්ක අපට කියන්න පුළුවන්කමක් නැහැ දරුවන්ට, දරුවෝ ඉන්න තැනම ඉඳලා පාසල්වල ඉගෙන ගන්න කියලා. දරුවෝ වෙනත් සමහර ජනප්‍රිය තැන්වලට යනවා. පහසුකම් තිබෙන තැන්වලට යනවා. අපි පහසුකම් කොයිතරම් සමනය කරන්න හැදුවත්, ඒවා අසමාන විධියට බෙදෙන අවස්ථාවන් ඕනෑ තරම් තිබෙනවා. ඒ නිසා මේ දරුවෝ ඇතුළත් කිරීමේදී මතුවන ගැටලුව විසඳන්න අවශ්‍ය සැලසුම් නිර්මාණය කිරීම මම හිතන්නේ, පළාත් සභාව මැදිහත් වෙලා සිද්ධ කරන්න ඕනෑ. ඒ පිළිබඳව ගරු ප්‍රධාන ඇමැතිතුමාගේ අවධානය යොමු කරයි කියන විශ්වාසය අපට තිබෙනවා.

ඒ වාගේම තමයි දරුවන් ඇතුළත් කරන්න පාවිච්චි කරන චක්‍රලේඛය. මේ චක්‍රලේඛය ගමක ඉන්න අහිංසක මිනිහෙකුට පුරවා ඉදිරිපත් කරන්න බැරි චක්‍රලේඛනයක්. වරප්‍රසාද හිමි පන්තිය තමයි මේ චක්‍රලේඛය නිර්මාණය කෙරුවේ. කවදාවත් මේ චක්‍රලේඛය නිර්මාණය කරන්න අධ්‍යාපනඥයින්ගෙන් උදව්ව ලබා ගත්තේ නැහැ. ඒ නිසා අපි අධිකරණයට යා යුතුව තිබෙනවා, මේ චක්‍රලේඛය වෙනස් කරන්න. මෙහි ඉල්ලා සිටින සමහර සහතික අහිංසක ගැමියෙකුට දෙන්න පුළුවන්කමක් නැහැ. ඔවුන් මේ අයදුම්පත පුරවා ගන්නත් මුදල් වියදම් කරනවා. සමහර නිලධාරීන් හමුවෙලා, සමහර ගම්වල ඉන්න ප්‍රභූවරුන් හමුවෙලා, සමහරවිට සල්ලි දීලා, රස්තියාදු වෙලා තමයි මේ අයදුම්පත පුරවන්නේ. ඒකත් නිවැරැදිව පුරවාගන්න පුළුවන්කමක් නැහැ. ඒ නිසා අයදුම්පත් ප්‍රතික්ෂේප වෙනවා. අයදුම්පත්වල අඩුපාඩු නිසා ඒ අය අයින් කරනවා. සමහර ඉල්ලා සිටින තොරතුරු ඉදිරිපත් කරන්න බැරිකම නිසා දරුවන්ව පාසල්වලට තෝරාගන්න බැරිව යනවා. ඒ නිසා මෙය බරපතළ අසාධාරණයක් සිද්ධ වන තැනක්. ඒ නිසා පාසල්වලට දරුවන් ඇතුළත් කිරීමේදී සැලසුම් සහගත ක්‍රමවේදයක් හදන එක වාගේම පාසල්වලට දරුවන් ඇතුළත් කිරීමේ චක්‍රලේඛයේ වෙනස්කම් කරන්න අපි හෙට දවසේ ක්‍රියා කෙරුවේ නැත්නම් බරපතළ අනතුරකට මේ රටේ ඉඩ තිබෙන්න පුළුවන්කමක් තිබෙනවා. ඊළඟ කැරැල්ල පාසල් දරුවන් ඇතුළත් කිරීම සම්බන්ධයෙන් මේ රටේ ඇති වෙන්න ඉඩ තිබෙනවා, මේ කාරණය ගැන අවධානය යොමු කරලා කටයුතු කෙරුවේ නැත්නම්. ඒ කාරණය ඔබතුමියට මතක් කරනවා.

ඒ වාගේම ගරු ප්‍රධාන ඇමැතිතුමාට ප්‍රශංසා හිමි කරන්න මතක් කන්න ඕනෑ. අපේ ආසනය, අපි ජීවත්වන මැතිවරණ බල ප්‍රදේශය විශාල කුල අසාධරණයක් තිබුණු මැතිවරණ බල ප්‍රදේශයක්. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ඔබතුමිය දන්නවා. කුසුමා ගුණවර්ධන මැතිනිය රාජ්‍ය මන්ත්‍රණ සභාව නියෝජනය කරන කාලයේ එවකට තිබුණු කුල අසාධාරණකම් නිසාම පාසල් පද්ධතිය සංවර්ධනය කරන්න කටයුතු කෙරුවා. සමහර පාසල්වලට වරප්රසාද තිබෙන පන්තියේ ඉන්න අය දරුවෝ ගන්න විරුද්ධ වුණාම, ඇය ගිහිල්ලා ඒ පාසල් ගිණි තියලා දාලා මේ අසාධාරණයට ලක් වුණු පාසල් දරුවෝ වෙනුවෙන් වෙනම පාසල් පද්ධතියක් ඇති කරන්න කටයුතු කෙරුවා. ඒ නිසා පාසල් පද්ධතිය අපේ මැතිවරණ බල ප්‍රදේශවල විශාල වෙලා තිබෙනවා. නමුත් අද වර්තමානයේ මේ තිබෙන සංස්කෘතික කාරණා ගැන අලුත් සමාජය කථා කරන්නේ නැති නිසා මේ පාසල් පද්ධතිය වැසී යාමේ තර්ජනයට ලක් වුණා. නමුත් අපි ඉතාම සතුටින් කියන්න ඕනෑ. ගරු ප්‍රධාන ඇමැතිතුමා මේ වැසී යාමේ තර්ජනයට ලක් වෙලා තිබුණු පාසල් වැසී යන්නට ඉඩ නොදී ඒවා සංවර්ධනය කරන්නට අවශ්‍ය විද්‍යාත්මකව ගවේෂණයන් කරමින් ඒ තත්ත්වයන් නැති කරන්න කටයුතු කරලා තිබෙනවා. විශේෂයෙන්ම බස්නාහිර පළාතේ 2012 වන විට 50 ට අඩු පාසල් 91 ක් තිබුණා. අද වන විට එයින් පාසල් 13 ක් 50 ට වැඩි පාසල් බවට පත් කරන්න කටයුතු කරලා තිබෙනවා. මේක අපි අර කලින් කිව්ව කාරණයත් එක්ක සම්බන්ධ වන කාරණයක්. ඉතාම අහිංසක දරුවන් ජීවත් වන ප්‍රදේශවල, ගැමියන් ජීවත්වන ප්‍රදේශවල දරුවන්ගේ අධ්‍යාපන අයිතිය නැති වෙන්න එනකොට ඒ අයිතිය තහවුරු වුණු තැනක් හැටියට මේ කාරණය මම මතක් කරන්න ඕනෑ. ඒ නිසා ඒ ගත්ත ක්‍රියාමාර්ගය පිළිබඳව විශේෂයෙන්ම අපි සතුටු වෙනවා. පරිගණක විද්‍යාගාර 36 ක් මේ පාසල් ඇතුළත හදලා තිබෙනවා. ගුරු ශිෂ්‍ය අනුපාතයට මානව සම්පත සංවර්ධනය කරන්නේ නැතිව, දරුවන් හත් දෙනෙක් ඉන්න තැනට ගුරුවරු 06 දෙනෙක් සහ විදුහල්පතිවරයෙක් දීලා මානව සම්පත සංවර්ධනය කරන්න කටයුතු කරලා තිබෙනවා. ඔළුගෙඩි සංඛ්‍යාවට නැතිව පන්තිවලට ගුරුවරු දෙන්න ගරු මහ ඇමැතිතුමා කටයුතු කරලා තිබෙනවා. ඒ නිසා අපි කලින් කිව්ව දරුවන්ගේ අධ්‍යාපන අයිතිය තහවුරු වෙලා අද ඒ පාසල් සංවර්ධනය වෙලා තිබෙනවා. මේක ඉතාම වැදගත් කාරණයක්. ග්‍රාමීය ප්‍රදේශවල යම් ප්‍රචණ්ඩත්වයක්, යම් ව්‍යාකූලත්වයක් නිර්මාණය වෙන්න තිබුණ ඉඩකඩ මේ හරහා වැහිලා තිබෙනවා වාගේම අහිංසක දරුවන්ට අවස්ථාවක් ලැබිලා තිබෙනවා, නිදහස් අධ්‍යාපනයේ වරප්‍රසාද භුක්ති විඳින්න. ඒ නිසා මේ කාරණය ගැන අපි විශේෂයෙන්ම ස්තූතිවන්ත වෙනවා.

ඒ එක්කම මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි,මම කැමැතියි තව එක කාරණාවක් මතක් කරන්න. අධ්‍යාපනය සම්බන්ධයෙන් නොවෙයි. පළාතේ පළාත් පාලන ආයතන මුහුණ දෙන ප්‍රධාන ගැටලුවක් පිළිබඳව. අද අපේ පළාත් පාලන ආයතනවලට තිබෙන ප්‍රධාන ගැටලුවක් තමයි කසළ කළමනාකරණය පිළිබඳව තිබෙන ප්‍රශ්නය. තමන්ගේ ප්‍රදේශයේ එකතුවන කැළි කසළ විධිමත්ව අපහරණය කරන්න ක්‍රමයක් නැතිව බරපතළ ගැටලුවකට මුහුණ දීලා තිබෙනවා. මේකට විසඳුමක් හැටියට බස්නාහිර පළාත්

[ගරු මහේෂ් අල්මේදා ]

සභාව අපද්‍රව්‍ය කළමනාකරණ අධිකාරිය පිහිටුවලා තිබෙනවා. අපි කියනවා, ගරු ප්‍රධාන ඇමැතිතුමා කොයිතරම් උත්සාහ කළත් මේ අපද්‍රව්‍ය කළමනාකරණ අධිකාරිය අද තමන්ගේ උවමනාවෙන් බැහැරව තමයි කටයුතු කරන්නේ. අපද්‍රව්‍ය කළමනාකරණ අධිකාරි ප්‍රඥප්තිය වහ වහාම සංශෝධය කළ යුතුව තිබෙනවා. මේක ඇතුළේ නිර්මාණය වෙලා තිබෙන ප්‍රධාන තනතුර ආරක්ෂා වන විධියට තමයි ඒ තනතුර අහෝසි කරන්න බැරි විධියට, මොන දූෂණය කළත්, මොන වංචාව කළත් මේ තනතුර රැකෙන විධියට තමයි මේ පනතේ බලතල සංශෝධනය වෙලා තිබෙන්නේ.

ඒ නිසා ඒ වගන්තිය අහෝසි කළ යුතුව තිබෙනවා. ඉතාම දූෂිත අධ්‍යක්ෂකවරයෙක් මේක ඇතුළේ ඉන්නවා. මේ අධ්‍යක්ෂකවරයාව එළියට දැම්මේ නැත්නම් අපද්‍රව්‍ය කළමනාකරණය පළාත තුළ සිද්ධ කරන්න පුළුවන්කමක් නැහැ. ඔහුව එළියට විසි කරලා දැම්මේ නැත්නම් මේ අපද්‍රව්‍ය කළමනාකරණ පද්ධතිය ඉස්සරහාට ගෙනියන්න පුළුවන්කමක් නැහැ. තමන්ගේ අයියාගේ නෝනට මේ අධිකාරියෙන් දුරකථන බිල ගෙවනවා. තමන්ගේ අයියාගේ දුරකථන බිල මේ අධිකාරියෙන් ගෙවනවා. අයියාගේ නෝනාගේ දුරකථන බිල මේ අධිකාරියෙන් ගෙවනවා. ඒ වාගේම දුරකථන හිමි නැති නිලධාරීන්ට දුරකථන පහසුකම් ලබා දීලා තිබෙනවා. දැවැන්ත දූෂණ වංචාවන් රාශියක් මේ ඇතුළේ සිද්ධ වෙනවා. පරිපාලන රෙගුලාසි, මූල්‍ය රෙගුලාසි, භාණ්ඩාගාර චක්‍රලේඛන මේ එකක්වත් ගණන් ගන්නේ නැතිව තනි මතයට, තනි තීන්දුවට මේක ඇතුළේ අති විශාල මුදල් සංඛ්‍යාවක් විනාශ කරමින් තිබෙනවා. පසුගිය කාලයේ මේ ආයතනයට ගත්ත සියලුම රථවාහන ගැන නිසි ඇගයීමක් සිද්ධ කරලා නැහැ. පළාත් පාලන ආයතවලට අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා දීලා තිබෙන යන්ත්‍ර එකක්වත් අධීක්ෂණය කරලා නැහැ. ඒවා තිබෙන තැන්වල තොරතුරු කියන්න මේ අධිකාරියේ අධ්‍යක්ෂකවරයා දන්නේ නැහැ. සමහර ආයතවලට ලබා දීලා තිබෙන ට්‍රක් රථ කිසිම ප්‍රයෝජනයක් ගන්නේ නැහැ. අපද්‍රව්‍ය අදින්න දීපු ට්‍රක් රථවලින් ගල් වැලි අදින පරිසරයක් තමයි තිබෙන්නේ. ඒ නිසා එකක්වත් නැවත භාවිතයට ගන්න බැරි විධියට අපහරණය වුණු තැන් බොහෝ රාශියක් තිබෙනවා. මේ සියල්ල සිද්ධ වන්නේ දූෂිත අධ්‍යක්ෂකවරයෙක්, ඉතාම වැරැදි සහගතව ක්‍රියා කරන කෙනෙක් මේ මූලාසනයේ රැඳී සිටීම නිසා. ඒ නිසා අපි යෝජනා කරනවා, වහාම ඒ අධ්‍යක්ෂකවරයා අයින් කරන්න. එහෙම නැත්නම් අපද්‍රව්‍ය බැහැර කිරීම කළමනාකරණය කිරීම කියන විෂයයට අපේ පළාත් සභාව ඇතුළේ තිබෙන කිසිම පළාත් පාලන ආයතනයකට මුහුණ දීගන්න බැරිව යනවා. ඒ කාරණය මතක් කරමින් මට කාලය ලබා දීම ගැන ඔබතුමියට ස්තුතිවන්ත වෙමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමිය**
Hon. Presiding Member

දැන් ගරු සභාපතිතුමා මූලාසනාරූඪ වෙනවා.

***ඊට අනුකූලව මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමිය [අශෝකා ලංකාතිලක මෙනවිය] මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු සභාපතිතුමා [සුනිල් විජේරත්න මහතා] මූලාසනාරූඪ විය.***

*Accordingly Hon. Presiding Member [Miss Asoka Lankathilaka] left the Chair and Hon. Chairman [Mr. Sunil Wijeratne] took the Chair.*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

යූ. ජෝර්ජ් පෙරේරා - විපක්ෂයේ ගරු ප්‍රධාන සංවිධායකතුමා, ඔබතුමාට විනාඩි 05 ක කාලයක් තිබෙනවා.

[අ.භා. 04.06]

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා
Hon. U. George Perera - Chief Opposition Whip

ගරු සභාපතිතුමනි, පස්වන පළාත් සභාවේ මේ අයවැය විවාදයේදී අධ්‍යාපන වැය ශීර්ෂය සම්බන්ධව කථා කරන්න අවස්ථාව ලබා දීම පිළිබඳව මම ස්තුතිවන්ත වෙනවා. අධ්‍යාපන උපදේශක කාරක සභාවට, ඒ වාගේම කලාප ව්‍යුහ රැස්වීම්වලට නොකඩවා පැමිණෙන විපක්ෂයේ මන්ත්‍රිවරයෙක් වශයෙන් මේ අවස්ථාවේ වචන ස්වල්පයක් හරි කථා කරන්න අවස්ථාව ලැබීම අපි අගය කොට සලකනවා. විශේෂයෙන්ම ගුරු පවුලක පුතෙක් වශයෙන්, ඒ වාගේම අධ්‍යාපනය සම්බන්ධයෙන් අපට ලැබෙන විමධ්‍යගත අරමුදලෙන් වැඩි ප්‍රමාණයක් අධ්‍යාපනයට යොමු කරන මන්ත්‍රීවරයෙක් වශයෙන් මේ අවස්ථාවේදී මට කියන්න සතුටුයි, ඇත්තටම ගම්පහ දිස්ත්‍රික්කයේ ශිෂ්‍යත්ව ප්‍රතිඵල ඉහළ මට්ටමක පවතිනවා කියලා සියලුම මන්ත්‍රීවරු

ප්‍රකාශ කළා. ඇත්තටම ඒ සම්බන්ධයෙන් විපක්ෂයේ ඉන්න අපිත් කථා කරනවා. මේ සම්බන්ධයෙන් දායකත්වය අපට ලබා දෙන්න පුළුවන් වුණු බව අපිත් කියන්න ඕනෑ. ඒකට හේතු ගණනාවක් තිබෙනවා. විපක්ෂයේ මන්ත්‍රීවරු වශයෙන් අපට ලැබෙන මුදල්වලින් පහේ ශිෂ්‍යත්ව පෙරහුරු වැඩ සටහන් කිරීමෙන්, පොත් ප්‍රදර්ශනය කිරීමෙන්, නැත්නම් සම්මන්ත්‍රණ පැවැත්වීමෙන් අපටත් ඒ දායකත්වය දෙන්න ලැබුණා. අපට ලැබෙන ඒ විමධ්‍යගත මුදල් යෙදවීම සම්බන්ධව මෙන්ම, ඊට අමතරව පහේ ශිෂ්‍යත්ව වැඩ සටහනෙන් සමත් වූ දරුවන්ව ඇගයීමක් කරන්නත් අපට අවස්ථාව ලැබුණා. කැලණිය අධ්‍යාපන කලාපයේ කැලණිය, බියගම, මහර,වත්තල කියන අධ්‍යාපන කොට්ඨාශ හතරේ ශිෂ්‍යත්ව ප්‍රතිඵල බැලුවාම කැලණිය, බියගම, මහර කියන කොට්ඨාශවල ශිෂ්‍ය සංඛ්‍යාව 200 කට වැඩි ප්‍රමාණයක් ශිෂ්‍යත්වය සමත් වී තිබෙනවා. එහෙත් වත්තල කොට්ඨාශයේ ශිෂ්‍ය ශිෂ්‍යාවන් 75 කට අඩු ප්‍රමාණයක් තමයි ශිෂ්‍යත්වයෙන් පාස් වුණු බව අපි දන්නේ. එයට හේතු ගණනාවක් තිබෙනවා.

විශේෂයෙන්ම වත්තල කොට්ඨාශය කියන්නේ නාගරික ප්‍රදේශයක්. ජාතීන් තුනම ජීවත්වන ප්‍රදේශයක්. ඒ ප්‍රදේශයේ ජාත්‍යන්තර පාසල් විශාල වශයෙන් බිහිවීම සම්බන්ධයෙන් තමයි මම මේ කථා කරන්න බලාපොරොත්තු වන්නේ. එයට යම්කිසි රෙගුලාසි ප්‍රමාණයක් අපේ බස්නාහිර පළාතේ තිබෙනවාද කියන එක මම බස්නාහිර පළාත් සභාවේ ගරු ප්‍රධාන අමාත්‍යතුමාගේ පිළිතුරු කථාවෙන් බලාපොරොත්තු වෙනවා. අපි දකිනවා, ජාත්‍යන්තර පාසල්වල OKI නැත්නම් ලයිසියම් පාසල, ගේට් වේ පාසල ගම්පහ දිස්ත්‍රික්කයේ ශාඛා තිබුණත් ඒ ප්‍රධාන ජාත්‍යන්තර පාසල්වලට අමතරව විශාල වශයෙන් ජාත්‍යන්තර පාසල් ප්‍රමාණයක් ගම්පහ දිස්ත්‍රික්කයේ තිබෙනවා. ඒ සම්බන්ධව යම් යම් පුවත්පත්වලින් අපි අමාත්‍යාංශ මට්ටමින් දැක්කේ 20 කට ආසන්න ප්‍රමාණයක් තමයි ලියාපදිංචි වෙලා තිබෙන්නේ කියලා. කුමන පැත්තේ ලියාපදිංචි වෙනවාද කියලා කියන්න අපි දන්නේ නැහැ. බස්නාහිර පළාතේ අධ්‍යාපන අමාත්‍යාංශයේ ලියාපදිංචි වෙනවාද? නැත්නම් සමාගම් රෙජිස්ටාර්වරයා යටතේ ලියාපදිංචි වෙනවාද? නැත්නම් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ හවුල් ව්‍යාපර යටතේ ලියාපදිංචි වෙනවාද? කියලා අපි දැනගන්න කැමැතියි. මේ ක්‍රම තුනෙන්ම රුපියල් 500/- ක්, රුපියල් 1000/- ක් දීලා සොච්චම් ගාස්තුවකට යටත් වෙලා මේ ලියාපදිංචිය අරගෙන මේ ජාත්‍යන්තර පාසල් කඩ ඇතිවීම කනගාටුවට කාරණාවක්. ඒ නිසා ගරු සභාපතිතුමනි, මේ සම්බන්ධයෙන් අපේ ගරු ප්‍රධාන අමාත්‍යතුමාගෙන් මම ඉල්ලීමක් කරනවා. මේ බස්නාහිර පළාත් සභාවේ ජාත්‍යන්තර පාසල් සම්බන්ධයෙන් ගන්නා වූ ක්‍රියාමාර්ග පිළිබඳව ඔබතුමාගේ පිළිතුරු කථාවේදී අපේක්ෂා කරනවා. මේ සම්බන්ධයෙන් ඉදිරියේදී බස්නාහිර පළාත් සභාව තුළ මේ ජාත්‍යන්තර පාසල් සම්බන්ධයෙන් කමිටුවක් පත් කරලා විනිවිදව පෙනෙන ආකාරයට පරීක්ෂණයක් පවත්වලා ජාත්‍යන්තර පාසල්වලට ළමයින් ඇදෙන්නේ ඇයි? කියන එක අපට පහදලා දෙන්න. නැත්නම් අපේ බස්නාහිර පළාත් සභාවේ පාසල්වලට කරන අගෞරවයක් බව ප්‍රකාශ කරමින් මම නිහඬ වෙනවා.

[අ.භා. 04.12]

**ගරු අශෝකා ලංකාතිලක**
Hon. Asoka Lankathilaka

ගරු සභාපතිතුමනි, අධ්‍යාපන අමාත්‍යාංශයේ වැය ශීර්ෂය යටතේ මට වචන ස්වල්පයක් කථා කරන්න අවස්ථාව ලබාදීම ගැන මම ස්තුතිවන්ත වෙනවා. මම මුලාසනයේ සිට අපේ ගරු මන්ත්‍රීතුමන්ලාගේ කථාවලට සවන් දීගෙන සිටියා. එතකොට මට ඇහුණා, අපේ චන්ද්‍රසෝම සරණලාල් ගරු මන්ත්‍රීතුමා ගොක් කොළ ගැන කථාවක් කියනවා. ඒ වාගේම සුදු කොඩි ගැන කථාවක් කියනවා. මම හිතන්නේ, එතුමා කාලයක් මේ සභාවේ සිටියේ නැහැ. ඒක නිසා මේ දියුණුව දකින්න නැතිව ඇති. එහෙම නැත්නම් එතුමා අවශ්‍ය කමිටුවලට සම්බන්ධ වෙලා මේ පිළිබඳව සුපසන් ඇසකින් බලන්නේ නැතිව ඇති. ඒක නිසා වෙන්න ඇති එහෙම පෙනෙන්නේ. නමුත් එතුමන්ලාට මතක නැහැ, ළමයින්ව පාසල්වලට දාන්න ගෝනවල සුනිල්ලාගේ ගෙවල්වල මිනිස්සුන්ට රස්තියාදු වෙන්න සිදු වුණු හැටි. මම හිතන්නේ, වර්තමානයේ ඒ වාගේ තත්ත්වයක් ඇති වෙන්න ගරු මහ ඇමැතිතුමා ඉඩ තියලා නැහැ.

අද පාසල්වලට දරුවන් ඇතුළත් කරන වේලාවටත් ප්‍රධාන පාසල්වලට ඇදෙනවා වාගේම අද ගමේ තිබෙන සාමාන්‍ය පාසල්වලට ළමයින්ට යන්න බොහෝදුරට පුළුවන් වෙලා තිබෙනවා. මොකද, හුඟාක් වේලාවට මේ පුංචි පාසල් කියලා නම් කරලා ඒ පුංචි පාසල්වලට තමන්ගේ දරුවන් යවන්න කැමැති වුණේ නැත්තේ ඒ වාගේ තිබුණු

[ගරු අශෝකා ලංකාතිලක ]

ගුරු හිඟයන් නිසා. එහෙම නැත්නම් ඒවායේ තිබුණු අඩුපාඩු නිසා. ඒ පාසලට සෙල්ලම් මිදුලක් තිබුණේ නැති නිසා. ඒ පාසල් ජරාවාස වෙලා තිබෙන නිසා. දරුවන්ට සතුටුදායක පරිසරයක් උදා කරන්නට ඒ පාසල්වල තිබුණු අවහිරතා නිසා. නමුත් මම හිතන්නේ, ඒ කිසි දෙයක් ඒ පාසල් තුළ නැහැ. පාසලට ඇතුළ් වෙන කොට හොඳට තීන්ත ගාලා - ගරු මහ ඇමැතිතුමා ඒ වාගේ වැඩ පිළිවෙළක් ඇති කර තිබුණු නිසා හොඳට තීන්ත ගාලා සුළු අලුත්වැඩියාවන් කරලා බොහෝ පාසල්වල ප්‍රියමනාප තත්ත්වයක් තිබෙනවා. ඒ වාගේම වැසිකිළි කැසිකිළි ප්‍රශ්න පසුගිය අවුරුදුවලදී මුදල් දීලා හැම පාසලකටම ඒ අඩුපාඩු සකස් කරලා තිබෙනවා. ඒ වාගේම ගිය වර්ෂය වාගේ ඒ ළමා මිතුරු පාසල් හැම එකකටම ළමා සෙල්ලම් පිටියක් ලබා දීලා තිබෙනවා. ඒක නිසා ඇත්තෙන්ම අද දෙමව්පියන් සතුටු වෙනවා. ලොකු පාසල් සොයාගෙන යනවාට වඩා ගමේ පාසලට දැමීමේ ප්‍රවණතාවයක් තිබෙනවා කියන එක මම මෙම අවස්ථාවේදී ආඩම්බරයෙන් ප්‍රකාශ කරනවා.

ඒ වාගේම ඉතාම සාර්ථක විධියට ගුරුවරු ලබා දීලා තිබෙනවා. පසුගිය කාලයේ ඕනෑම පාසලකට යනකොට ගුරු හිඟය තමයි දෙමව්පියෝ කියන්නේ. ඒ වාගේම තමයි සමහර දවස්වලට අපේ කාර්යාලවලට වළාකුළු පාවෙලා එනවා වාගේ තමයි දෙමව්පියන් පාවෙලා එන්නේ. අපේ ළමයි සාමාන්‍ය පෙළ කරන්න කිට්ටුයි. අපේ ළමයින් ශිෂ්‍යත්වය කරන්න කිට්ටුයි. මේ පාසලේ ගුරුවරුන් නැහැයි කියලා - නමුත් අපි දැන් දකිනවා. අපේ ගෙවල්වලට ඒ විධියට දැන් එන්නේ නැහැ. අපේ ගරු ප්‍රධාන අමාත්‍යතුමාගේ වැඩ පිළිවෙළ යටතේ අද විශාල ගුරුවරුන් ප්‍රමාණයක් බඳවාගෙන තිබෙනවා. විශ්‍රාම ගියත් ඉතා ටික කලකින් අලුත් ගුරුවරු ඒ පාසල් වෙත එනවා. ඒක නිසා මම හිතන්නේ, අර වාගේ දේවල් පෙනෙන්නේ එක්සත් ජාතික පක්ෂයට ඒවායේ තිබෙන නායකත්වයේ දුර්වලකම් නිසා. නමුත් අපේ පළාත් සභාවටවත්, එහෙම නැත්නම් ගරු ප්‍රධාන ඇමැතිතුමාටවත්, අපේ මන්ත්‍රීවරුන්ටවත් මේ වාගේ දේවල් පෙනෙන්නේ නැහැයි කියන එක මම මේ වේලාවේ තරයේ ප්‍රකාශ කරනවා.

ඒ වාගේම ගරු මහ ඇමැතිතුමා මේ පාසල විෂයයන් ශක්තිමත් කරන්න වැඩ පිළිවෙළවල් කරගෙන යනවා. මම හිතන්නේ, ඉදිරියේදී ගුරුවරුන් බඳවා ගැනීමේදී ක්‍රීඩා ගුරුවරු, නර්තන ගුරුවරු, චිත්‍ර ගුරුවරු ඒ වාගේ අයත් පාසල් වෙත දැනට සුළුවෙන් පැමිණෙමින් තිබෙනවා. නමුත් ඒ පුරප්පාඩු ටිකත් පිරවෙනවා නම් මම හිතන්නේ, දරුවන්ට ඉතාම සතුටෙන් පාසල් එන්න පුළුවන් තත්ත්වය තවදුරටත් පළල් වේවි කියන එක මම විශ්වාස කරනවා. ඒ වාගේම පාසල් අංශයෙන් අද මහා විවේචන ගොඩක් කිසිම කෙනෙකුට නැහැ. විරුද්ධ පක්ෂයේ කථා කරපු සමහර මන්ත්‍රීවරු පවා ඒ පිළිබඳව පැහැදීමෙන් කථා කරපු බව අපි දන්නවා.

නමුත් අපට අපේ ප්‍රාදේශීය සභාවල යම් යම් ගැටලු තිබෙනවා. මම හිතන්නේ අනවසර ඉදි කිරීම්, අනවසර ගොඩ කිරීම් වාගේ දේවල් නිසා සමහර වේලාවට ගැටලු ඇති වෙලා තිබෙනවා. ඒ වාගේම අපේ පළාත්බද මාර්ග අධිකාරියට අයිති පාරවල්වල ඒ තිබෙන දේවල් නිවැරදි කරන්න පළාත්බද මාර්ග සංවර්ධන අධිකාරියේ කාර්මික නිලධාරියෙක් ඒ සැලසුම් කමිටුවට වාඩි වෙනවා නම් මම හිතන්නේ, ඒ වාගේ දේවලුත් නිරවුල් කරගන්න පුළුවන්කම තිබෙනවා. ඒ වාගේ පාරවල්වල සමහර වේලාවට අපි දකිනවා, වැරදි ඉදි කිරීම් සිද්ධ වෙලා තිබෙනවා. ඒක නිසා අර වාගේ පළාත්බද මාර්ග සංවර්ධන අධිකාරියේ නිලධාරියෙක් ඒ සැලසුම් කමිටුව නියෝජනය කරනවා නම් ඒ වාගේ බරපතළ ප්‍රශ්න ඇති වන එකෙන් නිදහස් කරගන්නට අපට පුළුවන්කම තිබෙනවා. ඒ නිසා ඒ සම්බන්ධවත් ඔබතුමාගේ අවධානය යොමු කරනවා. ඒ වාගේම කුණු කසළ ප්‍රශ්නය පිළිබඳව මහේෂ් අල්මේදා ගරු මන්ත්‍රීතුමාත් කථා කළා. මම විශ්වාස කරනවා, තවම මෙහි වැඩ පිළිවෙළක් ජනතාව අතට ගියා මදී කියලා.

අපේ ඩෙංගු මර්දන ව්‍යාපාරවලදී එහෙම කසළ ඉවත් කරන්න යම් යම් ක්‍රියාමාර්ග ගත්තත් මේවා තවම ජනතාවගේ ඇඟට කාවදින ආකාරයෙන් සිද්ධ වෙලා නැහැ. මම හිතනවා ගරු මහ ඇමැතිතුමනි, අපේ ප්‍රාදේශීය සභාවල සමහර වේලාවට නොදිරන කුණු වෙනම ගන්න අවස්ථාවල් තිබෙනවා. නමුත් සමහර මිනිස්සු මේ පිළිබඳව කල්පනා කරලා අනුගතවීමක් වෙලා නැහැ. ඒක නිසා අපට පුළුවන්කම තිබෙනවා නම් මේ ප්‍රාදේශීය සභාවල සභාපතිවරු සමඟ සාකච්ඡා කරලා - අද ඕනෑ හැටියට ප්ලාස්ටික් වාගේ දේවල් මිලදී ගන්න ආයතන තිබෙනවා. ඒ වාගේම කඩදාසි වාගේ දේවල් මිලදී ගන්න ආයතන තිබෙනවා. වීදුරු කටු මිලදී ගන්න, ටිං වාගේ දේවල් මිලදී ගන්න ආයතන තිබෙනවා. මම හිතන්නේ ඒ වාගේ ආයතනවලින් නියෝජිතයෝ ඒ ප්‍රදේශයට ඇවිල්ලා කිලෝ

එකකට යම්කිසි මුදලක් ලබා දීලා ඒවා ඒ තැන්වලින් ගන්නවා නම්, ප්‍රාදේශීය සභාවලින් ඒ කුණු කඳුවලට එන කුණු, මම හිතන්නේ තුනෙන් දෙකක් පමණ අඩු වේවි. නොදිරන ද්‍රව්‍ය වෙන් කරලා දෙන්න කියලා ප්‍රාදේශීය සභාව කොපමණ කිව්වත් ජනතාවගේ ඒකට එපමණ උනන්දුවීමක් නැහැ. නමුත් ඒ අයගේ අතට මුදල ලැබෙනවා නම් මම විශ්වාස කරනවා, ඒක කවුරුත් කැමැත්තෙන් කරයි. ඒක නිසා අන්න ඒ වාගේ ක්‍රමයක් සකස් කරමුයි කියලා අපි කීප වතාවක් මතක් කරලා තිබෙනවා. මොකද, දියුණු රටවල ඒ වාගේ ක්‍රම තිබෙන නිසා තමයි කුණු ටික ගෙනැල්ලා එහෙම්ම පළාත් පාලන ආයතනයට බරක් වෙන්නට දාන්නේ නැත්තේ. ඒ අකාරයේ වැඩ පිළිවෙළකුත් ඉදිරියේදී සකස් කරලා ජනතාවට මේවායෙන් යම්කිසි මුදලක් ලැබෙන්නට සැලැස්සුවොත් සමහරවිට ඒ නිසාම ජනතාව මේ වාගේ වැඩ පිළිවෙළකට අනුගත වෙන්න පුළුවන්කම තිබෙනවා. මම ඒ සම්බන්ධවත් ඔබතුමාගේ අවධානය යොමු කරනවා. එහෙම නැතිව සන අපද්‍රව්‍ය අධිකාරිය විතරක් මේවා කරන තුරු බලාගෙන සිටියොත් අපට ගැටලු ඇති වෙන්න පුළුවන්.

සමහර අය කථා කළා, තවම කුණු ගඳ තිබෙනවා. කුණු ගන්දස්සාරේ තිබෙනවා කියලා. හැබැයි මම ආඩම්බරයෙන් කියනවා. අපේ රජය යටතේ ඒවා අවම තත්ත්වයකට පත් කරලා තිබෙනවා. අන්න ඒවා පිළිබඳවත් හිතන්න. ඉස්සර කොළඹ ප්‍රදේශයේ යනකොට මෙනතරම් කුණු ගඳ ගහන, ජරාවාස වුණු තැන් අපට දකින්නට තිබෙනවාද? ඒ වාගේම කෝට්ටේ වාගේ ප්‍රාදේශවල යනකොට ඒ වාගේ තැන් කොපමණ තිබුණාද? අද කොළොන්නාවේ වුණත්, කොළඹ නගරයේ කුණු ගෙනැල්ලා අපට හිසරදයක් වුණු හරිය හැරුණුකොට මම හිතන්නේ, එහෙම බරපතළ ගැටලු නැහැ. ඒ වාගේ දේවල් නිරාකරණය කරන්න යම් යම් ක්‍රියාමාර්ග ගන්න කියන ගෞරවනීය ඉල්ලීම කරමින්, සියලු දෙනාටම ස්තූතිවන්ත වෙමින්, ඒ වාගේම මේ අමාත්‍යාංශයේ අපේ හිටපු ලේකම්තුමිය, අද ප්‍රධාන ලේකම්තුමිය විශාල කාර්යභාරයක් ඉෂ්ට කළා. තනතුරු දෙකක වැඩ බලමින්. නමුත් එතුමිය ඉතාමත්ම ශක්තිමත්ව වැඩ කළා. ඒ වාගේම දැන් ඉන්න ලේකම්තුමාත් සහයෝගයෙන් වැඩ කරනවා. ඒ සියලුම නිලධාරීන්ටත්, ගරු මහ ඇමැතිතුමාගේ පෞද්ගලික කාර්ය මණ්ඩලයටත් මේ අවස්ථාවේදී අපට දක්වන සහාය පිළිබඳව ස්තූතිවන්ත වෙමින් නැවත වරක් ලබන කාලයේ තුළත් ඔබතුමාගේ ප්‍රධානත්වයෙන් මේ පළාත් සභාවේ වැඩ කරන්නට ශක්තිය, වාසනාව ලැබේවා කියලා ප්‍රාර්ථනය කරමින් මම මගේ වචන ස්වල්පය මෙයින් අවසන් කරනවා. ස්තූතියි.

[අ.භා. 04.24]

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

ගරු සභාපතිතුමනි, අපි දන්නවා වයඹ පළාත් සභාවේදී මේ ආණ්ඩුවේ ආදර්ශ පාඨය වුණේ සතුටයි. නිදහසයි. ගරු සභාපතිතුමනි, ඉතාමත්ම කනගාටුවෙන් කියනවා. පසුගිය අවුරුදු පහ තුළ බස්නාහිර පළාතේ විශේෂයෙන්ම නගර සභාවල, ප්‍රාදේශීය සභාවල සභාපතිවරු ක්‍රියා කළේ සතුටයි, නිදහසයි එක්ක. ගරු ප්‍රධාන අමාත්‍යතුමා අධ්‍යාපන ක්ෂේත්‍රය පිළිබඳව කෙතරම් කැපවීමක් කළාද කියනවා නම්, ඒ නිසාම එතුමා අතින් මම විශ්වාස කරනවා, විශේෂයෙන්ම පළාතේ පළාත් පාලන විෂයය මඟ හැරුණා කියන එක. ඒක බොහොම කනගාටුවෙන් මම මේ සභාවේදී මතක් කරනවා. ගරු සභාපතිතුමනි, සතුටයි, නිදහසයි අනන්ත අප්‍රමාණ ලෙස මේ ප්‍රාදේශීය සභාවල සභාපතිවරු, නගරාධිපතිවරු භුක්ති වින්දා. ඒකේ ප්‍රතිඵලයක් විධියට ඊයේ දවසේදී කැස්බෑව නගර සභාව තමන්ගේ ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරු හතර දෙනෙක් අදාළ සභාපතිවරයාට විරුද්ධව ඡන්දය පාවිච්චි කරමින් කැස්බෑව නගර සභාවේ අයවැය පළමු වතාවට ඊයේ පරාජයට පත් කළා.

ගරු සභාපතිතුමනි, ඒ නගර සභාව පිළිබඳව උපදේශක කාරක සභාවේදී මාස 09 ක් මම ගරු ප්‍රධාන ඇමැතිතුමාගේ අවධානය යොමු කළා. ඉඩමක් අනුමත කරලා, ඒකේ සීල් එක ගහලා නගරාධිපතිවරයාගේ අත්සන ගහලා, අන්තිමට නගරාධිපති මේ මගේ අත්සන නොවෙයි කියලා මහ සභාවට කිව්වාම ඔබේ අත්සන නොවෙයි නම් පරීක්ෂණයක් පවත්වන්න කියලා, මන්ත්‍රීවරු කිව්වා. ඒ සම්බන්ධයෙන් මම ඇවිල්ලා උපදේශක කාරක සභාවේදී කථා කළාම ප්‍රසන්න රණතුංග ගරු ප්‍රධාන අමාත්‍යවරයා ඒ පිළිබඳව ඔහුට CID එකේ පැමිණිල්ලක් කරන්න කිව්වාම ඔහු මාස 09 ක් තමන්ට භාර දුන්න කාර්යය පැහැර හැරියා. ගරු සභාපතිතුමනි, මාස 09 ක් ඔහු අදාළ පැමිණිල්ල කළේ නැහැ. මොකද, හොරාගේ අම්මාගෙන් පේන අහලා වැඩක් නැති නිසා. ඒ අත්සනට අභියෝග කරන්න CID එකට ගියොත් අත්සන කාගේද කියන එක අහුවෙන නිසා ඔහු මාස 09 ක් තිස්සේ උපදේශක කාරක සභාවත්, අපවත්

[ගරු නිරෝෂන් පාදුක්ක ]

නොමග යවමින් ක්‍රියා කළා. මේ සභාපතිවරු කරන අපැහැදිලි සතුටයි, නිදහසයි උපරිමය භුක්ති විඳින නිසා අවසානයේදී නගර සභා ක්‍රමය තුළ, ප්‍රාදේශීය සභා ක්‍රමය තුළ අභ්‍යන්තර කැරළි මතුවෙන්න ගත්තා. මන්ත්‍රීවරු අසහනයට පත් වුණා. ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරු අසහනයට පත් වුණා, ගරු සභාපතිතුමනි. ඒ අනුව දැන් අභ්‍යන්තර කැරළි නිර්මාණය වෙනවා විතරක් නොවෙයි. මන්ත්‍රීවරුන්ටත් දැන් තමන්ගේ හෘද සාක්ෂියට එකඟව අලුත් නිදහසට කාරණාවක් මතු වුණා. ඔවුන් කියන්න ගත්තා, සභාපතිවරු පරද්දවන්නේ අන් කිසිවක් නිසා නොවෙයි. මහින්ද චින්තනයට විරුද්ධව ඔවුන් ක්‍රියා කළ නිසත්, ඔවුන් හොරකම් කරන නිසාත්, මහින්ද චින්තනයට අනුව හොරකමට ඉඩක් නොමැති නිසා හොරකම් කරන සභාපතිරුන්ට විරුද්ධව අපි ක්‍රියා කරනවා කියන තර්කය තමයි ඒ විරුද්ධ වුණු මන්ත්‍රීවරු ගෙනාවේ ගරු සභාපතිතුමනි.

ගරු සභාපතිතුමනි, මම මෙය දැනගෙන සිටියා. කැස්බෑව නගර සභාවේ දූෂණ, වංචා සම්බන්ධයෙන් මීට පෙර බස්නාහිර පළාත් සභාව ක්‍රියාත්මක වුණා නම්, සමහරවිට ඒ සභාපතිවරයා මීට වැඩිය නියමාකාරයෙන් ඔහු පිළිබඳව Supervision කළා නම්, ඔහු පිළිබඳව අධීක්ෂණයකින් සිටියා නම් ඔහුව නිවැරැදි මාවතකට අරගෙන යන්න තිබුණා. නමුත් ගරු සභාපතිතුමනි, මේ තත්ත්වය තමයි නගර සභාවල නිර්මාණය වුණේ.

ඒ නිසා අධ්‍යාපන අමාත්‍යාංශය ගැන මම කථා කරන්නේ නැහැ. ප්‍රසන්න රණතුංග ගරු ප්‍රධාන අමාත්‍යවරයා පැහැදිලි උත්සාහයක්, තමන්ට කළ හැකි උපරිමය අධ්‍යාපන අමාත්‍යාංශය නඟා සිටුවීම සඳහා කළත් අවාසනාවකට මෙන් අධ්‍යාපන ක්ෂේත්‍රයේ සමහර පත්වීම් සැබැවින්ම 100% ක්ම දේශපාලනීකරණය වුණා. සමහර නිලධාරීන් ගුරුවරුන්ගෙන් ඇහුවේ දේශපාලන පක්ෂය. සමහර නිලධාරීන් පුටුවල වාඩි වුණාම රැස්වීම් තියලා කිව්වේ, අපි කොහොමද මේ ආණ්ඩුව රැක ගන්න වැඩ කරන්නේ කියලා. ඒ නිසා නිලධාරීන්ගේ විශාල ප්‍රශ්න පසුගිය කාලයේ තිබුණා.

ඒ විතරක් නොවෙයි, ගරු සභාපතිතුමනි. මේ සභාව නියෝජනය කරන කැස්බෑව ආසනයේ මන්ත්‍රීවරු තුන්දෙනෙක් ඉන්නවා. ගරු ඔබතුමා හරහා ප්‍රසන්න රණතුංග ගරු ඇමැතිතුමාට කියන්නේ. කැස්බෑවට ටොන් 15,000 ක් කුණු බාන ඒ කාලකණ්ණි දේශපාලන න්‍යාය පත්‍රයකට අද කැස්බෑව ජනතාව මුහුණ දීලා තිබෙනවා. තවත් රතුපස්වලක් කැස්බෑවෙන් බිහිවන ලකුණු පහළ වෙලා තිබෙනවා, ගරු සභාපතිතුමනි. එදත් මම මතු කළා. කඩුවෙල ව්‍යාපෘතිය. ලෝක බැංකු ආධාර මත ගෙනෙන ව්‍යාපෘතිය. නූතන පංචායුධ කුමාරයා නිසා මේ පළාත් සභාවට නවත්වන්න සිද්ධ වුණා. ඒ නිසා අද කැස්බෑවේ අපට කෝට්ටේ කුණු ගන්න වෙලා තිබෙනවා. කැස්බෑවේ අපට මහරගම කුණු ගේන්න වෙලා තිබෙනවා. කැස්බෑවේ අපට දෙහිවල - ගල්කිස්සේ කුණු ගන්න වෙලා තිබෙනවා. කැස්බෑවේ අපට මොරටුවේ කුණු ගන්න වෙලා තිබෙනවා. තවත් Agreement එකක් දාලා මොරටුවේ ට්‍රැක්ටර්වලට පානදුරෙත් කුණු ගෙනැල්ලා කැස්බෑවේ බාලා යනවා, ගරු සභාපතිතුමනි. හෝමගම කුණු ගේනවා.

හැබැයි, මේ පංචායුධ කුමාරයාට භය නොවී ඒ ව්‍යාපෘතිය ආරම්භ කළා නම් හෝමගම කුණු, මහරගම කුණු, කඩුවෙල කුණු, කෝට්ටේ නගර සභාවේ කුණු ඒ ව්‍යාපෘතිය හරහා ක්‍රියාත්මක කරන්න තිබුණා ගරු සභාපතිතුමනි. ඒවා සිද්ධ වුණේ නැහැ. වත්තල දික්ඕවිට ටොන් පහක් කුණු දහනය කරන්න පුළුවන් ව්‍යාපෘතියක් ආරම්භ වුණා. ප්‍රාදේශයේ බලගතු දේශපාලන නායකයා ඒකට විරුද්ධ වුණා. මුළු පළාතේම. ගම්පහ දිස්ත්‍රික්කයේ නායකත්වය ඒකට විරුද්ධ වුණා. ගරු සභාපතිතුමනි, මේ අපේ කීර්ති උඩවත්ත ගරු මන්ත්‍රීතුමා ඉන්නවා. කළුබෝවිල රෝහල ඇතුළේ කුණු ගොඩක් එකතු වෙලා තිබෙනවා. කොළඹ ජාතික රෝහලේ කුණු ගොඩක් එකතු වෙලා තිබෙනවා. මහරගම පිළිකා රෝහල ඇතුළේ කුණු ගොඩක් එකතු වෙලා තිබෙනවා. කුණු දහනය කිරීමට - ගරු සභාපතිතුමනි, මම අදාළ ආයතනත් එක්ක කථා කළා. දවසකට රෝහල්වල කුණු එකතු වන්නේ ටොන් එකහාමාරයි. ටොන් පහක් දහනය කළ හැකි යන්ත්‍රයක් ගෙනැල්ලා ඒක වත්තල ප්‍රාදේශයේ සවි කරන්න නොදී අද අසරණ වෙලා ඉන්නවා. අද රෝහල්වල කුණු එකතු වෙලා. මේ යථාර්ථය තිබෙන්නේ. අපි හැම තිස්සේම කථා කළේ බස්නාහිර පළාත් සභාවේ අනන්‍යතාවය. ඒක යූ.ඇන්.පී ද? ඒක ශ්‍රී ලංකාද? නොවෙයි. අපේ සභාවට ආවේණික වූ බලතලවලින්, අපට ලැබුණු බලතලවලින් අපි ශක්තිමත් වෙන්න ඕනෑ ගරු සභාපතිතුමනි. මේ යථාර්ථය තුළ තමයි සිද්ධ වුණේ.

අද අපට සතුටු වෙන්න පුළුවන් බස්නාහිර පළාත් සභාවේ එක ආයතනයක් තිබෙනවා. පළාත් ආදායම් දෙපාර්තමේන්තුව. ගිය අවුරුද්දේ ඇස්තමේන්තු කළේ මිලියන 6000 යි. මිලියන 6900 ක් මේ පළාත් සභාවට ගෙනැල්ලා දුන්නා. එහිදී විශේෂයෙන්ම හේතුවක් වුණා. ඔප්පු ලිවීමේදී නීතිඥවරුන්ට අහන්න වුණා, අපේ ඉඩම්වල වටිනාකම් කීයද? කියලා. අදාළ දෙපාර්තමේන්තුවෙන් එලෙස අහන්න සිද්ධ වුණු නිසා මිල අඩුවෙන් ලියන්න නොහැකි වුණා. මිලියන 6900 ක් අපි සොයා ගත්තා. ගරු සභාපතිතුමනි, එහි අභ්‍යන්තරයේ තවත් ප්‍රායෝගික නොවන කාරණා තිබෙනවා. ඔප්පුවක් ලියනකොට අපේ ආදායම් දෙපාර්තමේන්තුවෙන් ඇහුවත් අද වනතුරු කිසිම නීතිඥ මහත්මයෙක් ඉල්ලන්නේ නැහැ, ඔප්පු ලියද්දී අදාළ නගර සභාවේ අනුමත කරපු ඉඩම් කට්ටියේ copy එකක්. ඒ නිසා සමහර ඉඩම්වල වටිනාකම දුන්නත් ඒ ඉඩම් කට්ටිය සමහර වේලාවට නගර සභාවෙන් අනුමත කරලා නැහැ. ඔප්පු ලියනවා. අන්තිමට ගියාම අදාළ නගර සභාවේ සභාපති, එහෙම නැත්නම් නගරාධිපති ණය ගන්න ගියාම ලක්ෂ ගණනාවක් ඉල්ලනවා ඉඩම් කට්ටිය අනුමත කරන්න. මේ යථාර්ථය තුළ අපි ඉල්ලා සිටිනවා ගරු ප්‍රධාන ඇමැතිතුමනි, ඔබතුමා යටතේ තත්ත්වය වෙනස් වෙන්න ඕනෑ. අපි ඔබතුමා වෙනස් කරන්න උත්සාහ කළා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාගේ කාලය අවසන්.

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

ඒ වාගේම අපි දැක්කා මධ්‍යම ආණ්ඩුව. විශේෂයෙන්ම මේ රටේ ක්‍රීඩාවට විශාල කැළලක් වුණා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් ලැබෙනවා.

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

වයස අවුරුදු 13 න් පහළ ක්‍රීඩාව මධ්‍යම ආණ්ඩුව විසින් නැවැත්තුවා. මොකක්ද මධ්‍යම ආණ්ඩුවේ අධ්‍යාපන ඇමැතිතුමා කිව්වේ, 13 න් පහළ ක්‍රීඩා කළාම මානසික ආතතිය හැදෙනවා. ඒ නිසා ලංකාවේ 13 න් පහළ තරගාවලි නැහැයි කියලා කිව්වා, ගරු සභාපතිතුමනි. මම ප්‍රසන්න රණතුංග ගරු ප්‍රධාන අමාත්‍යතුමාට කියනවා. අදාළ කාලය අවසන් නිසා මේ යෝජනාව සභාවට ගෙනෙන්න බැහැ. හැබැයි, 13 න් පහළ ක්‍රීඩකයාට මානසික ආතතිය හැදෙන කොට අවුරුදු 11 ළමයාට ලංකාවේ භයානකම විභාගයට වාඩි වෙන්න මධ්‍යම ආණ්ඩුව ඉඩ සලසලා තිබෙනවා. වැඩියෙන්ම සිසුන් වාඩි වෙන, වැඩියෙන්ම සිසුන් Fail වෙන අමාරුම විභාගය තමයි පහේ ශිෂ්‍යත්ව විභාගය. ඒක මධ්‍යම ආණ්ඩුව කරන ගමන් අවුරුදු 13 ක්‍රීඩකයාට කියනවා, 13 න් පහළ ක්‍රීඩා කරන්න එපා. 96 ලෝක කුසලානය ලංකාවට අරන් දීපු කණ්ඩායමේ ක්‍රීඩකයින් 11 දෙනාගෙන් 09 දෙනෙක්ම අවුරුදු 11 න් පහළ ක්‍රිකට් ගහලා ආරම්භ කරපු අය. ප්‍රසන්න රණතුංග ගරු ප්‍රධාන ඇමැතිතුමාගේ සහෝදරයා අවුරුදු 13 දී ක්‍රිකට් ගහලා වාර්තා තිබ්බා. ඔහු ශ්‍රී ලංකාවේ නායකයා වෙනවා කියලා අඳුර ගත්තේ අවුරුදු 13 දී. නමුත් අද ලංකාවේ අධ්‍යාපන අමාත්‍යාංශය ක්‍රීඩාව නවත්වනවා.

අපට බැහැ ගරු සභාපතිතුමනි, මධ්‍යම ආණ්ඩුවේ අධ්‍යාපන ඇමැතිට ඕනෑ විධියට නටන්න. අපි එකඟ වුණත් අපටම ආවේණික වූ චක්‍රලේඛයක් ඕනෑ පළමුවැනි ශ්‍රේණියට සිසුන් ඇතුළත් කිරීමේදී. ඒක තමයි මහේෂ් අල්මේදා ගරු මන්ත්‍රීතුමා කිව්වේ. මේ යථාර්ථය තුළ තමයි ගරු සභාපතිතුමනි, පළාත් සභාවක් ඉදිරියට යන්න ඕනෑ. මධ්‍යම ආණ්ඩුව කියන විධියට දහලන්න අපට ඕනෑ නැහැ. අපේ ආදායම් පිළිබඳව ඊයේ උදය ගම්මන්පිල ගරු ඇමැතිතුමා හොඳ කථාවක් කිව්වා. එතුමා කියනවා, මධ්‍යම ආණ්ඩුවට හොඳ යාන්ත්‍රණයක් තිබෙනවා. ඒ නිසා BTT නැතිව මධ්‍යම ආණ්ඩුවේ යාන්ත්‍රණයෙන් අපි ගියාට කමක් නැහැයි කියලා. එහෙමනම් මධ්‍යම ආණ්ඩුවට හැමතැනම යාන්ත්‍රණයක් තිබෙනවා. කෘෂිකර්මයටත් යාන්ත්‍රණයක් තිබෙනවා. අධ්‍යාපනයටත් යාන්ත්‍රණයක් තිබෙනවා. අපි පළාත් සභාව හරහා මධ්‍යම ආණ්ඩුවේ යාන්ත්‍රණයට යටත් වෙමු, අපට මේ පළාත් සභාව කරගෙන යන්න ඕනෑ නම්. ගරු සභාපතිතුමනි, අපි දැක්කා, ප්‍රසන්න රණතුංග ගරු ප්‍රධාන ඇමැතිතුමා ගෙනාවා සරුදම් අරුණැල්ල.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාගේ කාලය අවසන්.

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

මගේ කාලය අවසන් නිසා. සරුදම් අරුණැල්ලෙන් දහම් පාසල්වලට ධෛර්යමත් කරන්න එතුමා වැඩ සටහනක් හැදුවත් අපට තවම බැරි වෙලා තිබෙනවා ආණ්ඩුවෙන් ඉල්ලන්න රජයේ රස්සාවලට ගන්නකොට දහම් පාසල් සහතිකයට ලකුණු දෙන්න. ඉසෙඩ් කෝ එකේදී දහම් පාසල් ගිය ළමයාට ලකුණු මට්ටමක් එකතු කරන්න. අපට ඒක කරන්න බැරි වුණා, ගරු සභාපතිතුමනි. ඒ නිසා අවසාන වශයෙන් පුරා වසර පහක් මේ පළාත් සභාවට නායකත්වය දුන්න, පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍යවරයා හැටියට කටයුතු කරපු අපේ මිත්‍ර ප්‍රසන්න රණතුංග මැතිතුමාගේ දේශපාලන අනාගතය සරුදම් අරුණැල්ලක් වේවා. සරදම් අරුණැල්ලක් නොවේවා කියලා ප්‍රාර්ථනය කරමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කීර්ති උඩවත්ත ගරු මන්ත්‍රීතුතුමා, ඔබතුමාට විනාඩි 08 ක් තිබෙනවා.

[අ.භා. 04.32]

**ගරු කීර්ති උඩවත්ත**
Hon. Keerthi Udawatte

මට විනාඩි 10 ක් තිබුණා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

විනාඩි 10 ක් තිබුණාට ඔබතුමාට මට දෙන්න විධියක් නැහැ. ඔබතුමාට විනාඩි 08 යි.

**ගරු කීර්ති උඩවත්ත**
Hon. Keerthi Udawatte

ගරු සභාපතිතුමනි, මම පළමුවෙන්ම කනගාටු වෙනවා, ඔබතුමා මට කරපු අසාධාරණය ගැන. මට විනාඩි 10 ක් -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට මම අසාධාරණයක් කළේ නැහැ. ඒ අසාධාරණය ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරුන් හරහා වුණේ.

**ගරු කීර්ති උඩවත්ත**
Hon. Keerthi Udawatte

හරි. දැන් තවත් විනාඩියක් අපතේ යනවා. ඒ නිසා මම කථාව පටන් ගන්නම්. ගරු සභාපතිතුමනි, මම මගේ කථාව කාල කළමනා කර ගන්නවා විනාඩි හතරක් අධ්‍යාපනයටත්. අනික් විනාඩි හතර පළාත් පාලනයටත්. නමුත් මම පළමුවෙන්ම පළාත් පාලනය ගැන කථා කරනවා. මක් නිසාද? අපේ උගත් මන්ත්‍රීතුමා, නිරෝෂන් පාදුක්ක ගරු මන්ත්‍රීතුමා ඒ පිළිබඳව බොහොම වේගවත් කථාවක් කළ නිසා. ගරු සභාපතිතුමනි, කථා කරන එක ලෙහෙසියි. ක්‍රියාත්මක කිරීම ඒ තරම්ම පහසු නැහැ. අපේ අනිකුත් පළාත් සභාවන් අනා ගනිද්දී, ඇමැතිවරු මහ ඇමැතිවරුන් පිළිබඳව විවිධ මතිමතාන්තර ඇති වෙද්දී, සමහර මහ ඇමැතිවරු ගෙදර යද්දී අපේ මහ ඇමැතිතුමා ලංකාවේ තිබෙන ඉතාම සංකීර්ණම පළාත් සභාව පාලනය කරමින්, ඉතාම දුෂ්කර තත්ත්වයන්ට මුහුණ දෙමින් මේ අවුරුදු පහම රැගෙන යාම සම්බන්ධයෙන් අපි එතුමාට අපේ ප්‍රණාමය පුද කරන්න ඕනෑ.

දැන් මේ පළාත් පාලන ආයතන පිළිබඳ ප්‍රශ්නය අපි පුළුල්ව විග්‍රහ කළොත් මේ ප්‍රශ්නය විසඳීමේදී ගරු ප්‍රධාන අමාත්‍යවරයා මුහුණ දෙන ගැටලු රාශියක් තිබෙනවා. මේ සම්බන්ධයෙන් මේ පළාත් පාලන ආයතන නියාමනය කිරීමේ ක්‍රියාවලිය අතිශයින්ම නීතිමය තත්ත්වයක්. ඒ නීතිමය තත්ත්වය ඉක්මවා යෑමට පළාත් සභාවේ විෂයය භාර අමාත්‍යවරයාට පුළුවන්කමක් නැහැ. ඉතාම වියදම් අධික, ඉතාම සංකීර්ණ, කාලය විශාල ප්‍රමාණයක් වැය වන ඉතාම යල් පැනගිය වැඩ පිළිවෙළක් තමයි මේ පළාත් පාලන ආයතන නියාමනය කිරීමට අපට තිබෙන්නේ. ඒ නිසා සමහර පළාත් පාලන ආයතවල අඩුපාඩුකම් තිබුණත් ඒ සම්බන්ධයෙන් ක්‍රියාත්මක වන්නට එතුමාට නොහැකි වූ බව අපි මේ අවස්ථාවේදී සඳහන් කරන්නට ඕනෑ. ඒ වාගේම මේ පළාත් පාලන ආයතනවලින් 95% ක්ම වාගේ එතුමා නියෝජනය කරන, අපි නියෝජනය කරන පක්ෂයේ පළාත් පාලන ආයතන. ඒ ආයතන සම්බන්ධයෙන් ක්‍රියාත්මක කිරීමේදී දේශපාලන පක්ෂයක සාමාජිකයෙක් හැටියට එතුමාට සිද්ධ වෙනවා, තමන්ගේ පක්ෂයේ නියමන්ට අනුව කටයුතු කරන්න. අපි ඒ යථාර්ථය පිළිගන්න ඕනෑ. ඒ නිසා සමහර විට එතුමාට මේ සම්බන්ධයෙන් ක්ෂණිකව මැදිහත් වෙන්න අවකාශය නොමැති වෙන්න පුළුවන්. හැබැයි, නිරෝෂන් පාදුක්ක ගරු මන්ත්‍රීතුමා කිව්වා වාගේ

මේ සම්බන්ධයෙන් අපි අනුගමනය කරපු උදාසීන ප්‍රතිපත්තිය නිසා ගරු මහ ඇමැතිතුමනි, අද ඉතාම කනගාටුදායක තත්ත්වයක් පළාත් පාලන ක්ෂේත්‍රයේ උද්ගත වෙමින් එනවා. වංචාව, දූෂණය පැහැදිලිව කරන තැනක ඒ වංචාව, දූෂණයට නිසි දඬුවමක් නොලැබෙන අවස්ථාවක සමහරවිට තමන්ගේ පක්ෂයේම නායකත්වයට එරෙහිව පක්ෂයේ මන්ත්‍රීවරු කැරැළි ගහපු අවස්ථාවන් අපි දුටුවා. මේවා මුල් අවස්ථාවේදීම හඳුනාගෙන ඒ සම්බන්ධයෙන් යම්කිසි ක්‍රියාමාර්ගයක් ගැනීමට අපි කටයුතු කළා නම් මේ තත්ත්වයන් ඇති වන්නේ නැහැ,. මම විශ්වාස කරනවා, ඊළඟ අවුරුදු පහේත් මේ පළාත් සභාවේ ගරු ප්‍රධාන අමාත්‍යවරයා හැටියට මේ පළාත් පාලන ආයතන නියාමනය කිරීම සඳහා මීට වඩා කාර්යක්ෂම වැඩ පිළිවෙළකට යා යුතු කාලය අපට එළැඹ තිබෙනවයි කියන එක කියන්නට ඕනෑ.

ගරු සභාපතිතුමනි, බලන්න. අල්ලස් අරගෙන හිරේට යන, රිමාන්ඩ් එකට පත් වෙන සභාපතිවරයා එළියට එනකොට මිනිස්සු යනවා. මොනවාටද? මල් මාලා දාන්න. අපේ රජා රජවේවා. මොකටද? හොරකම් කරපු එකා රජ වේවා. පගා ගත්තු එකා රජ වේවා. ස්ත්‍රී දූෂණය කරපු එකාට ජය වේවා. මල් මාලා දානවා. ඇත්තටම මොකක්ද මේ දේශපාලන සංස්කෘතිය. මහජනයා මොනතරම් පහත් විධියටද මේ දේශපාලන ක්‍රියාකාරකම් අගය කරන්නේ. ඇත්ත වශයෙන්ම අපි වරදක් කරලා හිර භාරයට ගිය මිනිහා දිහා බැලුවේ ඒ පුද්ගලයා දුෂ්ටයෙක්. නරක මිනිහෙක්. අපරාධකරුවෙක් හැටියට. අද ඔවුන් එළියට එන්නේ වීරයෝ හැටියට. මෙන්න මේ සංස්කෘතිය වෙනස් විය යුතුයි. ඇත්ත වශයෙන්ම වැරැද්දක් කරලා අධිකරණය හමුවට පත් වුණු කෙනෙක් නැවත වතාවක් ඇවිල්ලා කොහොමද සභාපති පුටුවේ ඉඳගෙන තමන්ගේ මන්ත්‍රීවරු පාලනය කරන්නේ. ඒ නිසා අපි ගරු සභාපතිතුමාගේ මාර්ගයෙන් ගරු මහ ඇමැතිතුමාට යෝජනා කරනවා. මේ සම්බන්ධයෙන් දැනට පවතින නීතිමය තත්ත්වය වෙනස් කරලා, මේ අය වැරැදිකාරයෙක් හෝ නිවැරැදිකාරයෙක් වෙනතුරු තාවකාලිකව හෝ ඔහුගේ තනතුර අහෝසි කිරීමේ වැඩ පිළිවෙළකට අපි යා යුතුව තිබෙනවා. එහෙම නැත්නම් මිනිස්සු අපට හිනා වේවි. මිනිස්සු අපට දොස් කියාවි. මිනිස්සු මේ වැරැදි දේ කවදාවත් අනුමත කරන්නේ නැහැ. අපි හිතනවා, අපට බලය තිබෙන කොට සියලු දේ හරි, මේක තමයි හරි ක්‍රමය කියලා. නමුත් කවදා හරි දවසක අපි පරාජය වෙලා විපක්ෂයට ගිය දවසට අපට මේ කරුණු ගැන නැවත මෙනෙහි කරන්න සිද්ධ වෙනවා. මම මේක පැහැදිලි කරන්නේ, මේ ක්‍රියාදාමය ඉෂ්ට කරන්න ගරු මහ ඇමැතිතුමාට බලතල නැහැ. සභාපතිවරයෙක් අල්ලස් අරගෙන හිර භාරයට ගිහිල්ලා රිමාන්ඩ් එකෙන් නිදහස් වෙලා ආවට පස්සේ ඒ සභාපති ධුරයට ඔහු යන එක වළක්වන්න බලයක් ගරු මහ ඇමැතිතුමාට නැහැ. ඉතින් එවැනි තත්ත්වයක් තුළ මේ සම්බන්ධයෙන් අපි එතුමාට නොවෙයි දෝෂාරෝපණය කරන්න ඕනෑ. මේ රටේ පාර්ලිමේන්තුවක් තිබෙනවා. ව්‍යවස්ථාදායකයක් තිබෙනවා. ඒ ව්‍යවස්ථාදායකය තුළ -

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

විධායකය.

**ගරු කීර්ති උඩවත්ත**
Hon. Keerthi Udawatte

මෙවැනි වැරැදි කරන පුද්ගලයන් සම්බන්ධයෙන් ක්ෂණිකව දඬුවම් දීමේ වැඩ පිළිවෙළක් ආරම්භ කරන්න ඕනෑ. එහෙම නැතිව ගරු ප්‍රධාන ඇමැතිතුමාට දොස් කීමෙන් මේ ප්‍රශ්නය අපට විසඳගන්න පුළුවන් වන්නේ නැහැ. ඒ නිසා මම මීට වඩා -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාට තව විනාඩියක කාලයක් තිබෙනවා.

**ගරු කීර්ති උඩවත්ත**
Hon. Keerthi Udawatte

මම ඔබතුමාගෙන් ඉල්ලීමක් කළා. මම විනාඩි 08 යි කථා කරන්නේ. මම හතරක් - එතකොට ඔබතුමා මට හතරේදී කියන්න තිබුණා, දැන් ඔබතුමාගේ හතර ඉවරයි කියලා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

එහෙම කියන්න උවමනාවක් නැහැ.

**ගරු කීර්ති උඩවත්ත**
Hon. Keerthi Udawatte

ගරු සභාපතිතුමනි, දෙවැනිවරටත් ඔබතුමා මට අසාධාරණයක් කළා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාගේ කාලය අවසන්. කරුණාකර කථාව අවසන් කරන්න.

**ගරු කීර්ති උඩවත්ත**
Hon. Keerthi Udawatte

ගරු මහ ඇමැතිතුමා විනාඩි දෙකක් දුන්නා. ඒ නිසා -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කාලයක් දෙන්න නැහැ. එතුමාට විනාඩි 10 යි තිබෙන්නේ. ඔබතුමා එතුමාට අවස්ථාව දෙන්න. වැරැදි පූර්වාදර්ශයක් යන්නේ. කථිකයෝ වුණාට ගරු මහ ඇමැතිතුමාට අවස්ථාව දෙන්න. උදෙත් ප්‍රශ්නයක් වුණා නේ? දැන් උදෙත් තිබුණු වැය ශීර්ෂවල ප්‍රශ්නයක් වුණා. අන්තිමට සභා කටයුතු ගරු ඇමැතිතුමාට කාලය නැහැ. ඔබතුමන්ලා කරන දේවල්වලින් මෙතුමන්ලාට කාලය නැහැ. ආණ්ඩු පක්ෂයේ සංවිධායකතුමාත් එක්ක ඒ ගැන බලාගන්න. ගරු විපක්ෂ නායකතුමා, ඔබතුමාට විනාඩි 08 ක කාලයක් තිබෙනවා. ඔබතුමා නියමිත වේලාවට අවසන් කරන්න.

[අ.භා. 04.40]

**ගරු මංජු ශ්‍රී අරංගල - විපක්ෂ නායකතුමා**
Hon. Manju Sri Arangala - Leader of the Opposition

ගරු සභාපතිතුමනි, අද දවසේ ප්‍රධාන අමාත්‍යතුමාගේ අධ්‍යාපන හා පළාත් පාලන පිළිබඳ වැය ශීර්ෂයේදී අපට කථා කරන්න තිබෙන්නේ, ඊයේ දවසේ මාධ්‍යවලින් මතු වුණු කාරණාවකුත් එක්ක. ඊයේ අල්ලස් සහ දූෂණ කොමිෂන් සභාවේ සභාපතිවරයා මාධ්‍යයට ඇවිල්ලා කියනවා, ලංකාවේ අල්ලස් හා දූෂණ පැමිණිලිවලින් වැඩිම පැමිණිලි තිබෙන්නේ අධ්‍යාපනය සම්බන්ධයෙන් කියලා. ඒ විතරක් නොවෙයි. ඔහු කියනවා, ඒ පැමිණිලිවල තිබෙන ස්වභාවය අනුව දරුවන් පාසල්වලට ඇතුළත් කරගන්න ගියාම තමයි මේ තරම් අල්ලසට හා දූෂණයට ලක් වෙලා තිබෙන්නේ කියලා. ඒ නිසා විශේෂයෙන්ම අපි මතක් කරන්න කැමැතියි. අපේ පළාත් සභාවේ අධ්‍යාපන ගරු ඇමැතිතුමා එතුමාගේ අයවැය කථාවේදී මේ අධ්‍යාපනය නගා සිටුවන්න ගන්න වෙහෙස මහන්සිය පිළිබඳව ප්‍රකාශ කරලා තිබෙනවා. හැබැයි, මේ සියල්ලම එක වැඩෙන් විනාශ වෙලා යනවා, තත්ත්වය මේ තරමටම පිරිහෙලා තිබුණොත්. උදාහරණයක් විධියට දැන් ඊයේ පෙරෙයිදා මාධ්‍යයක පළවෙලා තිබුණා. මේක අධ්‍යාපන ක්ෂේත්‍රයක නොවෙයි. කොළඹට ආසන්න කලාපයක සමහර පළාත් සභා මන්ත්‍රීවරු දරුවන්ව විද්‍යාලවලට ඇතුළත් කර ගන්න රුපියල් 25,000/-, රුපියල් 40,000/- එකතු කර ගන්නවා කියලා. ඒ නිසා මම හිතන්නේ එක පැත්තකින් අපි අධ්‍යාපන නිලධාරීන්ට වැරැදි කියන ගමන්ම - විදුහල්පතිවරු හැටියට විදුහල්වලට පත් වෙලා එනවා. ඒ ආවාම දේශපාලනයට යනවා. දේශපාලන කාලයේදී අධ්‍යාපන කාර්යාලවල විදුහල්පති පුටුවල ඉන්නේ නැතිව එක එක මන්ත්‍රීවරයාගේ කොළ බෙදන්න යනවා. කැන්වසින් කරන්න යනවා. මේ නිසාම අධ්‍යාපනය පරිහාණියට ලක් වෙනවා කියන එක අපිට පැහැදිලිව පෙනෙන්න තිබෙනවා. ඒ නිසා එක පැත්තකින් මුදලින් අල්ලස් ගන්නවා. අනික් පැත්තෙන් සමහර විදුහල්පතිවරු මච්චරුන්ගෙන් ශාරීරික අල්ලස් ගන්නවා. මේ තරමටම අධ්‍යාපනය පිරිහිලා තිබෙන්නේ.

ඒ නිසා ප්‍රධාන අමාත්‍යවරයා හැටියට විශේෂයෙන්ම වැසිකිළි කැසිකිළි හදන්න, ගොඩනැගිලි හදන්න, වර්ණාලේප කරන්න විශාල මුදලක් මේ කලාපවලට පොම්ප කෙරුවත්, ලබා දුන්නත් මේවා මාධ්‍යවලට යනකොට අර සියල්ලම මුට්ටිය බින්දා සේ ඒ සියල්ල යට වෙලා, හොඳ දේ යටවෙලා වැරැදි දේ තමයි ඉදිරියට එන්නේ. ඒ නිසා අපි පළාත් සභාවේ මන්ත්‍රීවරු හැටියට මේ කියන්නේ, මේ වැඩ පිළිවෙළට විරුද්ධව නොවෙයි. ගරු ප්‍රධාන ආමාත්‍යවරයා හැටියට අපි දන්නවා එතුමා විශාල මහන්සියක් ගන්නවා. බදාදා දවසට ඉස්පිරිතාලේ OPD එක වාගේ. තමන්ට කරන්නට පුළුවන් හැකියාවට වඩා ඉතාම උපරිමයෙන් වැඩ කටයුතු කරමින් මේ තිබෙන ප්‍රශ්න සමනය කරන්න එතුමා උත්සාහයක් ගන්නවා. ඒ පිළිබඳව අපි සන්තෝෂයට පත් වෙනවා. නමුත් වැඩේ වෙලා තිබෙන්නේ, එතුමාට යටින් තිබෙන මේ ක්‍රියා කරන සමහර තැන් දිහා බැලුවාම, වැඩ කටයුතු වන තත්ත්වය දිහා බැලුවාම අධ්‍යාපන අමාත්‍යවරයා හැටියට එතුමා ගන්න උත්සාහයට නිතරම අර කිරි කළයට ගොම බිඳක් වැටුණා සේ මේක විනාශ වෙමින් යනවා. ඒ නිසා අපි අධ්‍යාපන ඇමැතිවරයා හැටියට, ප්‍රධාන ඇමැතිවරයා හැටියට එතුමාට කියනවා. හොඳ නිරවුල් මානසික තත්ත්වයකින් යුක්තව මේ පිළිබඳව කටයුතු කරන්නටය කියලා.

ඒ වාගේම අපි දන්නවා, පළාත් පාලන ආයතන පිළිබඳව පක්ෂ විපක්ෂ මන්ත්‍රීවරු ගණනාවක් අද මෙතැන කථා කළා. අපි අවංකවම කියන්න ඕනෑ. ගරු ප්‍රධාන අමාත්‍යතුමා හැටියට එතුමාට මේ පිළිබඳව මම හිතන්නේ මධ්‍යම ආණ්ඩුවේ බලය තිබෙනවා. ජනාධිපතිවරයාට කථා කරන්න පුළුවන් හැකියාව තිබෙනවා. එතුමා කැබිනට් මණ්ඩලය නියෝජනය කරන සාමාජිකයෙක්. ඒ නිසා මේ පළාත් පාලන ආයතවල පනත වෙනස් කරලා හරි මේ තත්ත්වයන් එතුමාට පාලනය කරන්න පුළුවන් තැනකට ගෙනියන්න ඕනෑ. අපි දන්නවා, සමහර පළාත් පාලන ආයතනවල මාස ගණන් මුදල් කමිටු තියන්නේ නැතිව, ඒවා රැස් කරන්නේ නැතිව මුදල් ගෙවීම් කරනවා. සමහර පළාත් පාලන ආයතනවලට උපදේශක කාරක සභාවේදී ගන්න තීන්දු තීරණ ක්‍රියාත්මක කරන්න කියලා දැන්වූවාට ඒවා තඹ දොයිතුවකට මායිම් කරන්නේ නැතිව තමන්ට ඕනෑ විධියට රිසි සේ වැඩ කටයුතු කරන පළාත් පාලන ආයතන අනන්ත අප්‍රමාණ තිබෙනවා. ඒ නිසා විශේෂයෙන්ම මේ පළාත් පාලන ආයතනවලට අවශ්‍ය පහසුකම් ටික, අවශ්‍ය උවමනාවන් ටික ප්‍රධාන ඇමැතිවරයා හැටියට එතුමා සපයලා දුන්නත් - මෙහි කියනවා, හැම පළාත් පාලන ආයතනයකටම එතුමා වාහනය බැගින් දීලා ඒ අවශ්‍ය පහසුකම් ටිකත් ලබා දීලා තිබෙනවා කියලා. සභාපතිවරයෙක් ගෞරවයක් ඇතිව, පළමුවැනි පුරවැසියා කියන වචනයට සමාන්තරව වැඩ කටයුතු කරන්න ප්‍රධාන ඇමැතිවරයා හැටියට එතුමා කටයුතු කරලා තිබුණත් ප්‍රාදේශීය සභාවල, නගර සභාවල සභාපතිවරු කරන හම්බ කිරීම් කටයුතු නිසා මුදල්මය තත්ත්වයට ගිජු වෙලා, ලෝභ වෙලා ඒ මතම පැණි හැළියට වැටුණු ඇඹලයෝ වාගේ කටයුතු කරන නිසාම අද දීප්තිමත් පළාත් පාලන සේවය, කීර්තිමත් පළාත් පාලනය අද විනාශ මුඛයට පත් වෙමින් යනවා.

ඒ වාගේම අපි දන්නවා, කුණු කසළ වර්ගීකරණය පිළිබඳව කියනවා. කසළ සම්පතක් කියලා කියන්නේ. අද සමහර සභාපතිවරුන්ට කසළ සම්පතක් වෙලා තමයි තිබෙන්නේ. මේ පිළිබඳව හොඳට අධ්‍යයනයක් කළොත් ගරු සභාපතිතුමනි, ඔබතුමා හරහා ගරු ප්‍රධාන ඇමැතිවරයාට අපි යෝජනා කරන්න කැමැතියි. මේ කසළ එහේ මෙහේ ගෙන යන ක්‍රියාවලිය තුළ විශාල Business එකක් සිද්ධ වෙනවා. ඒ නිසා විශේෂයෙන්ම ප්‍රධාන අමාත්‍යාංශය හැටියට එතුමා මේ කරන කටයුත්තේදී මේවා පිළිබඳව නියාමනයක් ඇති කරන්න, පාලනයක් ඇති කරන්න මීට වඩා වැඩ කටයුතු කළ යුතුයි කියලා අපි විශ්වාස කරනවා.

ඒ වාගේම එතුමාගේ කථාවේදී කියනවා, උපාධිධාරී අභ්‍යාසලාභීන් 891 ක් බඳවාගෙන ඔවුන් වෙනුවෙන් අවශ්‍ය පහසුකම් සලසන්න කියලා. අපි දන්නවා, තවමත් රුපියල් 10,000/- ක දීමනාවක් විතරයි ගෙවන්නේ. හැබැයි, ඔවුන්ට උපාධිධාරියෙක් හැටියට ආත්ම ගරුත්වයක් ඇතිව තමන්ගේ අධ්‍යාපනයට සුදුසු වැඩ කටයුත්තකට පවරන්න කියලා අපි ගරු ප්‍රධාන අමාත්‍යතුමාට යෝජනා කරනවා. අද මොනවද ඔවුන් කරන්නේ? එක්කෝ දිවි නැඟුමේ ඇට බෙදනවා. එහෙම නැත්නම් කාර්යාලවල මේසයක් නැතිව එහා මෙහාට යන තත්ත්වයට පත් වෙලා තිබෙනවා. ඒ නිසා ගරු ප්‍රධාන ඇමැතිතුමාට ඔබතුමා මාර්ගයෙන් මතක් කරන්න කැමැතියි. උපාධිධාරීන්ට ඇත්තෙන්ම රැකියා අවස්ථා සුලභ කරලා ලබා දීලා තිබෙනවා. හැබැයි, ඔවුන්ට ආත්ම ගරුත්වයක් ඇතිව ඒ රැකියාව කරන්න අවශ්‍ය පහසුකම් ටික සලසා දෙන්නය කියලා කියන්නේ.

ඒ වාගේම අපි මතක් කරන්න කැමැතියි. පළාත් රාජ්‍ය සේවාවේ ගුරු භවතුන් සඳහා යෝජිත රක්ෂණ ක්‍රමය. අපි ඒකට සන්තෝෂයි. කැමැතියි. එතුමාගේ අලුත් දර්ශනයට අපේ සම්පූර්ණ සහයෝගය දෙනවා. හැබැයි, මේ පිළිබඳව අනෙක් සමස්ත පළාත් සභාවේ රාජ්‍ය සේවයේ ඉන්න නිලධාරීන් පිළිබඳවත් සොයා බලන්නය කියන එක මතක් කරනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාගේ කාලය අවසන්.

**ගරු මංජු ශ්‍රී අරංගල - විපක්ෂ නායකතුමා**
Hon. Manju Sri Arangala - Leader of the Opposition

ඒ නිසා මේ අවස්ථාවේදී විශේෂයෙන්ම අපි මතක් කරන්න කැමැතියි. අනික් පැත්තෙන් ඉතාම කෙටියෙන් මතක් කරනවා නම් ගරු සභාපතිතුමනි, මිනිත්තුවක කාලයක් දෙන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කාලය දෙන්න අමාරුයි.

**ගරු මංජු ශ්‍රී අරංගල -** විපක්ෂ නායකතුමා
Hon. Manju Sri Arangala - Leader of the Opposition

අමාරුවෙන් හරි දුන්නා නම් හොඳයි. විශේෂයෙන්ම අපි මේ අවස්ථාවේදී අධ්‍යාපන අමාත්‍යාංශයේ ගරු ප්‍රධාන ඇමැතිතුමාගේ අයවැය කථාවේ අවසානයේදී මේ වෙනුවෙන් එතුමාගේ නිලධාරීන් හැටියට කටයුතු කරන එතුමාගේ සමාන්තර නිලධාරීන්ගෙන් සේවාව අපි අගය කරනවා. අපි යමක් කිව්වාම කරලා දෙන තත්ත්වයට පත් වෙලා තිබෙනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු විපක්ෂ නායකතුමා කථාව අවසන් කරන්න.

**ගරු මංජු ශ්‍රී අරංගල -** විපක්ෂ නායකතුමා
Hon. Manju Sri Arangala - Leader of the Opposition

ඒ නිසා ඒ සියලුදෙනාටම අපේ ගෞරවයත්, ස්තුතියත් මේ අවස්ථාවේදී පුද කරමින් මගේ වචන ස්වල්පය මෙයින් සමාප්ත කරනවා.

[අ.භා. 04.50]

**ගරු ප්‍රසන්න රණතුංග -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

ගරු සභාපතිතුමනි, ශීර්ෂ අංක 104, 109, 110, 111, 112, 113 ,114 හා 115 යන ශීර්ෂ සම්බන්ධව නොයෙකුත් අදහස් ආණ්ඩු පක්ෂයේ සහ විපක්ෂයේ මන්ත්‍රීවරුන්ගෙන් ඉදිරිපත් වුණා. ඒ අදහස් යෝජනා ඉදිරිපත් කරපු, සාධාරණ විවේචන ඉදිරිපත් කරපු සියලුම ගරු මන්ත්‍රීවරුන්ට මගේ ස්තුතිය මේ අවස්ථාවේදී පුද කරනවා. ඒ වාගේම මම මෙය අවස්ථාවක් කර ගන්නවා. පසුගිය අවුරුදු කාල සීමාවේදී අපේ අමාත්‍යාංශ හරහා සාර්ථකත්වයක් ලැබුවා නම් ඒක මගේ පෞද්ගලික දායකත්වයට වඩා ආණ්ඩු පක්ෂයේ, විරුද්ධ පක්ෂයේ හා සියලුම නිලධාරීන්ගේ සහයෝගයෙන් ඇති වුණු ජයග්‍රහණයන් කියන එක මේ අවස්ථාවේදී මතක් කරන්න ඕනෑ.

ගරු සභාපතිතුමනි, අයවැයක වඩා වගකීමක් තිබෙන්නේ, විරුද්ධ පක්ෂයට. අපි ඉදිරිපත් කරන අයවැය පිළිබඳව අදහස්, යෝජනා, විවේචන ඉදිරිපත් කිරීම විරුද්ධ පක්ෂයේ කාර්යභාරයක්. ආණ්ඩු පක්ෂයක් හැටියට අඩුවෙන් විරුද්ධ පක්ෂය කථා කරන තරමට අපි සන්තෝෂයි. ඒ නිසාම තමයි අපි අයවැයකට සූදානම් වනකොට පොත්පත් හදලා සෑම මන්ත්‍රීවරයෙකුටම දෙන්නේ, අධ්‍යයනය කරලා ඒ සම්බන්ධව අදහස් හා යෝජනා ඉදිරිපත් කරන්න කියලා. අද විරුද්ධ පක්ෂයක් හැටියට විරුද්ධ පක්ෂයේ මන්ත්‍රීවරු තමන්ගේ වගකීම් කොටස ඉටු කළාද කියලා ඒ අය තමන්ගේ හිතට එකඟව සිතා බලන්න ඕනෑ. සමහර මන්ත්‍රීවරු ඉතාමත්ම හොඳින් මේ කරුණු කාරණා අධ්‍යයනය කරලා සාධාරණ විවේචන, අදහස් හා යෝජනා ඉදිරිපත් කළා. සමහර ගරු මන්ත්‍රීවරු ආතක් පාතක් නැතිව ඔහේ කථා කරලා යනවා. මම හිතන්නේ, ඊට වඩා සුදුසුයි මේක සාර්ථක කරගන්න ඒ සියලු දෙනාගේම දායකත්වය ලබා දෙන එක.

ගරු සභාපතිතුමනි, ඉදිරිපත් කරලා තිබෙන පොත්පත්වල පසුගිය පළාත් සභාවේදී අයවැය විවාදයේදී ගරු මන්ත්‍රිවරුන් ඉදිරිපත් කරපු කරුණුවලට උත්තර ලබා දෙන්න අපි කටයුතු කරලා තිබෙනවා. ඒ වාගේම අයවැයේදී ඉදිරිපත් කරපු යෝජනා උපදේශක කාරක සභාවට යොමු කරලා උපදේශක කාරක සභාවේදී ඒ ප්‍රශ්න සඳහා විසඳුම් ලබා දෙන්නත් අපි කටයුතු කරලා තිබෙනවා. ඒ නිසා ඉදිරි කාලයේදී මේ අයවැයට ඉදිරිපත් කරපු කාරණා පිළිබඳව එහිදී සාකච්ඡා කරන්න බලාපොරොත්තු වන නිසා, කාලය පිළිබඳවත් ගැටලුව තිබෙන නිසා මන්ත්‍රීවරු ඉදිරිපත් කරපු කරුණු අනුව සියලු දෙනාටම උත්තර සපයන්න දැන් වේලාවක් නැහැ. ඒ නිසා ප්‍රධාන වශයෙන් මම කථා කරන්න බලාපොරොත්තු වන්නේ, පළාත් පාලන විෂයය පිළිබඳව. මෙතැන පළාත් පාලන විෂය ගැන කථා කරනකොට ගරු සභාපතිතුමනි, අපේ මන්ත්‍රීවරු කිව්වා, අපි නිසි අධීක්ෂණයක් කරලා නැහැයි කියලා. නමුත් පසුගිය අයවැය ඉදිරිපත් කළායින් පස්සේ පළාත් පාලන කොමසාරිස් දෙපාර්තමේන්තුව හරහා කොමසාරිස්තුමිය වෙනම කණ්ඩායම් හදලා පළාත් පාලන ආයතන පිළිබඳව වෙනම විමර්ශනයක් කරන්න කටයුතු කරලා තිබෙනවා. මේ වන කොට පළාත් පාලන ආයතන 07 ක් සම්බන්ධව මූලික පරීක්ෂණ කරලා තිබෙනවා. එයින් තුනකට කොමිසමක් පත් කරලා, එයට විනිශ්චයකාරයන් පත් කරලා මේ වන විට ඒ පිළිබඳව ප්‍රශ්න කරනවා. කීර්ති උඩවත්ත ගරු මන්ත්‍රිතුමා ඒක පැහැදිලිව කිව්වා. අපේ තිබෙන නීති රීතිත් එක්ක තමයි අපට කටයුතු කරන්න වෙන්නේ. මෙතැන ඉන්න ගොඩාක් මන්ත්‍රීවරු පළාත් පාලන ආයතනවල නියෝජිතයෝ, සභාපතිවරු වෙලා සිටිය අය. ඒ විධායක බලතල තිබෙන ආයතනයක් හැටියට,සභාපතිවරු හැටියට ඒ අයත් එක්ක ගණුදෙනු

කරද්දී අපි නීතියත් එක්ක කටයුතු කරන්න ඕනෑ. නැත්නම් සභාවක් හැටියට අපි අසීරුතාවයකට පත් වෙනවා. ඒ නිසා අපි ආණ්ඩු පක්ෂය කියලා බලන්නේ නැතිව පළාත් පාලන ආයතන සම්බන්ධව මේ වන විට මූලික පරීක්ෂණ කරන්නත්, ඒ වාගේම කොමිසම පත් කරලා ඒ පිළිබඳව විභාග කරන්නත් කටයුතු කරලා තිබෙනවා කියන එක අපේ නිරෝෂන් පාදුක්ක ගරු මන්ත්‍රීතුමාගේ දැන ගැනීම සඳහාත් ඒක මතක් කරන්න ඕනෑ.

ඒ වාගේම ගරු සභාපතිතුමනි, පළාත් පාලන ආයතන දියුණු කරන්න විශාල දායකත්වයක් ලබා දෙන්න පළාත් සභාවක් හැටියට අපි කටයුතු කළා. පළාත් මාර්ග සංවර්ධනය කරන්න. ඒ වාගේම ගිය පාර අයවැයේදී මන්ත්‍රීවරු ගොඩාක් ඉදිරිපත් කළා, භාගයට ඉදි කරපු ආදාහනාගාර සම්බන්ධව. අද ඒ ආදාහනාගාර සියල්ලකටම රජයෙන්, ජනාධිපතිතුමාගේ සාකච්ඡාවෙන් පස්සේ විශාල මුදල් ප්‍රමාණයක් ලබා දෙන්න කටයුතු කරලා තිබෙනවා. ඒ වාගේම ගරු සභාපතිතුමනි, ඉඩම් විෂයය ගැන අපේ ගරු මන්ත්‍රීවරු අඩුවෙන් කථා කළත් අවුරුදු 12 කට පස්සේ ඉඩම්වල අයිතිය ලබා දෙන්න අපට පුළුවන් වුණේ, මේ පසුගිය කාලයේ. අපි ප්‍රඥප්ති සංශෝධනය කරලා සමහර මන්ත්‍රීවරු කියන්න හැදුවා අපේ තිබුණු බලය නැති කරගත්තා කියලා. ගරු සභාපතිතුමනි, බලය ගැන කථා කරනවාට වඩා ජනතාවට සේවය කිරීමයි වැදගත් වන්නේ. ඒ නිසා අපි ප්‍රඥප්ති සංශෝධනය කිරීම නිසා අවුරුදු 12 කට පස්සේ ඉඩම්වල අයිතිය ලබා දෙන්න කටයුතු කළා. මම හිතන්නේ විශාල ඉඩම් ප්‍රමාණයක් භුක්ති විඳින්න, ඒ අවස්ථාව අද බස්නාහිර පළාතේ ජනතාවට මේ වන විට ලැබිලා තිබෙනවා.

ඒ වාගේම අධ්‍යාපන ක්ෂේත්‍රය ගැන කථා කරනකොට ගරු සභාපතිතුමනි, ඉතාමත් කෙටියෙන්. අපේ මොහොමඩ් මුජිබුර් රහුමාන් ගරු මන්ත්‍රීතුමා එතුමාගේ කථාවේදී කොළඹ අධ්‍යාපනය කඩා වැටුණයි කියන කාරණාව එතුමා කථා කළා. ගරු සභාපතිතුමනි, මම හිතන්නේ මේ සංඛ්‍යා බන පොත්පත්වල දීලා තිබෙනවා. මම සන්තෝෂ වෙනවා. ඒක මගේ දෙයක් නොවෙයි. අපේ පාසල් පද්ධතිය තුළ, අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ ඉන්න සියලු නිලධාරීන්ගේ මැදිහත්වීම හරහා අපේ වැඩ පිළිවෙළවල් ක්‍රියාත්මක කිරීම තුළින් අපි ලබපු ජයග්‍රහණ තමයි, 2008 සිට 2012 වන විට ඒ කාල සීමාවන් අධ්‍යයනය කරල බැලුවොත් විශාල වශයෙන් අපට ප්‍රතිඵලවල ප්‍රගතියක් ඇති කරගන්න පුළුවන් වෙලා තිබෙනවා. පහේ ශිෂ්‍යත්ව කඩඉම කියන්නේ අර ශිෂ්‍යත්ව ආධාර ලබා දෙන්න ලකුණක් පමණයි. ඒ ලකුණට එහා යන කථාව නොවෙයි ගරු සභාපතිතුමනි. සමස්තයක් හැටියට ගත්තොත් මෙතුමා කිව්වා, කොළඹ කලාපය. 2008 වසරේ සමත් වුණු ප්‍රමාණය 42.4% යි. හැබැයි, 2013 වන විට එය 68.1% දක්වා වැඩි වෙලා තිබෙනවා. ක්‍රමානුකූලව වැඩි වෙලා තිබෙනවා. මේක මම හදන්නේ නැහැ, මේක මගේ ජයග්‍රහණයක් කියලා ලබන්න. මේක අපි හැමෝගෙම ජයග්‍රහණයක්. දරුවෝ අපි සියලුදෙනාගේම.

ඒ වාගේම ගරු සභාපතිතුමනි, සාමාන්‍ය පෙළ, උසස් පෙළ ප්‍රතිඵල දිහා බැලුවත් අපේ ප්‍රතිඵලවල ඉහළ වැඩිවීමක් දකින්නට පුළුවන්කම තිබෙනවා. මට එකින් එක කථා කරන්න බැහැ. මේ පොත්පත්වල ඒ සම්බන්ධයෙන් තිබෙනවා.

ඒ වාගේම අපේ චන්ද්‍රසෝම සරණලාල් ගරු මන්ත්‍රීතුමා, එතුමාගේ කථාවේදී කිව්වා - මම හිතන්නේ එතුමා විතරයි. ආණ්ඩු පක්ෂයේ සහ විරුද්ධ පක්ෂයේ සියලුම ගරු මන්ත්‍රීවරු මම ස්තූතිවන්ත වෙනවා. එතුමන්ලා අධ්‍යාපනයට අවධානය යොමු කරලා ඒකේ සාධාරණ විවේචන හා හොඳ දේවල් ගොඩ දෙනෙක් කථා කළා. අනික් විෂයයන්වලට වඩා. නමුත් එතුමා විතරක් අලුතෙන් කඩා වැටීමක් ගැන කිව්වා. මම කනගාටු වෙනවා. මොකද, එතුමා පළාත් සභාවේ දීර්ඝ කාලයක් හිටපු මන්ත්‍රීවරයෙක් හැටියට තමන්ගේ ගමේ පාසල වැහෙන තුරු බලන් සිටියා නම්, එතුමා මහජන නියෝජිතයෙක් හැටියට මෙතැන ඉන්න සුදුසුද කියන කාරණාව පිළිබඳව මට කනගාටුවක් ඇති වුණා. ඒ නිසා ගරු සභාපතිතුමනි, 2009 මේ පාසල වැහෙන්න ගිය පාසලක්. එක දරුවෙක් නිසා මේ පාසල ඇරගෙන ඉන්න සිද්ධ වුණා. නමුත් ඊට පස්සේ ඒ දරුවාට වෙනත් පාසලක් ලබා දීලා, අපි ඒක වහලා මානව හා භෞතික සම්පත් කළමනාකරණය කරන්න අපි කටයුතු කළා. ගරු සභාපතිතුමනි, එතුමා කථා කරගෙන යනකොට කිව්වා පළාත් පාලනයට මේ දේ වෙලා තිබෙන්නේ මහ ඇමැතිතුමාගේ දුර්වලකම නිසා කියලා. අධ්‍යාපනයේ පාසල් වැහෙන්නේ මහ ඇමැතිතුමාගේ දුර්වලකම නිසා කියලා. මම බලාගෙන සිටියා, තව මොනවද කියන්නේ කියලා. ඒ කාලසීමාවේ මගේ නෝනට බබා හම්බ වුණා. ඒකටත් වග කියන්න ඕනෑ මහ ඇමැතිතුමා තමයි කියලා, කියයි කියලා මම හිතුවා. ගරු සභාපතිතුමනි, හොඳ

[ගරු ප්‍රසන්න රණතුංග - ප්‍රධාන අමාත්‍යතුමා]

වේලාවට ඒක කිව්වේ නැහැ. ඒ කථාව කිව්වා නම් අද මට ගෙදර යන්න හම්බ වෙන්නෙත් නැහැ. ඒ නිසා ගරු සභාපතිතුමනි, -

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

මාර අපහාසයක් නේ.

**ගරු සිරිකමල් පිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Felician De Silva

ඒ හැකියාව නැහැයි කියලා දන්නවා.

**ගරු ප්‍රසන්න රණතුංග** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

මම අපහාසයක් කළේ නැහැ. මම කිව්වේ කියාගෙන ගිය විධියට එහෙමත් කියයි කියලා.

**ගරු ශිරන්ත අමරසේකර**
Hon. Shirantha Amarasekara

හිතේ තිබුණ දෙයක්ද කොහෙද කියැවිලා තිබෙන්නේ.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

ඒ ගැනත් අපි සොයා බලනවා.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

හැකියාව නැහැයි කියලා කොහොමද දන්නේ? කවුරු හරි දෙන්න ඇති එහෙමනම් නේද?

**ගරු ශ්‍රීනාත් ම. පෙරේරා**
Hon. Srinath M. Perera

ඒක ගැන සොයා බලන්න.

**ගරු ප්‍රසන්න රණතුංග** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

මගේ කථාව අවසාන කරන්න ප්‍රථමව කියන්නේ මේ පසුගිය අවුරුදු පහ කාලසීමාවේදී - විශේෂයෙන්ම මගේ ආණ්ඩු පක්ෂයට මගේ කැබිනට් මණ්ඩලයට පසුගිය කාලසීමාව තුළදී අප හා ඉතාමත්ම එකමුතුව සාමුහිකව කණ්ඩායම් හැඟීමෙන් කටයුතු කරන්න පුළුවන් වුණා. ඒ වාගේම ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරුන් එක්ක, විරුද්ධ පක්ෂයේ මන්ත්‍රීවරුන් එක්ක අපට සහයෝගයෙන් කටයුතු කරන්න ලැබුණා. උපදේශක කාරක සභාව අපි සෑම මාසයකම තියලා ඒ නිසාම අධ්‍යාපන ක්ෂේත්‍රයට වැඩි අවධානයක් යොමු කිරීම නිසා අපට සාර්ථක ප්‍රතිඵල ලබන්න පුළුවන්කම ලැබුණා. තමුන්නාන්සේලා අද අපේ විෂයයන් ගැන යම්කිසි ඇගයීමකට ලක් කළා නම්, ඒක තමුන්නාන්සේලා අපි සියලු දෙනාගේම ජයග්‍රහණය නිසා ලැබුණයි කියන එක මේ අවස්ථාවේදී මතක් කරමින්, ඒ වාගේම පසුගිය අවුරුදු පහේ කාලසීමාව තුළ මට සහයෝගය ලබා දීපු මගේ ප්‍රධාන ලේකම්තුමිය, අමාත්‍යාංශ ලේකම්වරුන් ඇතුළු ආයතන ප්‍රධානීන්, සියලුම පළාත් රාජ්‍ය නිලධාරීන්ට මගේ ස්තූතිය පුද කරන අතර, අවසාන වශයෙන් අපේ මංජු ශ්‍රී අරංගල ගරු විපක්ෂ නායකතුමා ඉල්ලීමක් කළා. ගුරුවරුන්ට ලබා දීපු රක්ෂණ ක්‍රමය පිළිබඳව පළාත් රාජ්‍ය සේවකයින්ටත් ලබා දෙන්නය කියලා. මම මීට ප්‍රථමත් ඒක කිව්වා. අපි ආරම්භයේ නියාමක වැඩ සටහනක් හැටියට ගුරුවරුන්ට දුන්නා. ලබන වර්ෂයේදී සියලුම පළාත් රාජ්‍ය සේවකයින්ට ඒ වැඩ පිළිවෙළ දියත් කරන්න කටයුතු කරනවයි කියන කාරණාව මතක් කරමින්, තමුන්නාන්සේලා සියලු දෙනාටම මගේ ස්තූතිය පුද කරමින් මම නිහඬ වෙනවා.

*ඊට අනුකූලව අ.භා. **04.59** ට, අංක **104, 109, 110, 111, 112, 113, 114** හා **115** යන ශීර්ෂ පිළිබඳ සාකච්ඡාව අවසාන විය.*
*Accordingly discussion on the Expenditure Head Nos 104, 109, 110, 111, 112, 113, 114 and 115 was concluded at 04.59 p.m..*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාට බෙහෙවින්ම ස්තුතිවන්ත වෙනවා. ප්‍රධාන අමාත්‍ය, මුදල් හා ක්‍රම සම්පාදන, නීතිය හා සාමය, ඉඩම්, අධ්‍යාපන, පළාත් පාලන හා පළාත් පරිපාලන, මිනිස්බල හා රැකි රක්ෂා, ආර්ථික ප්‍රවර්ධන හා විදුලිබල හා බල ශක්ති හා වෙළඳ විෂයය භාර වැය ශීර්ෂයන් පිළිබඳ විවාදය, ශීර්ෂ අංක 104, 109, 110, 111, 112, 113, 114 හා 115 යන වැය ශීර්ෂයන් පිළිබඳ විවාදය මෙයින් අවසන් වෙනවා. ඒ පිළිබඳව සභාවේ බෙදීමක් තිබෙනවාද?

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා
Hon. U. George Perera - Chief Opposition Whip

බෙදීමක් තිබෙනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකර සීනුව නාද කරන්න.

***ඊට අනුකූලව,***

***ශීර්ෂ අංක 104 හි සඳහන් මුදල අනුමත කළ යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, 61(3) රීතිය යටතේ පූර්ණ කාරක සභාව පක්ෂව 64 යි, විපක්ෂව 17 යි, වැළකුණු 00 යි යනුවෙන් බෙදුණේය.***

*The question that the amount indicated in the Head No. 104 should be approved was put and the Committee of the Whole Council was divided under Rule No. 61(3) as 64 for, 17 against and 00 decliners.*

***ශීර්ෂ අංක 109 හි සඳහන් මුදල අනුමත කළ යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, 61(3) රීතිය යටතේ පූර්ණ කාරක සභාව පක්ෂව 64 යි, විපක්ෂව 17 යි, වැළකුණු 00 යි යනුවෙන් බෙදුණේය.***

*The question that the amount indicated in the Head No. 109 should be approved was put and the Committee of the Whole Council was divided under Rule No. 61(3) as 64 for, 17 against and 00 decliners.*

***ශීර්ෂ අංක 110 හි සඳහන් මුදල අනුමත කළ යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, 61(3) රීතිය යටතේ පූර්ණ කාරක සභාව පක්ෂව 64 යි, විපක්ෂව 17 යි, වැළකුණු 00 යි යනුවෙන් බෙදුණේය.***

*The question that the amount indicated in the Head No. 110 should be approved was put and the Committee of the Whole Council was divided under Rule No. 61(3) as 64 for, 17 against and 00 decliners.*

***ශීර්ෂ අංක 111 හි සඳහන් මුදල අනුමත කළ යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, 61(3) රීතිය යටතේ පූර්ණ කාරක සභාව පක්ෂව 64 යි, විපක්ෂව 17 යි, වැළකුණු 00 යි යනුවෙන් බෙදුණේය.***

*The question that the amount indicated in the Head No. 111 should be approved was put and the Committee of the Whole Council was divided under Rule No. 61(3) as 64 for, 17 against and 00 decliners.*

***ශීර්ෂ අංක 112 හි සඳහන් මුදල අනුමත කළ යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, 61(3) රීතිය යටතේ පූර්ණ කාරක සභාව පක්ෂව 64 යි, විපක්ෂව 17 යි, වැළකුණු 00 යි යනුවෙන් බෙදුණේය.***

*The question that the amount indicated in the Head No. 112 should be approved was put and the Committee of the Whole Council was divided under Rule No. 61(3) as 64 for, 17 against and 00 decliners.*

***ශීර්ෂ අංක 113 හි සඳහන් මුදල අනුමත කළ යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, 61(3) රීතිය යටතේ පූර්ණ කාරක සභාව පක්ෂව 64 යි, විපක්ෂව 17 යි, වැළකුණු 00 යි යනුවෙන් බෙදුණේය.***

*The question that the amount indicated in the Head No. 113 should be approved was put and the Committee of the Whole Council was divided under Rule No. 61(3) as 64 for, 17 against and 00 decliners.*

***ශීර්ෂ අංක 114 හි සඳහන් මුදල අනුමත කළ යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, 61(3) රීතිය යටතේ පූර්ණ කාරක සභාව පක්ෂව 64 යි, විපක්ෂව 17 යි, වැළකුණු 00 යි යනුවෙන් බෙදුණේය.***

*The question that the amount indicated in the Head No. 114 should be approved was put and the Committee of the Whole Council was divided under Rule No. 61(3) as 64 for, 17 against and 00 decliners.*

***ශීර්ෂ අංක 115 හි සඳහන් මුදල අනුමත කළ යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, 61(3) රීතිය යටතේ පූර්ණ කාරක සභාව පක්ෂව 64 යි, විපක්ෂව 17 යි, වැළකුණු 00 යි යනුවෙන් බෙදුණේය.***

*The question that the amount indicated in the Head No. 115 should be approved was put and the Committee of the Whole Council was divided under Rule No. 61(3) as 64 for, 17 against and 00 decliners.*

## රීති අංක 50 (6) යටතේ යෝජනාව
MOTION UNDER RULE NO : 50 (6)

**ගරු සුනිල් ජයමිණි - සභානායකතුමා**
Hon. Sunil Jayamini - Leader of the House

ගරු සභාපතිතුමනි, "*පූර්ණ කාරක සභාවේ කාලය ප.ව. 05.15 දක්වා දීර්ඝ කළ යුතු යැයි*" යෝජනා කර සිටිනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*Question put and agreed to.*

***පූර්ණ කාරක සභාව නැවත පළාත් සභා තත්ත්වයට පත් කිරීම.***
*THE PROVINCIAL COUNCIL RESUMED.*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මෙම අවස්ථාවේදී පූර්ණ කාරක සභාව පළාත් සභා තත්ත්වයට පත් වෙනවා.

***ඊට අනුකූලව අ.භා. 05.06 ට පූර්ණ කාරක සභාව පළාත් සභාව බවට පත් විය.***
*Accordingly at 05.06 p.m. the Provincial Council resolved itself in to a committee of the whole Council.*

**[පූර්ණ කාරක සභාවේ ප්‍රගතිය ]**
[Progress of the whole council]

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අද දවසේ ප්‍රගතිය. 2014 වර්ෂය වෙනුවෙන් පවත්වනු ලබන අයවැය විවාදයේ අද දවසේ ශීර්ෂ අංක 100, 101 හා 102 ට අදාළ ආණ්ඩුකාරතුමා, බස්නාහිර පළාත් සභාව, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව පිළිබඳ විවාදයන් පැවැතුණා. ඒ සම්බන්ධයෙන් දීර්ඝ වශයෙන් කථා කළා. ඒකී වැය ශීර්ෂයන්ට බෙදීමක් අවශ්‍ය නැහැ. සම්ප්‍රදායානුකූලව එම වැය ශීර්ෂයන් සභා සම්මත වූ වැය ශීර්ෂයන් බවට සභාව නිවේදනය කළා.

ඉන් අනතුරුව ගරු ප්‍රධාන අමාත්‍යතුමාගේ වැය ශීර්ෂ අංක 104, 109, 110, 111, 112, 113, 114 හා 115 යන වැය ශීර්ෂයන් පිළිබඳ විවාදය ආරම්භ කරමින් විපක්ෂයේ හා ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීතුමන්ලා රාශියක් ඒ පිළිබඳව හරවත් දේශන ඉදිරිපත් කරමින් විවාදයට සම්බන්ධ වුණා. ඒ පිළිබඳව විපක්ෂයේ සහ ආණ්ඩු පක්ෂයේ සියලුම ගරු මන්ත්‍රීතුමන්ලාට මම ස්තුතිවන්ත වෙනවා. අවසානයේදී ගරු ප්‍රධාන අමාත්‍යතුමාගේ කථාවෙන් පසුව නියමිත වේලාවේදී එම වැය ශීර්ෂයන් අවසන් වීමෙන් පසු ඒ පිළිබඳව බෙදීමක් ඇති වුණු නිසා අපට ඡන්දයකට යැමට සිදු වුණා. ඒ ඡන්දයකට යැමේදී එම වැය ශීර්ෂයන්ට පක්ෂව ඡන්ද 64 ක්ද, විපක්ෂව ඡන්ද 17 ක්ද වැළකී සිටි ඡන්ද කිසිවක් නැහැ. ඒ අනුව ගරු ප්‍රධාන අමාත්‍යතුමාගේ ශීර්ෂ අංක 104, 109, 110, 111, 112, 113, 114 හා 115 යන වැඩි ඡන්ද 47 කින් සභා සම්මත වූ වැය ශීර්ෂයන් බව අද දවසේ ප්‍රගතිය වශයෙන් ඉදිරිපත් කරනවා. ඒ අනුව දවසට නියමිත න්‍යාය පත්‍රයානුකූල වැඩ සටහන අවසන් වෙනවා.

# කල් තැබීම
# ADJOURNMENT

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

*"දැන් මම මෙම සභාව කල් තබනවා."*

***ඊට අනුකූලව පළාත් සභාව අ.භා. 05.11 ට, 2013 දෙසැම්බර් මස 05 වන දින පූ.භා. 09.00 වන තෙක් කල් ගියේය.***

*Accordingly, the Provincial Council was adjourned at 05.11 p.m till 09.00 a.m, on 05.12.2013.*